
I NEED YOU LIKE A HEART NEEDS A BEAT...
සීගිරි FINAL
2019 SPRING COLLECTION
සුජීව ප්‍රසන්න ආරච්චි
# SUJEEWA PRASANNA ARACHCHI

# සීගිරිFinal

සුජීව ප්‍රසන්න ආරච්චි

# 01

දේවක ඇහැරුණේ හවස හයත් පසුවීය. ඔහු ඇස් විවර කළේ පවා අමාරුවෙනි. තද උණට ලබා දී තිබූ ප්‍රතිජීවක එන්නත් නිසා ඇස් විවර කිරීම පවා අපහසුය.

"සුද්දී"

දේවක ඇස් විවර කරන්නටත් පෙර කතාකළේය. තමා මේ තරම් කාලයක් නිදාගත් බවක් ඔහු දන්නේ නැත. අවට කළුවර වැටී අවසානය. ජීවන් කොල්ලා ළඟ ඉඳගෙන නළලත

වැසෙන්නට අතක් තැබුවේය. 'දැන් උණක් නෑ'

"සුද්දී"

යලිත් දේවක කතාකළේය. ඔහු මේ හිතන්නේ නින්දට වැටුණු මොහොතට පසුව මහා වේලාවක් ගියේ නැති බවය.

"සුද්දි ගියා චූටි මහත්තයෝ. දැන් රෑ වෙලා"

දේවක නෙත් විවර කළේ ඒ වෙලාවේය.

"අප්පච්චි මේ"

ජීවන් සිනාසුනේය.

"හවස හතර වෙනකල් සුද්දි ඔයා ළඟ ඉඳලා ගියේ. මං එනකොටත් ඔඩොක්කුවේ තියාගෙන උන්නේ. ඔයාට හොඳටම උණ. වමනෙත් දාලා."

දේවක ඇස් ලොකු කරගෙන බලාගෙන උන්නේය.

"දැන් රෑ වෙලා මහත්තයෝ. ඇඟට තාම අමාරුද?"

"මට අප්පච්චි ඇග වෙව්ලලා පණ නැති වුණා. සුද්දි මාව මෙහේ එක්කගෙන එනවා මතකයි"

"මට කෙල්ල හැමදේම කිව්වා. හතරට විතර ගියේ."

"එයා පව්."

"ම්. පව් තමයි. ඉඳලා ඉඳලා දරුවා ගෙදර ආපු දවසේ තේ ටිකක්වත් හදලා දෙන්න බැරිවුණා. ඔයාට තේත් හදලා පොවලා."

"සුද්දි."

"ම්. දැන් උණක් නෑ. අපි උණු වතුරෙන් ඇඟ ටිකක් හෝදගෙන කමු. මම මිරිස් මාළුවක් හැදුවා.

පොල් රොටි එක්ක. කාලා බෙහෙත් ටික බොමු."

දේවක බලාගෙනම උන්නේය.

"අප්පච්චිව දැකලා එයා අප්පච්චි"

"ඇඬුවා. ඇයි දන්නේ නෑ"

"එයා මේ මොනවත් දනනේ නෑ අප්පච්චි."

"දන්නවද කියලත් හිතුණා. ඇයි අප්පච්චි පොඩි පුතේ කියන්නේ කියලත් ඇහුවා"

දේවකට පුදුමය. ඊත් සමඟම ජීවන්ගේ දුරකථනය නාද විය. ජීවන් එය ගත්තේය. කතාකරන්නේ කෙල්ලය.

"පොඩි පුතේ"

ඔහු කතාකළේ එහෙමය.

"නැඟිට්ටද අප්පච්චි. උණ අඩුද?"

"දැන් උණ අඩුයි පුතේ. මේ දැන් නැගිටලා ඔයාව හොයනවා"

"අනේ මා..ව"

'අනේ දෙයියනේ ඉඳලා එන්න තිබුනේ' භාවනාට පසුතැවිල්ලක් ඇතිවිණ.

"ඉන්න මං දෙන්නම්"

ජීවන් කොල්ලාගේ අතට දුරකථනය දී උණු වතුර උණු කරන්නට ගියේය. දේවක දුරකථනය කණේ තබාගත්තේ ළය උණුවීගෙන යද්දීය.

"සුද්දි මාව"

"දැන් උණ අඩුයි නේද අයියේ"

"ඔ..ඔව්. චීත් සුද්දි හවස් වෙනකල් ඉඳලා"

"තව ටිකක් ඉන්න තිබුණා මට."

"අනේ බඩගින්නේ. ඉන්න ඇති"

"කොහෙද බඩගින්නක්"

'කන්නවත් ලැබුණේ නෑනේ. කොල්ලෙක් මගේ උකුලෙනේ. චූ ටිකක් දාගන්න යන්න බැරුව උන්නේ' කියන්නට සිතෙන්නේ එහෙමය.

"හරි අපි පස්සේ කතාකරමු. දැන් උණු වතුර ටිකකින් හොඳට ඇඟ සෝදගන්න ඕන. මොනවාහරි කන්නෝන. ඊට පස්සේ බෙහෙත් ටික බීලා ටිකක් ඇලවෙලා ඉන්නෝන. කන්ට්‍රෑක්ටලා ඔක්කොටම මම කතාකළා. ඒ වැඩ හරි. සිස්ටම් එක යනවා. ඒවා හිතන්න එපා. හවස මම සීගිරි එකටත් ගියා. ඔයා ඒ හාස්කම කරලා. අපි හෙට ඇවිත් බලමු හොළේ. මම අර වහපු පොලිකීන් කවර්ස් මොවවත් රිමූ කළේ නෑ. ඒවා

එහෙම රිමූ කළේ ඇයි කියලා මම දන්නවා. මට කතාකරන්න ගොඩක් දේවල් තියෙනවා. ඒවා පස්සේ. දැන් යන්න ඇඟ හෝදගන්න."

ඇය දිගටම කියාගෙන ගියාය. එෆ්එම් නිවේදිකාවක් සේ ඇය කියවාගෙන ගියාය.

"සුද්දි පව්"

"මී පව් තමයි අනේ"

ඇය කීවාය.

"මං සුද්දි."

"දැන් ඇඟ සෝදගන්න. යන්න. අද හොඳට කන්නෝන. බඩේ මොනවත් නෑ. වමනේ ගියේ කහ පාට පිත විතරයි"

ගෙවුණු පැය හත අට කොහොම ගෙවෙන්නට ඇත්දැයි දේවක සිතුවේය. පුදුමය.

"මං රෑට කතාකරන්නද?"

"මී. ඇඟ හෝදගෙන කාලා බෙහෙතුත් බීලා හොඳේ."

"මම ගන්නම්."

දේවක කොර ගසමින් මෙන් කුස්සියට ඇවිදගෙන ආවේය.

"කෙල්ල තේත් හදලා. පව්. තේ හදලා ඔයාට පොවලා."

ඇය එහෙම පැමිණ කළා කියා හිතන්නේ කෙසේද? 'එච්චර දේවල් වෙන වෙලාවේ මාව සිහිනැතිකරලා තිබ්බේ ඇයි දෙයියනේ' දේවක සිතුවේය.

"මං එනකොටත් ඔයා පොඩි පුතාගේ උකුලේ හොඳටම නිදි. කෙල්ලගේ බඩත් බදාගෙන."

"ම..ම අප්පච්චි එ..හෙ..ම"

"මී. මං ඒත් කිව්වා එයාට

මෙහෙම ගෑණු උකුලක නිදාගන්න ලැබිලා නෑනේ පුතේ කියලා.”

ඇය මොනවා හිතන්නට ඇත්ද?

“කොච්චර ඉඳලද කියනවානම් පැය හතරක් එහෙමම ඔයාව උකුලේ තියාගෙන ඉඳලා. මං ආවට පස්සෙයි කෙල්ල අප්පච්චි ටොයිලට් එක කෝ කියලා හොයාගෙන ගියේ. හිරකරගෙන ඉඳලා එච්චර වෙලාවක්.”

දේවක දුක් වුයේ නැත. ඔහුට දුක ඒ අසිරිමත් මොහොතේ තම හදවත අක්‍රීය වී තිබීමය. ‘පොඩිහරි සිහියක් තිබුණානම් හොරාට නිදාගෙන ඔයාගේ උකුලට වෙලා ඉන්න තිබුණා.’ ඔහු පසුතැවීමෙන් සිතුවේය.

“මට තාමත් හිතාගන්න බැරි පුංචි මහත්තයෝ.”

"ඔව් අප්ඵච්චි."

"ඇයි මේ කෙල්ල මාව බදාගෙන ඇඬුවේ කියලා."

ඇය යමක් දැනගත්තාද? එහෙත් කෙසේද? දේවක සිතුවේය.

"එයාට මේවා කියන්න උන්නේ අප්පච්චි"

"ම්. දැන් ඇඟ සෝදගමු. මඟින් මඟට කියලා ගියේ. උණු වතුර උණුකරලා දෙන්න කියලා."

මේ සිදුවූයේ හාස්කමක්ද? සූරියආරච්චි නිවසින් අරන් යන්නට හදන්නේ එහෙම කෙල්ලවද? දේවකට තවමත් සිතාගත නොහැක. 'ඔයා මොනවාහරි කියයි.' ඔහු සිතුවේය.

# 02

නේත්‍රා ඇඳට වී බලාගෙන උන්නේ භාවනා එනතෙක්ය. ඇයට මේ කියන්නට ඇති වැදගත් දේ කුමක්දැයි නේත්‍රාට සිතාගන්නට නොහැක. එය නිසැක වශයෙන්ම දේවක සම්බන්ධ දෙයක් බවනම් ඇය දනී.

භාවනා ආවේ නමයත් පසුවූ පසුය. නිවස දැන් සන්සුන්ය. අද තාරකා යළිත් සේවයට පිටවගියේ

මේ හැමදේම වෙනස් කරය. එය කළ හැක්කේ ඇයටම පමණක් යැයි නේත්‍රාටද සිතෙයි. 'කෙල්ල බය නෑ.' ඇය සිතුවාය.

භාවනා ආවේ රෑ ඇඳුම ගතට දාගෙනමය. රෝස පැහැගත් රෑ ඇඳුම සුදු පැහැගත් ලේස් එකකින් පයිපින් කර ඇත. එය යුවතියට ගෙන ආවේ ලාබාළ පෙනුමකි.

"සීගිරි එක දැන් බලන්න ලස්සනයි නේද අක්කා."

"කොල්ලගේ වැඩ තමයි. මටත් හිතාගන්න බැහැ මේ පොඩි කොල්ලා එහෙම කළා කියලා හිතනකොට."

නේත්‍රා කීවාය.

"ඒක අක්කා ලේවල ඇති. ඒ දක්ෂකම."

භාවනා කීවාය. නේත්‍රාට ඒ කියූ

දේ හරියටම වැටහුනේ නැත.

"ලේවල කිව්වේ බබා."

"ඉන්නකෝ කියන්න තත්පරයක්"

භාවනා දුවගොස් කාමරයෙ දොර වසාම පැමිණි ඇඳට ආවාය. ඊටත් පසුව කොට්ටයක් ගෙන ඇඳ වියලට තබා ඇලවුණාය. කෙල්ල කියන්නට යන්නේ එසේ මෙසේ කතාවක් නොවන බව නේත්‍රාට ඉවෙන් මෙන් වැටහිණ.

"දේවක මල්ලිට දැන් සනීපද බබා."

"මං හිතුවේ අක්කා එයාව ඉන්ටෙන්සිව් ටාන්නත් වෙයි කියලා"

"අනේ එච්චර."

"ඉන්නකෝ කියන්න. රුවන්ත මට කතාකළේ ඩිස්පෙන්සරියේ ඉඳලා. දේවකව ස්පෙෂල් ට්‍රීට්මන්ට් රූම්

එකට අරන්. මං දුවලාගියා."

"කොල්ලා කොහොමත් හිටියේ හරි අප්සට් එකෙන්නේ."

"ම්. මේ හදිස්සි අසනීපය ඒ නිසාම වෙන්න ඇති. වේල් තුන හතරකින් කාලා නෑ. ඒත් දිගටම මහන්සිවෙලා. වෙන දුකකුත් එයාට තිබුණානේ. ඉතින් ඔක්කොම උණෙන් ගියා"

"අනේ."

"මේ සිද්ධවෙන්න ගිය දේවල් එහෙමම වුණානම් අද දේවක සීගිරි එකේ නෑ. ඒක මට අද හිතුණා."

"මටත්. ඉතින් ඔයා ගියා."

"ම්. යනකොටත් අසිහියෙන් වගේ හිටියේ. ගිනිමැලේට උණ.ඩෙංගුද කියලා බලන්නත් බ්ලඩ් ටෙස්ට් එකක් අරන් යවලා. බ්ලඩ් ටෙස්ට් එක

එනකල් එයාව තියාගෙන උන්නා. මම රුවන්තව යවලා දේවකයියා ළඟට වෙලා හිටියා. අනේ කතාකරග න්නවත් පණක් නෑ."

"කොල්ලා එහෙම ලේසියෙන් වැටෙන කොල්ලෙක් නෙමේ."

"එහෙම නොවැටෙන කොල්ලත් වැටුනේ මම නිසා අක්කා"

කෙල්ල ඒ දේ තේරුම් ගෙන උන්නාය. නේත්‍රා සන්සුන්ව අසාගෙන උන්නාය.

"මං පස්සේ කැබ් එකක් අරන් ගෙදර එක්කගෙන ගියා. එහෙම තනියම යවන්න බෑ. යනකොටත් මගේ මේ කකුල් දෙක උඩ නිදාගෙන ගියේ. පොඩි එකෙන් වගේ"

නේත්‍රා මවාගත්තාය. වසන්ත කාලයට වෙන දේවල් ලස්සනය.

දුකත් සැපකි.

"යන ගමන් සැන්ඩ්විච්ස් ටිකක් කිරි පැකට් ටිකක් එහෙම අරගෙන ගියේ. ගේ පෙන්නුවෙත් අමාරුවෙන්. අතුරුගිරියේ වෙල් යායක් ළඟ අලුතෙන් හදාගෙන යන පොඩි ගෙයක්. ගඩොල් බිත්ති විතරයි. ඒත් හරි අහිංසක තැනක්. අක්කට ගියාම තේරෙයි. මේ අප්පච්චියි පුතයි එතන තමා ජීවත්වෙන්නේ"

භාවනා කීවාය. දෛවය මේ අප්පච්චිලා පුතාව මේ ගෙනවිත් ඇත්තේ දෛවෝපත තැනකටය.

"අනේ ගෙදර ගියත් හරි පොඩි සැට් කෑල්ලකට වැටුණා. එහෙමම නිදි. කන්නෙත් නැතුව. මම ටිකක් ඔළුව අතගගා උන්නා. දේවකයියගේ අප්පච්චිත් නෑ. තට්ට තනියම අපි

දෙන්නා."

කොල්ලට උණ තිබුණ නිසා හොඳය. නැත්නම් මොනවායින් මොනවා වේදැයි දන්නේ නැත. ආදරවන්තයන් තනිවූ විට කෙළවර වෙන තැන නේත්‍රා දනී.

"මොකද අමුතු විදිහට හිනාවෙන්නේ. අපි එහෙම."

"දැන් කවුද එහෙම කිව්වේ. ඇරත් කොල්ලට උණනේ."

"මං ඉතින් පව් නිසා උකුලේ තියාගෙන උන්නේ. මේ වෙව්ලනවා. පොඩි එකා වගේ වැටිච්ච වැටිච්ච තැන නිදි."

"මී පස්සේ."

"පස්සේ අක්කා එයාට ඇඳුමක් බලන්න මම කාමරේට ගියා. ගඩොල් බිත්ති විතරයි. ඒත් හරි සනීපයි.

වෙල් යායේ හුළඟ හායි ගාගා කාමරේට එනවා.”

කෙල්ලගේ කතාවේ විස්තර වැඩිය. මේක නවකතාවක් නොවේ.

“ඉතින්”

“මම අල්මාරිය ඇරයා. අනේ ඇරපු ගමන් මට දොර පලුව දිහා බැලුණා. මගේ ෆොටෝ එකක්. මගෙන් හොරකම් කරලා අල්මාරියේ ගහගෙන”

ඒ ටික කියනවිටත් භාවනාගේ ඇස්වල කඳුළුය.

“පව් අහිංසකයා.”

“එහෙම කෙනෙක් මගේ පොටෝ එකත් අල්මාරියේ ගහගෙන ඉන්නකොට මම අර සුරියආරච්චිලා එක්ක ගියානම් නේද අක්කා.”

“එහෙම වුනේ නෑනේ බබා. දැන්

අඬන්න එපා"

"පව්. ඒ අල්මාරියේ පලුවෙම එයාගේ අම්මගෙයි අප්පච්චිගෙයි පින්තූරේ ගහලා තිබුණා."

"මැරිච්ච අම්මත් උන්නද?"

"ම්. අප්පච්චි හරිම ලස්සන නිවුනු පාටක් තියෙන අහිංසක අප්පච්චි කෙනෙක් අක්කා. හරියට ලකී ඩයස් වගේ. හරිම කරුණාවන්ත පාටයි."

නේත්‍රාගේ සිතට අමුත්තක් දැනුණි.

"දේවකයියගේ අම්මගේ මූණ දකිනකොට මට මහා අමුත්තක් දැනුණා. එයාව දැකලා තියෙනවා වගේ. මම ගොඩක් කල්පනා කළා. මට හිතෙන දේ ඇත්තමද කියලා මම හිතුවා"

භාවනාව වෙව්ලන්නාක් මෙන්ය.

නේත්‍රාට පුදුම සිතුණි.

"ඇයි බබා"

"ඒ පින්තූරේ හිටපු දේවකයියගේ අම්මා කවුරු‍ැ කියලද අක්කා හිතන්නේ. ආ සුදූ කවුද?"

නේත්‍රා පුදුමයෙන් බලාගෙන උන්නාය. කෙල්ල මේ කියන්නට යන්නේ මොනවාද?

"මට හිතාගන්න බෑ බබා."

"තත්පරයක් ඉන්න අක්කා."

කෙල්ල දුවගොස් රඹුක්වැල්ල පවුලේ ඡායාරූප අතර ඇති නර්මදාගේ පින්තූරය ගලවාගෙන ආවාය. 'මගේ සුදු නැන්දි. චූටි නැන්දි මම ඔයාගේ පුතාව ඇස්දෙක වගේ බලාගන්නවා. පොරොන්දු වෙනවා. අපිට පිහිට වෙන්න' ඇය ඒ පින්තූරය අරගෙන එද්දිත් නර්මදාගේ

මුහුණ දෙස බලාගෙන කීවාය.

භාවනා ආවේ පින්තූරය පිටුපස සඟවාගෙනය.

"මොකක්ද බබා හංඟගෙන එන්නේ."

"එයාගේ අම්මගේ පින්තූරේ අක්කා."

භාවනා කීවාය. නේත්‍රාට පුදුමය. ඇය මේ පින්තූරයක් හදිස්සියේ උස්සාගෙන ආවේ කොහෙන්ද? ඇරත් මේ නිවසේ දේවකගේ අම්මාගේ පින්තූර කොහෙද?

"මෙහේ බබා."

"මට ඉස්සෙල්ලා කියන්න අපිට නැන්දලා දෙන්නෙක් ඉන්නවා. කාටද වැඩියෙන්ම ආදරේ."

නේත්‍රා බැලුවාය.

"මේ දෙන්නටම නෙමේ බබා.

මෙයාලට වඩා ගොඩක් වෙනස් මනුස්සකම් උතුරන හරිම කරුණාවන්ත නැන්දි කෙනෙක් අපිට උන්නා. දෙවියෝ හරි ඉක්මනට එයාව අපි ළඟට ගත්තා. මේ හැමෝටම වඩා ඒ නැන්දිට මම ආදරෙයි. අදටත්"

භාවනාගේ දෑස් තෙමිණ.

"ඇයි බබා මේ"

නේත්‍රා ඇසුවාය.

"මෙයානේ. නර්මදා නැන්දිනේ."

භාවනා ඇගේ පින්තූරය නේත්‍රාගේ උකුල මතින් තැබුවාය.

"අනේ පව්"

නේත්‍රා ඇගේ මුහුණ අතගෑවාය. කඳුළක් වැටිණ.

"එයාගේ මහත්තයා අක්කා"

"මී ජීවන් පොඩි මාමා. මම

ගොඩක්ම ආදරේ කරන කෙනෙක්. මම විතරක් නෙමේ අම්මයි තාත්තයිත් හරි ආදරෙයි"

නේත්‍රා කීවාය.

"ඒත් බබා මේ කොල්ලගේ කතාව කියන්නකෝ."

"හරි. මේ පින්තූරේ බලන්න අක්කා"

භාවනා ඇගේ ස්මාට් දුරකථනයේ තිරය මතට දේවකගේ නිවසේදී ගත් පින්තූරය ගත්තාය. ඇය මේ පින්තූරය ගත්තේ දේවකගේ අල්මාරියේ ගසා තිබුණ දේවකගේ අම්මාගේත් තාත්තාගේත් ඡායාරූපයෙනි.

"මේ බබා. නර්මදා නැන්දයි ජීවන් බාප්පයි."

නේත්‍රාට ආයේ සැකයක් නැත.

ඒ ආදරණීය මුහුණු දෙක ඇයට හොඳින් මතකය. කෙල්ල මේ කියන්න යන්නේ මොනවාද?

"මී එයාලා තමයි"

"එතකොට බබා"

නේත්‍රාව වෙව්ලන්නට මෙන් විය.

"ජීවන් මාමටයි නර්මදා නැන්දිටයි පුතෙක් හිටියලු නේද? මී දැකලා තියේද ඒ මල්ලිව"

භාවනා ඇසුවාය.

"මම පොඩි එකාව වඩාගෙනත් තියෙනවා. දෙතුන් පාරක්. නැන්දි හොස්පිට්ල් එකේ ඉන්නකොට ජීවන් මාමා වඩාගෙන ආවා. මට අවුරුදු පහක් විතර ඇති. හරි ආසයි මම ඒ දවස්වල බබාලට"

නේත්‍රා කීවාය.

"බබා."

"දේවක. ඒ ඔයා වඩාගත්ත පොඩ්ඩා තමා. ජීවන් මාමගෙයි නර්මදා නැන්දිගෙයි එකම පුතා. අපේ පොඩිම මස්සිනා."

භාවනා අඬාගෙන මෙන් කීවාය. නේත්‍රා ඇළේ රූටාගෙන මෙන් කෙල්ල ළඟට ආවාය. එහෙම නැතුව ඇයට එන්නට අමාරුය.

"බබා."

"මම අද මගේ සුදු මාමව දැක්කා. බදාගෙනත් උන්නා. අනේ මට පොඩි පුතාලු. මම ඇහුවා ඇයි මට පොඩි පුතා කියන්නේ කියලා. ඔළුව අතගෑවා."

"ම..ම..ට ම..ට බ..බා"

"මේක දරාගන්න බෑ තමයි අක්කා. හිතන්නකෝ මේ දේවල් අර පුංචි ගෙදරදී තනියම මම දරාග

න්නකොට. කාටවත් කියන්නේ නැතුව. මේක හරි පුදුම දෙ..ය..ක්."

නේත්‍රා බලාගෙනම උන්නාය.

"එහෙනං කොල්ලට ආවේ නැන්දිගේ දක්ෂකම."

"මි ජීවන් මාමගේ අහිංසකකමත් එක්කම"

කෙල්ලගේ අත අල්ලාගෙන උන් නේත්‍රාගේ අත වෙව්ලන්නට විය.

"ම..ට ම..ට බ..බා ජීවන් මාමව බලන්න ඕන"

"මේ රෑ. අක්කා"

"ඔව්. මේ රෑ. බබා ඇඳුමක් දාගන්න. මම අම්මට කියන්නම්. සීගිරි එකේ වැඩක් කියලායන්න."

භාවනා කිසිවක් කීවේ නැත. අක්කා මේ තරම්ම ජීවන් මාමාටත් නර්මදා පුංචිටත් ආදරේ බවක් ඇය

දන්නේ නැත. මේ රෑ ඒ නිවසට යන්නට භාවනාටත් ආසාවක් ඇත. 'කොහොමත් මේ කතාව දවසක එළිවෙන්න ඕන. ජීවිතේ හැමදෙයක්ම වෙන්නේ හදිස්සියේ. අදත් එහෙම වෙයි' ඇයට සිතුණි.

# 03

භාවනා උඩට ගොස් ඇඳුමක් දාගත්තාය. මේ රෑ ජීන්ස් එකක් අඳින්නට ඇයට මොකක්ද වාගේය. ඒ නිසා භාවනා ඇගේ කළු පැහැගත් ඩොට් ඩොට් අත් නැති ගවුමය. එයට භාවනාගෙන් ආවේ වයසටත් වඩා ළාබාල පෙනුමකි. යන්තමට මුහුණට රෝස පුයර ටිකක් පමණක් දමාගෙන කෙල්ල ප්ලෙන් මුහුණින්ම නේත්‍රාගේ කාමරයට ආවාය.

“අම්මටත් ටිකක් කියාගෙන යන්.

නැත්නම් එයා බලනවා.”

“ඔයා යනකොට සැක නෑ.”

භාවනා කීවාය.

“මේ රෑ මැණික.”

ඉඳුනිල් ඇසුවාය. කෙල්ලෝ දෙන්නාම යන නිසා ඇගේ හිතට බියක් නැත.

“ඉක්මනට එන්නම් අම්මා. දොර වහන්න එපා”

“ම්. පරිස්සමින්.”

භාවනා නේත්‍රාගේ රෝද පුටුව වාහනය ළඟටම කර ඇයව වත්තන් කරගෙන වාහනයට ගත්තාය. නේත්‍රාගේ සාය සකසා භාවනා සුසුමක් පිටකළාය.

“ඔයාව පේරාදෙණියේ එක්කගෙන යන්න එයා මෙච්චර උත්සාහ කළේ ඇයි කියලා දැන් තේරෙනවා.”

"ඒකගේ මනුස්සකම පව්"

නේත්‍රා කීවාය.

"අපි කොහෙටද යන්නේ ලොකු බේබි."

රියදුරු ඇසුවේය.

"අපි ටිකක් සීගිරි එක පැත්තෙන් අතුරුගිරියට යන් අන්කල්."

නේත්‍රා කෝකටත් කීවාය. අම්මා සීගිරි එකට කතාකරන්නේ නැත. එහෙත් ඇය කතාකළොත් බියවෙන බවත් නේත්‍රා දැනගෙන උන්නාය.

සීගිරි එකේ මේ රෑත් වැඩය. නේත්‍රා සිතුවේ නිකමට ඒ පැත්තට ගොස්ම අතුරුගිරියට යන්නටය. සීගිරි එකට වාහනය දමද්දීම වාගේ එහි ඉදිරිපිට නවතා තිබූ ඩබල් කැබ් රිය දැක භාවනා ඕනාකමින් ඒ දෙස බැලුවාය.

"පොඩ්ඩක් ඔහොම තියන්න අන්කල්."

ඇය සීගිරි එකට ඇතුළුවන තැනම වාහනය නතරකර ගත්තාය. පසුව වාහනයේ වීදුරුව පහත් කළාය.

"එස් ඕ."

ඇය කතාකළේ සීගිරි එකේ රෑ සේවයේ නියුතුව සිටි ආරක්ෂක නිළධාරියාටය.

"මිස්."

"කවුද අර ඩබල් කැබ් එකෙන් ආවේ. ඊට එහා තියෙනනේ මිහිරංග සර්ගේ වෙහිකල් එක නේද?"

"ඔව්. සර් එක්ක ආව යාළුවෙක්ගේ"

භාවනා නේත්‍රා දෙස බැලුවාය.

"දැන්ද එයාලා ආවේ"

"දැන් පැයක් විතර වෙනවා. වාහන දෙකකින් ආවේ. එකක් ගියා. මේ අනිත් එක"

"ම්. ටිකක් විමසිල්ලෙන් ඉන්න. ඔතනින් හෙල්ලෙන්න එපා."

භාවනාගේ සිතට අමුත්තක් දැනුණි.

"මෙතන මොකක්හරි වෙනවා අක්කා. දැන් සීගිරි එකේ ෆයිනල් වැඩටික යන්නේ. මෙයාට මෙතන මහ රෑ ඇවිත් කරන්න දෙයක් නෑ"

නේත්‍රාද හිස වැනුවාය.

"අපි ටිකක් බහිමුකෝ."

භාවනා වේගයෙන් වාහනයෙන් බැස නේත්‍රාව රෝද පුටුවට ගත්තාය.

"අන්කල් ටිකක් ඔහොම එළියට වෙලාම බලාගෙන ඉන්න. මෙතන මොකක්හරි වෙනවා."

"හරි පොඩි බේබි."

භාවනා නේත්‍රාගේ රෝද පුටුවත් තල්ලු කරගෙනම සීගිරි එකට ඇතුල් වූවේය. සේවකයන් කිහිප දෙනෙක් වැඩකරමින් උන්නෝය. මේ සීගිරි එකේ අවසන් වැඩ ටිකය. ඔවුන් උන්නේ ඕපන් කිචන් එකේ සහ මීට් සෙක්ෂන් එකේ වැඩ නිමකරමිනි.

"කෝ මේ ආපු අය."

"ටිකක් පරිස්සමින් බබා."

නේත්‍රා කීවාය. භාවනා කාර්යාලය දෙසට ගියේ ශබ්ද නොනැඟෙන ලෙසිනි. කාර්යාලයේ සියළුම දොරවල් විවරකර තිබුණි.

"මගේ රූම් එකත් ඇරලා. මේ ඇයි. ඒකේ කී එක කා ළඟවත් නෑනේ. ඒත් කොහොමද?"

භාවනාගේ පපුවම ඇවිලෙන්නට

විය. මිහිරංග උන්නේ හය දෙනෙක් සමඟය. ඔවුන් සියල්ලන්ම උන්නේ සීගිරි හී සියළුම ගිණුම් කටයුතු සහ කැෂියර් මැෂින් එකට සම්බන්ධකළ පරිගණක කාමරයේය.

භාවනා බියමුසුව නේත්‍රා දෙස බැලුවාය. නේත්‍රා අතින් කීවේ භාවනාට කිසිවක් කතානොකරන ලෙසය.

"ඇතුළට යන්."

නේත්‍රා මෘදුව කීවාය.

"මල්ලි මොනවද මේ කරන්නේ. මේ කට්ටියක් දාගෙන. කම්පනි එකේ කම්පියුටර්ස් දොරවල් ඔක්කොම ඇරගෙන"

නේත්‍රා කේන්තියෙන් ඇසුවාය. මිහිරංග උඩ විසිවිය. 'මේ ගෑණි කොහොමද මෙතනට ආවේ' ඔහු

සිතුවේය.

"ආ අක්කා. මේ රෑ ඇයි."

"මාත් ඔයාගෙන් අහන්නේ ඒක තමයි. ස්ටාෆ් එකේ අයටවත් මේ රූම් එකට එන්න තහනම්නේ. මේ කවුද"

ඒ අතර මැරයන් වැනි අයද උන්නෝය. තුන්දෙනෙක උන්නේ පරිගණක ක්‍රියාත්මක කරගෙන ඒවාවල කුමක්ද දෙයක් කරමිනි.

"මගේ ෆ්‍රෙන්ඩ්ස්ලා ටිකක්. ඇයි අහන්නේ."

"අහන්නේ ඇයි. ඇයි මට අහන්න බැරිද? මම කවුද කියලා මෙතන ඔයාට තේරුම් කරලා දෙන්න ඕනද ආ."

මිහිරංග වියරුවෙන් මෙන් සිනාසුනේය.

"ඇයි මට බැරිද මෙතනට එන්න."

"මේ රෑ. ඇරත් මෙතන ඉන්නේ ඔයා විතරක් නෙමේනේ. මේ කවුද"

"මං කිව්වේ. මට ඕනදෙයක් මම කරනවා. මෙතන ගිනි තියලා නෑනේ මම. සිස්ටම් එක චෙක්කළා."

"ඒක කරන්නේ මේ මහ රෑ නෙමේනේ."

"මට පුළුවන් වෙලාවට මම වැඩකරන්නේ. ඇයි මෙතන නයිට් කරන්න පුළුවන් එක බල්ලෙක්ට විතරද?"

මිහිරංග කිව්වේ ද්වේකටය.

"මේ සිස්ටම් එරස් ගොඩක් තියෙනවා. මම ඒවා හදනවා. මටත් ඒවාකරන්න කාගෙවත් අවසරයක් ගන්නෝන නෑනේ."

භාවනා ඉදිරියට ආවාය.

"මේ. කරුණාකරලා එළියට යන්න. ඔය කම්පියුටර් ඔන් කරගෙන ඉන්න තුන්දෙනාටත් එක්කයි මම කියන්නේ. ප්ලීස් ගෙට් අවුට්."

භාවනා වෙව්ලමින් මෙන් කීවාය.

"බබා"

මිහිරංග මොනවද කියාගෙන ආවේය.

"මෙතන බබාලා නෑ. ප්ලීස් ගෙට් අවුට්. මම පොලීසියෙන් මෙතනට ගෙන්නන්න කලින් යනවා."

ඇය වියරුවෙන් මෙන් කෑගැසුවාය. නේත්‍රා භාවනාගේ අතකින් අල්ලාගත්තාය.

"උඹලා එළියේ ඉඳපල්ලා. යන්න එපා"

මිහිරංග කීවේ ඔහුගේ සහචරයන් පිටවෙද්දීය.

"හරි. දැන් මොනවද කියන්න ඔයා මෙතන කළේ. ආ සිස්ටම් එක චෙක් කළාද සිස්ටම් එක අවුල් කළාද? නැත්නම් සිස්ටම් එකේ ඩේටා කොපි කළාද. මේ සීඩී ඇයි."

"ඔයා මෙතන එම් ඩී නෙමේනේ මේවා අහන්න"

භාවනා වේගයෙන් මේසයට ගැසුවාය.

"මම කවුද කියලා මිස්ටර් මිහිරංගට මම කියලා දෙන්නම්. ඊට කලින් යන් සීයා ළඟට. නළ. දැන් කරුණාකරලා මෙතනින් පිටවෙන්න. කවුද අවසර දුන්නේ මගෙයි අක්කගෙයි රූම්ස් අරින්න. කොහොමද ඒවා ඕපන් කළේ. හොර කීස් තියාගත්තා නේද? මොන පහත් මිනිහෙක්ද ඔයා. ෂිහ්. ලැජ්ජ නැද්ද?

මේවා සීගිරි පවුලේ දේවල් නේද?"

"ඒක තමුසෙලා දෙන්නට තමයි අමතක වෙලා තියෙන්නේ. මට නෙමේ. තමුසෙගේ පාට් එක මට වැඩක් නෑ"

"මිහිරංග."

නේත්‍රා කෑගැසුවාය.

"කෙල්ලට තව එක වචනයක් කිව්වොත් මම උඹව මරනවා."

නේත්‍රා වෙව්ලමින් මෙන් කීවාය.

"අනේ මේ. වීල් චෙයාර් එකට වෙලා ඉන්නවා හලෝ. මම බයවෙලා දුවයි දැන්. බලමු මොකද වෙන්නේ කියලා. පුළුවන්නම් ඕපන් කරපන්කෝ සීගිරි එක දැන්."

නේත්‍රා තොල්පට වේගයෙන් හපාගත්තාය. ඇයගේ දෑස් කඳුළින් පෙඟිණ.

"බලනවා හෙට අනිද්දට සීගිරි එකට මොකද වෙන්නේ කියලා"

මිහිරංග ගියේ දොරවල් හප්පාගෙ නය. භාවනා පරිගණක සියල්ල වේගයෙන් පරීක්ෂා කරගෙන ගියාය.

"මුන් සිස්ටම් චේන්ජ් කරලා අක්කා. ඔක්කොම අවුට්. ඒත් ඔක්කොම කරගන්න බැරිවුණා. අපි ආවනේ."

නේත්‍රා කිසිවක් කීවේ නැත. ඇය රෝද පුටුවට අතක් තබාගෙන මොහොතක් බලාගෙනම උන්නාය.

"බබා."

"අක්කා"

"තව ගොඩක් දේවල් කරලා ඇති. මේ අපි දැක්ක දේ විතරයි. දොරවල් ඔක්කොම වහලා කීස් ගන්න. අනිත් කම්පියුටර්ස්වලට අත තියන්න එපා.

අපිට ඇඟිලි මාක් ගන්න ඕනවෙයි."

"ඔව්. ඒත් දොරවල් වහලා වැඩක් නෑ අක්කා. මුන් ළඟ ඩුබ්ලිකේට් තියෙනවා. ඒකනේ මේවා ඇරියේ"

"උඹ දැනට වහපන්කෝ."

නේත්‍රා කීවාය. භාවනා ඇය කියූ දේ කළාය. ඇය ළඟ තිබූ යතුරුවලින් ඇය දොරවල් සියල්ල වසා දැමුවාය. ඊටත් පසුව ඇය කොළ අලවා දොරවල් සීල්කළාය.

"එස් ඕ."

ඇය ආරක්ෂක නිළධාරියාට කතාකළාය.

"මිස්."

"කිසිම කෙනෙක්ට ආයේ සීගිරි එකට ඇතුල්වෙන්න බෑ. හරි. එනවානම් මට කෝල් එකක් ගන්න. මේ මගේ නම්බර් එක. හරි"

"හරි මිස්."

නේත්‍රා ඇගේ අංකය ආරක්ෂක නිළධාරියාට දුන්නාය.

"බබා"

"අක්කා"

"දැන් අතුරුගිරියේ යන්න බෑ. මට සීයා එක්ක කතාකරන්න ඕන. මේ දැන්"

"ම්. මටත් හිතෙනවා. මොකක්ද ලොකු දෙයක් වෙන්න යනවා"

නේත්‍රාත් භාවනාත් නිවසට ආවේ ඉක්මනින්.

# 04

"මාව මෙතන තියලා සීයටයි තාත්තටයි අම්මටයි කතාකරන්න බබා"

නේත්‍රා කීවාය. අද කෝසළත් රුවන්තිත් නිවසේ නැත. ඔවුන් කොහේ යනවාද කියා කිසිවෙකු දන්නේ නැත. එහෙත් දවස් දෙක තුනකට සැරයක් දෙන්නාම ඇවිත් මෙහේ නවතියි. ඒ නිවසේ හිමිකාරත්වය වෙනුවෙන්දැයි

කිසිවෙකු දන්නේ නැත.

"ලොකු පුතේ."

රඹුක්වැල්ල මහතා ආවේ සරම පිටිනි. මිලින්දද දුවගෙන ආවේය.

"තාත්තයි සීයයි ටිකක් ඉඳගන්න. මට කතාකරන්න තියෙනවා"

ඇය කීවාය. නේත්‍රා මේ පවුල් තුනේම වැඩිමහල් දරුවාය. ඇයට පවුලේ ලොකු බලයක් ඇත.

"ඇයි ලොකු පුතේ. මොකක්ද වුනේ."

රඹුක්වැල්ල මහතා පුටුවේ ඉඳගනිමින් ඇසුවේය.

"තාත්තේ සීයේ. මමයි බබයි දැන් ටිකකට කලින් සීගිරි එකට ගියා."

"මේ රෑ පුතේ."

රඹුක්වැල්ල මහතා ඇසුවේය.

"ඔව්. දේවකට අසනීපවෙලා හොඳටම. කොල්ලගේ වැඩ ටික බලන්න ගියේ. ඒත් මහ පුදුම දෙයක් එතනදී දැක්කේ."

නේත්‍රා හැමදේම විස්තර කළාය. රඹුක්වැල්ල මහතා සියල්ල අසාගෙන උන්නේ වේදනාවෙනි.

"මේක ලොකු ප්‍රශ්නයක්. දේවක හැමදේම ලස්සනට ඉවරකරගෙන ගියේ. අපිට ෆ්‍රයිඩේ සීගිරි එක ආයෙත් ඕපන් කරන්න පුළුවන් තත්වයක තිබුනේ."

භාවනා කීවාය.

"ඔව් සීගිරි එක දැන් බලන්න ලස්සනයි. හැමදේම කොල්ලා කරලා. කිව්ව හැමදේම."

රඹුක්වැල්ල මහතා කීවේය.

"දේවක මටත් කතාකළා.

ඇවිත් අඩුපාඩුවක් බලලා කියන්න සර් කියලා කිව්වේ."

නේත්‍රා නෙත් බරකළාය. 'ඔයාගේම සීයට මාමට ඔයාට සර් කියන්න වුණේ. පව්' ඇය සිතුවාය.

"මිහිරංග මිනිස්සු ගෙනත් සිස්ටම් සේරම අවුල් කරලා. අපිට ආයෙත් සිස්ටම් එක මුල ඉඳලා දාන්න වෙනවා. තව මොනවා කරලද කියලා බලන්න ඕන. දේවක එනකල් ඒක කරගන්න බෑ. නමුත්"

රඹුක්වැල්ල මහතා නේත්‍රාගේ කතාව නැවැත්තුවේය.

"මට මිහිරංගට කෝල් එකක් අරන් දෙන්න."

රඹුක්වැල්ල මහතා ඔහුගේ ජංගම දුරකථනය භාවනාට පා කීවේය. භාවනා මිහිරංගගේ අංකයට

ඇමතුමක් ගෙන රඹුක්වැල්ල මහතා අතට දුන්නාය.

"මිහිරංග."

"කියන්න සීයා."

"මං මේ කියන දේ හොඳින් අහගන්නවා. හොඳින්. අද ඉඳලා තමුන්ට සීගිරි එකට ඇතුල්වෙන්න තහනම්. සපුරා තහනම්. හරි. මට මිහිරංග කියලා මුණුපුරෙක් නෑ."

"සීයා මේ අක්කයි බබයි."

"අක්කයි බබයි මට කිව්ව දෙයක් නෑ. තමුන් ගැන ගොඩක් දේවල් මම හොයාගෙන තියෙන්නේ. ගොඩක් දේවල් දරුවෙක් නිසා ඉවසගෙන උන්නේ. ඒත් අද ඉඳලා බෑ. මේක කඩකරලා තිබ්බොත් මම නරක මිනිහා කියලා කියන්න එපා. වාහනේ ගෙනත් බාරදෙනවා හෙට."

රඹුක්වැල්ල මහතා එසේ කියා දුරකථනය තැබුවේය. මිලින්ද බලාගෙනම උන්නේය.

"තාත්තේ."

"කියන්න පුතා"

"මේක මෙහෙම යන්න බෑ තාත්තේ. සීගිරි එක ගැන අපිට තීරණයක් ගන්න වෙනවා"

මිලින්ද සන්සුන්ව කීවේය.

"බෑ තමයි. මම හෙට ලෝයර්ව හම්බවෙනවා. මං ගන්න තීරණ මම ගන්නම්. ඔයාලා කිසිකෙනෙක් ඒකට සම්බන්ධවෙන්න එපා."

කිසිවෙක් කතාකළේ නැත. කිසිවෙක්ම කතාකළේ නැත.

"මැණික"

රඹුක්වැල්ල මහතා යළිත් භාවනාට කතාකළාය.

"මට දේවකට කෝල් එකක් අරන් දෙන්න."

භාවනා ඇමතුම ගත්තේ ඇගේ දුරකථනයෙනි. ඇයට හුස්මක් වත් ගන්න පුළුවන් වූයේ නැත. මේ වූ දේ ඔහුට පසුව කිව යුතුය.

"මම ගත්තේ."

"සුද්දි."

"ටිකක් ඉන්න. සීයට කතාකරන්න ඕන කියනවා."

ඔහු යමක් කියන්නට පෙරම ඇය දුරකථනය සීයා අතට දුන්නාය.

"සර්."

දේවක කතාකළේය.

"දේවකට අසනීප වුණාද?"

"දැන් සනීපයි සර්. මේ පොඩි උණක් වගේ ආවා. දැන් හරි සර්."

දේවක කීවේය.

"හෙට උදේම ඇවිත් මාව හම්බවෙන්න. අපිට සිකුරාදා ඕපන් කරන්න පුළුවන් නේද?"

"ඔව් සර්."

"සීගිරි එකේ කම්පියුටර් සිස්ටම් පොඩ්ඩක් අවුල්වෙලා"

"ඒත් සර් මම හැමදේම චෙක්කරලා ටෙස්ට් රන් එකකුත් දිව්වා"

"ඒක තමයි. අපිට එහෙම වුනොත් ආයේ ඉන්ස්ටෝල් කරන්න පුළුවන්නේ."

"පුළුවන් සර්. හෙට නයිට් එකක් දැම්මාම ඒක කරන්න පුළුවන්."

"මී. මාව හෙට ඇවිත් හම්බවෙන්න. වෙලාවට බෙහෙත් ටික බොන්න."

"තැන්කියු සර්. මං උදේම එන්නම්."

රඹුක්වැල්ල මහතා මොහොතත් බිම බලාගෙන උන්නේය.

"ලොකු පුතා."

රඹුක්වැල්ල මහතා කතාකළේය.

"තාත්තේ."

"හදිස්සියක් වුනොත් මට සල්ලි ටිකක් ගන්න පුළුවන් නේද? මිලියන හයක් හතක්."

ඔහු ඇසුවේය. භාවනාට පුදුම සිතුණි.

"මං ඉතුරු කරපු සල්ලි ටිකක් තියෙනවා තාත්තේ. අර ඉඩමත් තියෙනවනේ. සුද්දිට අරගෙන දාපු"

"ම්. සමහරවිට ඕනවෙයි. මං ළඟත් සල්ලි ටිකක් තියෙනවා. මම තීරණයක් අරන් හෙට කියන්නම්"

රඹුක්වැල්ල මහතා කීවේය.

"සීයා"

මෙතෙක් වෙලා නිහඬව උන් නේත්‍රා කතාකළාය.

"සීයා ලොකු බරක් ගන්න එපා. අවශ්‍යනම් මායි බබයිත් සීගිරි එකෙන් අයින්වෙන්නම්. අපිට ඒක කරන්න පුළුවන්."

භාවනාද හිස වැනුවාය.

"හැමදේම දෙන්න. ඒත් ඔයා අපි ගාව ඉන්න. ඒ ඇති. අපිට සුපර් මාර්කට් එකක් නැත්නම් පොඩි ග්‍රොසරියක් කරන්න පුළුවන්. අපි සතුටින් එකට ඉන්න එකයි වටින්නේ."

රඹුක්වැල්ල මහතා හිස වැනුවේය.

"මේක පුතේ කරන්න ගත්තේ

පොඩි ග්‍රෝසරියක් වගේ තමයි. මිනිමාර්ට් එකක්. මේක පටන් ගනිද්දී මේ කවුරුවත් උන්නේ නෑ. මායි තාත්තයි මැරිච්ච පොඩි නැන්දයි එකතුවෙලා පොඩියට කළේ. පිටකොටු ගිහින් තාත්තා බඩු ගෙනාවේ. ඒ බඩුවලට ප්‍රයිස් ටැග් ගැහුවේ නැන්දා. දවසක් බලනකොට මහ රෑ තුනයි. නැන්දා ක්‍රීම් ක්‍රැකර් එකක් කකා නිකං තේ එකක් බිබී රාක්කවලට බඩු අසුරනවා. සීගිරි එක ඕපන් කරන දවසේ කෙල්ලට හොඳටම උණ. මහන්සිවෙලාම. වෙව්ල වෙව්ල කැෂියර් එකේ උන්නේ. එයා තමයි අපේ පළවෙනි කැෂියර්. පැය දාහතරක් දවසකට හිටගෙන ඉන්නවා. එහෙම කෙල්ලව මම මේ ගෙදරින්.”

රඹුක්වැල්ල මහතා කියාගෙන

ආ දේ නැවැත්තුවේය. ඔහු දෑස් පොඩිකරගත්තේය.

'එයාගේ පුතාටත් අද දෙවෙනි පාරට සීගිරි එක හදන්න දුක් විඳලා උණා අරන්' භාවනාට කියන්නට සිතුණි. ඇය නේත්‍රා දෙස බැලුවේ ඒ නිසාය.

"එයා ජීවත්වෙලා ඉන්න තිබුණා."

නේත්‍රා කීවාය.

"ඒ මගේ ජීවිතේ වෙච්ච ලොකුම නැතිවීම"

රඹුක්වැල්ල මහතා කීවේය.

"සීයා දැන් ගිහින් නිදාගන්න."

රඹුක්වැල්ල මහතා ගියේ නේත්‍රාගේ හිසද අතගාගෙනය. ඇගේ දෑස්වලට කඳුළු පිරුණි.

"මේක මෙහෙම වෙන්න බෑ තාත්තා. අපිටත් තීරණයක් ගන්න

වෙනවා."

නේත්‍රා කීවාය.

"මම කොහොමත් සීගිරි එකෙන් අයින්වුණේ ඒකයි ලොකු පුතේ."

"දැන් අපිටත් ඒක කරන්න වෙලා. අද වුණේ මහ නින්දිත වැඩක්"

නේත්‍රා කීවාය.

"එයාලා ඔක්කොටම ඕන සීගිරි එක වහන්න. වහලා මේක විකුණලා බෙදාගන්න."

භාවනාගේ කතාවට මිලින්දද හිස වැනුවේය.

"තාත්තා සීයා එහෙම තීරණයක් ගත්තොත්"

ඇය ඇසුවාය.

"අපි බලමු. මම සීයා එක්ක මේවා ගැන කතාකරන්නේ නෑ. දෙන දෙයක් ගන්නවා. කියන දෙයක් කරනවා. ඒක

එදත් එහෙමයි අදත් එහෙමයි."

භාවනා හිස වැනුවාය.

"ඔව්. අපිට සීයා ළඟ උන්නොත් ඇති."

ඇය කීවාය.

"යන් අක්කා. අම්මා රස්නෙට බොන්න මොනවාහරි"

"මං ගේන්නම්"

මෙතෙක් වෙලා නිහඬව උන් ඉඳුනිල් කීවාය.

"සීයා එහෙම තීරණයක් ගත්ත එක හොඳයි. මොන දේ කරන්නත් අපි සීගිරි එක නිදහසේ ඕපන් කරන්න ඕන."

නේත්‍රා කීවාය.

"මටත් අද හරි බයක් ආවා"

"මිහිරංග නිකං ඉන්නේ නෑ. හෙට එයි නැන්දලා දෙන්නම මෙතනට සායවල් උස්සගෙන"

"බලමු."

යන්නට ගියේ අතුරුගිරියේය.

"අක්කා දැන් හෙට එයා ආවාම"

භාවනා ඇසුවේ දේවක ගැනය.

"හිතාගන්න බෑ"

"දැන්ම කියන්න එපා. මට බයයි"

"ම්. මේ ප්‍රශ්න දුවන වෙලාවේ ඒක කියන්න බෑ තමයි. අපි ටිකක් ඉවසමු. කොල්ලව නැතිකරගන්න බෑ."

"මටත් හිතෙනවා. එදා ජීවන් මාමව දැකලත් මට අහන්න හිතුණා. ඒත් හිතේ තද කරගෙන උන්නා"

"ඒක හොඳයි. කලබල වෙන්න එපා. පොඩි නැන්දිට මේ ගෙදර

තැනක් තියෙනවා. සීයගේ තාත්තගේ හදවතේ. ඒක නැතිවෙන දෙයක් නෙමේ."

භාවනා හිස වැනුවාය. නේත්‍රා කෙල්ලව අතගෑවාය.

"දැන් යන්න. ගිහින් නිදාගන්න."

ඉඳුනිල් කිරි කෝපි හදාගෙන ආවාය. භාවනා අම්මා දෙස බැලුවාය.

"සීයට කැමති තීරණයක් ගන්න දෙන්න. ආයේ මොනවත් කියන්න එපා."

ඇය කීවාය.

"තේරෙනවා අම්මා. සීගිරි එකට එහෙම වෙනකොට බලාගෙන ඉන්න බෑ. ඒක අපි ඔක්කොමගේ"

"ම්. දැන් නිදාගන්න. එක ප්‍රශ්නයක් යනකොට තවත්

ප්‍රශ්නයක්. ප්‍රශ්න ඇති කළේ ඔයාලා කියලා අහන්න මම කැමති නෑ. සාමාන්‍යයෙන් වෙන්නේ ඒක තමයි."

ඇය කීවාය. අම්මා කියන කතාව ඇත්තය. ප්‍රශ්නයක ගැඹුර තේරෙන්නේ ඒ ප්‍රශ්නය මැද ඉන්නා අය නොවේ. එළියේ ඉන්නා අයය.

"මේ හැම ප්‍රශ්නයක්ම හෙට අනිද්දා විසඳෙයි අම්මා"

නේත්‍රා කීවාය. ඇයට එසේ සිතෙයි.

"යනවා අම්මා. බුදු සරණයි"

භාවනා උඩට ආවේ එසේ කියාය. ඇය එද්දීම දේවකට කෙටි පණිවිඩයක් දැම්මාය.

"මං ගන්නවා. නිදාගන්න එපා."

මේ හදිස්සියේ ඔහුට කතාකළ නොහැක. ටිකක් රෑ වී කතාකළ

යුතුව ඇත. 'මේ හැම ප්‍රශ්නයකම කෙළවර ඔයත් ඉන්නවා.' එය එහෙමමය. මිහිරංගලා මේ තරම් කලබල වී ඇත්තේ මේ අලුතින් හැදෙන සීගිරි එකේ ලස්සන දැකය.

# 05

දේවක පඩියට වී උන්නේ තරමක සනීපයක් දැනුන නිසාය. දැන් එහෙමට කියා උණක් නැත. ඇත්තේ උණ තෝන්තුවාව පමණි.

"ඔයා මාව පැය හතරක් ඔඩොක්කුවේ තියාගෙන ඉඳලා. කොහොම වෙන්න ඇත්ද ඒක. පුදුමයි. පැය හතරක්. විනාඩි දෙසීය හතළිහක්. ඒ විනාඩි දෙසීය හතළිහෙන් එක විනාඩියකට මාව

ඇහැරුණේ නෑනේ”

දේවක මේ දුක්වෙන්නේ එසේ සිතාය.

“ඒත් සුද්දි ඔයා යන්නනේ ඉන්නේ. හෙට සීයා හදිස්සියේ එන්න කියන්නෙත් ඒ නිසා වෙන්න ඇතිවෙඩින් එකත් තියෙන නිසා සමහරවිට සීගිරි එක ඉක්මනට ඕපන් කරලා දාන්න ඕන ඇති. ඊට පස්සේ වෙඩින් එකට මහන්සිවෙන්න තියෙනවනේ. අක්කත් නෑනේ.”

දේවක සිතුවේය. දේවක දොරකඩ පඩිය පැත්තක වූ ගඩොල් පඩියට හිස තියාගෙනම රෑ මිදුලේ සරණ කණාමැදිරියන් දෙස බලාගෙ නම උන්නේය. ‘ඔයාව නැතිම වෙන්න යන වෙලාවේ ඔයා ගැන මහ ලෝබකමක් එනවා. පුදුමයි’

දේවක දෑස් තදකරගත්තේය. තමා අඬනවාද කියාත් ඔහුට සිතෙයි.

"චූටි මහත්තයෝ. ආයෙත් හිස කකියනවද?"

ජීවන් ආවේ කොල්ලාගේ හිස අතගාගෙනමය.

"දැන් අඩුයි අප්පච්චි. ඒත් නිකං තෝන්තුවාව වගේ"

'කෙල්ල ඇවිත් ඔඩොක්කුවේ තියාගෙන උන්නානම් හරි' ජීවන්ට කියන්නට සිතුණි. දෙන්නා අතර මහ බරපතල දෙයක් තිබෙන්නට පුළුවන.

"මං මේ පාන් ටෝස්ට් කරලා බටර් ගෑවා. තේ එක්ක එකක් කමු. රොටි දෙකයිනේ කෑවේ."

දේවක බටර් ගා සීනි දැමූ පාන් ටෝස්ට් එක අතට ගත්තේය. මේ ඔහු ප්‍රියකරන කෑමකි.

"හෙට නිවාඩුවක් දාන්න. අපි ටිකක් විවේකයෙන් ඉමු. මාත් නිවාඩුවක් දාන්නම්"

"බෑ අප්පච්චි. දැන් සීයා කතාකළා. හෙට උදේම ඇවිත් හම්බවෙන්න කිව්වා"

"හදිස්සියේ පුතේ. වැඩක් ඉවරයි නේද ගොඩක්"

"එයාලට ඉක්මනට සීගිරි එක ඕපන් කරන්න ඕන අප්පච්චි. එයාගේ වෙඩින් එක ගන්නනේ යන්නේ"

දේවක කීවේ උගුරෙන් මෙන්ය. කොල්ලා විටින් විට ඒ ගැන කීවේය. ඒත් ජීවන් හාරා අවුස්සන්නට ගියේ නැත.

"එහෙම කෙල්ල යන්නේ නෑ පුතේ."

ජීවන් කීවේ විශ්වාසයෙනි.

"ඒත් අප්පච්චි."

"ඒ පවුලේ දූලගේ හැටි මම දන්නවා. අවුරුදු විස්සකට සැරයක් ඒ පවුලේ දෙව්දුවක් උපදිනවා. එක්කෙනෙක් ඔයාගේ අම්මා. දැන් මේ කෙල්ල"

"ඒත් තාත්තා ඒ මැරේජ් එක"

"හිතන්න එපා. ඔයාව කෙල්ල උකුලේ තියාගෙන හිටපු හැටි මම දැක්කා. අපි බලමුකෝ"

අප්පච්චි මේ දේවල් කොහොම හිතනවාද කියා දන්නේ නැත. 'ඒත් අපි දෙන්නා එහෙම' දේවක හිතාගෙන ආ දේ සිතීම පවා නැවැත්තුවේය.

"ඕක ඔක්කොම කන්න. මොනවා කරන්නත් ඇඟට පණක් ගන්න ඕන. හෙට යන්නම ඕනනම් යන්න.

බෙහෙත් ටික බීලා බලමු උදේට"

"හොඳයි අප්පච්චි."

"රෑ නිදිමරන්න එපා"

"දවසක්ම නිදාගෙන දැන් නිදිමත නෑ අප්පච්චි."

ජීවන් සිනාසුනේය. තරුණ කාලෙට හැදෙන අසනීපත් වෙලාවකට සනීපය. දේවක පාන් ටෝස්ට් එක කෑවේ ආසාවෙනි. ඔහු තේ එකත් ඔක්කොම බීව්වේය.

"ඔයා අපේ කුස්සියේ තේත් හදලා. මේ දේවල් වුනේ කොහොමද. මං සිහිනැතිවෙලා හිටපු ටිකට. ඔයා මැරිකරලා යන්න කලින් එන්න කියලා මගේ අතින්ම ලන්ච් එකක් හදලා දෙනවා."

එහෙම සිතන විටත් දේවකගේ පපුවම අම්හිරි දුකකින් කීරිගැහෙයි.

එය ඉවසිය නොහැකි වේදනාවකි.

භාවනා දේවකට කතාකළේ මහ රෑ එකොළහට පමණය. 'දවල් වරුවෙම නිදාගත්තේ මගේ උකුලට වෙලා. දැන් ඇහැරගෙන ඉන්නෙපැයි.' ඇය සිතුවේ එසේය.

"සුද්දි."

දේවක කතාකළේ ගොරෝද හඬකිනි.

"කෑවද කියන්න"

ඇය ඇසූ මුල්ම ප්‍රශ්නය එයය.

"අප්පච්චි මිරිස් මාළු හදලා රොටි හදලා දුන්න සුද්දිරොටි දෙකක් කෑවා. ඉඳුල් කනකොට මොකක්ද අප්පිරියාවක් එනවා. දැන් මේ පාන් ටෝස්ට් හදලා ගෙනත් දුන්නා. බටර් ගාලා. ඒක රසයි"

ළඟක උන්නානම් එහෙම හදා

දෙන්නට තිබුණි. භාවනාද පාන් ටෝස්ට්ලට බටර් ගාගෙන කන්නට ආසය.

"බෙහෙත් බිව්වද කාලා"

"ඔව්. බිව්වා සුද්දි."

"අර. චූටි කහපාට පෙත්ත. ඒක දෙන්නේ නිදාගන්න. බිව්වද"

"න්නෑ. ඒක මේ නිදාගන්නකොට බොන්න උන්නේ"

භාවනාට දිග සුසුමක් පිටවිය. අක්කාත් සමඟ ගිය විඩයේම අතුරුගිරියේ ගියානම් බොහෝ දේ වෙනස්වන්නට තිබුණි.

"දැන් නිදිමත නෑනේ නේද?"

ඇය ඇසුවාය.

"මං දවල් වරුවෙම නිදාගෙ නනේ"

"කොහෙද නිදාගත්තේ. මි."

ඇය ඇසුවේ තොල්පට තදකරගෙනය. ඔහුට එසේ කියූ විට ලැජ්ජා හිතෙන බව ඇය දනී.

"මට සුද්දි මේ"

"හරි හරි. එක තත්පරේකට ඇස් ඇරියේ නෑනේ. මං පැය පහක් පාළුවේ උන්නේ. අපිට ටොයිලට් එකටවත් යන්න නෑ."

ඇය කීවාය. එහෙම කියද්දීත් මිහිරක් දැනෙන්නේ ඇයි? දන්නේ නැත.

"මම සුද්දි."

"හරි. අප්පච්චි මොනවද කිව්වේ"

අප්පච්චි කියූ දේවල් කිව හැකිද?

"සුද්දිට හරි ආදරෙයි. දැනුත් මතක් කළා"

"මාව"

"ඔව් මේ පාන් ටෝස්ට් දීලත්

කියලා ගියේ."

"මොනවද?"

ඔහු කතාකලේ නැත. 'අප්පච්චි මං ගැන කියන්න ඇති තමා. මං කවුද කියලා ඔයාලා දන්නවනේ' ඇය සිතුවාය.

"තේ එකක් බොන්න. මාත් මේ කෝපි එකක් බොනවා."

"මං දැන් බිව්වා සුද්දි. නිදාගන්නකොට මොනවා හරි හදාගෙන බොනවා. තිබහයි තමයි"

ඇය බොන්නට ගත් කෝපි ටික පැත්තකින් තැබුවාය.

"පිපාසයි වගේද?"

"තොල කට වේලිලා"

"ඒ ගහපු ඉන්ජෙක්ෂන් එකට. ගිහින් තේ එකක් හදාගෙන එන්න. මම ගන්නම් ටිකකින්"

"කමක් නෑ සුද්දි"

"කියන දේ කරන්න"

ඇය සැර කළාය.

"මේ යනවා."

ඇය ඉන් සතුටක් වින්ඳාය.

"මං ලයින් එකේ ඉන්නම්. මහ රෑ පාළුයිනේ. කෝ කේතලේ තිබ්බද?"

"අප්පච්චි උණු වතුර ප්ලාස්ක් එකට දාලා තියෙන්නේ සුද්දි"

"කෝපිද බොන්නේ තේද?"

"තේ එකක් දැන් බිව්වනේ. මේ කෝපි ටිකක්"

"මී සීනි ටිකක් වැඩිපුර දාගන්න. රස එතකොටයි"

ඇයට දැන් මවාගත හැක.

"මම ඔතනට වෙලා තේ හැදුවා. රස තේ එකක් ආවා. අනේ තනියම

අපි තේ හදනවා. ගෙදර අය නිදි. හොඳට සැපට නිදි"

ඇය කීවාය.

"මට සමාවෙන්න සුද්දි"

"මොකටද මී."

"දවසක මං ලන්ච් හදන්නම්. එන්න"

"මී. දෙන්නත් එක්ක හදමුකෝ"

"කෝපි එක හරි සුද්දි"

"අරන් එන්නකෝ සැටියට. ටිකක් කතාකරන්න තියෙනවා."

ඇය කීවාය.

"දහයාමාරට විතර මායි අක්කයි සීගිරි එකට ගියා. නිකං ගියේ. අයියත් නැති නිසා. වැඩ බලන්න"

ඇය කීවාය.

"මම කතාකළා සුද්දි හැමෝටම.

වැඩ යනවා"

"මී නිකං ගියේ බලන්න. යනකොට එතන මහ අමුතු දෙයක් වෙනවා"

භාවනා හැමදේම කීවාය. සීගිරි එකේ සිට නිවසට පැමිණි සීයාට කියූ දේවල් පවා ඇය කීවාය.

"ඒ වෙලාවේ තමයි අයියට කෝල් එකක් අරන් දෙන්න කියලා සීයා කිව්වේ."

"මම බයවුණා."

ඔහු ඇත්තම කීවේය.

"ඇයි බයවුනේ. මී"

ඔහු කතාකළේ නැත.

"කියන්න. ඇයි බයවුනේ"

දේවක ඒද කතාකළේ නැත.

"මට කියන්න"

ඇය වචන බරකර කීවාය.

"මං හිතුවා මේ සුද්දිගේ වෙඩින් එක නිසා මේ."

ඔහු ගොත ගැසුවේය.

"ඒක නිසා සීයා සීගිරි එකේ ඕපනින් එක ඉක්මන් කරන්න කිව්වා කියලා"

"ඔව්."

"දෙයක් කියන්නද?"

"හා සුද්දි."

"ඇත්තටම මම මැරිකරලා යයි කියලා හිතනවද? ම්."

ඇය කියනා දෙයක් තේරෙන්නේ නැත. අප්පච්චි කිව්වේ කවදාවත් එය වෙන්නේ නැති බවය.

"මම සුද්දි"

"මං දෙයක් කියන්නද එහෙනම්"

"කියන්නනකෝ"

"ඕන නෑ. ඒක පස්සේ කියන්නම්. දැන් කියන්න අපිට පුළුවන්ද මේ සිස්ටම් ආයෙත් දාන්න"

"ඒවා මහ දේවල් නෙමේ සුද්දි. සීගිරි එකේම සිස්ටම් අයින් කළත් එක රැයින් මම හදනවා. හෙට රෑ නයිටක් දානවා. වැඩ හෙට රෑ ඉවරකරනවා"

"මී. මාත් එන්නම් නයිට දාන්න."

ඈය කීවාය.

"සීගිරි එක ඕපන් කරනවනේ."

"ඔව් සුද්දි"

"ඒක හාස්කමක් වෙනවා. බයවෙන්න එපා. සුපර් හිට් අපි. ඔයා ඒ හාස්කම කරලා"

ඈය කට පුරා කීවාය. දේවකගේ උණු පපුව වෙව්ලාගෙන ගියේය.

"හෙට කීයටද එන්න හිතාගෙන ඉන්නේ. මී."

ඇය ඇසුවාය.

"මං පාන්දරම එනවා සුද්දි. හයාමාර වෙද්දී."

දේවක කෝපි එක අතට ගනිමින් කීවේය.

"මං එනවා ගන්න. තනියම මේ දවස් ටිකේ එන්න එපා. හයයි කාලට මං එන්නම්."

දේවකට පුදුමය. මේ හෙට අනිද්දා විවාහ වී යන්නට ඉන්නා කෙල්ලව එහෙම ගෙන්නා ගන්න එක හරිද?

"සුද්දි මම"

"ඒ ගැන ඇති. තව දෙයක් කියන්න ඕන"

ඇය කීවාය. දේවක කෝපි එකත්

ගෙන පඩියෙන් වාඩි වුනේය.

"කෝපි එක රසද?"

"ඒක එච්චර දැනෙන්නේ නෑ සුද්දි. කට තිත්තයි."

"හෙට වෙද්දී ඇරිලා යයි. සනීපවුණාම නුවර යන්නෝන. මට කතාකරන්න තියෙනවා. සීගිරි එක ඕපන් කරලම යන්."

මේ කිසිවක් ඔහුට තේරෙන්නේ නැත.

"මටත් කියන්න කතාවක් තියෙනවා කිව්වා නේද? දිග කතාවක්. මතකද"

"මතකයි සුද්දි."

"කියන්නේ නෑ."

ඔහු කතාකළේ නැත. 'ඔයා කියන්න ගිය කතාව මම දැන් දන්නවා.' ඇයට කියන්නට සිතෙයි.

එහෙත් මේ එයට වෙලාව නොවේ.

"දැන් නිදාගන්න. ගොඩක් රෑ වෙලා. දැන් හෙටත් නයිට් කරන්න එපැයි. සනීපයක් තිබුණොත් විතරයි හොඳද?"

ඇය යන්නේ ඇමතුම තබන්නටය.

"සුද්දි."

දේවක මුමුණා මෙන් කීවේය.

"කියන්න."

"මම හෙට කියන්නම්."

ඔහු කියන්නට ගිය දේ කීවේ නැත.

"මම මතක් කරන්නම්. දැන් නිදාග න්න. හොඳට නිදාගන්න. මං උදේ එනවා. ලෑස්තිවෙලා ඉන්න"

"බුදු සරණයි සුද්දිට."

"බුදු සරණයි"

දේවක දිග සුසුමක් හෙළුවේය. 'අනේ ඔයාව මට නැතිවෙනවනේ' ඔහු ගඩොල් බිත්තියේ හිස හප්පාගෙන මෙන් සිතුවේය.

"ඔයා මොනවද මට මේ කියන්න යන්නේ. යනවා කියලා යන්නද යන්නේ."

දේවකට සිතාගන්නට නොහැකිය. මොකක්ද දෙයක් සිදුවෙමින් පවතින බව ඔහුට දැනෙයි. ඒත් ඒ කුමක්දැයි දේවකට සිතාගන්නට අපහසුය.

# 06

භාවනා ඇඳගත්තේ පාන්දරමය. හරියටම පාන්දර පහටය. උදේ කියා නොබලා ඇය නෑවාය. සීතල වතුරින් නාගත් විට ගතට පුදුමාකාර ප්‍රබෝධයක් දැනෙයි. භාවනා සතියකට පසුව අද සාරියක් අඳින්නට ගත්තාය. ඇය ඇන්ඳේ ඇගේ ප්‍රියතම රෝස පාට සාරියය. එහි හීන් රිදී නූලක් පොටට ගොස් ඇත. ඒ පෙනෙන නොපෙනෙන

ලෙසිනි. මේ සාරියේ ඇති වටිනාම මෝස්තරයත් එයය.

කෙල්ල මේ සාරියට මසාගත්තේ අළු පැහැයත් රෝස පැහයත් එකට මුසුවී හැදෙන පැහැයට සාරි හැට්ටයකි. එය ඇඳගත් විට ඇයට එන්නේ චාම් පිවිතුරු ලස්සනකි. මේ සාරියට ඇය දමන්නේ සුදු රත්තරන් මාලයකි. ඉතාම සිහින් නූල් පටක් වැනි ඒ මාලයේ කුඩා හාට් පෙන්ඩනයක් එල්ලෙයි. භාවනාට මේ සුදු රත්තරන් මාලය අරගෙන දුන්නේ නේත්‍රාය. ඒ ඇගේ උපන් දිනයටය. කනට සුදු ගලක් ඇල්ලූ රිදී පැහැගත් කරාබු දෙක භාවනා දමාගත්තේ ඊයේ රාත්‍රීයේය. අඩුවට තිබුනේ සිල්වර් පැහැගත් ඔරලෝසුවය. කෙල්ල රෑ තාරකාට කතාකලේ ඒකටය. ඒ මොහොතේ

ඇය උන්නේ ඩුබායිවලය. කොළඹ ඩුබායි ෆ්ලයිට් එකෙන් ඇය බැස්සා පමණය.

"ගුඩ් ඊව්නිං මගේ සුදු අක්කා."

කෙල්ලගේ හරි තොදොල්ය.

තාරකාට දුකය.

"දැන් ඉන්නවා සුදූ කියාගෙන උඹ නේ"

"ම්. හැපි හැපී ෆුල් හැපී. තැන්කියු සෝ මච්. අයි ලව් යූ."

"ලව් යූ ටූ පැටියෝ. මේ ලෑන්ඩ් කළා විතරයි."

ඇය කීවාය.

"ගොඩක් විස්තර තියෙනවා ආවාම කියන්නම් හොඳේ."

"හරි සුදූ. දැන් කතාකළේ සුදූ"

තාරකා ඇසුවාය.

"මේ මම මේ හෙට පින්ක් කලර් සාරිය අඳින්නේ. ඒකට සිල්වර් කලර් වොච් එකක් ඕන. අපේ සුදු අක්කි ගාව ලස්සන සිල්වර් කලර් වොච් එකක් තියෙනවා. ගන්නද ටිකක්"

භාවනා ඇසුවාය.

"උඹ මගෙන් දැන් ගුටි කනවා"

තාරකා කීවාය. භාවනා සිනාසුනාය.

"හරි ඉතින්"

"මං එනකොට එකක් ගෙනල්ලත් දෙන්නම්. උඹ පව්"

නංගිට කියා දෙයක් අරන් දී ඇත. ඒත් ඇය පසුගිය වසර දෙක පුරාම තමාට රුපියල් හැට හැත්තෑ දහසක් දී ඇත. සමහරවිට අහන්නේ නැතුවම කීයක් හෝ ඇඳ ළඟ තබා

යයි. ඒ කෙල්ලගේ හැටිය.

"මේ බබා"

"ම්."

"කොල්ලටත් එකක් ගෙනත් දෙන්නම්. උඹ දීපන් ම්"

"හා. එයාට ලස්සන මේ ලෙදර් කලර් පටියක් තියෙන. ඒත් ඉතින් තාම සැලරි ලැබුනේ නෑනේ සුදූ.."

භාවනා කියාගෙන ආවාය.

"උඹ එහෙනම් ඒවත් බැලුවා. මං ගාව සල්ලි ටිකක් තිබුණා කෙල්ලේ. කරපු කමෂල් එකකින් ලක්ෂ දෙකක් ලැබුණා මට. මම අරන් එන්නම්"

"ලස්සන දෙයක් කියන්නත් තියෙනවා. එන්නකෝ."

ඔහු මියගිය නර්මදා නැන්දාගේ පුතා බව මේ දුරකථනයෙන්

කියන්නට භාවනාට ලෝබය. සෙනසුරාදා ඇය ආ විට කියන්නට එය තබාගත යුතුය.

භාවනා පහළට ආවේ ඊයේ රෑ පැයක් පමණ ගෙන අලුතෙන් සූදානම් කරගත් සුදු අත් බෑගයද දමාගෙනය. මේ ඇඳුමට ලස්සන සුදු අත් බෑගයකි. මේ තරම් හැඩ වී යන්නේ ඔහුව බලන්නට යන නිසාද?

පහළට බසින විටම පහළ සාලයේ උන් පිරිසව දැක භාවනා ගැස්සිණ. සුරංගිත් රුවන්තිත් මිහිරංගත් පමණක් නොව එහි මලීෂාත් කෝසලත් උන්නෝය. සියල්ලන්ම නෙත් ඔසවා එකවරම බැලුවේ එමින් උන් භාවනා දෙසය ‘උදේම මෙතන සටනක් දෙන්න වගේ හමුදාවම ඇවිත් තියෙන්නේ. අතුරුග

රියේ ගිහින් හමාරයි වගේ.' භාවනා සිතුවාය.

"කට්ටියම ඇවිත් නැන්දේ"

ඇය අමාරුවෙන් ඇසුවාය. භාවනාට දරාගත නොහැකි අසීරුතාවයක් දැනුණි. සමහරවිට අද සියල්ලන්ම එන්නට ඇත්තේ අවසන් මෙහෙයුමට වන්නට ඇත.

"ඔව් උදෙන්ම ආවා. ටිකක් කතාකරන්න"

සුරංගි කීවාය. සුරංගි යනු මිහිරංගගේත් මලීෂාගේත් අම්මාය. ඇයට පුදුම සිතුනේ කවදාවත් නොමැතිව මිහිරංගගේත් මලීෂාගේත් පියා වූ නාමල්ගමත් පැමිණ තිබීමය.

"මං අක්කව එක්කගෙන එන්නම්"

භාවනා අඩිය ඉක්මන් කර නේත්‍රාගේ කාමරයට ආවාය. නේත්‍රා

කාමරයට වී රෝද පුටුව මත උන්නේ යාගත නොහැකිවය. කෙල්ලව දුටුවනම ඇය බැලුවාය.

"මේ අක්කා ඇයි මේ."

"බැටෑලියන් එකම ඇවිත් බබා. දැන් මොනවා වෙයිද දන්නේ නෑ. මිහිරංග ගිහින් කට්ටියම ෆෝම් කළා"

භාවනා සන්සුන්ව බැලුවාය. සියල්ලටම පෙර දේවකට කතාකළ යුතුය. ඇය ගත්තාය.

"ගුඩ් මෝනිං සුද්දි."

ඔහු කතාකළේ ප්‍රබෝධයෙනි. අසනීප පාටක් නැත.

"දැන් උණ අඩුද?"

"ඔව් සුද්දි. අද ෆිට්. මේ දැන් නාගෙන ඇවිත් තේ බොනවා."

"අනේ නෑවා."

“මී. වතුර ටික දාගත්තට පස්සේ ෆිට්”

ඔහු කීවේය. භාවනාට සතුටක් දැනුණි. ඊයේ ආවේ උණත් නොවේ. දුකකි. ඇය ඒ බව කෙහොමත් දැනගෙන උන්නාය.

“මෙතන පොඩි ප්‍රශ්නයක් යන්න අයියේ යන්නේ. එන්න සමහරවිට පරක්කු වෙයි. එහෙම වුනොත් මම මැසේජ් එකක් එවන්නම්.”

“ඇයි සුද්දි”

“සීගිරි එකට අයිතිය කියන කට්ටිය ඇවිත් ගේ වටකරලා. අද මෙතන ලොකු කතාවක් යනවා”

ඇය හූල්ලා මෙන් කීවාය.

“මම එන්නම් සුද්දි”

“ඉන්නකෝ ඔහොම. ඔළුව හොඳට පිහදගන්න.”

ඇය කියද්දී නේත්‍රාටත් පුදුමය. කෙල්ල දවසක ආදරය කරන බව ඇය දැනගෙන උන්නාය. ඒත් මේ තරම් ලස්සනට ආදරය කරයි කියා ඇය සිතුවේ නැත. ඉඳලා ඉඳලා ආදරය කරනකොට එහෙමයි. පැලෙනවා. ඇය සිතුවාය. මේ ආදරයට ඇස් වහක් කටවහක් වදින්න එපා කියා ඇය සිතුවාය.

"ම්. මං තියනවා."

ඇය සිනාසී දුරකථනය තැබුවාය.

"අපරාදේ කෙල්ල ලස්සනට ඇඳගෙන යන්න ගියේ"

භාවනාටත් දුකය.

"ඒක ගාණක් නෑ. මේක බලමුකෝ."

"එන විදිහක් බලමු බබා. යන්"

භාවනා ආවේ නේත්‍රා ඉඳගෙන

උන් රෝද පුටුව තල්ලු කරගෙ නමය. නේත්‍රා සාමාන්‍ය සායක් සහ බ්ලවුසයක් ඇදගෙන උන්නාය. ටිකකට කලින් එය අන්දවා ගියේ ඉඳුනිල්ය.

"සීයට ගන්න තීරණයක් ගන්න දෙන්න මැණික. හොඳද?"

ඉඳුනිල් හිමිහිට කීවාය. තම දරුවන් මේ සීගිරි එකේ දේපොළ ප්‍රශ්නවලට මැදිවෙනු දකින්නට ඉඳුනිල් අකමැති වූවාය.

"සුද්දි සීයව එක්කගෙන එන්න"

මිලින්ද කීවේය. භාවනා පිරිස මැදින් ගියාය. කෙල්ල යන දෙස මිලින්ද බලාගෙන උන්නේය. අද ඇය ලස්සනය. මිලින්දට සිහිවූයේ ඇය කියූ කතාවය. 'කෙනෙක් ගැන හිතාගෙන උන්නා තාත්තා. ඒත් දැන්

ඒ ගැන කතාකරලා වැඩක් නෑ'

මිලින්දට අද සැනසීමක් දැනුණි. අවශ්‍යම දේ දරුවන් සතුටින් සිටීමය.

"සීයා."

රඹුක්වැල්ල මහතා තම මිණිපිරිය දෙස බැලුවේය.

"අද ඔයා ලස්සනයි පුතේ"

ඇය මලානික ලෙස සිනාසුනාය.

"කට්ටිය ඇවිත් සීයේ"

"යමු. මටත් කතාකරන්න ඕන."

රඹුක්වැල්ල මහතා ආවේ භාවනාත් සමඟමය.

"මලීෂා ඔතන සීයට දෙන්න ඉඳගන්න. මෙතනට එන්න"

මලීෂා රඹුක්වැල්ල මහතා ඉඳගන්නා පුටුවේ ඉඳගෙන සිටිද්දී නේත්‍රා කීවාය. මලීෂා පුටුවෙන් නැගිට්ටේ දුරකථනයෙන් දෙනෙත්

ගන්නේ නැතුවමය.

"කට්ටියම ආපු එක හොඳයි. නාමල්ගමත් ආව එක හොඳයි."

රඹුක්වැල්ල මහතා කීවේය.

"මෙතන මොකක්ද වෙන්නේ තාත්තේ. අපේ දරුවන්ට බැරිද මේ."

සුරංගි අව් අමෝරාගෙන කියාගෙන ආවාය. රඹුක්වැල්ල මහතා අතින් තම වැඩිමහල් දුවව නැවැත්තුවේය.

"මට කතාකරන්න දෙන්න සුරංගි"

ඔහු කීවේය.

"දැන් මෙතන වෙච්ච දේවල් කතාකරලා තේරුමක් නෑ. කොහෙත්ම වැඩක් නෑ. අපිට පවුලක් විදිහට මේ සීගිරි එක පවත්වාගෙන යන්න බෑ. මම රෑ නිදාගන්නේ නැතුව හිතලා තියෙන්නේ."

ඔහු කීවේය.

"සුපර් මාර්කට් එකක් විදිහට සීගිරි එක විකුණන්න බෑ. අපි වැටිලා ඉන්නේ. අනික බිල්ඩින් එකත් පරණයි."

ඔහු කීවේය. භාවනාගේ දෙනෙත් තෙමිණ. එහෙත් නේත්‍රා ඇගේ අතකින් අල්ලාගත්තාය. කෙල්ලව වෙව්ලන බව ඇයට දැනෙයි.

"කරන්න පුළුවන් එකම දේ සීගිරි ලෑන්ඩ් එක දෙන එකයි. මම මිලින්දගෙනුයි සුරංගිගෙනුයි රුවන්තිගෙනුයි අහන්නේ. කැමතිද ඒකට."

රඹුක්වැල්ල මහතා මුලින්ම බැලුවේ සුරංගි දෙසය.

"තාත්තට අපි කලිනුත් කිව්වනේ. මෙහෙම යන්න බෑ තමයි. සීගිරි එක

ගොඩගන්න බෑ කියලා එකවුන්ට්ස් හදලා මිහිරංග අපිට ඔප්පු කරලා පෙන්නුවා. නේද පුතා"

මිහිරංග හිස වැනුවේය. රඹුක්වැල්ල මහතාද හිස වැනුවේය.

"ඔව් අමාරුයි. අපි හිතුවේ ඒක ගොඩගන්න. නමුත් බෑ තමයි. සල්ලිත් නෑ."

මිහිරංග සිනාසුනේය. ඒ සිනහව භාවනාගේ හදවතට ගෙන ආවේ අපුලකි.

"රුවන්ති මොකද කියන්නේ"

"මමත් විශ්වාස කරන්නේ නෑ. අපේ දරුවෝ කැමති වෙන දේවල්වලට. අනික සුපර් මාර්කට් වැහිවැහැලා. කොහොමත් ඕක අපට හවුලේ කරන්න බෑනේ"

ඇය කීවාය. රඹුක්වැල්ල මහතා

යළිත් හිස වැනුවේය.

"මිලින්ද?"

මිලින්ද බිම බලාගෙන ටික වෙලාවක් උන්නේය.

"මේ සීගිරි එක හැදුනේ මායි තාත්තයි නංගියි. මට මගේ කෙල්ලෝ තුන්දෙනත් හරි සීගිරි එකත් හරි. සීගිරි එක එහෙම විකුණන්න බෑ. කවදාවත් බෑ. මට ඒකට හිත  හදාග න්න බෑ තාත්තේ. සොරි"

සුරංගිත් රුවන්තිත් කලබල වුනෝය. මේ අතට ලැබෙන්න යන වාසිය ගැන ඔවුන් මේ මොහොතේ උන්නේ ඇවිලෙමිනි.

"ඒත් අපි කැමති නෑ සීගිරි එක මේ විදිහට කරන්න. අපි දරුවෝ මෙතන සෙකන්ඩ් ක්ලාස් එකට වැටිලා. අයියට විතරක් තනි තීරණ

ගන්න බෑ"

රුවන්ති කීවාය. මිලින්ද හිස වැනුවේය.

"මං කිව්වේ මං හිතන දේ. කැමති දෙයක් තාත්තා කරන්න."

මිලින්ද කීවේය. භාවනා තොල්පට තදකරගත්තාය. සීගිරි එකේ ඉරණම දැන් තීන්දුය.

"මං තීරණයක් අරන් ඉන්නේ. ලෑන්ඩ් එක බැලුවොත් සීගිරි ලෑන්ඩ් එක කීයක් වටීද"

ඔහු ඇසුවේය.

"නාමල්ගම ලෑන්ඩ් ගැන දන්නවනේ. කියන්න."

රඹුක්වැල්ල මහතා කීවේය.

"මෙහේ පර්චස් එකක් දැන් මිලියනයත් පැනලා යනවා."

"ම්. එච්චර ඇති තමයි. මේ ඉඩම

සීයා ගත්තේ පර්ච් එක රුපියල් විසිහත්දාහට."

රඹුක්වැල්ල මහතා දෙනෙත් පොඩිකරමින් කීවේය. ඔහු සීයා කීවේ මිලින්දලාගේ සීයාටය. ඔහුගේ පියාටය.

"සීගිරි ලෑන්ඩ් එකේ පර්චස් අසූවක් තියෙනවා"

රඹුක්වැල්ල මහතා කීවේය. සුරංගි දෙනෙත් ලොකුකළාය. 'පර්චස් එකක් මිලියනයක් කියලා හිතුවත් එතනම මිලියන අටසීයක්නේ. කෝටි අටක්" ඇය ගණන් හැදුවාය.

"මං සීගිරි එක බෙදනවා."

රඹුක්වැල්ල මහතා තීරණය දැනුම් දුන්නේය. භාවනාගේ අත මිට මෙලවිණ. ඉඳුනිල් තම බාල දුව

දෙස බැලුවාය. ඇය ඇස්වලින් කීවේ කිසිවක් නොකියන ලෙසය.

"අපිට කෝටි අටක් විතර ගන්න පුළුවන් වෙයි. සීගිරි එකේ වාහන මම දෙන්නේ නෑ. ඒවා මට ඕන. අනිත් බඩු පස්සේ සේල් එකක් දාන්න පුළුවන්. බෙදන්නේ ලෑන්ඩ් එක විතරයි."

ඒත් ඇතියැයි සුරංගිට සිතුණි.

"ඒත් මම සීගිරි බෙදලා ඔයාලට දෙන්නේ නෑ. ඒ කිව්වේ සුරංගිටයි රුවන්තිටයි මිලින්දටයි දෙන්නේ නෑ"

සුරංගිගෙත් රුවන්තිගෙත් දෑස් លොකු විය.

"ඇයි ඒ?"

"මම දෙන්නේ ඔයාලගේ දරුවන්ට. දරුවන්ටයි මම දෙන්නේ. එයාලනේ දැන් ජීවිතේ පටන්

ගන්නේ"

රඹුක්වැල්ල මහතා කීවේය. කාටවත් එයට එරෙහිව කිසිවක් කියාගත නොහැකි විය.

"එතනිනුත් පාඩුම මගේ කොල්ලට"

රුවන්ති කීවාය.

"ඇයි උඹට එක පුතෙක් ඉන්න නිසාද?"

"මෙතන ඕක පහට බෙදන්න ඕන නෑනේ."

"දෙන්නේ මම. ඒකත් එපා කෙනෙක් ඉන්නවානම් අතන තියෙනවා දොර යන්න පුළුවන්. අනික දෙන්න ඕන දේවල් මම යනකොට දුන්නා. ඔයාට සුරංගිට."

රඹුක්වැල්ල මහතා කීවේය. රුවන්තිගේ කට වැසිණ.

"මම මේක විකුණලා එන ආදායමෙන් සියයට තිහක් තියාගන්නවා. මම මොනවාහරි කරන්න ඕන. ජීවත්වෙන්න. කාටවත් මට අතපාන්න බෑ."

කිසිවෙක් කතාකළේ නැත.

"අපි හිතමුකෝ පර්චස් එක ලක්ෂ දහය ගානේ දුන්නා කියලා. එතකොට කෝටි අටක් ලැබෙනවා. ඒකෙන් මිලියන විසිහතරක් මම තියාගන්නවා. කාටහරි ඒක ප්‍රශ්නයක්ද?"

රඹුක්වැල්ල මහතා වටේටම ඇස් යවා ඇසුවේය. කාටවත් කතාකරගත නොහැකි විය.

"ඉතුරු මුදල අපි හයට බෙදමු. නේත්‍රාටයි භාවනාටයි තාරකාටයි මිලින්දටයි මලීෂාටයි කෝසලටයි."

භාවනාගේ අත දැඩිවිය. ඇය

ඉදිරියට ආවාය.

"සීයා."

ඉඳුනිල් පපුව උඩට ගත්තාය. 'මං කතාකරන්න එපා කිව්වනේ මැණික' ඈය සිතින් කීවාය.

"කියන්න පුතේ. ඇයි ඔයාට ප්‍රශ්නයක්ද?"

"නෑ සීයා. සීයා කරන දේ කරන්න. ඒත් හයට බෙදන්න බෑ."

ඇය කීවාය.

"ඇයි"

"ඒක සීයා හතට බෙදන්න ඕන."

සියල්ලන්ටම පුදුම සිතුණි. රඹුක්වැල්ල මහතා බැලුවේ මිලින්ද දෙසය. මිලින්දටද මේ කිසිවක් සිතාගත නොහැකිවිය.

"ඇයි මැණික හතට"

"දරුවෝ හත්දෙනෙක් ඉන්නවා සීයා. සීයට මතක නැතිවෙලා. නැත්නම් හිතාමතා මතක නැතිකරලා. ඒක සාධාරණ නෑ"

කෙල්ල මේ කියන්නේ කුමක්දැයි රඹුක්වැල්ල මහතාට එකවර සිතාගත නොහැකිවිය.

"මෙතන කොහෙද හතක් භාවනා"

සුරංගි කේන්තියෙන් ඇසුවාය.

"ඉන්න නැන්දා"

භාවනා ගොස් සීගිරි පවුලේ ඡායාරූප ගසා ඇති තැනට ගොස් නර්මදාගේ පින්තූරය ඉන් ගලවාගෙන ආවාය. හැමෝම ගල් ගැසී උන්නෝය. 'මං ඔයාගේ අයිතිය ගන්නවා පොඩි නැන්දා. පිහිට වෙන්න මට.' ඇය සිතින් නර්මදාගේ මුහුණ දෙස බලාගෙන කීවාය.

"මේ පොඩි නැන්දා. සීගිරි එක හැදුවේ එයයි සීයයි තාත්තයි කියලා මේ දැනුත් තාත්තා කිව්වා. ඉතින් මේ පොඩි නැන්දට පුතෙක් උන්නනේ. ඇයි එයා සීයගේ මුණුපුරෙක් නෙමේද?"

රඹුක්වැල්ල මහතා වේදනාවෙන් මිලින්ද දෙස බැලුවේය.

"මෙතන දෑහටවත් දැක්කේ නැති උන් ගැන කතාකරන්නේ මොකද භාවනා."

සුරංගි ඇසුවාය.

"කෙනෙක් දෑහට දැක්කේ නෑ කියලා අයිතිය නැතිවෙන්නේ නෑනේ නැන්දා. සීයගේ අතින් දෙවෙනි පාරටත් පවක් වෙන්න බෑ. එහෙම නේද? දවසක ඔයා නැන්දිව මේ ගෙදරින් අයින් කළා. ඔයා ජීවිතේම

ඒ ගැන පසුතැවෙනවා. ඒ පසුතැවීම ආයෙත් හදාගන්න එපා. දවසක තමන්ගේ හිතට දුකක් නැතිව හිතන්න පුළුවන් තීරණයක් ගන්න සීයා."

නේත්‍රාට කෙල්ල ගැන පුදුම නැත. 'දේවක මල්ලිගේ අයිතිය වෙනුවෙන් කෙල්ල කතාකරන්නේ. ඒක හරියටම හරි.' නේත්‍රා රෝද පුටුව කරකවාගෙන ආවාය.

"කෙල්ල කියන්නේ ඇත්ත සීයා. ඒ මල්ලිත් දැන් මිහිරංගගේ වයසෙම ඇති. කොහේහරි ඇති. ඒක දෙන නොදෙන එක සීයගේ වැඩක්. ඒත් ඒ මල්ලිටත් කොටසක් යන්න ඕන. ඒකෙන් අපිට පාඩුයි. මගේ කොටසක් අඩුවෙනවා කියන්නකෝ. ඒත් සාධාරණ නෑ. මේක හැදුවේ නැන්දියි

සීයයි තාත්තයි. එහෙම දුක් වින්ද ගෑණිගේ දරුවට අරම අසාධාණායක් කළොත් සීයේ අපිට හරියන එකක් නෑ"

නේත්‍රා කීවාය.

"ඒක අයින්කරලා තියන්න තාත්තේ. නංගි වෙනුවෙන්. තාත්තා මොනවාවත් දුන්නෙම නැත්තේ කෙල්ලටයි. වෙඩින් එකක් ගත්තද? කර මාලයක් අරන් දුන්නද? අඩුම ගානේ යනකොට මේක තියාගනින් කියලා රුපියල් දාහක් දුන්නද? නෑ. ඒකි ගියා. ඇඳුම් දෙක තුනක් අරන් ජීවන් අයියා එක්ක ගියේ. අපි පහුගිය අවුරුදු විස්ස පුරාම මේ සීගිරි එකෙන් කෑවා බිව්වා. මේ දෙන්නගේ වෙඩින් කළා. හැමදේම කළා. දරුවන්ට වාහන අරන් දුන්නා.

එයාලව හොඳම ඉස්කෝලවලට යවලා ඉගැන්නුවා. ඒවා කළේ සීගිරි එකේ සල්ලිවලින්. ඔයා දුන්නේ. ඒත් නංගිගේ දරුවට එක පැන්සලක්වත් අරන් දීලා නෑ. එහෙම නේද? ඔයාගේ එක මුණුපුරෙක් මොන දුකක් වින්දද කියලා අපි දන්නවද?"

මිලින්ද කීවේය. භාවනා තම පියා දෙස බැලුවේ ආදරයෙනි. 'ඔයා මම හිතුවට වඩා හරිම මනුස්සකම් දන්න තාත්තා කෙනෙක්.' ඇය කෘතවේදීව සිතුවාය.

"ඇත්ත. එදා පුතේ මට මේක කියලා දෙන්න කෙනෙක් උන්නේ නෑ. ඒකී ගියා තමයි. අපි එයාගේ කොටස අයින් කරලා තියමු. දවසක එයි."

'එයා ඇවිත් ඉන්නේ. ඒත් දැන්ම මට කියන්න බෑ' භාවනා දෙනෙත්

බරකරගෙන සිතුවාය.

"එතකොට මේක හතට බෙදන්නේ."

"ඔව් හතට."

"හරි එතකොට"

සුරංගිට එය දැනගන්නා තුරු නිවනක් නැත.

"අපි හිතමු ඉතුරුවෙන්නේ ලක්ෂ පන්සිය හැටක් කියලා. මම කියන්නේ මගේ කොටස අයින් කළාම. ඒක මම මැරෙන දවසට ආයෙත් උඹලා ටිකට බෙදලා දෙනවා."

රඹුක්වැල්ල මහතා දෙනෙත් බරකර කීවේය.

"එහෙම කළාම එක් කෙනෙකට රුපියල් ලක්ෂ අසූවක් ලැබෙනවා. ඒක මම දරුවන්ගේ අතට දෙනවා. කරගන්න දෙයක් එයාලට කරගන්න

පුළුවන්.”

ඔහු තීන්දුව දෙමින් කීවේය.

“මට දැන්ම කියන්න කැමතිද අකමැතිද කියලා. මට ලියවිල්ලක් හදලා තියෙන්නේ. හැමෝම අත්සන් කරන්න ඕන“

මේ වෙන්නේ මොනවාදැයි භාවනා සිතුවාය. ‘අපිට සීගිරි එක ආයෙත් ඕපන් කරන්න බැරිවෙයි දේවකයියේ’ ඇය සිතුවාය.

“අපි හිතාගෙන උන්නේ සීගිරි එක ලබන සිකුරාදා ඕපන් කරන්න. ඒත් එදාට ඕපන් කරන්නේ නෑ. මං ඒ ගැන පස්සේ තීරණයක් ගන්නවා.”

නේත්‍රා සන්සුන්ව අසාගෙන උන්නාය

“මොකද කියන්නේ. දැන්ම මට කියන්න. මිහිරංගකෝසළ මලීෂා.

නේත්‍රා. කියන්න. කියන්න පුතේ”

භාවනා දරුවන් සියල්ලන්ගේම මුහුණු දෙස බලා ඇසුවේය.

“මම කැමතියි සීයා”

මිහිරංග කීවේය. ‘උඹ පුතේ උඩින්ම කැමතිවෙනවා කියලා මම දැනගෙන උන්නා’ රඹුක්වැල්ල මහතා සිතින් කීවේය.

“මාත් කැමතියි”

මලීෂාද කීවාය.

“මාත්”

රුපියල් අටසීයක් නැතිව ඉන්නා වෙලාවේ ලක්ෂ අසූවක් අතට එනවා කියන්නෙත් පුදුම දෙයක් යැයි කෝසළට සිතුණි.

“මම කැමති නෑ”

නේත්‍රා කීවාය.

"මාත් කැමති නෑ"

භාවනාද කීවාය. රඹුක්වැල්ල මහතා මේ උත්තරය බලාපොරොත්තු විය.

"චීත් කැමති වෙන්න වෙනවා. ඔයාලත් එක්ක සීගිරි මැනේජ්මන්ට් එක කරන්න මිහිරංගවත් මලීෂාවත් කෝසලළවත් එන්නේ නෑ. එතන දැන් යන්නේ වෙනම ප්ලෑනක්"

සුරංගි කීවාය.

"එහෙම කතාකරන්න එපා නැන්දා. අපි හැදුවේ සීගිරි එක ගොඩගන්න."

"ඒක ගොඩගන්න බෑ. ගොඩ ගන්නේ අර අලුතින් ගත්ත ගොඩයා එක්කද?"

භාවනාගේ අත මිට මෙලවිණා.

"දැන් වෙන කතා ඕන නෑ."

රඹුක්වැල්ල මහතා කීවේය.

"සීගිරි එක විකුණනවා."

ඔහු අවසන් තීන්දුව ගෙන කීවේය. භාවනා ඉදිරියට ආවාය.

"මම සීයා සීගිරි එක ඉස්සරහ උපවාස කරනවා. එහෙම සීගිරි එක විකුණන්න දෙන්නේ නෑ. ඒක අපේ. අපි හැමෝගෙම. ඒක දෙන්න බෑ. කොහොමටවත් දෙන්න බෑ"

ඇය අඬමින් කීවාය. මිලින්ද නැඟිට කෙල්ලගේ උරහිසින් අල්ලා ඇයව ඉන්ඳවූවේය. රඹුක්වැල්ල මහතා බලාගෙන උන්නේ වේදනාවකින් නොවේ. 'මේ කෙල්ලෝ දෙන්නට විතරයි කැක්කුම' ඔහු දැන් සැබෑවටම සීගිරි එකට ආදරය කරන්නේ කවුදැයි දනී.

"මෙතන නිකං ප්‍රශ්නයක් හදන්න

එපා භාවනා. මේවා වෙන විදිහක් තියෙනවා. හෙට අනිද්දා ඔයාලා හැමෝම මැරිකළාම කොහොමත් මේවා බෙදන්න වෙනවනේ."

භාවනා ඇස් තදකරගෙන කඳුළක් පිටකළාය.

"අපි සීයා අමාරුවෙන් හරි මේක කරගෙන යන්."

නේත්‍රා කීවාය. රඹුක්වැල්ල මහතා බැලුවේය.

"ඒත් බෑ ලොකු පුතේ."

මොහොතක් සියල්ලන්ම නිහඬව උන්නෝය.

"අපි නෙට් එකේ දාමු ඩීල් එක සීයා. මේ ලෑන්ඩ් එක ගැන මගෙනුත් කීපදෙනෙක් ඇහුවා."

මිහිරංග කීවේය. රඹුක්වැල්ල මහතා හිස ඔසවා බැලුවේය

"ආ. කවුද ඒ."

"බරකාරයෝ දෙතුන් දෙනෙක් තමයි. සීයාමම එයාලා එක්ක ඩීල් එක කතාකරන්නම්"

"මමත් දන්න අය ඉන්නවා"

නාමල්ගමත් කීවේය. රඹුක්වැල්ල මහතා මේ සියල්ල අසාගෙන උන්නේය.

"මම මේක ගන්න කෙනා කැමතිවුනොත් මගේ කොටසත් දාලා සීගිරි එක කරනවා නාමල්ගම."

ඔහු කීවේය.

"ඒක තාත්තගේ කැමැත්තක්."

"මගේ කොටසත් මම සීයට දෙනවා."

භාවනා කීවාය.

"මමත් දෙනවා."

නේත්‍රාද කීවාය. සුරංගිටත් රුවන්තිටත් කරකියා ගන්නට දෙයක් නැතිවිය.

"ඉන්න මම පොඩි අක්කගෙනුත් අහන්නම්."

භාවනා එහෙමම තාරකාට ඇමතුමක් ගත්තාය.

"සුදූ මේ සීගිරි එකේ ප්‍රොපටීස් ගැන සීයා කතාකරනවා. කට්ටියම ඇවිත්. අපි හැමෝටම බෙදනවා. ඔයාටත් කොටසක් දෙනවා. මගෙයි අක්කගෙයි කොටස අපි සීයටම දෙනවා. සීගිරි එක විකුණන්න බැරි නිසා. ඔයාගේ කොටස සුදූ. දැන් කියන්න. මම ස්පීකර් ෆෝන් දානවා"

භාවනා කීවාය.

"සීගිරි එක කොහොමටවත් විකුණන්න බෑ. මගේ කොටසත්

මම දෙනවා. සීගිරි එක හැමදාම තියෙන්න ඕන. ඒක අපේ ජීවිතේ වගේ. අපේ දරුවොත් සීගිරි එකේ ඇවිදින්න ඕන. ඒක එහෙම කෑලි කෑලිවලට විකුණන්න බෑ බබා. අපි කෑවේ බිව්වේ ඇන්දේ ඉගෙනගත්තේ සීගිරි එක නිසා. සීගිරි එක නැතිවෙනවා කියන්නේ මගේ සීයා නැතිවෙනවා වගේ මට. මගේ කොටසත් දාපන් වස්තුවෙ

භාවනා ස්පීකර් ෆෝන් දමා හැමෝටම ඇගේ කතාව අසන්නට දුන්නාය. රඹුක්වැල්ල මහතා බැලුවේ මිලින්ද දෙසය. වඩාත්ම වටිනා දරුවන් හැදුවේ ඔහුය.

“තෑන්ක්ස් සුදූ. මම පස්සේ ගන්නම්”

භාවනා දුරකථනය කට් කළාය.

"එතකොට නර්මදාගේ පුතා කෝ."

සුරංගි ඇසුවාය.

"එයා කවදාහරි එයි කියලා හිතමුකෝ නැන්දා. ඒක කොහොමත් සීයගේ අතේ තියෙනවා. ඒක ගැන අපි කොණ්හලා තේරුමක් නෑනේ. සීගිරි එක හදපු කෙනෙක්ට ඒ අයිතිය තියෙන්න එපැයි. අපි නෙමේනේ සීගිරි එක හැදුවේ"

භාවනා කීවාය.

"දැන් ඔයාලා මොකද කියන්නේ සුරංගි. ආ රුවන්ති"

දෙදෙනාම මුහුණට මුහුණ බැලුවෝය.

"අපිට සීගිරි එකට හවුල්වෙන්න බෑ. නේද නංගි"

සුරංගි කීවේ රුවන්තිවද ඇදාගෙ

නය.

"කොහෙත්ම බෑ."

රුවන්තිද එකහෙළාම කීවාය.

"තේරුමක් නෑනේ සීයා. සීගිරි එක කවදාවත් ගොඩගන්න බෑ. මේ මාකට් වැලියු එක වැඩිවෙලාවේ ලෑන්ඩ් එක දීලා දාන්න."

මිහිරංග කීවේය.

"මේක දෙන්නේ නෑ."

භාවනා කෑගසා මෙන් කීවාය. 'මේකිටනේ මෙතන අමාරුව තියෙන්නේ' මිහිරංග සිතුවේය.

"මිලින්ද?"

රඹුක්වැල්ල මහතා සෑහෙන වෙලාවකට පසුව කතාකළේය.

"කියන්න තාත්තේ"

"ඔයාට පුළුවන්ද මේ කොටස්

ටික ගෙවලා දාන්න. මිහිරංගගෙයි කෝසලගෙයි මලීෂාගෙයි. එහෙම වුනොත් අපිට මේක විසදන්න පුළුවන්”

මිලින්ද සෑහෙන වෙලාවක් කල්පනා කළේය.

“ඔයාට දවසක නංගිගේ පුතාට දෙන කොටසත් ගෙවන්න වෙනවා. මගේ කොටස ටික ටික මට ගෙවන්න. එහෙම වුනොත් මම සීගිරි එක ඔයාගේ කෙල්ලෝ තුන්දෙනාට දෙන්නම්.”

රඹුක්වැල්ල මහතා කීවේය.

“මට ටිකක් හිතන්න දෙන්න තාත්තා”

මිලින්ද කීවේ අසරණවය.

“හරි හැමෝම හිතන්න. මාත් හිතන්නම්. අපි කියපු විදිහට සීගිරි

එක ආයෙත් ඕපන් කරන්නේ නෑ. අපි බලමු. සතියක් බලමු."

"සතියක් බලන්න දෙයක් නෑ තාත්තේ. මගේ දරුවෝ නංගිගේ දරුවෝ සීගිරි එක කරන්න එන්නේ නෑ. එහෙම යවන්නෙත් නෑ." සුරංගි එකහෙලාම කීවාය.

"සතියක් දෙන්න"

රඹුක්වැල්ල මහතා නැඟිටිමින් කීවේය. සියල්ලෝම විසිර ගියේ කතා බහකින් තොරවය. මහගෙදර මොහොතකට නිසල විය. භාවනා ඉඳගෙන උන් තැනම ඉඳගෙන උන්නාය. මිලින්ද පැමිණ කෙල්ලගේ හිස අතගෑවාය.

"සුද්දි."

"අනේ තාත්තා."

ඇය ඇඬුවාය.

"සීගිරි එක වහන්න බෑ තාත්තා."

"මටත් බෑ"

භාවනා තොල්පට තදකරගත්තාය. මිලින්දගේ ඇස් ගියේ මොහොතකට කළින් කෙල්ල බිත්තියෙන් ගලවාගෙන ආ නර්මදාගේ පින්තූරයටය. ඔහු එය අතට ගත්තේය. ඉඳුනිලුත් නේත්‍රාත් භාවනාත් මිලින්ද දෙස බලාගෙන උන්නෝය.

"අද නැන්දි හිටියනම් එයත් කියනවා සීගිරි එක දෙන්න බෑ කියලා. එහෙනම් මට ඒක ලොකු ශක්තියක්."

භාවනාගේ ළය ඇවිළිණ. ඇය නේත්‍රා දෙස බැලුවාය. ඇය දෙනෙතින් කීවේ කිසිවක් කියන්නට එපා කියාය. තවම නේත්‍රා මේවා දැක

නැත.

"අපි හදපු සීගිරි එකට මෙහෙම වෙනවනේ"

මිලින්ද කීවේ පින්තූරයේ උන් නැගණිය දෙස බලාය. ඇය පුරුදු දයාබර සිනාවෙන් බලාගෙන උන්නාය. මිලින්දගේ හදවත බරවිය.

"දවසක නංගිගේ පුතා එයි."

මෙතෙක් වෙලා නිහඬව උන් ඉඳුනිල් කීවාය. භාවනා අම්මා දෙස බැලුවේ ගැස්සීමෙන්ය.

"කොල්ලා දැන් ලොකු ඇති. අම්මා වගේම ඇති."

ඉඳුනිල් යළිත් කීවාය. ඇයට ඒ පුංචි පිරිමි දරුවාව යන්තමට මතකය.

"තාත්තා සල්ලි නෑ."

භාවනා ඇසුවාය.

"එච්චර නෑ මැණික. ඔයාගෙයි අක්කගෙයි වෙඩින් එකට කියලා හැටක් විතර එකතු කරගෙන උන්නා. පොඩි ඉඩමක් ගෙවන්න ගත්තා. එච්චර තමා."

මිලින්ද ඇත්තම කීවේය.

"මං ළඟ විස්සත් විතර තියෙනවා තාත්තා. මාත් මේ කෙල්ලෝ දෙන්නට දෙන්න ඉතුරුකළේ."

නේත්‍රා එහෙමම කීවාය.

"සීයා සතියක් දුන්නනේ. අපි බලමු මොකක්හරි."

"ඔයා ඒවා හිතන්න එපා"

මිලින්ද කෙල්ලගේ හිස අතගා කීවේය.

# 07

රඹුක්වැල්ල මහතා දේවකට කතාකළේ කාමරයට ගොස්ය.

"ඔයාට දැන් සනීපද පුතා"

දේවකගේ ළය උණුවිය. මේ අහන්නේ සීයාය.

"දැන් සනීපයි සර්. එහෙම අමාරුවක් නෑ. මේ ඇඳගෙන ඉන්නේ එන්න"

"ටිකක් එන්න. මට කතාකරන්න ඕන"

ඔහු කීවේය. දේවකට පුදුමත් සිතුණි.

"මං එන්නම් සර්."

රඹුක්වැල්ල මහතා මොහොතක් ඔහුගේ කාමරයේ ඉඳගෙන උන්නේය. පසුව නැගිට එහෙට මෙහෙට ගියේය. පසුව ඔහු මිලින්දටත් ඉඳුනිල්ටත් ටිකක් කාමරයට කතාකළේය.

"තාත්තේ"

රඹුක්වැල්ල මහතා ආදරයෙන් ඔහුගේ පුතා දෙස බැලුවේය.

"මට අද ඔයාගේ කෙල්ලෝ තුන්දෙනා ගැන හරි ආදරයක් ආවා. කොහොමත් උන් තුන්දෙනාට ආදරෙයි. ඒත් අද ඒ ආදරේ වැඩිවුනා. එහෙම කෙල්ලෝ තුන්දෙනෙක් හැදුවට ඔයාටයි දුවටයි

පින්."

රඹුක්වැල්ල මහතා කීවේය. ඉඳුනිල්ගේ දෑස් තෙමිණ. ඔහු පැමිණ ඉඳුනිල්ගේ හිස පිරිමැද්දේය.

"ඔයා තමයි මේවා කළේ. ඔයාව ලොකු පුතා එක්කගෙන එනකොට මම දැනගත්තා. අද වෙනතුරු ඔයා මේවට කතාකරන්න ආවේ නෑ. ලබන ආත්මේ මම පතන්නේ ඔයාව මගේම දරුවෙක් වෙන්න කියලා."

රඹුක්වැල්ල මහතා ඉඳුනිල්ගේ හිස අතගා කීවාය.

"මේ ආත්මේ කියලා වෙනසක් නෑ තාත්තේ."

ඇය අඬමින්ම කීවාය.

"මිලින්ද හවස ටිකක් එන්න ඔෆිස් එකට. මට කතාකරන්න ඕන."

"හොඳයි තාත්තේ"

"මේ ලොකු පුතා"

රඹුක්වැල්ල මහතා හදිස්සියේම කතාකළේය.

"තාත්තේ."

"පොඩි කෙල්ල හදිස්සියේම නර්මදා ගැන කතාකළේ ඇයි? මට පුදුමත් හිතුණාමේ කෙල්ල නැන්දව දැකලාවත් නෑනේ. නර්මදා නැතිවෙනකොට භාවනා අතේ."

ඉඳුනිල්ටද එය පුදුමය. මිලින්ද සිනාසුනේය.

"මටත් හිතාගන්න බෑ තාත්තේ. ඒත් කෙල්ල කිව්වේ ඇත්ත"

"ඔව්. ජීවන් ගැන අර්ජුන දන්නවා. පුළුවන් වෙලාවක අර්ජුනට කතාකරන්න ලොකු පුතා"

"අර්ජුන ලංකාවේ නෑ තාත්තේ. ඒත් මම නම්බර් එක හොයගෙන

කතාකරන්නම්. ජීවන් අයියව දන්නවා තමයි"

මිලින්ද කීවේය. ඔහු මේ ළඟටම ඇවිත් බව කිසිවෙක් දන්නේ නැත.

"පොඩි එකාව දකින්නත් ආසයි."

රඹුක්වැල්ල මහතා කීවේය. ඔහු කවුරු වාගේ වෙන්නට ඇත්ද?

"දැන් තාත්තේ මේ සීගිරි එක පුදුම ලස්සනට හදලා තියෙන වෙලාවේ. අර කොල්ලත් පැලෙයි."

මිලින්ද ඇසුවේ දේවක ගැනය.

"මම මේ දැන් කොල්ලට කතාකළා. ඒක බලන්න ආස හිතෙන ලස්සනක් තමයි. වෙලාවක ඉන්දුවත් එක්කගෙනම එන්න"

රඹුක්වැල්ල මහතා කීවේය.

"විකුණන එක බලලා වැඩක් නෑනේ තාත්තේ"

ඔහු සිනාසුණේය.

"අපි බලමු දුව. සීගිරි එක තිබ්බ හැටියටනම් දෙන්න තමයි මාත් උන්නේ. ඒත් දැන් දෙන්න ලෝබයි."

ඔහු ඇත්තම කීවේය.

*** *** *** *** ***

භාවනා දේවකට ගත්තේ උඩ කාමරයට ගොස්ය. හිතාගෙන උන්නේ අතුරුගිරියේ යන්නටය. ඒත් දැන් එහි යන්නට වෙලාවක් නැත.

"කොහොමත් ඔයා එක්ක හෙට අනිද්දම කතාකරන්න වෙනවා."

ඇය සිතුවාය. දැන් තත්වය වෙනස්ය. 'මං ඔයා වෙනුවෙන් ඔයාගේ අයිතිය වෙනුවෙන් සටන් කරනවා. මෝඩයා ඒක දන්නෙවත්

නෑනේ.' ඇය සිතුවාය.

"දේවකයියේ."

"මං මේ ඇඳගෙන ඉන්නේ සුද්දි. එන්නද?"

"ම්. එන්න වෙනවා. මට එන්න දැන් වෙලාවක් නෑනේ"

ඇය කීවාය.

"මං දුවලා එන්නම්"

"මොකක්ද ඇඳගෙන ඉන්නේ."

ඇය නිකමට ඇසුවාය.

"මං මේ වයිට් ෂර්ට් එක සුද්දි. ඇයි."

"ටයි එකත් දාගෙන එන්න. හොඳ කමිසයක් ඇඳන් එන්න ගමනක් යන්න තියෙනවා"

දේවකට මේ කිසිවක් තේරෙන්නේ නැත.

"මං ඇඳගෙන එන්නම්."

"කෑවේ නෑ නේද?"

"තාම නෑ සුද්දි. මේ අප්පච්චිත් දුකෙන් ඉන්නේ."

"ඇයි"

"පොඩි පුතත් එන එකේ කෑම ටිකක් හදාගන්න විදිහක් නෑ කියලා."

ඔහු කීවේය.

"ඇයි මට පොඩි පුතා කියන්නේ කවුද ලොකු පුතා"

ඇය ඇසුවාය. දේවකට කියාගන්නට දෙයක් නැතිවිය.

"එන්නකෝ. දෙන්නත් එක්කම කමු. මි බෙහෙත් ටික මතක ඇතිව අරන් එන්නමට අදත් මේ ලොකු දඩෝරියන් බබෙක්ව උකුලේ තියාගෙන ඉන්න බෑ"

ඇය තොල්පට තදකරගෙන මෙන්

කීවාය. එහෙම කියූ විට ඔහුට ලැජ්ජ හිතෙන බව ඈය දනී.

"ඒයි මේ දේවකයියේ"

"සුද්දි නරකයි."

"හරි හරි අපි නරකයි. මට ඇත්ත කියන්න. බොරුවට නේද උන්නේ. ඊයේ ඇහැරුණා නේද? මඟදී."

ඈය ඇසුවාය. එසේ වූයේ නැති බව භාවනා දනී.

"ඇහැරෙන්න තිබ්බා තමා."

"ඇයි"

ඔහු කිසිවක් කීවේ නැත. 'දවසක ඉතින් ඇහැරලා ඉන්නකොටම උකුලේ තියාගන්නද. අපිට නම් බෑ. වස ලැජ්ජයි' ඈය සිතුවාය.

"එන්නකෝ"

භාවනා එහෙමම පහළට විතර කුස්සියට ගියාය.

"මේකත් අරන් යන්න කන්න. නොකා ගිහින් ගෑස් එනවා ඒ පාර"

ඉඳුනිල් කෙල්ලට හැදූ සැන්ඩ්විචස් ටික දුන්නාය. පසුව බැලුවාය.

"අද මේ ලස්සනට ඇඳගෙන"

"ම්. මේක වහනවා කියලා දන්නේ නෑ අම්මා. එහෙම දන්නවානම් අඳින්නේ නෑ. යන්නෙත් නෑ. සීගිරි එක දැන් හරි ලස්සනයි. ඒ ලස්සනට ගැළපෙන විදිහට ඇඳන් යන්නෝන නිසා ඇන්දේ."

ඉඳුනිල් බැලුවාය.

"සීයා මොකක්හරි කියයි. බයවෙන්න එපා"

භාවනාටද එය දැනෙයි.

"ඔයා පොඩි නැන්දා ගැන කිව්වේ"

එය හැමෝටම ප්‍රශ්නයක් බව

භාවනාද දැනගෙන උන්නාය.

"ඒක අසාධාරණ නෑනේ නේද අම්මා."

"කොහොමටවත් බෑ. මටත් අමතක වුණා."

"තමන්ගේ ළඟ හිටපු හොඳම අයව අමතක කරන්න එපා. එයාලා නැතිවුනත්."

භාවනා කීවාය. ඇය ගියේ පහත්වී ඉඳුනිල්ට වැඳය. ඉඳුනිල්ගේ මුවින් සුසුමක් පිටවිය. 'මොකක් නමුත් වෙනවා' ඇයට එය දැනෙයි. ඒත් ඒ කුමක්ද කියා තේරෙන්නේ නැත.

සීගිරි එකට යන මඟ පුරාවටම භාවනා සිතුවේ දේවක ගැනත් ජීවන් මාමා ගැනත්ය. 'මට ඔයාලා දෙන්නා එක්ක කතාකරන්නම

වෙනවා' භාවනා සිතාගත්තාය. ඒත් කවදාද කියා දන්නේ නැත. 'මොන දේ කරන්නත් අයියේ අපි දෙන්නට කතාකරගන්න වෙනවා. ඔයාව මට විශ්වාසයි.' ඒ විශ්වාසය කවදා කොහොම ආ එකක්ද කියා භාවනාම දන්නේ නැත.

"ඔයා සීගිරි එකට ඇවිත් තාම මාස තුනයි"

ඒ මාස තුනට ඔහු අවුරුදු දෙකක බැඳීමක් හදාගත්තේ කෙසේද? සමහරවිට මේ බැඳීමට පූර්වාත්මයේ සම්බන්ධයක් තිබෙන්නට පුළුවන.

සීගිරි එකට පය තබද්දීම භාවනාගේ පපුව ඇවිලිණ. අද සීගිරි එක බලන්න ලස්සනය. එහි දැන් බොහෝ සුපර් මාර්කට්වල නැති සුන්දරත්වක් ඇත. පසෙකින් ඇති

විවෘත මුළුතැන්ගෙය ලංකාවේ කිසිම සුපර් මාර්කට් එකක නැති දෙයකි. ඊටත් එහායින් ඇති බේකරි සෙක්ෂන් එක අලුත් පාන් කේක් පුච්චන්නට බලාගෙන ඉන්නාක් වැනිය. කැෂියර් පේළියට වම් පසින් වූ කුඩා බුක් කවුන්ටරය අලුත් පොත් පුරවාගෙන උන්නේ පුංචි ගනුදෙනුකරුවන් එන තෙක්ය. මේ හැමදේම ඔහුගේ නිර්මාණය. මේ සීගිරි එකට ආ දා ඔහු මේ තරම්ම ලස්සන සුපර් මාර්කට් එකක් හැදීමේ සිහිනය මවා පෙන්නුවේය. වචනවලින් මවන දේවල් ඇත්තට හදන්නට බොහෝ දෙනෙක්ට හැකියාවක් නැත. එහෙත් දේවක පුංචි බණ්ඩාර එය කළේය. දැන් ඇත්තේ මේ සුපර් මාර්කට් එක විවෘත කරන්නට පමණය.

ඒත් සීගිරි පවුල අද කතා

කරන්නේ එය විවෘත කරන්නට නොවේ. වසා දමා කෑලි කෑලිවලට කඩා බෙදාගන්නටය. නැත. එය කිසි ලෙසකවත් කරන්නේ නැතැයි භාවනා සිතාගත්තාය. එහෙත් එය කොහොම කරන්නද කියා භාවනාට සිතාගත නොහැක. 'ඔයා එක්ක මේ හැමදේම කතාකළොත් ඔයාම විස. දුමක් කියයි.' භාවනා සිතුවාය. ඔහු පුදුම කෙනෙකි. බොහෝ ප්‍රශ්නවලට මේ පුංචි කොල්ලා ළඟ උත්තර ඇත. භාවනා පැය බාගයක් පමණ ගෙන සීගිරි එක පුරාම ඇවිද්දාය. හැම තැනකම ඔහුගේ සුවඳය. ඔහුගේ වැඩය. සැමදේ සපිරි නාමය සුපිරි සීගිරි යැයි කිව හැක්කේ දැන්ය. දේවක විසින් ඇඹුල් තියල් හැදීම සඳහා ගෙනවිත් තිබූ අලුත් කුඩා මැටි හට්ටි තොගය දකිද්දී

භාවනාට පුදුම සිතුණි. එතැන කුඩා මැටි ඇතිළි පන්සීයක් පමණ විය. ප්‍රමාණ දෙකකින් තිබූ එම හට්ටිවලට මාළු ග්‍රෑම් දෙසීය පනහේ හා පන්සීයේ ඇඹුල් තියල් වැටෙයි. මේවා ඔහු කරන්නට ඇත්තේ කොතරම් බලාපොරොත්තුවකින්ද? එහෙත් අද හෝ හෙට මේ සීගිරි එක වහනවායැයි ඒ මුහුණ දෙස බලාගෙන සීයා කියන්නේ කෙසේද? නැත. එසේ විය නොහැක.

'සීගිරි ෆ්‍රෙෂ් බ්‍රෙඩ්' වශයෙන් ගුරු පැහැයෙන් නම මුද්‍රණය කළ සෙලෝපේන් බෑග් තොගයත් බේකරි සෙක්ෂන් එකේ ගොඩගසා තිබුණි. ඒවා ගෙනවිත් ඇත්තේ බේකරි අංශයේ දිනපතාම බේක් කරන අලුත් පෙති පාන් දමන්නටය. දිනකට පෙති පාන් පැකට් තුන්සීයකට වඩා

සුපර් මාර්කට් එකක අලෙවිවෙයි. ඔහුගේ සැළසුම් වී ඇත්තේ එයට පිටතට යන මුදල් සීගිරි එකේම රඳවා ගන්නටය. ඊට අමතරව සීගිරි අවන් ෆ්‍රෙෂ් බටර් කේක් වශයෙන් මුද්‍රණය කළ කාඩ්බෝඩ් පට්ට විය. ඒවා ගන්නේ අලුත හදන බටර් කේක් වටේ ඔතන්නටය. මේවා ඔහු කොහොම සිතුවාද කියා භාවනා දන්නේ නැත. ඇය දන්නේ එක දෙයක් පමණය. ඒනම් මේවා මෙහෙම සිතිය හැක්කේ කළ හැක්කේ දේවක පුංචි බණ්ඩාරට පමණක් බවය.

තනිවම ඇවිදිමින් මේ සීගිරි එකේ ලස්සන බලන්නට කෙල්ලට ලෝබය. ඇය ආසාවූයේ පසෙකින් ඔහුවත් තියාගෙන මේ හැමදේම අගයමින් මේවා බලන්නටය.

සීගිරි සුපර් නොවිකුණා ළඟ තබාගත හැකිද? භාවනා සිතුවාය.

භාවනා දේවකගේ ජංගම දුරකථන අංකයට ඇමතුමක් ගත්තාය.

"සුද්දි."

"කොහෙද කියන්නකෝ. මං ඇවිත් ගොඩක් වෙලා."

දැන් ඒ මුහුණ බලන්නට මේ තරම් හදිස්සියක් ආවේ ඇයි. ? ඊයේ පැය හයක් හතක් ඔහුව උකුලේම තබාගෙන ඇතිතරම් ඒ මුහුණ බලාගත්තා නොවේද?

"මේ වීල් එකක එන්නේ සුද්දි. දියවන්නාව පැන්නා විතරයි."

"චුට්ටක් ඔහොම නවත්තගන්න අයියේ"

භාවනා කීවාය. දේවක ත්‍රීවීලරය

නවත්වා ගත්තේය.

"ඔය හරියේ ටිකක් කතාකරන්න තැනක් තියෙනවද?"

"ම්. මං සුද්දිට දවසක් කිව්වේ අර දියවන්නා කොටේජ් එක ගැන. මේ උදේටත් ඇරලා. ඇයි."

"එතන බහින්න. මම එන්නම්. මට හරියට තැන කියන්නකෝ. දැන් සීයා අයියා එක්ක කතාකරනවා. ඊට කලින් දෙයක් කියන්න තියෙනවා."

භාවනා කීවාය. දේවකට කිසිවක් සිතාගන්නට නොහැකි විය. සීගිරි හී මොනවාද දෙයක් සිදුවෙමින් පවතින බව දැන් දේවකට පැහැදිළිය.

"මට තැන කියන්නකෝ. මං මේ එළියට ආවා."

දේවක ඇයට දියවන්නා කොටේජ් අවන්හල ඇති තැන කීවේය. එය

දියවන්නා ඉවුරට සමීපයේ පිහිටා තිබූ කුඩා අවන්හලකි. පහළ ගස් යට ඇතිතරම් මේස දමා ඇත්තේ හවසට එන අමුත්තන්ට විවේකීව ඉඳගෙන කෑම ගන්නටය. දේවක එතනින් බැස්සේය.

"බ්‍රේක්ෆස්ට් මොනවද ගන්න තියෙන්නේ."

දේවක ඇසුවේය.

"ඉන්ග්ලිෂ් බ්‍රේක්ෆස්ට් තමයි ගන්න පුළුවන්. ටෝස්ට් ඔම්ලට් සොසේජස්."

දේවකට සැනසීමක් දැනුණි.

"අපිට බ්‍රේක්ෆස්ට් පැක් දෙකක් දාන්න. තව මිස් කෙනෙක් එන්න ඉන්නවා. පහළ ටේබල් එකක් දාන්න."

"වැව ළඟට වෙන්න. පහළම

එකක්"

දේවක සිනාසී හිස වැනුවේය. ඇයට මේ හදිස්සියේ කියන්නට ඇත්තේ මොනවාද? උදේ සනීප වී තිබූ උණ දැන් ආයෙත් වැඩිවීගෙන එන්නාක් මෙන් ඔහුට දැනුණි. දේවක කෝකටත් පැරසිටමෝල් පෙති දෙකක් ගෙන බීව්වේය.

භාවනා ආවේ වාහනයේ නොවේ. කැබ් රියකය. තමා ආවේ කොහේද කියා කිසිවෙක් දැනගත යුතු නැත.

මේ හදිස්සියේ ගොස් ඔහුගෙන් මොනවා අසන්නටද? මොනවා කියන්නද? එහෙත් ඔහුත් සමඟ මොහොතක් තනිවීමේ දැවැන්ත ආසාවකින් භාවනා දැවුණාය. 'නිකං මේ තත්වේවත් ඔයාට කියනවා. සීයා එක්ක කතාකරන්න කලින් ඒක

ඔයා දැනගන්න ඕන.' අද නැතත් හෙට අනිද්දා දවසකම ඔහුත් සමඟ තීරණාත්මක කතාවක් කරන්නට සිදුවෙයි. 'ඒක මගේ ජීවිතේ ගැන ප්‍රශ්නයක්.' භාවනා සිතුවාය.

# 08

කැබ් රියෙන් බසිද්දීම දේවක දුවගෙන ආවේය. දැන් ලෙඩ පාටක් නැත. 'ඒත් චුට්ටක් බයවෙලා වගේ. මේ ඇයි කියලා බලනවා ඇති'

"කැබ් එකක සුද්දි. වාහනේ කෝ."

"මං කැබ් එකක ආවා."

භාවනා ඔහුගේ ලස්සන වාහනයෙන් බහින්නටත් පෙරම රස වින්ඳාය. ඒත් හැබෑම ලස්සන රස වින්ඳේ ඔහුය. 'ඔයා මාව

ඊයේ ඔඩොක්කුවේ තියාගෙන අච්චර වෙලාවක් උන්නා කියලා හිතනකොටත් පුදුමයි. මේ ඔයාමනේ.' දේවක සිතුවේය.

"ඇයි. මී."

ඔහු තමාගේ මුහුණ දෙසම බලාගෙන කල්පනා කරද්දී භාවනා ඇසුවාය.

"න්නෑ සුද්දි."

'මොනවද හිතුවා මං දිහා බල බල' ඇයට දැන් ඔහුව දැනෙයි.

"යන් ඇතුළට. මේක ලස්සන තැනක්නේ."

"දවසක් අප්පච්චියි මායි ආවා සුද්දි. ආපු අලුත. ඇවිත් රෑට කෑවා"

"අප්පච්චි එක්කද නැත්නම්"

ඔහු සිනාසුනේය. ඒ සිනහව හරියට දිය කැට පහනක් වාගේය.

පිරිසිදුය.

"පහළට යන්"

කළු ගල් අල්ලා තිබූ පිටගැට පෙළ දිගේ දෙදෙනාම බැසගෙන ආවේ දියවන්නා ඉවුරට යාබද කොටේජ් මේස වෙතය. එතනට ඈතට යනතුරු දියවන්නාව දිස්වෙයි. තුනී මිහිදුම් තට්ටුවක් දියවන්නා දිය මතුපිට ඇත. තාමත් උදේය. කොරවක්කන්ගේ හඬ වඩාත් ළංව ඇසෙන්නට විය.

"උණක් නෑනේ දැන් නේ."

ඇය මඟ නැවතී මෙන් ඔහුගේ නළලට සුරත තැබුවාය. අවශ්‍ය වූයේ උණ බලන්නද? නැතහොත් ඒ සිරුරට අතත් තබා හදවත තුළ දැවෙන ගින්දරක් තුනීකරගන්නටද? දන්නේ නැත.

"දැන් නෑනේ"

"සුද්දිගේ අත රස්නෙයිනේ."

ඔහු කීවේය.

"ම්. දැන් මට උණ."

ඔහු ඇයගේ නළලට අතත් තැබුවේය. දෑස් අඩවන් විය.

"එහෙම රස්නේ නෑනේ. මේ අත"

භාවනා තොල්පට තදකරගත්තාය. ඒ උණුසුම් අත ටිකක් අල්ලාගෙන ඉන්නද කියා අසන්නට ඔහුට සිතෙයි.

"අනිත් කෙනාගේ ඇඟෙන් ආපු රස්නෙනේ බලන්නෝනමගේ උකුල පිච්චුණා. ගෙදර ගිහිල්ලත් රස්නෙයි."

භාවනා ඔය ටික කීවේ දෑස් බරකරගෙනය. 'පිච්චුනේ උකුල නෙමේ' ඇයට ඒ ටිකත් කියා

දමන්නට සිත්විය.

"ම..ම..ට සුද්දි."

"පැය කීයක් උන්නද? අප්පච්චි එනකල්. පොඩි බබෙක්වත් එච්චර වෙලාවක් නිදාගන්නේ නෑනේ."

ඔහුගේ මුහුණ රතුවෙන හැටි බලාගෙන ඉන්නට ආසය. භාවනා තොල්පට මුව තුළට දමාගෙන ඔහු දෙස බලාගෙන උන්නාය. 'ලැජ්ජ හිතිලා.'

"අපට ටොයිලට් එකටවත් යන්න නෑ. හිරකරගෙන උන්නේ. අප්පච්චිත් බලන්න ඇති. මං ටොයිලට් එකට ගිහින් විනාඩි දහයක් විතර ඉඳලා ආවේ."

ඒ ගැනම ඇය කීවාය.

"මට එච්චරම අමාරුවුණා සුද්දි"

ඇය මොහොතක් කතානොකරම

පඩිපෙළ බැස්සාය.

"දේවකයියේ."

කටහඬ ආවේ බිඳීගෙන මෙන්ය. මඟදී උගුර සිරවිය.

"සුද්දි."

"කෙනෙක් දිහා එකදිගට පැය හයක් හතක් බලාගෙන ඉන්න පුළුවන්ද? මී. හෙලවෙන්නේවත් නැතුව."

ඔහු ටික වෙලාවක් බලාගෙන උන්නේය.

"මට පුළුවන්. රැක්ම හරි."

"මේ කෙනෙක්ව උකුලෙත් තියාගෙන. ආ."

"පුළුවන්."

"කාවද එහෙම තියාගෙන බලාගෙන ඉන්න පුළුවන්මී."

ඔහු අසරණව බැලුවේය.

"කාවද කියලා සුද්දි දන්නවා."

දේවක කීවේය.

"හරි වැඩක්නේ. මං දන්නේ කෙහොමද. මට ලියලා දීලා තියෙනවද? කියලා තියෙනවද? ආ."

මේ උදෑසනේ මේ තරම් දේවල් අවුස්සන්නේ ඇයි?

"මං එහෙම හිටියා. බලාගෙනත් උන්නා. ෆස්ට් ටයිම්. වෙරි ෆස්ට් ටයිම්. දන්නේ නෑ එහෙම පුළුවන් වුනේ කොහොමද කියලා. අප්පච්චි නාවානම් තවත් ඉඳී."

ඇය ඒ ටිකත් මේ ගමන්ම කියා දැම්මාය. පපුවට බර වැඩිය. පහළට බරවූ අරලියා අතු යටින් ඇවිදගෙන යද්දී අරලියා ගස්වල අතු මත කොළ මත ඇති රෑ වැටුණු පිණී ඉහට

වැටෙයි. දේවක ඇයට යන්නට අතු මෑත්කර දුන්නේය. ඒ අවසරයෙන් ඔහු ළඟ ළඟට ඇයව දැකගත්තේය.

"අද ලස්සන සාරියකුත් ඇඳගෙන."

"ම්. හොඳද?"

"ලස්සනයි. සාරිය නෙමේ සුද්දි."

"ගොඩක්."

ඇය ඇසුවාය.

"හරි ගොඩක්."

දේවක තවත් බැලුවේය.

"මේ චූටි ඉයරින් දෙක ෂෝක්නේ"

නැත. ලස්සන ඉයරින් දෙක නොවේ. ඒවා එල්ගෙන කන් පෙතිය. භාවනා තොල්පට තදකරගත්තාය.

"මෙතන ලස්සනයි. ඉඳගන්නකෝ. බඩගිනියි."

"මං ඉන්ග්ලිෂ් බ්‍රේක්ෆස්ට් ඕඩර් කළාදැන් ගෙනෙයි"

"මං ආසයි. පාන් ටෝස්ට් රහයි නේ."

"එහෙම තමා දෙන්නේ සුද්දි."

"ඉඳගන්නකෝ."

ඔහු ඉඳගත්තේ අඩමානයටය. හිත අද තිබ්බාට නෑ වගේය.

"අද වෙන අසනීපයක් හැදිලා වගේනේ. මොකෝ මේ."

ඇය ඇසුවාය. දේවක ඇය මේසය මතින් තැබූ ඇගේ සුදු පැහැගත් අත් බෑගය පසෙකින් තැබුවේය. ඒක තිබූ විට මුහුණ හරියට පේන්නේ නැත. භාවනා තොල්පට යළිත් තදකළාය. 'මාව බලන්න මාර්ග බාධකත් අයින් කරන්නේ මොකෝ.' ඇයට අසන්නට

සිතුණි.

"සීයා තව ටිකකින් කතාකරයි. එන්න කිව්වනේනේද?"

"මං කතාකරලා කිව්වා සුද්දි. පැයකින් සීගිරි එකට එන්නම් කියලා"

භාවනා මොහොතක් බලාගෙන ඉඳ ලොකු හුස්මක් පපුවට ගත්තාය.

"සීගිරි එකේ ටිකක් ලොකු ප්‍රශ්නයක් යනවා අයියේ. ලොකුම එකක්."

දේවකට එය දැනුණි.

"ඊයේ මිහිරංගලා ඇවිත් සිස්ටම් එක ඇදපු කතාව මම කිව්වේ"

"ඒක හදන්න පුළුවන් සුද්දි."

"මාත් දන්නවා. ඒත් ඒක නෙමේ ප්‍රශ්නේ. උදේ මං ඇඳගෙන දේවකයියලගේ ගෙදර එන්නනේ ගියේ. ඒ එන්න පහළට එනකොට

කට්ටියම පහළ සාලේ එක්රැස්වෙලා. බෝඩ් මීටින් එකක් වගේ. මිහිරංගලාගේ තාත්තත් ඇවිත්. මිහිරංග මල්ෂා කෝසළ එයාලගේ අම්මලා. පස්සේ අපේ තාත්තත් ආවා. සීයත් ආවා.සීගිරි පවුලම එතන."

දේවක අසාගෙන උන්නේය.

"එතන ලොකු කතාවක් ගියා. ලොකුම එකක්."

භාවනා සියල්ලම දේවකට කීවාය.

"අන්තිමට තීන්දු වුනා සීගිරි එක විකුණලා ඒ සල්ලි බෙදන්න."

දේවකගේ මුහුණ පුරා පැතිරීගිය වේදනාව භාවනා හොඳින්ම දැක්කාය. එය කොතරම් අවංක වේදනාවක්ද කියා ඇය අද උදේ තේරුම් ගත්තාය. සීගිරි එක

විකුණනවා කියා කියද්දී තමාගේත් හදවත ඇවිලීගියේ මේ ලෙස නොවේද?

"මේ අම්මා තාත්තා විකුණගෙන කනවා වගේනේ සුද්දි. ඇයි කට වහගෙන හිටියේ."

දේවක ඇස්වල කඳුළු තබාගෙන කීවේය. භාවනා මොහොතක් බලාගෙන උන්නාය.

"හිතන්නෙ කතාකළේ නෑ කියලද මී. අහගන්න එතන වෙච්ච කතාව."

භාවනා ඇගේ ජංගම දුරකථනයෙන් අද උදේ වූ කතාව පටිගත කළාය. එසේ කළේ දේවකට අසන්නට දෙන්නට නොවේ. අනාගතයේ යම් දවසක මේ කතාව යළිත් අසන්නට අවශ්‍යවේ යැයි සිතාය.

"සුද්දියි අක්කයි පව්."

දේවක දුක්බර හඬකින් කීවේය.

"පව් අපි නෙමේ අයියේ. අපේ සීගිරි එක. මේ අත් දෙකින් හැදුව සීගිරි එක. ඔයා පව්."

භාවනා අඬමින් කීවාය. දේවක යටිතොල හපාගෙනම උන්නේය. මෙය කොතරම් අමිහිරි වේදනාවක්ද කියා ඇය දැනගෙන උන්නාය.

"අන්තිමට සීයා කිව්වා සීගිරි එක බෙදනවා හැබැයි බෙදන්නේ මිලින්දට සුරංගිට රුවන්තිට නෙමේ දරුවෝ ටිකට කියලා."

දේවක බලාගෙන උන්නේය.

"ඒ කියන්නේ මට අක්කට අපේ පොඩි අක්කට මිහිරංගට මල්ෂට කෝසළට. හරියටම හයට. සීයා සියයට තිහක් තියාගන්නවා කිව්වා."

දේවක කිසිවක් කීවේ නැත.

"එහෙමවත් වෙච්ච එක හොඳයි සුද්දි."

"මොකක්ද හොඳේ"

"සීගිරි එකේ වැඩි අයිතිය සුද්දිගේ පවුලටනේ. සමහරවිට."

දේවක කියාගෙන ආවේය. ඒත් භාවනා ඇයව නැවැත්තුවාය.

"ඒත් මේ බෙදීම සාධාරණ නෑ කියලා මම ඒ වෙලාවේ කෑ ගහලා කිව්වා. ගොඩක් තදින් කෑගහලා කිව්වා"

දේවක පුදුමයෙන් හිස එසෙව්වේය.

"ඇයි සුද්දි අසාධාරණ. මොකක්ද ඒකේ තියෙන අසාධාරණේ. සීයා හරිනේ."

"නෑ සීයා හරි නෑ අයියේ. අද

විතරක් නෙමේ. අදින් අවුරුදු විසිහතරකට විතර කලිනුත් සීයා හරි නෑ. ගොඩක් වැරදියි"

දේවකට මොකක්ද දැනුණි. ඔහු හිස එසෙව්වේය.

"අවුරුදු විසිහතරකට විතර කලින් කිව්වේ සුද්දි"

'ඇයි ඔයාට ගොත ගැහෙන්නේ' ඇය සිතින් ඇසුවාය.

"ඒ වෙලාවේ සීයත් ඇහුවා ඔය ප්‍රශ්නෙම. මං දුන්න උත්තරේ දැනග න්න ඕනද2 මි."

භාවනා ඇසුවාය. දේවක හිස වැනුවේය.

ඇය ඇයගේ ජංගම දුරකථනයෙන් පටිතක කළ දෙවන සවුන්ඩ් ක්ලිප් එකත් පිටතට ගත්තාය.

"අහන්න"

භාවනා එය වාදනය කළාය. පසුව ඔහු දෙසම බලාගෙන උන්නාය.

"නෑ සීයා. සීයා කරන දේ කරන්න. ඒත් හයට බෙදන්න බෑ."

"ඇයි"

"ඒක සීයා හතට බෙදන්න ඕන."

"ඇයි මැණික හතට"

"දරුවෝ හත්දෙනෙක් ඉන්නවා සීයා. සීයට මතක නැතිවෙලා. නැත්නම් හිතාමතා මතක නැතිකරලා. ඒක සාධාරණ නෑ"

"මෙතන කොහෙද හතක් භාවනා"

"ඉන්න නැන්දා"

භාවනා දුරකථනය මොහොතකට නවතා දේවක දෙස බැලුවේය.

"මං මේ වෙලාවේ අපේ සාලේ

ෆැමිලි පොටෝස්වල ගහලා තියෙන මගේ පොඩි නැන්දිගේ පින්තූරේ අරගෙන ආවා අයියේ. මම කිව්වේ අර අවුරුදු විසි එකකට විතර කලින් නැතිවෙච්ච මගේ පොඩිනැන්දි ගැන. එයාගේ පින්තූරේ අරගෙන ආවා"

භාවනා කීවාය. දේවකගේ දෙනෙත් රත්විය. පපුව ඇවිලිණි. 'අනේ දෙයියනේ ඔයා මේ' දේවක පපුවට අතක් තියාගත්තේය. 'ඔයාට මොනවද වුණා අයියේ' භාවනා සිතින් කීවාය.

"එහෙම ගෙනත් මම පවුලටම මගේ පොඩි නැන්දගේ පින්තූරේ පෙන්නලා මේ ටික කිව්වා. අහන්නකෝ"

භාවනා යළිත් එය වාදනය කළාය.

"මේ පොඩි නැන්දා. සීගිරි එක හැදුවේ එයයි සීයයි තාත්තයි කියලා මේ දැනුත් තාත්තා කිව්වා. ඉතින් මේ පොඩි නැන්දට පුතෙක් උන්නනේ. ඇයි එයා සීයගේ මුණුපුරෙක් නෙමේද?"

දේවකගේ දෙනෙත් තෙත්විය. ඔහු ඇඬේ යැයි සිතා මුත තදකරගත්තේය. භාවනා මේ සියල්ල බලාගෙනය. 'ඔයාට අද මට කියන්නම වෙනවා අයියේ. තවත් හංගන්න බෑ.' භාවනා සිතින් කීවාය.

"මෙතන දෑහටවත් දැක්කේ නැති උන් ගැන කතාකරන්නේ මොකද භාවනා."

භාවනා යළිත් වාදනය නැවැත්තුවාය.

"එහෙම කිව්වේ මිහිරංගගේ

අම්මා. නල්ල මලේ නැන්දා එයා"

භාවනා එසේ කියා යළිත් වාදනය කළාය.

"කෙනෙක් දෑහට දැක්කේ නෑ කියලා අයිතිය නැතිවෙන්නේ නෑනේ නැන්දා. සීයගේ අතින් දෙවෙනි පාරටත් පවක් වෙන්න බෑ. එහෙම නේද. දවසක ඔයා නැන්දිව මේ ගෙදරින් අයින් කළා. ඔයා ජීවිතේම ඒ ගැන පසුතැවෙනවා. ඒ පසුතැවීම ආයෙත් හදාගන්න එපා. දවසක තමන්ගේ හිතට දුකක් නැතිව හිතන්න පුළුවන් තීරණයක් ගන්න සීයා."

"කෙල්ල කියන්නේ ඇත්ත සීයා. ඒ මල්ලිත් දැන් මිහිරංගගේ වයසෙම ඇති. කොහේහරි ඇති. ඒක දෙන නොදෙන එක සීයගේ වැඩක්. ඒත්

ඒ මල්ලිටත් කොටසක් යන්න ඕන. ඒකෙන් අපිට පාඩුයි. මගේ කොටසක් අඩුවෙනවා කියන්නකෝ. ඒත් සාධාරණ නෑ. මේක හැදුවේ නැන්දියි සීයයි තාත්තයි. එහෙම දුක් වින්ඳ ගෑණිගේ දරුවට අරම අසාධාණයක් කළොත් සීයේ අපිට හරියන එකක් නෑ."

දේවකගේ දෙනෙත්වලින් කඳුළු දහරාවක් ගලාගෙන ගියේ භාවනා බලාගෙන ඉඳිද්දීමය. ඒ කඳුළු ගැලිය යුතුම කඳුළු බව භාවනා දැනගෙන උන්නාය. එහෙත් ඇය උන් අසුනෙන් ඉස්සී දේවකගේ දෙනෙත් පිසදැම්මාය.

"ඒක අයින්කරලා තියන්න තාත්තේ. නංගි වෙනුවෙන්. තාත්තා මොනවාවත් දුන්නෙම නැත්තේ

කෙල්ලටයි. වෙඩින් එකක් ගත්තද? කර මාලයක් අරන් දුන්නද? අඩුම ගානේ යනකොට මේක තියාගනින් කියලා රුපියල් දාහක් දුන්නද? නෑ. ඒකි ගියා. ඇඳුම් දෙක තුනක් අරන් ජීවන් අයියා එක්ක ගියේ. අපි පහුගිය අවුරුදු විස්ස පුරාම මේ සීගිරි එකෙන් කෑවා බිව්වා. මේ දෙන්නගේ වෙඩින් කළා. හැමදේම කළා. දරුවන්ට වාහන අරන් දුන්නා. එයාලව හොඳම ඉස්කෝලවලට යවලා ඉගැන්නුවා. ඒවා කලේ සීගිරි එකේ සල්ලිවලින්. ඔයා දුන්නේ. ඒත් නංගිගේ දරුවට එක පැන්සලක්වත් අරන් දීලා නෑ. එහෙම නේද? ඔයාගේ එක මුණුපුරෙක් මොන දුකක් වින්ඳද කියලා අපි දන්නවද?”

“ඇත්ත. එදා පුතේ මට මේක කියලා දෙන්න කෙනෙක් උන්නේ නෑ.

ඒකී ගියා තමයි. අපි එයාගේ කොටස අයින් කරලා තියමු. දවසක එයි."

භාවනා ජංගම දුරකථනයෙන් වාදනය වෙමින් තිබූ දේ නැවැත්තුවාය. දේවක භාවනාගේ මේසය මතතිබූ අත අල්ලාගෙන ඒ මත හිස තියාගෙන ඇඬුවේය. භාවනා නිදහස්ව තිබූ අත දේවකගේ හිස මත තැබුවේය.

"අඬන්නේ ඇයි කියලා මම අහන්නේ නෑ සුදු අයියේ. කවදාවත් අහන්නේ නෑ."

භාවනා මෘදුව කීවාය.

"ම..ම..ට සමාවෙන්න සුද්දි. සමාවෙන්න."

ඔහු අඬමින්ම කීවේය. භාවනා ඇය උන් අසුනෙන් ඉස්සී ඔහුගේ පුටුව අද්දරටම ආවාය. ඊටත්

පසුව ඇය ඔහුගේ හිස ඇගේ උකුලට බරකරගත්තාය. දිගටම හිස පිරිමැද්දාය.

"මම දැන් කියන්න. මං දන්නවා මට මොකක්ද දෙයක් හැමදාම කියන්න උන්නානේද? සීගිරි පවුලට උරුමකම් කියපු අපේ දුප්පත් අයියා. අවුරුදු විසිහතරක් දුක් විඳපු කොල්ලා. එකපාරටම ඇවිත් හාස්කම් කරනකොට අපිට නිකමටවත් හිතුණේ නෑ. මේ අපේ සුදු අයියා කියලා. මිහිරංගලා වගේ කබ්බෝ. කෝසළලා වගේ කෝම්බ කෑලි වටේ ඉන්නකොට මට පුදුමත් හිතුණා. මේ පවුලට එක හොඳ කොල්ලෙක්ව දුන්නේ නැත්තේ ඇයි කියලා. අනේ මේ දීලා තියෙන්නේ දෙයියනේ. මම ඔයාගේ අයිතිය වෙනුවෙන් අද කෑගැහුවා සුදු

අයියේ. ගේ දෙවනත් කළා. අක්කා කතාකළා. තාත්තා කතාකළා. අම්මත් කතාකළා.”

දේවකට කතාකරගන්නට නොහැකි විය. ඔහු දිගටම භාවනාගේ උකුල බදාගෙන ඇඬුවේය.

“අදත් ලෙඩවන්නද පිස්සෝ යන්නේ. ආ. අදත් මට මෙහෙම දවසම තියාගන්නද කියන්නේ. ම්.”

ඇය ඔහුගේ හිසකේ අතරින් ඇඟිලිතුඩු යවමින් ඇසුවේය.

“මට චුට්ටක් මූණ පෙන්නන්න”

ඇය ඔහුගේ හඬා වැටෙන මුහුණම දෝතට ගත්තාය. දේවකගේ දෑස්වලින් ගැලූ කඳුළින් භාවනාගේ දෑත් තෙමිණ.

“අනේ මේ ඇයි?”

"මම හැමදේම කියන්න සුද්දි උන්නේ. ඒත් හදිස්සියේම සූරියආරච්චිලා ඇවිත්."

කියාගෙන ආ දේ දේවකම ගිලගත්තේය. ඔහුට පසුගිය දවස් ටිකේ වූයේ එය බව භාවනාද දැනගෙන උන්නාය. එක අතකට සූරියආරච්චිලා ඇවිත් අරම කරපු එක හොඳය.

"මාව අරන් යයි කියලා හිතුවද? මි"

දේවක හිස වැනුවේය.

"ඉ..ති..න් අරන් ගියාම මොකෝ. කවුරුහරි ඇවිත් මාවත් අරන් යන්නෝනනේ. නේද? එහෙමනේකෙල්ලෝ දවසක මැරිකරනවනේ. ඇයි ඉතින්"

හැමදේම ඔහුගේම මුවින් අසාග

න්නට ඇයට ආසය.

"ම..ම..ම සුද්දි."

භාවනා කතාකළේ නැත. ඔහුගේ හිසකේ අතර ඇය ඇතැඟිලි රැගෙන ගියාය.

"හැමදේම මම විසඳගන්නවා. පොඩි අක්කා ඇවිත් ගොඩක් ප්‍රශ්න අයින්කරලා දුන්නා. ඒත් අයියේ."

ඔහු බලාගෙනම උන්නේය.

"මගේ ජීවිතයටත් මට උත්තර ඕනේ."

දේවක කතාකළේ නැත. එහෙම අද ඔහුට කතාකරන්නට අමාරු බවත් ඇය දැනගෙන උන්නාය.

"දවසක අපි කතාකරමු. මී. අපි දෙන්නගෙම ජීවිතේ ගැන අයියේ. කතාකරන්නම ඕන. හොඳේ"

දේවක හිස වැනුවේය.

"මම ගැන මේ ඇත්ත තව කවුද දන්නේ සුද්දි"

භාවනා සිනාසුනාය.

"අක්කයි මායි විතරයි. මට අක්කට නොකියා ඉන්න බෑ. ඊයේ මම හැමදේම හිතුවා. එක දෙයක් නිසා."

භාවනා ඒ මුහුණේ දුක්බර රේඛා දෙසම බලාගෙන කීවාය.

"සරමක් ගන්න ඔයාගේ අල්මාරිය ඇරියා. එතන මගේ මැරිච්ච නැන්දිගේ පින්තූරේ තිබුණා. හැමදේම මට ඒ පින්තූරේ කියලා දුන්නා. හැමදේම. ඒත් එක දෙයක්."

"ම්."

"ඒ අල්මාරි පලුවේ කැත කෙල්ලෙක්ගේ පින්තූරයකුත් තිබුණා"

ඇය කීවාය. ඔහු ලැජ්ජාවෙන්

දෙනෙත් බරකරගත්තේය.

"ඇයි දන්නේ නෑ ඒ කැත කෙල්ලගේ පින්තූරේ අල්මාරි පලුවේ ගහගෙන උන්නේ"

ඇය තොල්පට තද කරගෙන මෙන් ඇසුවාය.

"ඒ කැත කෙල්ලෙක්ගේ පින්තූරයක් නෙමේ"

"එහෙනම්."

"මම දැකපු එකම සුරංගනාවිගේ පින්තූරේ. මගේ ජීවිතේ  මම දැකපු එ..ක..ම දේවතාවී"

දේවක කීවේය. භාවනාගේ ළය වෙව්ලාගෙන මෙන් ගියේය. ඇයගේ අත ඔහුගේ හිස මත තදවිය.

"ඉතින් කාගේ වුනත් පින්තූරයක් එහෙම ගහගෙන ඉන්නකොට මේ."

"මම දවසක කියන්නම් සුද්දි."

"කියන්නම වෙනවා අයියේ. මේ කෑම ඇවිත්. අපි කාලා ඉමු. මට බඩගිනියි."

දේවක දෑස් පිසදා ගත්තේය. භාවනා ඉඳගෙන ඔහුගේ මුහුණ දෙසම බලාගෙන උන්නාය. 'නැන්දගෙම මූණනේ' ඇය සිතුවාය.

"කන්න. සුද්දි"

පාන් ටෝස්ට්වල බටර් ගා දුන්නේ දේවකය.

"මට මේ කතාවම කියන්න ඕන. කොහෙද හිටියේ. කවදද ආවේ. කොහොමද අප්පච්චියි පුතයි ජීවත්වුනේ. හැමදේම."

"කියනවා සුද්දි"

"දැන් මේ කතාව."

"දැනට මේ කතාව සුද්දියි අක්කයි දැනගත්තාම ඇති සුද්දි."

"ඒත් දවසක කියන්න ඕන. හැමෝටම."

ඇය පාන් ටෝස්ට් එක කමින්ම කීවාය.

"දැන් මට කියන්න අයියේ. සීගිරි එක බේරගන්නේ කොහොමද? එයාලට සල්ලි දෙන්නෝන. අපි සීගිරි එක විකුණන්න බෑ."

"කවදාවත් බෑ. අපි සීගිරි එක ලස්සනට කරනවා සුද්දි."

"ඒත් කොහොමද? එයාලගේ සල්ලි දෙන්නෝන අයියේ. නැත්නම් මේක අපිට කරගෙන යන්න බෑ."

දේවක ඔහුගේ පෑන සාක්කුවෙන් ගත්තේය. ඊටත් පසු ඔහුගේ සයිඩ් බැග් එකෙන් සුදු කොළයක් ගත්තේය.

"දැන් කියන්නකෝ සුද්දි එයාලා

සීගිරි එක දෙන්න යන්නේ කීයටද කියලා"

භාවනා සියල්ලම පහදා දුන්නාය.

"මට තේරෙනවා. එතකොට මිහිරංගට ලක්ෂ අසූවක් දෙන්න වෙනවා. මලීෂාටටත් ඒ ගාණ. කෝසළටත් එහෙම. එතකොට ඒ තුන්දෙනාට විතරක් ලක්ෂ දෙසිය හතළිහක්."

"ඔව්. අපි කොහොමද ඒ ගාණ දෙන්නේ අයියේ."

"ඒත් සුද්දි දෙන්න පුළුවන්නම් අපිට සීගිරි එක කරගෙන යන්න පුළුවන්. එහෙම නේද"

"ම්. මගෙයි අක්කලා දෙන්නගෙයි මේ අ..පේ අර පොඩි අයියා ඉන්නේ. නැන්දිගේ පුතා. එයාගේ කොටසත් දාලා නේද?"

භාවනා ඔහුගේ ඇස්දෙස බලමින් ගොතගසමින් කීවාය.

"මම ආවේ සුද්දි කොටස ගන්න නෙමේ"

"ආ. දැන් නොගෙන ඉන්නද ලෑස්තිය. ගහනවා මම. බූරුවා වගේ මගේ කොටස එපා කියන්න එපා. ගොන් හරකා. හරක් රැළ"

දේවක සිනාසුනේය. තවත් බණිනවානම් ඔහු ආසය.

"දවසක දරුවෙක්ට හරි තියෙන්න ඕන. මෙතන වෙස්සන්තරගේ බාල පුතා වෙන්න යනවා"

ඇයට කියවින.

"සුද්දි"

"කා..ගේ ද..රු..වෙ..ක්..ට..ද සුද්දි"

භාවනා බැලුවාය. සියල්ල ඒ

දෑස්වල ලියවී තිබුණි.

"සොරි සොරි."

භාවනා රැව්වාය.

"සීයගේ කොටසත් අපිට දානවනේ. එතකොට සීගිරි එක කරගෙන යන්න පුළුවන්. ප්‍රශ්නේ තියෙන්නේ අර ලක්ෂ දෙසීය හතළිහ. ඒක මේ දැන් ඉල්ලන්න වගේ එයාලා ඉන්නේ."

දේවක හිස වැනුවේය.

"තත්පරයක් දෙන්න සුද්දි"

දේවක ඔහුගේ ජංගම දුරකථනය ගත්තේය. එහි අංකයක් ගෙන ඔහු ඇමතුමක් ගත්තේය. දුරකථනය කනේ තබාගෙන ඉන්නා ගමන්ම ඔහු සොසේජස් එක කපා ඇයට දුන්නේය. 'මං දුවෙක්ද එහෙම සොසේජස් කපලා කන්න දෙන්න.'

ඇයට අසන්නට සිතෙයි.

"ගුඩ් මෝනිං නිශාන්ත අයියා. මම දේවක"

ඔහු මේ හදිස්සියේ කතාකරන්නේ කාටද?

"ඔව් අයියේ. දැන් කොළඹ සෙට්ල් වෙන්නම හිතන් ඉන්නේ. කතාකළේ අයියේ පොඩි දෙයක් දැනගන්න"

භාවනා පාන් ටෝස්ට් එකකට බටර් ගා ගම්මිරිස් කුඩු ටිකක් ඉස එයට සොසේජස් එකක් තැබුවාය. ඊටත් පසුව එය රෝල් එකක් සේ එතුවාය. ඊටත් පසුව ඇය ඔහුට කටක් කැව්වාය. දෙදෙනාගේ දෑස් හමුවිය. රත්කළ ඇල්පෙනිත්තක් ඇස් අස්සෙන් ගියාක් සේ රිදින.

"මට කියන්න අයියේ ලක්ෂ දෙසීය පනහක විතර ලෝන් එකක්

ගන්න කීයක විතර ප්‍රොපට් එකක් තියන්න ඕනද? ඇපයක් විදිහට"

භාවනා විමසිල්ලෙන් අසාගෙන උන්නාය.

"ආ ඒ ගාණ ඇති නේද අයියේ. එතකොට අයියේ මට නිකමට කියන්න බෑන්ක් ඉන්ට්‍රෙස්ට් එකත් එක්කම ලෝන් ඉන්ස්ටෝල්මන්ට් එක කීයක් වෙයිද. අවුරුදු දහයකට අපි ලෝන් එක ගන්නවා කියලා හිතමු. ආ හරි අයියේ. මම ඉන්නම්. මට දැන්මම දැනගන්න ඕන."

දේවක දුරකථනය අල්ලාගෙනම උන්නේය. භාවනා ඒ අවසරයෙන් තවත් පාන් ටෝස්ට් කටක් කැව්වාය.

"මේ ගාණ වගේ නේද අයියේ. මම අයියට හවස්වෙලා ගන්නම් අයියේ. තැන්කියු."

දේවක දුරකථකනය තැබුවේය.

"අපිට මේ ප්‍රශ්නේ හරිම ලේසියෙන් විසඳගන්න පුළුවන් සුද්දි. සීගිරි එකත් රැකගෙන එයාලට දෙන සල්ලිත් දීලා පොඩි මුදලක් මාසෙකට කලෙක්ෂන් එකෙන් අයින් කරලා."

භාවනා සිතුවේම සීගිරි එක විකුණන්න වේවී කියාය.

"කීයක් දෙන්න වෙනවද ලක්ෂ දෙසිය හතළිහක ලෝන් එකක් ගත්තාම අයියේ."

"තුන්ලක්ෂ විසිතුන්දාහයි. ඊටත් අඩුවෙයිලු. නිකං අයියා කිව්වේ. නුවර අයියා කෙනෙක්දැන් බී ඕ සී එකේ හෙඩ් ඔෆිස් ඉන්නේ. අපි එකට වැඩකළේ."

භාවනාට පුදුම සැනසීමක් දැනුණි. ඈය ඒ සැනසීමෙන්ම සිනාසුනාය.

“දැන් අපි සීයට මේ වැඩේ කියමු. මී.”

“මේක සුද්දි තාත්තත් ඉන්න තැනම කියමු. සුද්දි තාත්තටත් ටිකක් සීගිරි එකට එන්න කියන්න. අපි මේක විසඳමු. සීගිරි එක වහන්න බෑ.”

භාවනාගේ අතක් දේවකගේ අතක් මතට වැටුණි. දේවක දෙනෙත් එසවූවේය.

“සීගිරි එක බේරගන්න. ඒක අපේ ජීවිතේ.”

ඇය මුමුණා කීවාය. දේවක හිස වැනුවේය.

“ඇයි කියලා මම පස්සේ කියන්නම්.”

දැන් පස්සේ කියන්න කියා සිතාගත් සෑහෙන දේවල් ඇත.

# 09

දෙදෙනාම ගොඩවූයේ කැබ්රියේ පිටුපස අසුනටය. එකට යන්නට එක්ව යන්නට මේතරම් ආසාවක් හදවතට දැනෙන්නේ ඇයි? භාවනා ඉඳගත්තේ සාරි පොටද ඉදිරිපසට ගෙනය. අලුත් හිරු එළිය රන් කහ පාටට වාහනයට වැටුනේ වාහනය ගමන් කරමින් තිබුනේ දියවන්නා වෙල්යාය අද්දරින් නිසාය.

දේවක ඔහුගේ ජංගම

දුරකථනයේ කැමරාව ක්‍රියාත්මක කළේය. ඊටත් පසුව තත්පරයේදී ඔහු එය භාවනාගේ මුහුණට ළංකළේය. ඔහු කරන්නට යන දේ භාවනා ඉවෙන් මෙන් තේරුම් ගත්තාය. ඇය හරි ඉක්මනට ඔහුගේ පැත්තට ආවාය.

"තනියෙන් සෙල්ෆි ගන්නේ නෑ මෝඩයෝ. එහෙම ලස්සන නෑ. අපි මෙහෙම ගමුකෝ."

භාවනා දේවකගේ අතින් ජංගම දුරකථනය ගෙන ඇයද ඔහුට සමීප වූවාය. ඊටත් පසුව ඇය දෙදෙනාගෙ ම රුව ජංගම දුරකථනයේ සටහන් වන සේ සේල්ෆි පින්තූර හයක් හතක් එක දිගටම ගත්තාය. පසුව ඇය ගත් පින්තූර දෙස එකින් එක බලාගෙන උන්නාය.

"මේක මම දැම්මා වෝල් එකට. මේ. සෝ කියුට්. එක ලස්සන කෙල්ලෙකුයි කැතම කැත කොල්ලෙකුයි."

ඇය නෙතඟින් ඔහු දෙස බලා කීවාය. දේවක සැහැල්ලුවෙන් සිනාසුනේය. උදේ ඇය කියූ දේවල් නිසා හිත ටිකක් සැහැල්ලු විය. ඇත්තටම හිත සැහැල්ලු වූයේ සූරියආරච්චිලා කෙල්ලව අරගෙන යන්නේ නෑ කියා හරියටම දැනගත් පසුද?

"මේ දැම්මා හරි."

ඇය ඔහුගේ දුරකථනයේ මුහුණතට දැන් ගත් පින්තූරය දමා පෙන්වූවාය. ඇත්තටම එය ලස්සනය.

"ඔන්න මේක මාරුකරලා

අහුවෙන්නේ නෑ හරිද?”

දේවක හිස වැනුවේය.

“මං හිතුවා සීගිරි එක දුන්නම තමයි කියලා.”

“මේ යෝජනාවට සීයයි තාත්තයි කැමතිවෙයි නේද සුද්දි.”

“කැමතිවෙයි. එහෙම නැත්නම් මම කැමති කරගන්නවා. අපිට ගෙවන්න පුළුවන් නේද?”

“බේකරි සෙක්ෂන් එකේ ප්‍රොෆිට් එකෙන් විතරක් ගෙවන්න පුළුවන්”

“මම චුට්ටක් බැලුවා. පස්සේ හවස්වෙලා හරියටම බලන්න ඕන. ලස්සනයි දැන්.”

ඒ දේවකගේ සම්පූර්ණ ශ්‍රමයය. එය එසේ නැතැයි කියන්නට කිසිවෙක්ට අද නොහැක. භාවනාගේ දුරකථනයට නේත්‍රා ඇමතුමක්

දුන්නාය.

"බබා කොහෙද?"

"මේ අයියවත් එක්කගෙන එනවා අක්කා."

"ඉක්මනට එන්නකෝ. මට කොල්ලගේ මූණ ටිකක් බලාගන්න"

ඇය දුරකථනය කනේ තබාගෙ නම ඔහු දෙස බැලුවාය.

"එහෙම බලන්න තරම් දෙයක් මේ වහු පැටියගේ මූණේ නෑ අනේ"

ඇය කීවේ දේවකගේ අතක්ද මිරිකාය. ඇය මේ කියන්නේ කා ගැනදැයි දේවක තේරුම් ගත්තාය.

"අපි මේ ළඟ අක්කා. ඉක්මනට එනවා."

භාවනා දුරකථනය විසන්ධි කර බැලුවාය.

"මට අප්පච්චි එක්ක කතාකරන්න

ඕන. හොඳේ."

"අප්පච්චිට මම කියනවා. සුද්දි අද මට අර රෙකෝඩ් කරපු ටික එවන්න හොඳේ."

ඔහු කියන්නේ හැමෝම ඉදිරියේ නැන්දාගේ පුතා ගැන කතාකළ දේවල් ටික ගැනය.

"සීගිරි එක සුද්දකරගෙනම පටන් ගන්න එක හොඳයි. හරි නිදහස්."

"පටන්ගන්න දවස ටිකක් කල් දාගන්න වෙයි සුද්දි."

"ඒක කමක් නෑ. ඊට පස්සේ සීගිරි එක අපේ විතරමයි."

භාවනා කීවාය.

"හදිස්සියේ මේ සුද්දිව දෙන්න මේ."

දේවක යමක් කියන්නට ගොත ගැසුවේය. ඔහු අසන්නට යන්නේ

කුමක්දැයි භාවනා ඉවෙන්මෙන් තේරුම් ගත්තාය.

"මාව තාත්තා කාටහරි දෙන්න යයි කියලද. ආ අයියේ"

ද්වේක හිස වැනුවේය.

"ඒකනම් දන්නේ නෑ. අපිට ඉතින් එහෙම නොයන්න කාරණාවකුත් නෑනේ. ඔන්න තිබ්බානම් කියනවා. මං කිව්වේ මේ ඉතින් සළකලා බලන්නවත් කවුරුහරි ඇප්ලයි කරන්න එපැයි නේද අයියේ. නැද්ද මං කියන්නේ."

භාවනා අහක බලාගෙන මුව තදකරගෙන කීවාය. ද්වේක බැලුවේ අසරණාවය.

"එහෙම කියන්නම ඕනද සුද්දි."

"ඉතින් අයියේ අපිට දිවැස් නෑනේ. නේද? ඉස්සරනම් ලෙටර්ස්

දෙනවලු. රෝස මල් පෙති දාලා සෙන්ට් ටිකක් දාලා. දැන් ඉතින් මේ එස් එම් එස් තියෙනවා. වයිබර් තියෙනවා වට්ස් ඇප් තියෙනවා. ඒ නැතත් මේ මූණටම කියලා දාන්න බැරිද? මං කියන්නේ හිතේ තියන් ඉන්න ගල් ඉබ්බට නේද?"

දේවක අසරණව සිනාසුනේය.

"එයා කියයි ඉතින්. ගල් ඉබ්බනේ. මී හරකනේ. හරක් රැළනේ. ටිකක් වෙලා යනවා මීටර් එකට වැටෙන්න."

දිලුලන දැසින් ඇය බැලුවාය. ඊටත් පසුව තොල්පට මුව තුළට ගෙන පාරට සිනාසුනාය.

"ආදරේ අයික් ක්‍රීම් එකක්ලු. කනවානම් ඉක්මනට කන්නෝන. නැත්නම් දියවෙලා යනවා. කෝන්

එක තමයි සූප්පු කරන්න වෙන්නේ නැත්නම්. කෙල්ලෝ කියන්නේ ඔය ඉස්සර."

ඇය අහක බලාගෙනම කීවාය.

"නෑ සුද්දි. ආදරේ එහෙම දියවෙන අයිස් ක්‍රීම් එකක් නෙමේ. වතුර ගන්න ගන්න තව උල්පත්වලින් වතුර උනන හොඳ ළිඳක්. ගත්තා කියලා වතුර අඩුවෙන්නේ නෑ."

ඔහු කීවේ රහසින් මෙන්ය. කැබ් රියදුරා මේ කිසිවක් අසාගෙන ඉන්නේ නැත.

"හරි ඉතින්. මොනවා කරන්නත් ඉතින් ළිඳට බාල්දියක් දාන්න කෙනෙක් එන්නෙපැයි අනේ."

ඇය කියූ දෙයට ඇයටම හිනාව නවත්වාගන්නට බැරිවිය. දේවකද සිනාසුනේ ඒ මුහුණ දෙස බලාගෙ

නය. 'එනවකෝ පනිට්ටුවක් අරන් අපේ ළිඳ ගාවට.' ඇයට අතින් ඇන කියන්නට සිතෙයි.

"එහෙම ඉතින් ආවට ගියාට හොඳ ළිඳකින් වතුර ගන්න බෑ සුද්දි. මල් දෙක තුනක් ළිඳට දාලා අඟුරු කෑල්ලක් දෙකක් එහෙමත් දාලා සීරුවට ළිඳෙන් වතුර ටික ගන්න එපැයි."

ඔහු සිනාව නවත්වා කීවේය. බලාපොරොත්තු නොවූ ලෙස දෙදෙනා අතර තිබූ ආසනයමැද කොටසේ තිබූ ඉඩේ තිබූ දේවකගේ අත මතට භාවනාගේ අත වැටිණ. තදවිණ.

"මල් කඩ කඩ ඉන්න වෙලේ වෙන අය ඇවිත් බාල්දි පෙරළයිද කියලයි බය. එකපාරක් එහෙම වෙන්න

ගියානේ"

ඇය එපමණක් කීවාය. කැබ් රිය සිගිරි එක අසළට ආවේය. භාවනා එක බැල්මකින් බැලුවාය.

"තේරුනාද?"

ඇය ඇසුවාය.

"ම්. හොඳට"

දේවක කීවේය.

භාවනා තාත්තාට ගත්තේ වාහනයේ ඉන්නා ගමන්මය. සීගිරි එක බේරාගන්න කතාකරනවානම් එතන තාත්තාත් සිටිය යුතුමය. ඊටත් වඩා ඇයට ඕනා වී තිබුනේ මේ මෙහෙයුම පිටුපස ඉන්නේ දේවක බව තාත්තාට ඒත්තු ගන්වන්ටය. පිය රජතුමාට සපුමල් කුමාරයා ගැන කියන දවසට මේ සියල්ල වැදගත් වෙනු ඇත.

"තාත්තා. ඔයා කොහෙද?"

දේවක ඇය දෙස බලාගත්වනම බලාගෙන උන්නාය. ඔහුගේ බැල්මේ කතා දහසක් ලියවී ඇත. අද සිදුවූ හැමදේම මෙහෙම හිතන්නට අමාරුය. මේ කතාවේ රචකයා දැන් තමා නොවේ. මේ වම්පසින් ඉන්නා ගැහැණු ජීවිතයය. ඇයව මේ අත්දෙකින් රැකගත හැකිවේද? එය දන්නේ දෙවියන් පමණය. ඒ වෙනුවෙන් දෙවියන් ඉල්ලන්නේ කවර වන්දියක්ද? ඒ වන්දිය අවශ්‍යනම් මේ දැන් ගෙවන්නට දේවක සූදානම්ය.

"නෑ තාත්තා. මේ සීගිරි එක කරගෙන යන්න පොඩි අදහසක් තියෙනවා. දේවකයියා කිව්වේ. තාත්තට පුළුවන්නම් චුට්ටක්"

භාවනා අයැද සිටියාය.

"මං එන්නම් සුද්දි මොනවද කොල්ලා කියන්නේ"

ඔහු එහෙම කියද්දීත් ඇයට ආසය. තාත්තාගේ හිතේ දේවක ගැන ඇත්තේ පැහැදීමකි. 'කවුද මේ පිස්සට පැහැදුනේ නැත්තේ ඉතින්. මට පුදුම මෙච්චර කාලයකට කෙල්ලෙක් පැහැදුනේ නැති එක.' එහෙම වූ එක හොඳය.

"තාත්තා එන්නකෝ. ඇවිත්ම අහන්නකෝ. උදෙන්ම එන්න හොඳේ."

භාවනා දුරකථනය තබා ඔහු දෙස බලා සිනාසුනාය. ඒ ඇස් තිබුනේ ඇය වෙතමය. දෑස්වල බැල්මට සමාන්තරව භාවනා දෙතොල් පට තදකරගත්තාය. තමා දෙස මෙහෙම කෙනෙක් බලාගෙන ඉන්නවා

කියන්නේම පුදුමයකි.

"අපි මේ අයියේ."

භාවනා යමක් කියාගෙන ආවාය. දේවක බැලුවේය. කැබ්රිය පිටුපස අසුන කුඩාය. ඒ නිසා එහි යද්දී දෙදෙනා අතර මහ දුරක් ඇත්තේ නැත.

"ඇයි සුද්දි"

"නෑ එක්කෝ හවසම කියන්නම්කෝ."

"කමක් නෑ කියන්න දැන්මම."

"එහෙම විශේෂ දෙයක් නෙමේ. හවස්වෙලා කියන්නම්. ඒක නෙමේ වෙද මහත්තයාගේ ගෙදර මළගේ ඉවර ඇතිනේ."

"ඒත් හත් දවසක් ඉන්නෙපැයි සුද්දි."

"ම්. වෙලාවක් තිබුණානම් අපිට

නෑ මං කිව්වේ මේ."

ඇයගේ දෑස් බැබලෙයි. එය වෙසක් එකට සල් උයනකට දමන සීරියල් බල්බ් වැලක් සේය. යමක් කියාගන්නට පෙරම වාහනය සීගිරි එකට ආවේය. භාවනා වාහනයෙන් බහින්නට පෙර දේවකගේ වමත මත සුරත තැබුවාය.

"කොහොමහරි මේක රැකගමු. මං වෙනුවෙන් මි"

ඇය කීවාය. එසේ කී විට ඔහු කොහොමත් එය රැකගන්නා බව භාවනා දැනගෙන උන්නාය. එවැනි විශ්වාසයක් එක් ආත්ම භවයකදී එක් වරකට එයි.

"තේරෙනවා. සුද්දි යන්න. මං ගෙවලා එන්නම්."

දේවක කීවේය. භාවනා

දේවකගේ අතින් අත ගත්තේ මන්දග
ාමීවය. ඔහුත් සමඟ තනිවම දුරක
යෑවේ ආශාවක් ඇයට ඇතිවිය.
කොහොමත් මේ දුර ජීවන ගමන
ඔහුත් සමඟ යන්නට භාවනා
රඹුක්වැල්ල තීරණය කර හමාරය.
හදවතට මේ දැනෙන නිවන ඒකය.
සුවය ඒකය. මේ කරදර නිමාවූ පසුව
සින්දුවක් දාගෙන නටන්නට පවා
කෙල්ලට ආසාවක් ඇතිව ඇත්තේද
ඒකය.

නේත්‍රා උන්නේ ඇගේ කාමරයේ
කබඩ් එකක් ඇරගෙන දොරට
පිටුපාය. දේවක ආවේ මෑදුවට පා
තබාය. ඔහු ආ බවක් ඇය දැක්කේ
නැත. ඇයට ඇසුනේද නැත.

දේවක පැමිණ රෝද පුටුවට
අතක් තැබුවේය.

"අක්කේ."

දේවක කතාකළේ උගුරින් මෙන්ය. නේත්‍රාගේ නහර දිගේ ගලාගෙන ගිය ලේ සහෝදර සෙනෙහසකින් උණුවිය. කොල්ලාගේ මුහුණ යළිත් වරක් දකින්නට ඇය උදේ සිටම දැවුණාය.

ඇය රෝද පුටුව හරවාගත්තේ වේගයෙනි. දෑස් කඳුළින් තෙත්ව ගොස් තිබුණි. නේත්‍රා දේවකගේ අතක් දැඩිව අල්ලාගත්තාය.

"චුට්ටක් පහළට එන්න මගේ සුදු මල්ලියේ."

නේත්‍රා කීවේ අඬමිනි. දේවක රෝද පුටුව ළඟ දණඹබා නේත්‍රාගේ උකුලටම හිස තැබුවේය. නේත්‍රා තම උකුලේ තිබූ කොල්ලාගේ හිස අපමණ ආදරයකින් සිපගත්තාය.

"ඔයා ආපු දවසෙම මට මොකක්ද

දැනුණා මහත්තයෝ. අනේ මගේ පොඩි මල්ලියා. ඔයාට මම කොච්චර ආදරේද?"

දේවකට ඇඬුණි. මේ වැනි අක්කා කෙනෙක් ලද හැම බාල මල්ලී කෙනෙක්ම වාසනාවන්තය. එසේම, මේ වන් මල්ලී කෙනෙක් ලබන හැම අක්කා කෙනෙක්ම ඊට වඩා වාසනාවන්තය.

"මට සමාවෙන්න අක්කේ."

දේවක කීවේ අඬමින්.

"අනේ අඬන්න එපා. මට මගේ මල්ලිව ලැබුණානේ. මම මගේ මල්ලියව ඉඹලත් තියෙනවා. මේ පුංචි මූණ මම ඉඹලත් තියෙනවා. ඔයා අපි ළඟටම ආවනේ"

නේත්‍රා දේවකගේ හිස නොනවත්වා සිපගනිමින් කීවාය.

එදෙස බලාගෙන උන් භාවනාගේ දෑස් තෙත්විය.

"මට බාප්පව බලන්න ඕන. ඔයාගේ අම්මට ඔයාගේ අප්පච්චිට මම කොච්චර ආදරේද කියලා ඔයා දන්නේ නෑ. මායි සුද්දියි හවස එනවා."

දේවක හිස වැනුවේය.

"ඒ තරමටම අප්පච්චි අක්කට සුද්දිට ආදරෙයි. එයා මාව සීගිරි එකට එව්වෙත් එකනේ අක්කේ."

නේත්‍රා දේවක තම උකුලේ නිදාගෙන ඉන්නා හැටි ඇස්දෙකින් භාවනාට පෙන්නුවාය. භාවනා සිනාසුනේ තෙත දෑසිනි.

"මාව පේරාදෙණියේ වෙද මහත්තයා ළඟට උස්සගෙන යනකොට මම හිතින් පැතුවා මේ

වගේ මල්ලි කෙනෙක්ව ලබන ආත්මේ හරි මට දෙන්න කියලා. දැන් ආයේ අපිව දාලායන්න බෑ සුදු මල්ලියේ හොඳේ."

දේවක හිස වැනුවේය. නේත්‍රා යළිත් වතාවක් පහත් වී ඔහුගේ හිස සිපගත්තාය.

"අපිට පිරිමි සහෝදරයෙක්ට ඔයා ඇති. ඔයා විතරක්ම ඇති. අනේ අපේ කොල්ලා මෙච්චර ලොකුවෙන්න කොච්චර දුක් විඳින්න ඇත්ද? ඔයාව ලොකුමහත් කරන්න ජීවන් බාප්පා කොච්චර දුක් විඳින්න ඇත්ද?"

දෛවය කොතරම් පුදුමාකාරද?

"ඔයාටයි පින් බබා. මේකව මෙහෙම රැකගත්තට."

ඇත්තටම ඔහුව රැකගත්තේ භාවනාය. කෙල්ල නොවන්නට දේවක

කෙනෙක් සීගිරි එකේ නැත.

"ම..ම ඒ වෙනුවෙන් ලොකු ණයක් සුද්දිට ගෙවනවා අක්කේ."

ඒ කුමක්දැයි ඔහු කීවේ නැත. භාවනා නෙත කඳුළු තබාගෙන අක්කාගේ දෙපා පාමුළ වැටී ඉන්නා දේවක දෙස බලාගෙනම උන්නාය. 'හවසට පොඩි අක්කටත් කියනවා. එයත් ආසවෙයි' භාවනා සිතාගත්තාය.

# 10

රඹුක්වැල්ල මහතාගේ කාමරයේ දොරවල් වැසුණි. එහි ඇතුළත රඹුක්වැල්ල මහතාත් මිලින්දත් නේත්‍රාත් භාවනාත් දේවකත් රැස්විය. මේ සීගිරි එක බේරාගැනීමේ අවසාන මෙහෙයුමය. එය අද බේරාගන්නට එන්නේ වෙන කෙනෙක් නොවේ. මේ සීගිරි එක තම හදවතින්ම ගොඩනැඟූ එක් සුන්දර ගැහැණියකගේ, දැන් මළවුන් අතර

ඉන්නා ලේ උරුමක්කාරියගේ එකම පුතාය.

දේවක ඉඳගත්තේ සුදු කොළ ටිකක් ෆයිල් එකක් මත තබාගෙන පෑනත් අතේ තබාගෙනමය. රඹුක්වැල්ල මහතා පරිස්සමින් කොල්ලා දෙස බලාගෙනෙ උන්නේය. දේවකව දුටු දවසේ සිට ඔහුගේ සිතටද යමක් දැනෙයි. ඒත් දෛවය මේ තරම් හාස්කමක් කර ඇති බවක් රඹුක්වැල්ල මහතා දන්නේ නැත.

දැනගත් දවසට ඔහුට දේවකගෙන් සමාව ගන්නට සිදුවෙනු ඇත. ඒ තම බාල දියණිය වෙනුවෙනි.

"මට හැමදේම භාවනා මිස් කිව්වා සර්."

දේවක කතාව පටන් ගත්තේ

එසේය. භාවනාගේ ළය ඇකිළිණි. ඒ හා සමානවම නේත්‍රාගේද ළය දැවී ගියේය.

"මල්ලි කියන්නකෝ."

නේත්‍රා එහෙම කීවේ ඒ ඇතිවූ දුක පහව යවාගන්නටය. වඩාත් වටින්නේ නෑකම්ය. ලේ නෑකම්ය. ඒවා සාමාන්‍ය බැඳීම් නොවේ. හදවතේ වත්කම්ය.

"අපිට සර් එයාලට ගෙවන්න ඕන ලක්ෂ දෙසීය හතළිහක්නේ"

"දැනට දේවක. තවත් කෙනෙක්ට අපි පස්සේ කාළෙක ගෙවන්න ඕන. ඒත් දැනට ඒ පුතා අපි ළඟ නෑ. එයා ආපු දවසට ඒක ගෙවන්න පුළුවන්"

මිලින්ද කීවේ තම නැගණියගේ එකම දරුවා ගැනය. මේ ඇවිත්

ඉන්නේ ඒ පුතා බව ඔහු දන්නේ නැත.

"එයා ගැන අපි දැන්ම හිතන්නේ නැතුව ඉමුකෝ සර්. මේක අපි ගෙවන්න ඕනනේ"

මිලින්ද හිස වැනුවේය.

"අපිට පුළුවන් සර් සීගිරි එකේ ප්‍රොපට් එක බෑන්ක් එකකට මෝගේජ් කරලා ලෝන් එකක් ගන්න. මේකේ වැලිව් එක අනුව ඒකගන්න එක හරිම ලේසි දෙයක්. මම උදේ භාවනා මිස් කිව්වට පස්සේ බෑන්ක් එකට කතාකළා. මගේ අ දුනන අයියා කෙනෙක් බී ඕ සී හෙඩ් ඔෆිස් ඉන්නවා. එයාට කතාකරලා මම ඩීටේල්ස් ගත්තා."

මිලින්දට පුදුම සිතුණි. ඔහුට ඒ බවක් මතක් වූයේම නැත.

"අපිට කියන්න දේවක ඒ ගැන."

"මෙහෙමයි සර්. අපිට අවුරුදු දහයකට ලෝන් එක ගන්න පුළුවන්. ඒකෙන් කියන්නේ නෑ අපි අවුරුදු දහයක්ම මේ ලෝන් එක ගෙව ගෙව යනවා කියලා. අපිට කලෙක්ෂන් එන විදිහට ඒක ඉක්මනට ගෙවලා ඉවරකරන්න පුළුවන්. දැනට අපිට ලක්ෂ දෙසිය හතළිහක් ගත්තොත් මාසෙකට තුන්ලක්ෂ විසිදාහක් ගෙවන්න ඕන. මම පොරොන්දුවෙනවා සර් ඒ ගාණ බේකරි සෙක්ෂන් එකේ ප්‍රොෆිට් එකෙන් විතරක් හොයලා දෙනවා කියලා. ඒක කරන්න පුළුවන් අපිට"

මිලින්ද බැලුවේ පුදුමයෙනි. එතරම් ලාභයක් බේකරි සෙක්ෂන් එකකින් ලබාගත හැකිද? එසේ

හැකිනම් පුදුමයකි.

"මේ අපේ මේ අලුතින් දාන බේකරි සෙක්ෂන් එකෙන් දේවක"

මිලින්ද ඇසුවේය.

"ඔව් සර්. ඒක කරන්න පුළුවන්. මම ඒක පොරොන්දුවෙනවා. අපිට මේ ලෝන් එකට යන්නම වෙනවා සර්. සීගිරි එක වැඩකරන බෑන්ක් එකක් එක්ක කතාකළොත් අපිට තවත් අඩුකරගන්න පුළුවන්. අපි ඒක අදම කරමු සර්. වැලුවේෂන් එකක් අරන් අපි අදම බෑන්ක් ලෝන් එකකට ඇප්ලයි කරමු. සති දෙක තුනක් ඇතුළත අපිට ලෝන් එක දෙනවා. ඒක දුන්න ගමන් අපිට සීගිරි එක ඕපන් කරන්න පුළුවන්. මේ වහලා තිබ්බා වගේම තව මාසයක් අපි වහලා තියනවා කියලා

හිතමුකෝ. මේක ක්ලියර් කරගෙ නම අපි සීගිරි එක ඕපන් කරමු සර්. අපේම සීගිරි එක කියලා හිතලා."

මිලින්දට පුදුම සිතුණි. 'අපේම සීගිරි එක.' කොල්ලාගේ වචන ඔහුගේ හදවතට ගෙන ආවේ මහ පුදුමාකාර හැඟීමකි. පිටින් ආ කොල්ලෙක්ට ඒ හැඟීම ආවා කියා සිතන්නටත් අමාරුය.

"දේවකගේ වැඩේ කරමු. අපිට වෙන විසඳුමක් නෑ පුතා. මේක බෑන්ක් එකත් එක්ක කතාකරන්න පුළුවන් නේද ලොකු පුතේ"

රඹුක්වැල්ල මහතා ඇසුවේ නේත්‍රාගෙනි. බැංකු සමඟ ගනුදෙනු කරන්නේ ඇයය.

"අදම කරනවා සීයේ. මේක අපිට හිතුනේ නෑනේ. දේවක මල්ලි

කියනකල්."

මිලින්ද සිනාසුණේය.

"ඔයා පුතේ අපි ගාව හැමදාම ඉන්නෝන."

මිලින්ද කීවේ හදවතින්මය. දේවක නෙත් බරකර හිස වැනුවේය.

"හැමදාම සර්. අපිට තව මාසයක් තියෙන නිසා මම සීගිරි එක තවත් හොඳටම කරන්න සැළසුම් කරන්නම් සර්. සිංහල අවුරුද්දට සති තුනක් තියලා අපිට පටන් ගන්න පුළුවන්. ඒ අතර සර් මම බේකරි සෙක්ෂන් එකෙන් බටර් කේක් එකක් හදනවා සර්. අපිට මාකට් එකට සමහරවිට ඒක දාන්න පුළුවන් වෙයි. සීගිරි හෝම් මේඩ් බටර් කේක්. සීගිරි එක පටන් ගන්නකල් අපිට ඒකෙන් මේ

ළමයින්ගේ සැලරීස් එහෙම ගෙවන්න පුළුවන්. ආදායමක් නැති නිසා ඒක හොඳයි.”

මේ කොල්ලා සීගිරි එකට ආවේ කොහෙන්ද කියා මිලින්ද සිතුවේය.

“සීගිරි හෝම්මේඩ් බටර් කේක්. ෂෝක්නේ. අපි ඉතින් හැමදාම ඒක කරනවද?”

“කරමු සර්. ඒක එච්චර අමාරුදෙයක් නෙමේ. අපි ලංකාවේ රසම කේක් එක හදනවා කියලා හිතන්නකෝ.”

මිලින්ද නැඟිටවිත් දේවකගේ පිටට තට්ටු කළේය. දේවක නැඟිට්ටේය. සිරිත එයය. භාවනා සෙනෙහස ගලන දෑසින් බලාගෙන උන්නාය.

“ඔයා අපි ගාවට ආපු එකයි

පුදුම."

මිලින්ද කීවේය. 'ඒ ආපු එකා කවුද කියලා ඔයා දන්නවානම් තාත්තේ අද ඔයාගේ ඇස්වලත් කඳුළු' නේත්‍රාට කියන්නට සිතුණි. එහෙත් මේ එයට වෙලාව නොවේ. අමාරුම දේ සීගිරි එක බේරාග ැනීමය. ඉන්පසුව දේවක ගැන කියන්නට පුළුවන. කොහොමත් දැන් කියන්නට සිදුවෙනු ඇත.

"මේක අලුතින් පටන්ගන්නකොට ඔයා තමයි මේකේ අලුත් ජෙනරල් මැනේජර්. මේ කෙල්ලෝ දෙන්නා එක්ක මේක කරන්න ඕන ඔයා. ඒක මම ඔයාට අද පොරොන්දුවෙනවා"

මිලින්ද කීවේය.

"අපි මේක හදමු සර්."

දේවක කීවේය. වටින්නේ

තනතුරු නොවේ. බැඳීම්ය. ඔහු එය ඇදහුවේය. මේ පවුලත් සමඟ අතීත බැඳීමක් ඇත. එහෙත් දැන් යන්නේ අලුත් බැඳීමක් හදාගන්නටය.

"දැන්මම බෑන්ක් එකට කතාකරන්න ලොකු පුතේ. අදම එයාලා ඉල්ලන ඩොකියුමන්ට් බාරදෙන්න. අපි ලැබෙන දවසක් බලලා එයාලට කියමු සල්ලි ගන්න එදාට එන්න කියලා. කතාව ඉවරයිනේ"

"ඔව් සීයේ. මල්ලි කිව්වා වගේ එදා ඉඳලා සීගිරි එක අපේ."

"මම හරි බයෙන් හිටියේ මේක වහන්න වෙයි කියලා"

රඹුක්වැල්ල මහතා දුක්බරව කීවේය. සියල්ලෝම බලාගෙන උන්නේ ඔහු දෙසය.

අලුතින් නිමවූ සිගිරි එක වටා අද හතර පස් දෙනාම ඇවිද්දෝය.

“මේ ටික වෙන්කරලා තියෙන්නේ සර් වෙජිටබල් සෙක්ෂන් එකටමේ දවස් දෙක තුනේ මම අඩුම වියදමට ඒක හදන්නම්. ආයෙත් මට සල්ලි එපා සර්. එහෙම වියදමක් අපිට දරන්න බෑ. ලෝන් එකකටත් යන නිසා. වියදමක් නැතුව කරන්න පුළුවන් හැමදේම මම කරන්නම්.”

දේවක කීවේය. ප්‍රශ්නයක් කියන්නට පෙර ප්‍රශ්නය තේරුම් ගන්නා අය ව්‍යාපාරයකට මෙන්ම ජීවිතයටත් වටිනා අයය. මිලින්ද තනිවම ඒ බව සිතුවේය. ඔහුගේ සිතට යමක් ඉවෙන් මෙන් දැනෙයි. එහෙත් කිසිවකට කලබලවෙන්නට දෙයක් නැත.

"ලෝන් එක ලැබෙන දවස බලලා අපි ඕපන් කරන දවසක් ගැන හිතමු. එතකල් මේ වහලා තිබ්බා වගේම අපි සීගිරි එක වහලා තියමු"

"ඒත් තාත්තා අපි ඕපන් එක එයාලට කියනවා"

භාවනා කීවාය. මිලින්ද සිනාසුණේය.

"ඔව්. එයාලට එදාට හරියට දුක හිතෙයි."

ඒ බව මිලින්ද දැනගෙන උන්නේය. කොහොමත් දැන් සීගිරි එක ගැන ඔහුට බියක් නැත.

"මේක සර් අපි සාර්ථක කරගන්නනම් අපේම කියලා වතුර බෝතලයක් හදන්න ඕන. අපේම කියලා පහේ කුඩු පැකට් ටිකක් අපි හදන්න ඕන. ටික ටික ඒවට

පිටට යන සල්ලි අපි නවත්තගන්න ඕන. හැම මාසයකම අපි පොඩි ඉලක්කයක් හදාගන්න ඕන. එළියට යන චෙක්ස් පහක්වත් අපි හැම මාසයකම නවත්තගන්නවා කියලා. එහෙම වුනොත් සර්."

"අපිට ඉක්මනටම තවත් සීගිරි බ්‍රාන්ච් එකක් දාන්න පුළුවන්. නේද පුතා"

මිලින්ද කියද්දී දේවක සිනාබරව හිස වැනුවේය.

"ඒක ඉක්මනටම වෙයි සර්."

ඔහු පසුව කීවේය. මිලින්ද සීගිරි එකෙන් පිටවූයේ සැනසීමෙනි. ඔහු වාහනයේ සිටිද්දීම ඉඳුනිල්ට ඇමතුමක් ගත්තේය. ගෙන හැමදේම පැහැදුවේය.

"මට ඉන්දු මේ කොල්ලා ගැන

මහ පුදුම දෙයක් හිතෙනවනේ."

ඔහු කීවේය. ඉඳුනිල්ට පුදුමත් සිතුණි. බියක්ද දැනුණි.

"මොකක්ද"

"න්නෑ මේ අපේ පොඩි කෙල්ල මේ කොල්ලා ගැන."

මිලින්ද කියාගෙන ආවේය.

"නරක දෙයක් වෙන එකක් නෑනේ. අපි බලාගෙන ඉමුකෝ. අපේ බඩ්ඩත් එහෙම ලේසියෙන් ජීවිතයකට අත තියයි කියලා හිතනවද?"

"ඒකත් ඇත්ත. කොහොමත් මම කොල්ලට ආදරෙයි."

"ඒකව දැක්ක මුල්ම දවසේ මටත් හරි ආදරයක් ආවා. අනේ මන්ද මොකක්ද දැනෙනවා"

"එහෙම දැනෙනවද?"

"ඔව්."

"මටත් දැනෙනවා. කොහොමහරි දැන් සීගිරි එක අපේ වෙන්න යන්නේ ඉන්දු. දුවලා තුන්දෙනා ගැන බයක් නෑ."

"හවස එහෙනම් වේලාසන ගෙදර එන්න."

ඇය කීවාය. මිලින්ද සිනාසුණේය.

"අද සීගිරි එක පුරාම ඇවිද්දා. දැන් ආයෙත් ආසයි සීගිරි එකේ වැඩකරන්න. මට අද නංගිවත් මතක් වුණා. අපිත් සීගිරි එක මුලින්ම හැදුවේ මේ වගේ දුක් විඳලනේ"

"කෙල්ල නංගිගේ පුතා ගැන කියපු කතාව නේද?"

ඉඳුනිල් සිහිකළාය.

"මටත් පුදුමයි. මටත් නංගිගේ

කොල්ලව දකින්න ආසයි. දැන් ලොකු ඇතිනේ. මිහිරංගලාගේ වයසේ නේද"

"අනේ ඔව්මම පොඩි එකාව වඩාගෙනත් තියෙනවා"

ඉඳුනිල් කීවාය.

# 11

"එන්න"

භාවනා දේවක ළඟින් ඇවිදගෙන ආවේ රහසින් මෙන් එසේ කියාගෙනය. දේවක උන්නේ පරිගණකවලට අලුතින් සිස්ටම් එක ඇතුල්කරන තැනය. දේවක පොඩි එකෙක් අම්මාගේ පසුපස ඇවිදගෙන එන්නාක් මෙන් භාවනා පසුපස ආවාය.

"වෙලාව දෙකයි. බඩගිනියි.

කන්නේ නැද්ද?"

ඇය දොර ළඟදී ඇසුවාය.

"මං ගෙදරින් කෑම එක ගෙන්නගත්තා. අම්මා අද රසට හදලා එවලා. සොසේජසුත් බැදලා."

දේවක පොඩි දැරිවියක් දෙස බලාගෙන ඉන්නාක් බඳුව බලාගෙන උන්නාය. 'අනේ ඇයි එහෙම බලාගෙන ඉන්නේ' ඇය සිතුවාය.

"සොසේජස් කන්න ආසද?"

භාවනා තොල්පට තදකරගෙන සිනාසුනාය.

"සමහර දවස්වලට අප්පච්චියි මායි සොසේජස් තෙල් දාලා සම්බෝලයි බතුයි එක්ක කනවා. මරු කෑම."

"දවසක එන්නම් එහෙම කන්න. හදලා දෙන්න."

"සුද්දි එන දවසට එහෙම දෙනවද?"

"ඉතින් මං ආස දේනේ දෙන්නෝන"

"හදන්නම්."

ඔහු උගුරෙන් මෙන් කීවේය.

"අර තියෙනවයි කිව්ව ළිඳෙන් නාන්නත් ඕන."

"ෂෝක් වතුර ටික."

"ඇදගෙන නාලානම් නෑ"

ඇය සිනාසී කීවාය.

"ඇදගෙන නෑවාම තමයි සුද්දි නෑවා කියලා තේරෙන්නේ."

"ඉතින් මම."

"ළිඳ ළඟ වාඩිකරවලා ඕනනම් නාවන්න බැරියෑ."

"මා..ව"

"ම්."

"ශුව අයියේ."

"ශුව."

ඇය මවාගත්තාය. ඊටත් පසුව ඒ මවාගත් දේ සිතින් රස වින්ඳාය. වඩාත් ලස්සන එවිටය. භාවනා වතුර වීදුරුවක්ද අරගෙන මේසයට ආවාය. භාවනා බත් මුල දිගහැරියාය.

"මෙහෙම කමු. එන්නකෝ."

දෙදෙනා දෙපැත්තෙන් ළංවිය. ඔහු ළඟළඟට ඇයව බලාගත්තේය.

"ඇයි ම්."

"න්නෑ"

"කියන්න."

"හෙට අනිද්දා නුවර යන් සුද්දි"

"යන්කෝ. ඇයි ඒක හදිස්සියේ

මතක් වුනේ."

"න්නෑ. රෑට නිස්කලංකයේ කතාකරන්න පුළුවන්නේ."

"හෝටලේ. බැල්කනියේ නේද?"

"ම්. මොනවද කතාකරන්නේ"

"හදාගන්න ඕන"

ඇය සිනාසුනාය.

"එහෙම හදාගෙන කතාකරන්න ඕන නෑ. නිකං කියලා දාන්න"

"මොකක්ද"

"මං දන්නවයෑ. දැන් කිව්වේ මමයෑ"

"හා."

"මොනවද හා"

"එහෙම කියන්නම්"

ඇය පහත් වී මෙන් ඔහුගේ දෑස් දෙස බැලුවාය. ඔහුගේ මුහුණ ලැජ්

ජාවෙන් රතුව තිබුණි.

"ඉතින් ඒකට ඔච්චරම රතුවෙන්න ඕනයෑ. ලැජ්ජ හිතෙන දෙයක්ද කියන්න යන්නේ"

"වෙන්න ඇති."

ඇය මොහොතක් බලාගෙන උන්නාය.

"පව්."

ඇය කීවාය.

"ම්. මේ කට මගෙන්"

ඇය එය ඇනුවේ ඔහුටමය. මොකක්දෝ හේතුවක් නිසා භාවනාගේ දෑස් තෙත්වී කඳුළක් බත් එකට වැටුණි. දේවකගේ ළය ඇවිලිණ. ඒ කඳුළ බොහෝ දේ කීවේය. කඳුළක් කියන්නේ ජීවිතයක කතාවකි. එය කොහොමටවත් සාමාන්‍ය දෙයක් නොවේයැයි

ද්වකට සිතෙයි. ඔහු කඳුළු එපමණටම බරට දැක්කේය.

"ඒක රසයි සුද්දි."

"එහෙම තමා මම කවනකොට. අක්කත් කියනවා"

ඇය තොල්පට තදකරගෙන බොඳවූ දෑස් බරකළාය.

"ඇයි මේ."

ඔහු ඇසුවේය.

"දන්නෑ."

නැත. කෙල්ලෙක්ගේ ඇස්දෙකකින් වැටෙන හැම කඳුළක්ම නිකම් වැටෙන ඒවා නොවේ.

"අක්කයි මායි හවස එනවා හොඳේ."

"එහෙනම් මම ඉක්මනට යන්නෝන. අප්පච්චිටත් කියන්නෝන."

"එහෙම මොනවත් හදන්න එපා පව්නේ. මේ උණත් අරන් සනීපවුණා විතරයි"

"ආයේ උණ ගන්නේ නෑ."

"එහෙනම් ගත්තේ."

ඔහු කතාකළේ නැත.

"උණගත්ත හේතුව අයින් වෙලාද?"

"වෛරල් ෆ්ලූ එකක්නේ"

"වයිරල් එක මේ"

දොර කැරකැවෙන හඬ ඇසුනෙන් දෙදෙනාම කතාව නැවැත්තුවෝය. දේවක ගොස් දොර විවර කළේය. දොර අද්දර වූයේ නේත්‍රාය.

"දෙන්නත් එක්ක දොරත් වහගෙන."

ඇය මුව තදකරගෙන කීවාය. එහෙම කියූ විට තම සහෝදරියටනම්

අමුතු ලැජ්ජාවක් නැති බව නේත්‍රා අත්දැකීමෙන් දනී. එහෙත් කොල්ලාගේ මුහුණ රතුවෙන හැටි ඇය රස වින්ඳාය.

"මේ ලන්ච් ගත්තා අක්කේ."

දේවක දෙනෙත් බරකර කීවේය.

"ඒකට ඉතින් දොර වහගන්න ඕනයෑ"

දේවක ඉඳුල් අත සඟවාගෙන අනිත් අතින් හිස කැසුවේය. භාවනා අක්කාට රැව්වාය.

"හරි හරි. දෙන්නත් එක්කම කන්නකෝ එහෙනම්."

"අනේ අක්කේ එන්ඩයියෝ"

නේත්‍රා රෝද පුටුව කරකරවාගෙ නම ආවාය.

"බෑන්ක් එකට කතාකළා. එයාලා දෙයි බබා. හෙටම ගෙනත් ලෝන්

ඇප්ලිකේෂන් එක දෙන්න කිව්වා."

"මං කිව්වේ අක්කේ"

"ඒක කියලා යන්න ආවේ."

"අක්කත් බත් කටක් කමුකෝ. එන්නකෝ. සුද්දි මේ දැන් මට බත් කටක් කැව්වා මාර රසයි."

දේවක කීවේය. 'ගොන් හරකා. ඒක දැන් මොකටද මෙතන කිව්වේ.' භාවනා දෑස් වසන් කරගෙන සිතුවාය.

"මේ අපේ නංගි."

"ඔව් මේ."

"පුදුමයි. ඔය මං හිතන්නේ කොලු පරාණයකට බත් කටක් කැව්වමයි."

"අක්කා දන්නේ නෑනේ මං කවපු ඒවා. නමය වසරේ ඉඳලා මං කොල්ලන්ට බත් කවනවා. කොල්ලෝ කියලා කීදෙනෙක්ද? නම්වත්

මතක නෑ. ආ අන්තිමට කැව්වේ නයනජිත්ටනේ”

භාවනා බත් කටක් අනමින් කීවාය. දේවක සිනාසුනේය. ඇයගේ කතාව කවුරුවත් විශ්වාස කරන්නේ නැත. ‘නයනජිත්. කොහේ උන්න බයියෙක්ද අනේ ඒ’ පසුව භාවනා සිතුවාය.

“බත් කටක් දෙකක් කවලා ඊට පස්සේ පපුවලට ගින්දර දාන්න එපා බබා. කන්නකෝ. අපි හවස එනවා මල්ලී හොඳේ.”

නේත්‍රා කීවාය.

“මං අප්පච්චිට කියනවා අක්කේ. බත් කටක් කාලා යන්නම එන්න හොඳේ.”

“මී. ඔයාද ඉතින් උයන්නේ”

“හේරත් මාමත් එයි. නැතත්

ඉතින් අප්පච්චිටයි මටයි සීයකට හරි උයන්න පුළුවන්අක්කලා එන්නකෝ”

නේත්‍රා තවත් වතාවත් දේවක දෙස බලාගෙන උන්නාය. ආදරය පිරි ඇගේ දෑස් මේ මොහොතේදීත් තෙත්ව ඇත.

# 12

නාමල්ගමත් මිහිරංගත් හවස හතරට පමණ සීගිරි මහගෙදරට ආවෝය. දේවකත් ගිය නිසා භාවනාත් වේලාසනම ආවාය. නේත්‍රාත් භාවනාත් කතාවූයේ හවස හතට පමණ අතුරුගිරියේ යන්නටය.

"යන ගමන් කොල්ලුටයි බාප්පටයි මොනවාහරි අරන් යන්නෝන බබා"

"හා. අපි දෙන්නත් එක්කම ගිහින් ගමු."

භාවනා සිනාසී කීවාය. 'ලස්සන දෙයක් මුලින්ම දෙන්න හිතාගෙන ඉන්නවා. ඒක මගේ අතින්ම දවසක දෙනවා. අද ඕන නෑ.' ඇය සිතාගත්තාය.

මිහිරංගත් නාමල්ගමත් එද්දී රඹුක්වැල්ල මහතාත් නේත්‍රාත් භාවනාත් උන්නේ සාලයේ මැද පුටු සැටියට වී කට්ලට් කමිනි. ඉඳුනිල් අද කට්ලට් ටිකක් හැදුවේ නිකමටය. මිලින්දගේ ආසම කෑම කට්ලට්ය. ඔහු අද උඩ තට්ටුවට වී පොඩ්ඩක් ගන්නා බව ඇය අත්දැකීමෙන් දනී. කිසිම දවසක ඔහු තාත්තාට පේන්නට බොන්නේ නැත.

'මෙයාලා ඇයි මේ. තවත් ගිනිගෙඩියක් අරන් එනවද' භාවනා සිතුවාය.

"එන්න නාමල්ගම. ඉඳගන්න."

රඹුක්වැල්ල මහතා කතාකළේ තරහක් හිතේ තියාගෙන නොවේ. දැන් කොහොමටත් ඔහුගේ හිත නිදහස්ය. ඔහු පණ සේ ආදරය කළ සීගිරි එක බේරාගන්නට දැන් සැළසුමක් ඇත.

"පොඩි පුතේ මේ මහප්පටයි අයියටයිත් කට්ලට් ටිකක් ගේන්න."

රඹුක්වැල්ල මහතා කීවේය. 'කට්ලට් දෙන්නම දෙන්නා.' කෙල්ල ගියේ කේන්තියෙනි.

"දෙන්නත් එක්ක ඇවිත්. බෝලයක් බස්සන්න වෙන්න ඇති."

ඇය කුස්සියට ගොස් ඉඳුනිල්ට කීවාය.

"දැන් කතාවට යන්න එපා. හැම තිස්සෙම පොර පූසි වගේ කඩාගෙන පනින්න එපා. කට වහගෙන ඉන්න"

ඉඳුනිල් කීවාය. කෙල්ලට තරහ ආයේය.

"දැන් ඔයාටත් මාව පේන්නේ පොර පූසියෙක් වගේද?කියපු කැත ඒක."

"මට පේන්නේ ඔයාව පොර පූසියෙක් වගේ නෙමේ. හොර පූසියෙක් වගේ. කිසිම දෙයක් කියන්නේ නැතුව කරන හොර වැඩ මම දන්නේ නෑ කියලද හිතන්නේ."

ඉඳුනිල් කීවාය. භාවනා ගැස්සීමෙන් අම්මා දෙස බැලුවාය.

"මම මොනාදයියෝ හොර වැඩ කළේ."

"දැන් මේක ගිහින් දෙන්න"

භාවනාගේ හිතේ මහා බයක් නැත. 'අපි දෙන්නා ගැන ඉවෙන් වගේ දැනෙනවා ඇති. අම්මනේ' ඇය

සිතුවාය.

භාවනා දෙන්නාටම් සෝස්ද දමා කට්ලට් දෙක බැගින් දමා දුන්නාය. මිහිරංග කට්ලට් එක එක කටකට කෑවේය. 'කාපු කැත ඒක.' භාවනා සිතුවාය.

"ඉතින් නාමල්ගම. මොකක්හරි වැඩකටද ආවේ."

නාමල්ගම බැලුවේ මිහිරංග දෙසය.

"සීයා සීගිරි එකට මරු ඔෆර් එකක් තියෙනවා. අපි කතාකරපු ගාණටම වගේ. ඕනනම් වන් මිලියන් ටූ මිලියන් එහෙට මෙහෙට වෙයි. තාත්තා කතාකරන්නද කියලා අහන්න ආවේ"

රඹුක්වැල්ල මහතා පින් දුන්නේ දේවකටය. ඔහු අද හොඳ සැළසුමක්

නොකියන්නට මේ දේ පිළිගන්නට වෙන බව රඹුක්වැල්ල මහතා දැනගෙන උන්නේය.

"අපි සීගිරි එක"

භාවනා කියාගෙන එද්දී රඹුක්වැල්ල මහතා එය වැළැක්වූවේය.

"මාත් තැන් දෙකකට කතාකරගෙන යනවා නාමල්ගම. එයාලාගේ ඔෆර් එක අහලා මට කියන්නකෝ. අපි ඔෆර් එකක් දෙන්නේ නෑ. වැඩිම ඉල්ලුමට දෙනවා."

රඹුක්වැල්ල මහතා කීවේය. භාවනාගේ දෑස් විසල් විය. නේත්‍රා භාවනා දෙස බලා කතාකරන්න එපා යැයි නෙතින් කීවේය. සීයා කියපු දේ හරිය. කරන දෙයක් කළ යුත්තේ

මෙහෙමය.

"මේක බ්‍රෝකර් කෙනෙක් මාර්ග යෙන් කතාකරන්නේ. එයාලට සියයට දෙකක් දුන්නාම ඇති."

"සීයට දෙකක්"

"ඔව්"

"ඒ කියන්නේ ලක්ෂ දාහතරක්."

"බිස්නස් එක ගොඩක් ලොකුයිනේ සීයා. අපිට පාඩු නෑ. වැඩේ ෂුවර්නේ"

රඹුක්වැල්ල් මහතා කතාකළේ නැත.

"බලලා කියන්නකෝ. මාත් බලාගෙන යනවා මේ දවස්වල."

"අපි එහෙනම් කතාකරමු නේද තාත්තා. ඔෆර් එකක් දෙන්න කියමුකෝ"

නාමල්ගමත් මිහිරංගත් ගියේ මේ දැන් ඔෆර් එක කතාකරගන්නට

මෙන්ය.

"දෙන්නගේ ප්ලෑන් එක ඒකෙනුත් ගාණක් තියාගන්න. මරු තාත්තයි පුතයි."

රඹුක්වැල්ල මහතා කීවේය.

"ඒත් සීයා එයාලා"

"එයාලට එහෙම හිතාගන්න දෙන්න. අපි කරන වැඩේ එයාලට වැඩක් නෑ. එයාලට ඕන සල්ලිනේ. අපි ඒක දෙමු. එච්චරයි. දැන් ගාණත් කියයිනේ. එතකොට තවත් ලේසියි වැඩේ. නැත්නම් පස්සේ කියයි මීට වඩා අපිට ලැබෙන්න තිබුණා කියලා. මෙහෙම වුණාම ඒක කියන්න බෑ"

භාවනා සිනාසුනාය.

"ඔයාගෙත් මොළේ තමයි මොළේ."

භාවනා කට්ලට් කෑල්ලක් සීයාට කවමින් කීවාය.

"තමන්ගේ අම්මව විකුණාන්නත් බයර් කෙනෙක්ව හොයයි මේ තාත්තයි පුතයි. ලැජ්ජයි සීගිරි පවුලේ කියන්න. අර පිට කොල්ලට මුන්ට වඩා කැක්කුමයි"

රඹුක්වැල්ල මහතා කීවේය. භාවනා හදපිරි සතුටින් සිනාසුනාය. ඔහු ගැන මේ දවස් ටිකට අහන්නට වෙන්නේම හොඳය. 'නරකක් ඇත්තෙම නැද්ද එයාගේ. මං හොයාගන්නම්කෝ දවසක. ළඟින් ඉන්නකොට වැරදි පේන්න ගනී. එදාට ඉතින්.' භාවනා තමාටම සිනාසුනාය. භාවනා තනිවම සිනාසෙන්නේ දේවකව සිහිවී බව නේත්‍රා දනී. කෙල්ලගේ ජීවිතයට ලැබෙන්නට යන්නේ ලැබිය යුතු හොඳම කෙනා යැයි ඇයට සිතෙයි. 'ඇස්වහක් කටවහක්නම් වදින්න එපා.' නේත්‍රා

පැතුවාය.

*** *** *** *** ***

දේවක වේලාසනින්ම අප්පච්චි ඉන්නා වැඩබිමට ගියේය. දෙහිවල නගර මාධ්‍යයේ ඉදිරිකරගෙන යන අලුත්ම තට්ටු නිවාස සංකීර්ණයක වැඩ බැලීමට ඔහු ගොස් උන්නේය. ජීවන් කැපවීමෙන් ඉදිරිකිරීමේ සමාගම වෙනුවෙන් වැඩකළේ රැ කියාවේ උසස්වීමක් ලැබුණොත් එය කොල්ලාගේ අනාගතයට හොඳ නිසාය.

ගිය සතියේ සිට ජීවන්ට ආයතනයෙන් වෑන් රියක් පාවිච්චියට ලැබුණි. එය දුන් ආයතනයට ඔහු කළ හැකි හැම අයුරකින්ම

කැපවී සේවය කළේය. දේවක ත්‍රී වීලරයෙන් බැස වැඩබිම් කාර්යාලයට දුවගෙන ආවේය. ජීවන් උන්නේ ඉංජිනේරුවරයෙක් සමඟ කතාබහකය. ඔහු එය ඉක්මනින් අවසන් කර වැඩබිමේ වැඩකරද්දී පළඳින කහ පැහැගත් සේෆ්ටි හෙල්මටය ගලවමින්ම දුවගෙන ආවේය.

"පුංචි මහත්තයෝ. ඇයි."

"නෑ අප්පච්චි මුකුත් අවුලක් නෑ. අද ටිකක් වේලාසන ආවා. නිකමට හිතුණා මේ පැත්තේ ඇවිත් අප්පච්චි එක්කම යන්න"

ජීවන්ගේ ඇඟට ලේ ටිකක් ඉනුවේ එවිටය. කොල්ලා ඉන්නේ අවධානම් තැනකය. මෙහෙම උන්නද ඔහු කොල්ලාව සීගිරි එකට යවා ඉන්නේ

ගින්දරෙනි.

"අද ටිකක් වේලාසන යන්න ඕන අප්පච්චි. වේලාසන යන්න අමාරුවෙයිද?"

"ඉන්න පුංචි මහත්තයෝ ටිකක්. මං ලොග් ෂිට් දෙකක් තියෙනවා. දාලා එන්නම්. උඩට යන්න ආසයි නේ. ගිහින් බලමු."

"වෙන දවසක අප්පච්චි. අද බෑ."

ජීවන් ඉක්මනින්ම වෑන් රිය ගෙන ආවේය.

"අප්පච්චි බහින්නකෝ. මං වෑන් එක අරන් යන්නම්"

ජීවන් එයට ආසය. කොල්ලා පදවන වාහනයක ඉදිරිපස අසුනකට වී යන්නට ඔහුද ආසය.

"එන්නකෝ එහෙනම්. අද ට්‍රැෆික් එකත් නැති එකේ."

දේවක ඉදිරිපස අසුනේ සිටම වෑන් රියේ රියදුරු අසුනට පැන්නේය.

"ෂා. පවර් ස්ටියරින්. ඔටෝ ගියර්. මේවනේ බඩු අප්පච්චි."

"හිම්හිට යන්."

ඒත් අද හිම්හිට යා නොහැක. හත අට වෙද්දී කෙල්ලෝ දෙන්නා එයි.

"අප්පච්චි"

"පුංචි මහත්තයෝ"

"පොඩ්ඩක් මේ අයිනෙන් නවත්තනවා. පොඩ්ඩි කතාවක් කියන්න තියෙනවා."

ජීවන් බැලුවේය. කොල්ලා එද්දීම ඔහුට එය දැනුණි.

"අද අප්පච්චි සුද්දි ඉන්නේ"

දේවක සියල්ලම කීවේය. මේ දේ කවදාක හෝ වෙන බව ජීවන් දැනගෙන උන්නේය.

"කෙල්ලෝ දෙන්නා විතරද දන්නේ පුංචි මහත්තයෝ"

"ඔව් අප්පච්චි. ඒකත් වෙන්නේ නෑ. ඊයේ එයා මගේ අල්මාරිය ඇරලා."

කොල්ලා එහි අම්මාගේ පින්තූරයක් ගසාගෙන උන්නේය. ජීවන්ද එය දැක ඇත.

"අක්කා මාව බදාගෙන ඇඬුවා. ඒක නෙමේ අප්පච්චි වැඩේ."

"එහෙනම් පුතේ."

"අද උදේ අප්පච්චි. සීගිරි ෆැමිලි එකම එකතුවෙලා. සීයා මාමා පුංචිලා ලොකු අම්මලා සේරම."

ජීවන් සියල්ලන්ගේම මුහුණු සිහිකළේය.

"සීගිරි එකේ අයිතිය වෙනුවෙන් කෑගහලා තියෙන්නේ. එයාලට

ප්‍රශ්නයක් වෙලා තියෙන්නේ මාව අප්පච්චි. මං මෙතන අලුතින් කරගෙන යන වැඩේ.”

“තේරෙනවා පුතේ. ඉතින්”

“අන්තිමට සීයා කියලා සීගිරි එක මෙහෙම කරගෙන යන්න බෑ ඒක විකුණලා බෙදනවා කියලා. ඒත් මාමලට පුංචිලට ලොකු අම්මලට බෙදන්නේ නෑ කියලා”

“එහෙනම්”

“එයාලගේ දරුවන්ට බෙදනවා කියලා තියෙන්නේ. ඒ කියන්නේ නේත්‍රා අක්කට භාවනාට තාරකාට මිහිරංගට මලීෂට කෝසළට. හරියටම හයකට.”

ජීවන්ගේ පපුව දාගෙන ගියේය. සීගිරි එක හදපු තුන්දෙනාගෙන් එක්කෙනෙක් වූයේ තම මියගිය බිරිඳය. එදවස කවුරුවත් ඒවා

කරන්නට ආවේ නැත. මැරුණේ රඹුක්වැල්ල මහතාත් මිලින්දත් තම බිරිඳත්ය. එහෙම දුක් විඳ සීගිරි එක හැදූ ගෑනිගේ පුතාට සීගිරි එකේ අයිතියක් නැත. ජීවන්ට දුක සිතුණි.

"ඒක හැදුනේ සීයයි මිලින්දයි ඔයාගේ අම්මයි. හරිනම්"

ජීවන් කියන්නට ගිය දේ ගිලගත්තේය.

"ඒත් එයාලා කියලා තියෙන්නේ ඒක හයකට බෙදනවා කියලා. ඒ කියන්නේ අප්පච්චි ගණන් බැලුවාම එක දරුවෙක්ට ලක්ෂ අසූවක්. සීයා සියයට තිහක් තියාගෙන. අනිත් ටික හයට බෙදනවා"

ජීවන් දේවක දෙස දුක්බරව බලාගෙන උන්නේය.

"ඒක හරි අසාධාරණයි පුතේ.

හරිම අසාධාරණයි"

ජීවන් වේදනාවෙන් කීවේය. දෙයක් ලැබෙනවානම් ලැබිය යුත්තේ සීගිරි එක දුක් විඳ හැදූ දෙදෙනාගේ දරුවන්ටය.

"ඒක අසාධාරණයි තමයි අප්පච්චි. ඒත් එයාලට මං කියලා කෙනෙක් ඉන්නවා කියලා මතක නෑනේ."

"ඔව්."

"ඒත් එයා අප්පච්චි"

"කවුද"

"සුද්දි අප්පච්චි. අපේ භාවනා. ඒ අවුරුදු විසි ගාණකට කලින් මැරුණ පොඩි නැන්දා වෙනුවෙන් එයාගේ පුතා වෙනුවෙන් කතාකළා. මේ."

දේවක භාවනා වාදනය කළ ඒ මොහොතේ වූ කතාව ජීවන්ට අසන්නට සැළැස්සුවේය.

"ඉතුරු මුදල අපි හයට බෙදමු. නේත්‍රාටයි භාවනාටයි තාරකාටයි මිලින්දටයි මලීෂාටයි කෝසලටයි."

"සීයා."

භාවනාගේ කටහඬ ජීවන් ඇඳින ගත්තේය.

"කියන්න පුතේ. ඇයි ඔයාට ප්‍රශ්නයක්ද?"

"නෑ සීයා. සීයා කරන දේ කරන්න. ඒත් හයට බෙදන්න බෑ."

ජීවන්ට පුදුම සිතුණි.

"ඇයි"

"ඒක සීයා හතට බෙදන්න ඕන."

"ඇයි මැණික හතට"

"දරුවෝ හත්දෙනෙක් ඉන්නවා සීයා. සීයට මතක නැතිවෙලා. නැත්නම් හිතාමතා මතක නැතිකරලා. ඒක සාධාරණ නෑ"

ඊයේ තමාට වැඳ ගිය දරුවාව ජීවන්ට සිහිවිය.

"මෙතන කොහෙද හතක් භාවනා"

සුරංගි කේන්තියෙන් අසන හැටි ජීවන් අසාගෙන උන්නේය. ඇය වෙනස් වී නැත. එදා සිටි කුහක ගෑණිමය.

"ඉන්න නැන්දා"

"මේ පොඩි නැන්දා. සීගිරි එක හැදුවේ එයයි සීයයි තාත්තයි කියලා මේ දැනුත් තාත්තා කිව්වා. ඉතින් මේ පොඩි නැන්දට පුතෙක් උන්නනේ. ඇයි එයා සීයගේ මුණුපුරෙක් නෙමේද?"

"මෙතන දෑහටවත් දැක්කේ නැති උන් ගැන කතාකරන්නේ මොකද භාවනා."

සුරංගි අසන හඬ ඇසී ජීවන්ගේ

හදවත ඇවිලිණා.

"කෙනෙක් දෑහට දැක්කේ නෑ කියලා අයිතිය නැතිවෙන්නේ නෑනේ නැන්දා. සීයගේ අතින් දෙවෙනි පාරටත් පවක් වෙන්න බෑ. එහෙම නේද? දවසක ඔයා නැන්දිව මේ ගෙදරින් අයින් කළා. ඔයා ජීවිතේම ඒ ගැන පසුතැවෙනවා. ඒ පසුතැවීම ආයෙත් හදාගන්න එපා. දවසක තමන්ගේ හිතට දුකක් නැතිව හිතන්න පුළුවන් තීරණයක් ගන්න සීයා."

ජීවන්ගේ දෑස් තෙත්විය. 'අනේ ඔයා එහෙම කතාකළානේ පුතේ'

"කෙල්ල කියන්නේ ඇත්ත සීයා. ඒ මල්ලිත් දැන් මිහිරංගගේ වයසෙම ඇති. කොහේහරි ඇති. ඒක දෙන නොදෙන එක සීයගේ වැඩක්. ඒත් ඒ මල්ලිටත් කොටසක් යන්න ඕන.

එකෙන් අපිට පාඩුයි. මගේ කොටසක් අඩුවෙනවා කියන්නකෝ. ඒත් සාධාරණ නෑ. මේක හැදුවේ නැන්දියි සීයයි තාත්තයි. එහෙම දුක් වින්ද ගෑණිගේ දරුවට අරම අසාධාරණයක් කළොත් සීයේ අපිට හරියන එකක් නෑ."

මේ කතාකරන්නේ නේත්‍රා බව ජීවන් ඇඳිනගත්තේය. 'ඔයා එදත් එහෙමයි ලොකු පුතේ. මගෙයි නැන්දගෙයි පැත්තේ'

"ඒක අයින්කරලා තියන්න තාත්තේ. නංගි වෙනුවෙන්. තාත්තා මොනවාවත් දුන්නෙම නැත්තේ කෙල්ලටයි. වෙඩින් එකක් ගත්තද? කර මාලයක් අරන් දුන්නද? අඩුම ගානේ යනකොට මේක තියාගනින් කියලා රුපියල් දාහක් දුන්නද?නෑ.

ඒකි ගියා. ඇඳුම් දෙක තුනක් අරන් ජීවන් අයියා එක්ක ගියේ. අපි පහුගිය අවුරුදු විස්ස පුරාම මේ සීගිරි එකෙන් කෑවා බිව්වා. මේ දෙන්නගේ වෙඩින් කළා. හැමදේම කළා. දරුවන්ට වාහන අරන් දුන්නා. එයාලව හොඳම ඉස්කෝලවලට යවලා ඉගැන්නුවා. ඒවා කලේ සීගිරි එකේ සල්ලිවලින්. ඔයා දුන්නේ. ඒත් නංගිගේ දරුවට එක පැන්සලක් අරන් දීලා නෑ. එහෙම නේද. ඔයාගේ එක මුණුපුරෙක් මොන දුකක් වින්ඳද කියලා අපි දන්නවද"

මිලින්ද කියද්දී ජීවන්ට ඉකිබිඳුම් එන්නට මෙන් ආවේය. 'ඔයා එහෙනම් එහෙම කිව්වා මල්ලී. ගොඩක් පින්. උඹයි උඹේ කෙල්ලෝ ටිකයි ඉඳුනිල් නංගියි පුදුමයි.' ජීවන් හදවතින්ම ඒ පවුලට නමස්කාර කළේය.

"ඇත්ත. එදා පුතේ මට මේක කියලා දෙන්න කෙනෙක් උන්නේ නෑවීකී ගියා තමයි. අපි එයාගේ කොටස අයින් කරලා තියමුදවසක එයි."

මේ කතාව කීවේ රඹුක්වැල්ල මහතා බව ජීවන් හොඳින් හඳුනාගත්තේය. 'ඔයා ඒ ටික කිව්ව එකම ඇති තාත්තේවෙන මොනවත්ම එපාමට ඒ ඇති' ජීවන් දෑස් පිසදාගත්තේය.

"අප්පච්චි."

"කෙල්ල පව්. ඔයා වෙනුවෙන් කතාකළානේ. එහෙම කවුරුවත් කතාකරන්නේ නෑ පුතේ"

"මං ඒක දන්නවා අප්පච්චි. එයා හරි පුදුම කෙනෙක්."

"ඒ පවුලම එහෙමයි. ඔයාගේ

අම්මත් එයාගේ අයියට නෑනට කෙල්ලෝ තුන්දෙනාට හරිම ආදරෙයි"

"අද අක්කයි සුද්දියි එනවා අප්පච්චි. අක්කට එයාගේ බාප්පව ඉඹින්න ඕනලු. ඉතින් මම කොහොමද එන්න එපා කියන්නේ."

"ඔව් අපි යන්. අපි වෙනුවෙන් කතාකරපු කෙල්ලෝ දෙන්නා"

ජීවන් තවත් වතාවක් දෑස් පිසදාගත්තේය.

"හේරත් මාමත් ආවා හවස. අපි බඩු ටිකක් අරන් යන්. පොඩි කෙල්ල මොනවද කන්න ආස"

"සොසේජස්. චිප්ස්. කරවල තෙල්දාලා. පොල් සම්බෝල. අඹ අච්චාරු. ඕවා තමයි"

ජීවන් කරුණාවෙන් බැලුවේය.

"අපි සොසේජස් ටිකකුත් අරන්

යන්"

ජීවන් දයාබරව කීවේය. 'මට හරි ඉක්මනටම ඔයා කතාකරයි මිලින්ද? මම ජීවන් කියලා දැනගෙන නෙමේ. මේ කොල්ලගෙයි කෙල්ලගෙයි ප්‍රශ්නෙට. මටත් කරන්න දෙයක් නෑ මල්ලී.' ජීවන් සිතින් කීවේ මිලින්දටය.

# 13

භාවනා දම් පාට සායට සුදු මල් විසිර ගිය සිල්ක් බ්ලවුසය අතට ගෙන ඒකට ඩෙනිම් ජීන්ස් එක අඳිනවාද නැත්නම් දම් පැහැගත් සාය අඳිනවාද කියා තුන්වරක්ම සිතුවාය.

"මේ ගමන හරි සුබ ගමනක් වෙයි කියලා හිතෙනවා. එහෙම ගමනකට ජීන්ස් ගහගෙන යන්න හොඳ නෑ. අප්පච්චිත් බලයි ඒ පාර"

මේතරම් හිතන්නේ හිතෙන්නේ ඇයිදැයි භාවනා දන්නේ නැත. ඒත් හිත තියෙන්නේ මේ ලෝකයේ නොවේ. වෙනත් ග්‍රහලොවකය.

"අක්කයි නංගියි අද මේ කොහේ යන්නද? ලස්සනට ඇඳගෙන"

ඉඳුනිල් ඇසුවාය. දෙන්නා අද එළියට යන බව වේලාසනම කීවෝය.

"අපි යනවා ෂෝයි කොල්ලෙක් බලාන්ඩ. නිකමට හිතෙන්නේ නැද්ද අනේ. පෙම් පාටට යනකොට සරුංගල් දෙකක් වගේ"

භාවනා කීවාය. ඉඳුනිල් මුව තදකරගෙන නේත්‍රා දෙස බැලුවාය.

"පේනවා ඒක. තාත්තා අහපු කාලෙකට ඔහොමම කතාව කියන්න තියෙන්නේ හොඳේ. මට කියාගෙන එන්න එපා"

භාවනා ගොස් අම්මාව වැළඳගත්තාය.

"සූ සූ. එහෙම කියන්න එපා මිසිස් රඹුක්වැල්ල. ඔයා ඉතින් අපේ ඉඳුනිලනේ. තාම එහෙම ස්ටෝරියක් කියන්න තරම් දෙයක් නෑනේ අනේ. කතාවක්නම් ඒකට පොඩි තිර රචනාවක් තියෙන්න එපැයි"

"ආ ඇත්තද? කමින් කෑලිනම් අපි දකිනවා."

"මළා. මොනවද ඔයා දැක්කේ."

ඉඳුනිල් භාවනාගේ පිටට ගැසුවාය.

"කන්න එන්නේ නෑ"

"නෑ අම්මා. අපි කාලා එන්නම්."

"හෙට කොහේවත් යන්න දාගන්න එපා. කට්ටියම ගෙදර ඉන්නෝන"

"හරි. අපි දන්නවා ඔයා අපේ

තාත්තට මායම් දාලා දැලේ දාගෙන අවුරුදු තිහයි කියලා. ඔයත් හොඳ නල්ල මගේ ඉඳුනිල නේනේද"

ඉඳුනිල් යළිත් කෙල්ලට ගැසුවාය. ඇය ඉන්නේ සතුටිනි. මේ කියවන්නේ ඒකය. ඉඳුනිල් ඒවා දනී.

හෙට මිලින්දගේත් ඉඳුනිල්ගේත් තිස්වෙනි විවාහ සංවත්සරය.

"හෙට අපි ඔක්කොම යන්කෝ කොහේහරි. මේ ගෙදර කෑම කාලා එපාවෙලා අනේ. ඉන්නකෝ මං තාත්තට කියන්න"

"අපි තාත්තට කියමු බබා"

"බැඳලා අවුරුදු තිහක් කියලා කියන්නත් බෑනේ. තාම නිව්ලි මැරීඩ් කපල් එකනේ මේ."

ඉඳුනිල් සිනාසුනේ ලැජ්ජාවෙනි. භාවනා නේත්‍රාගේ රෝද පුටුව

කරකවාගෙනම මිදුලට ආවාය. වාහනයට නඟින්ට පෙර ඇය දුවගෙ ාස් බුදු පහනට වැන්́.දාය. අද දවස විශේෂය.

ෆැෂන් කලෙක්ෂන් එකෙන් ඇඳුම් තේරුවේ භාවනාය. නේත්‍රා වාහනයටම වී උන්නාය.

"බාප්පට ෂර්ට් දෙකයි කොල්ලට ෂර්ට් දෙකයි. එහෙම හොඳයිනේ බබා නේද?"

භාවනා සිනාසුනාය.

"මං තෝරගෙන එන්නම්."

ඔහු වෙනුවෙන් මීටත් වඩා ලස්සන දෙයක් දියයුතුය. එහෙත් එය දිය යුත්තේ අද නොවේ. දවසක ඔහු ළඟටම වී කතාවක් කියූ පසුවය. භාවනා මුළින්ම කමිස දෙක තේරුවේ ජීවන්ටය. ඇය අමාරුවේ වැටුණේ

දේවකට කමිස තෝරද්දීය.

"ඔයාට මේ ලා පාට කමිස ලස්සනයි. ගින්දර පාට ඔයා අඳින්නේ නෑ. වයිට් බැක්ග්‍රවුන්ඩ් එකේ ලයිට් පර්පල් ස්ට්‍රිප්ස් ගිහින්. නියමයි. මේකත් හොඳයි."

භාවනා ඉක්මනින් ඇඳුම් ටිකට මුදල් ගෙවා ආවාය. නේත්‍රා බෑග් දෙක ගෙන බැලුවාය.

"හොඳට තෝරලනේ."

"මගේ තේරීම් හොඳයිනේ නේද අක්කා"

"සුපර්"

නේත්‍රා සිනාසී කීවාය. කොහොමත් ඇගේ හැම තේරීමක්ම ලස්සනය. පිළිවෙලය. නේත්‍රා අක්කා කෙනෙක් ලෙස ඒ ගැන සතුටු වූවාය. හැම කෙල්ලෙක්ගේම තේරීම් එහෙම

ලස්සන නැත. පිළිවෙළ නැත. මොනවා ලස්සන වුවත් වැඩක් නැත. කෙල්ලෙක් තමාගේ ජීවන සහකරුවා තෝරාගනිද්දී ලස්සන විය යුතුය.

දේවක කතාකළේ භාවනාගේ දුරකථනයටය.

"මේ මඟ අයියේ."

"නිකං බැලුවේ සුද්දි."

"මොනවද කරන්නේ."

ඇය ඇසුවාය.

"බබෙක් අපේ ගෙදර එනවා කියලා තියෙනවා. මේ සොසේජස් ඩෙවල් දානවා."

"හානේ"

භාවනා ලැජ්ජාවෙන් කීවාය.

"එහෙම රහයි නේ."

"බලන්නකෝ ආවාම කාලා. මං ඩෙවල් එක්ස්පර්ට්."

"රසට දාන්න. නැත්නම් මම ඔයාව ඩෙවල් දානවා."

දේවකගේ සිනාසුනේය. භාවනා තොල්පට තදකරගත්තාය. නේත්‍රා ඇන්නේ රියදුරු අසාගෙන උන් නිසාය.

"එනකොට මොනවාහරි ගේන්නෝනද අයියේ."

"ම්"

දේවක කල්පනා කරමින් මෙන් කීවේය.

"මේ මඟින් එහෙනම් ගොරකා කිලෝ එකක් ගේන්නකෝ."

"ෂටප් මෝඩයා. ගොරකා කිලෝ එකක් මොකටද? මාව තම්බන්න ගොරකා කිලෝ එකක් මදි."

ඇය අතින් කට වසාගෙනම කීවාය.

"ඉක්මනට එන්නකෝ"

"ම්."

භාවනා දුරකථනය තබා නේත්‍රා දෙස බැලුවේ සැනසීමෙනි.

"සොසේජස් ඩෙවල් දානවලු."

"ආසයි කියලා කිව්වද"

"ම්. කියලා තියෙන්ඩෙපැයි. එතකොට ලේසියි."

දවසකටවත් කෙල්ල භාවනායැයි නේත්‍රාට සිතුණි. ජීවත්විය යුත්තේ එහෙමය. සරලවය. ඒ අතින් තම නංගීගේ ජීවන කල්පනා හරිය.

"ලබන සතියේ පේරාදෙණියේ යන්න පුළුවන් අක්කා. වෙද මහත්තයාගේ ගෙදර මළ ගේ ඉවරයිනේනේද?"

"මේ වැඩ අස්සේ බබා."

භාවනා සුරත තැබුවේ භාවනාගේ

දෙපා මතය.

"අපි දැන් ඉක්මනට සීගිරි එක ඕපන් කරන්නේ නෑනේ. ටික දවසක් ඉන්නවනේ අක්කා."

එහෙම කරන එක හොඳය. බලපෑම් කරන්නට කිසිවෙක් නැති සීගිරි එකක වැඩකරන්නට භාවනාද අසාවෙන් උන්නාය.

"ම්."

හැමදේම සිදුවූයේ හොඳටයැයි දැන් නේත්‍රාටත් සිතෙයි. සිදුවූ හොඳම දේ දේවක සීගිරි එකට පැමිණීමද? සමහරවිට එය වන්නට ඇත. මේ සියල්ල වෙනස් වූයේ ඉන් පසුවය. 'ඒක හරි බලගතු සම්ප්‍රාප්තියක් වෙන්න ඇති. කොල්ලා ආවේ පොඩි නැන්දිගේ ආත්මෙත් අරන්. ඉතින් කොහොමද වරදින්නේ.'

අම්මාටත් තාත්තාටත් සීයාටත් මේ කතාව කියන දවස පුදුමම දවසක් වෙනු ඇත. එයට තව ටික දවසක් ඉවසන්නට සිදුවෙයි. එසේ කරන්නට වෙන්නේ කෙල්ලගේ ජීවිතයත් සමඟ මේ කතාව දැන් බැඳී ඇති නිසාය.

# 14

"මේකනේ පේස්ට් එක හේරත් මාමා. පාන් කාලක් මැදට දාගත්තා නම් මරුනේ."

දේවක හේරත් විසින් මාළු මිරිස්වලට පුරවන්නට හැදූ සැමන් පේස්ට් එකෙන් ටිකක් කා කීවේය.

"මේක පුංචි මහත්තයා මගේ අම්මගෙන් මම ඉගෙනගත්තේ. එයා සිංහල අවුරුද්දට මෙහෙම හදනවා. පළාතම සුවඳයි."

"වෙලාවක ඔයාගෙන් ඉගෙන ගන්න ඕන."

ජීවන් ආවේ ඇඟත් සෝදාගෙන අලුත් සරමක් ඇඳගෙනය. අප්පච්චී අද ලස්සනයැයි දේවකට සිතුණි. කොහොමත් ඔහු රැවුළ බාගෙට කැපූ විට ලස්සනය.

"දැන් ගිහින් වොෂ් එකක් දාගන්න පුංචි මහත්තයෝ."

"හේරත් මාමට සපෝට් එකක් දුන්නා අප්පච්චී. මරු කුක්නේ හේරත් මාමා"

"මල්වතු පන්සලට දානේ ඉව්ව පරම්පරාවේ අත්නේ පුංචි මහත්තයෝ. ඉතින් රස නොවී තියෙයිද"

ජීවන් කීවේය.

දේවක කාමරයට ගොස් අල්මාරිය

විවර කළේ ඇඳුමක් ගන්නටය. එහි දොර පවුලේ වූ භාවනාගේ රූපය දෙස ඔහු මොහොතක් බලාගෙන උන්නේය.

"මෙතන පුටුවක් තියාගෙන බලාගෙනම ඉන්න හිතෙනවා. අනේ ඉතින් එහෙම හිතපු මාව දවසක්ම ඔයා ඔඩොක්කුවේ තියාගෙන උන්නලුනේ. එක තත්පරයකට සිහිය ආවේ නෑනේ."

ඒ මොහොත යන්තමට හෝ සිහියේ තිබුණානම් කොතරම් සුන්දරද කියා ඔහුට දැන් සිතෙයි. එහෙත් කිසිවක් ඔහු දන්නේ නැත. දෙවියන් සමහරවිට එහෙමය. සමහර දේවල් ට්‍රයි කර බලන්නේ කිසිවෙක්ට නොකියාය.

"අඳිනවා මාත් සරමක්. කොට

කලිසම් ගහගෙන ඉන්න බෑ සුද්දියේ ඔයා එනකොට. ඒක හොඳ නෑ."

දේවක අතට ගත්තේ නිල් පාට සරමය. පසුව ඔහු සුදු පැහැයට හුරු ක්‍රීම් පැහැයේ කමිසයත් අතට ගත්තේය.

"අපි අතුරුගිරිය හන්දියේ."

භාවනා කෙටි පණිවිඩයක් එවා තිබුණි.

"වැස්සත් අරගෙනම එන්න සුද්දි."

ඔහු ටයිප්කර යැව්වේය.

"ඇයි ගොරකා එපාද පිස්සෝ."

ඇය අසා එව්වාය. දේවක සිනාබරවම දුරකථනයෙන් ටයිප් කරමින්ම ළිඳ ළඟට ගියේය.

"ගොරකා එපා සියඹලා තිබුණා"

දේවක ඉක්මනනින් ටයිප් කළේය. අද ඇඟ සෝදාගන්නට ලැබෙන්නේ

නැත.

"එච්චර ඇඹුලටද උයන්නේ"

"ඇඹුලට හොඳයි. කොහොමත් ඇඹුල්නේ"

"මොනවද?"

"ඉක්මනට එන්නමම මේ ළිඟ ළඟ."

දේවක එසේ යවා කොට කළිසම පිටින්ම ඇඟ සෝදන්නට ගත්තේය. යන්තම් වැහි කළුවක් එන ලකුණු අහස පුරා විය. වහිනවානම් වැහපුදෙන් කියා ඔහු සිතුවේය. සුබ දවස්වල කොහොමත් වැස්සය.

නිල් සහ ක්‍රීම් පැහැගත් සරමත් ඇඳගෙන ගඩොල් බිත්ති අතරින් නිවසට ආ කොල්ලා දෙස ජීවන් මොහොතක් බලාගෙන උන්නේය. අද පමණක් නොව අදින් අවුරුදු

විසි ගණනකට පෙරත් ඔහු මෙසේම කොල්ලා දෙස බලාගෙන හදවතින් සතුටු වූවේය. අම්මාත් නැතුව ඔහුව හදන්නට විඳි දුක් සේරම ඒ ඇස්වල තිබුණි. 'ජීවිතේ හරි පුදුමයි සුදු නෝනා' ජීවන් රහසින් කීවේ තම මියගිය බිරිඳටය. ඇය කොහේ හෝ සිට මේ සියල්ල දෙස බලාගෙන ඇතැයි ඔහුට දැනුත් සිතෙයි.

"ආ අප්පච්චි ලයිට් එකක් දැම්මද මෙතනට."

දැන් මුළු සාල කෑල්ලම වෙනදාට වඩා එළියය. එහෙම එළියට තියෙද්දී ගඩොල් බිත්තවලින් පමණක් වටවූ නිවසේ සාලය වෙනදාටත් වඩා හැඩය.

"මං ගෙනල්ලා තිබුණේ. මතක්වෙලා දැම්මා"

"අපිත් අප්පච්චි හිමිහිට අලුත් ගඩොල් බිත්ති ටිකක් බැඳන් යන්නෝන නේද?"

දේවකගේ හිතේ එහෙම ආසාවක් ඇත.

"හදමු පුංචි මහත්තයෝ. බැරිවෙන එකක් නෑ"

"නුවර ඉඩම දීගත්තොත් පුළුවන් නේද අප්පච්චි."

"ඒ ඉඩම වටිනවා පුංචි මහත්තයෝ."

දේවක ගඩොල් බිත්තියට බරවූවේය. යන්තමට පොදයක් වැටෙයි. හදවතට අද කවදාවත් නැති සැනසීමක් දැනෙයි. ඒ සැනසීමේ කෙළවරක උන්නේ භාවනා බව දේවක හ. දුනාගත්තාය. 'කොහොමත් ඔයා මගේ ජීවිතයට හරි ලස්සන

උත්සවශ්‍රීයක් ගෙනාවා. ඔයා තමයි උත්සවේ. මගේ කානිවල් එක' දේවක හිතින් කීවේය.

ඒත් සමඟම වත්තේ ඇරුණු පාරෙන් වාහනය නිවසට දැමිණ. දේවක අප්පච්චී දෙස බැලුවේය.

"අප්පච්චී ඉන්න. මං අක්කව එක්කගෙන එන්නම්."

දේවක කීවේය. ජීවන් හිස වැනුවේය. අදින් වසර විසි ගණනකට කලින් ඔහු දුටු පුංචි දැරිවියව ජීවන් සිහිකළේය. 'බබාට මොනවද ගෙනාවේ බාප්පෝ.' මේ දෙබස් එදවස ආවේ පුංචි දැරිවියක්ව උන් නේත්‍රාගේ මුවිනි. ජීවන්ගේ දෙනෙත් අතීතය සිහිවී තෙත්විය.

දේවක මිදුලට ආවේ පොදට මැද්දෙනි. ඔහු අතේ තිබූ කුඩය

භාවනා අතට දුන්නාය. 'ලස්සන අද' ඒ කතාව කිවේ දේවකගේ දෑස්ය. භාවනා ඇස්වලින් සිනාසුනාය.

"අක්කේ."

දේවක පිටුපස අසුනට හිස දැම්මේය

"මගේ වීල් චෙයාර් එක මල්ලියේ."

දේවක වීල් චෙයාර් එක ගත්තේ නැත. කර දඩු උස්වූ මල්ලී කෙනෙක් ඉන්නාවිට අක්කට වීල් චෙයාර් ඕනා නැත. ඔහු පහත් වී හරි ලස්සනට නේත්‍රාගේ ගතට දෑතම තැබුවේය.

"අනේ මල්ලියේ"

"මෙහෙම යන් අක්කේ. මල්ලිගේ අතින්."

නේත්‍රා තෙත්වූ දෑස් සහිතව හිස වැනුවාය. දේවක ඉතාම ශක්තිමත් ලෙස නේත්‍රාව තම දෑතට ගත්තේය.

භාවනා සියල්ල දෙස බලාගෙන උන්නාය.

ජීවන් දොරකඩ බලාගෙන උන්නේ හදවත පුරා දරු සෙනෙහසක් ලියලද්දීය. කෙල්ලෝ දෙන්නාගේම මුහුණු දෙස ඔහු බලාගෙන උන්නේය. තම පුතාගේ අතින් නිවසට එන නේත්‍රා දෙසත් අනාගත ලේලියකගේ අසිරිය මුහුණ පුරාම තවරාගෙන නිවසට එන කෙල්ල දෙසත් ඔහු බලාගෙන උන්නේය.

නේත්‍රා ජීවන්ව දැක්කාය. එසැනින් ඇගේ දෑස් තෙත්විය.

"අප්පච්චී."

භාවනා දොකරඩදීම ජීවන්ට පහත් වී වැන්දාය. ජීවන් එහෙමම කෙල්ලව වැළඳගත්තේය.

"පොඩි පුතේ. අද ලස්සන මගේ

දූගේ"

ජීවන් කෙල්ලගේ හිස අතගාමින් කීවේය. ඇය ජීවන්ව වැළඳගෙන ටික වෙලාවක් උන්නාය.

"මට පොඩි පුතා කියලා කතාකරනකොට මොකක්ද හිතුණා."

ඇය මුහුණා මෙන් කීවාය. ජීවන් භාවනාගේ හිස පහත් වී සිපගත්තේය. ද්වේක හරි පරිස්සමින් නේත්‍රාව පුටුවක් මත තැබුවේය. ජීවන් ඇය කරා එද්දීත් ඇය උන්නේ අඬමිනි.

"අනේ ලොකු පුතේ. ඇයි මේ."

නේත්‍රාට ඇඬුම් වාවාගෙන ඉන්නට පුළුවන් වූයේ නැත. මේ තමා අභියස ඉන්නේ තමාගේ සීයාටත් තාත්තාටත් පසුව වඩාත්ම ආදරය කළ පිරිමියාය.

"අනේ මගේ සුදු බාප්පා."

ජීවන් පහත් වී නේත්‍රාගේ හිසමෙ සිපගත්තේය. නේත්‍රා පුටුව මත ඉඳගෙනම දෑත් එකතුකළේ ඇඬුම් වාවගෙනය.

"මට පහත්වෙලා වළින්න බෑනේ බාප්පේ."

ජීවන් දෑස් තදකළේය.

"ඔයා ලොකු පුතේ බිම වැටි වැටී මට කොච්චර වැඳලා තියෙනවද මැණිකෙ. බබාට මොනවද ගෙනාවේ බාප්පෝ කි..යා..ගෙ..න ඔයා දුවගෙන එන්නේ"

නේත්‍රා ඇඬුවේ ජීවන්ගේ බඳ බදාගෙනය. ජීවන් කොල්ලාත් කෙල්ලත් දෙස බලාගෙන අසරණව නේත්‍රාගේ හිස පිරිමැද්දේය.

"ඔයාවයි මල්ලිවයි ආයේ දකින්න වාසනාවක් තිබ්බනේ බාප්පේ. ඒත්

කොල්ලව දකින හැම වෙලාවේම මට කාවද මතක් වුණා. අනේ කොහොම ජීවත්වුණාද?කොහොමද මේකව ලොකු කළේ. අපිට පේන්නවත් ආවේ නෑනේ. ඒත් කොච්චර මතක්වුණාද ඔයාවයි නැන්දිවයි මල්ලිවයි”

නේත්‍රා ඇඬුම්බරව කීවාය. ඇගේ දෙනෙත්වලින්  වැටෙන විශාල කඳුළු ඒ හදවතේ ඇති දුකත් ආදරයත් නිහඬව කීවේය.

“දන්නවා පුතේ. එන්න පුළුවන්කමක් තිබුණානම් එනවා. අන්තිමට හිතලා හිතලා තමයි කොල්ලව සීගිරි එකට එව්වේ”

ඔහු කීවේය.

“ඒකට පින් බාප්පේ. ගොඩක් පින්.”

ජීවන් භාවනා දෙස බැලුවේය.

“අපේ පොඩි බෝලෙගේ ලස්සන

දැන්. නේද ලොකු පුතේ. ටිකක් ළඟට එන්නකෝ පොඩි පුතේ."

ජීවන් කීවේ භාවනා දෙසම බලාගෙනය. දේවකද ඇය දෙස බැලුවේය. භාවනා කඳුළු පිරි මුහුණින් ජීවන් වෙත ආවේය.

"ඔයාව අම්මට ලැබිච්ච දවසේ නැන්දියි මායි ඇවිත් ඔයාගේ කකුල් දෙකත් ඉම්ඹා. නැන්දි තමයි ඔයාට භාවනා කියලා නම තිබ්බේ. කෙල්ල දිහා බලාගෙන භාවනා කරන්න හිතෙනවා කියලා"

ජීවන් කීවේය. අම්මා හරිය. ඇය දෙස බලාගෙනම ඉන්න හිතෙනවා නොවේදැයි දේවක සිතුවේය.

"අපිට අපේ මල්ලිව ලැබුණා බාප්පේ. ඒකම විතරක් ඇති. මේ වගේ හොඳ මල්ලියෙක් නැතුව

උන්නේ. මේකව මෙහෙම ලස්සනට ගුණයහපත්කමට හදපු එකම ඇති බාප්..පේ"

නේත්‍රා කීවේය. සියල්ලන් බැලුවේ දේවක දෙසය.

"ඒකනේ එයාව ඔයාලා ළඟට එව්වේ පුතේ. එයාටත් කාත් කවුරුවත් නෑනේ."

"එහෙම කියන්න එපා බාප්පේ. තමන්ගේකම කියන්නේ මොකක්ද කියලා මල්ලිම ඇවිත් අපිට කියලා දුන්නා. අද සීගිරි එක බේරගන්නේ අපේ පවුලේ වෙන පිරිමි සහෝදරයෝ නෙමේ. අපේ කොල්ලා."

කොල්ලාව සීගිරි එකට යැවූ එක ගැන අද ජීවන් සතුටුවිය. කළේ කරන්නට තිබූ හොඳම දේය.

"වෙච්ච ගොඩක් දේවල් අර්ජුන

අන්කල් මට කිව්වා පුතේ. මේ කකුල් දෙක"

"ඒක හිතන්න එපා බාප්පේ. මල්ලි මාව සනීපකරනවා කියලා කියන්නේ"

"එයා කරයි"

මේ ජීවිත මැද අද දේවක ඉන්නේ කොතරම් ආදරණීය තැනක දැයි ජීවන් තේරුම් ගත්තේය. එය පමණක්ම ඇතියැයි ඔහුට සිතෙයි.

"අම්මයි තාත්තයි සීයයි සනීපෙන් නේද ලොකු පුතේ."

ජීවන් ඇසුවේය.

"ඔව් බාප්පේ. එයාලත් හරියට ඔයාවයි නැන්දිවයි මල්ලිවයි මතක් කරනවා"

"දන්නවා ලොකුපුතේ. හිම්හිට මම එන්නම්කෝ. තාත්තවයි අම්මවයි දකින්න හරිම ආසයි. මිලීව මේ

ළඟදිත් මම මතක්කළා.”

“එහෙම එන්න. සීයගේ හිතේ දැන් තරහක් නෑ.”

“දන්නවා පුතේ. ඒත් නැන්දි නැතුව සීගිරි එකට එන්න හිත හදාගන්න අමාරුවුණා මට.”

ජීවන් සුසුමක් හෙළා කීවේය.

“එයා දැන් ජීවත්වෙනවා කියලා හිතෙනවා බාප්පේ. මල්ලි නිසා.”

“එයා අම්මම තමයි.”

දේවක හිස කැසුවේය. භාවනා ජීවන් ළඟටම වී දේවක දෙස බැලුවාය. ‘අද හරි ලස්සනයි. සරමට ගොඩක් හැඩයි’

*** *** *** *** ***

"මට ළිඳ පෙන්නන්න."

භාවනා කීවේ ජීවනුත් නේත්‍රාත් අතීත සිදුවීම් ගැන කතාකරමින් සිටිද්දීය.

"මේ වෙලාවේ ළිඳ පැත්ත අන්ධකාරයි පොඩි පුතේ."

"ඒකෙන් දවසක නාන්නෝනලු අප්පච්චි. මම කිව්වා ළිඳ ළඟ වාඩිකරවලා නාවන්නම් කියලා."

දේවක හැමෝම ඉදිරියේ කීවේය. 'ගොන් හරකනේ. ඒකත් කියනවා මෙතන. හරක් රැළ'

ඇය සිනාබරව සිනාවාය.

"එන්න"

දේවක ඇයව එක්කාගෙන ආවේ කුස්සිය පැත්තෙනි. හේරත් කට්ලට් බදිමින් උන්නේය.

"හේරත් මාමා මේ සුද්දි."

ඇය සිනාසුනාය.

"පුංචි මහත්තයා ඇවිත් කොයි වෙලත් කියනවා දුව ගැන"

භාවනා කුස්සියෙන් ආවේ සිනාසෙමිනි.

"මොකද මං ගැන කියනවා කියන්නේ අයියේ."

ඇය ඇසුවාය. ළිඟ පැත්ත ඇත්තටම කළුවරය.

"ඒ මේ නිකං සුද්දි"

"නිකං කියනවයෑ. කියනවකෝ"

ඇය ආවේ කළුවරට පරිස්සමින් අඩි තියමිනි. දේවක දුරකථනයේ වූ කුඩා ටෝච් එක දල්වාගත්තේය.

"එන්න සුද්දි."

දේවක අත පෑවේය. භාවනා ඔහුගේ අත අල්ලාගත්තේය. එය ඉතාම ලස්සනට ඇය අල්ලාගත්තාය.

දේවකගේ ඒ පැත්තම හිරිවැටිණා. ‘අත අල්ලගත්තාම අත වෙව්ලන්නේ මොකෝ අනේ’ ඇයට අසන්නට සිතුණි. ඒත් මේ ආධුනිකබවට ඇය ආදරය කළාය.

“මේක තමයි ළිඳ සුද්දි.”

ඇය ඔහුගේ උරතලයට බරවී ළිඳ දෙස බලාගෙන උන්නාය. භාවනාගේ ගතින් එන සුවඳ ළං ළංව දේවකට දැනුණි.

“මාව නාවනවා කිව්වේ මෙතන වාඩිකරවලද?”

ඇය ළිං පඩිය පෙන්නා ඇසුවාය. දේවක සිනාසුනේය.

“මේ රෑ සීතලයි පොදෙත් එක්කනේ. නැත්නම් දැන්මම නානවා.”

“දවාලක නාන්නෝන සුද්දි. අව්ව හොඳට පායලා තියෙනකොට. මේ

අඹ අතු අස්සෙන් අව්ව වැටෙනවා.”

“අයියේ”

ඇය මේ යන්නේ දෙයක් අහන්නටය.

“ම්.”

“ඉතින් ඇයි එහෙම ළමයිව නාවන්නේ”

දේවක ළිඳ දෙස බලාගෙන කෝල ලෙස සිනාසුණේය.

“නෑ ඉතින් පස්සේ කිව්වට කමක්නෑ. නිකං ඇහුවේ”

භාවනා ඔහුගේ උරතලයට හිසම බරකළාය.

“අයියේ”

භාවනාගේ වචන ආවේ උගුරෙන් මෙන්ය.

“සුද්දි.”

"ඔය ෆෝන් එකේ ලයිට් එක වහන්න ටිකක්"

දේවක එසේ කළේය. වැස්ස නිසා අද හඳ එළියක් ඇත්තේම නැත. ළිඳ අවට ඝන කළුවරක ගිලිණ.

භාවනා වඩාත් සුරක්ෂිත ලෙස ඇගේ හිස ඔහුගේ උරහිසේ ගසාගත්තාය. ඊටත් පසුව ඇය දෙපතුල්වලින් ඉස්සී දේවකගේ කොපුළක් මත මෘදු හාදුවක් සටහන් කළාය.

දේවකගේ ළය සෙලවිණ.

"සුද්දි."

"චූටි එකක්."

ඇය කොඳුරා මෙන් කීවාය. දේවක මුව පහත්කළේ ඇගේ හිසටය. භාවනා අන්ධකාරයේ තොල්පට තදකරගත්තාය.

"වැස්ස දුවමු."

හදිස්සියේම ඇය කීවාය. ඊටත් පසුව යුවතිය දේවකගේ අතක එල්ලී ළිඳ ළඟින් නිවස දෙසට පියවර මැන්නාය.

ඔහුගේ මුහුණ කොතරම් රතුව ඇත්දැයි භාවනා දැක්කේ කුස්සියේ දල්වා ඇති විදුලි පහන් එළියෙනි. ඇය එය ඇත්තටම රස වින්ඳාය. මේ ගෙවෙන්නේ වසන්තයේ ලස්සනම දවස්ද? මල් මමමත සමනළ පියාපත් තැවරෙන රොන් සුණු විසිරෙන වස්නතයද?

*** **** **** ***** ****

රාත්‍රියේ භාවනාට නින්දක් ගියේම නැත. අතුරුගිරිය නිවසේ ගඩොල්

බිත්ති අතරත් කළුවර ළිඳ ළඟත් වූ හැමදේම ඇයට සිනමා පටයක් මෙන් සිහිවෙන්නට විය. ඒ සුන්දර සිදුවීම් විසින් යුවතියව නින්දෙන් ඈත්කර තැබුවේය.

වෙලාව රාත්‍රී දොළහත් පසුවී තිබුණි. අතුරුගිරිය නිවසින් එද්දී රාත්‍රී දහයත් පසුවී තිබුණි.

අද නෑකම් අලුත් විය. භාවනා ඒ පිළිබඳව උන්නේ සතුටු සිතිනි. අක්කා ඉන්නේද එවැනිම සතුටකින් බව ඇයගේ මුහුණින්ම භාවනා දැක්කාය.

භාවනා ජීවන්ට බාප්පා කියන්නට ගියේ නැත. ඇය කීවේම අප්පච්චී කියාය. එහෙම ලස්සනය. ඔහුගේ අප්පච්චීය. දවසක තමාගේත් අප්පච්චීය. ඒ නෑකම ලස්සනය. මේ සියළු දේ සිතමින් ඇය ඇඳ මත

පෙරලෙමින් උන්නාය.

"මොනවද දන්නේ නෑ පිස්සා කරන්නේ. හරියට කිස් එකක් වත් දුන්නේ නෑ ළිඳ ළඟදී. හරක් රැළනේ"

ඒත් ඒ ගැන හදවතේ ගැඹුරු ප්‍රසාදයක් ඇත. එය ඇය රහසේ වින්ඳාය. 'ඇයි මමත් එහෙම කළේ. අපි මොනවත් කතාකරගෙනවත් නෑනේ.' භාවනා සිතුවාය. සමහර දේවල් එහෙම කතාකරගන්නට අවශ්‍යමද කියාත් පසුව ඇය සිතුවාය. නැත. කිව යුතු බොහෝ දේ දැන් කියා අවසානය.

එහෙත් ප්‍රථම ප්‍රේමයේ අසිරිමත් වදන් අසන්නට ආසය. හදවත එහෙම ප්‍රාර්ථනාවක් කර ඇත.

"එයා ජීවිතේට ආපු විදිහ හරි පුදුමයි. ටිකෙන් ටික ඒත් හරි

ඉක්මනට. කලින් එන්න හිතාගෙන උන්නා වගේ. අන්තිමට හැමදේම එයා වුණා."

භාවනා ඇඳේ පෙරළෙමින් සිතුවාය.

"අපි දොයි නෑ."

ඇය දුරකථනය ගෙන කටේ පණිවිඩයක් ද්වේකට යැව්වාය. තත්පර කිහිපයකින් පිළිතුරු ලැබිණ.

"අපිටත් නින්ද යන්නේ නැතෝ."

"ඒ මොකද යකෝ."

භාවනා සිනාව තොල්පටින් තදකරගෙන යැව්වාය.

"එක විදිහකට ඉන්න බෑ."

"ඇයි නලියනවද?"

"ටිකක්."

"ඒක ලෙඩක්."

"මාත් හිතන්නේ. හරි අසනීපයි වගේ"

"අසනීප සනීපකරගන්න ඕන."

"ඒක තමයි මාත් හිතුවේ."

භාවනා දුරකථනය දෙසම බලාගෙන මොහොතක් උන්නාය. මේ ගෙවෙන දවස් කොතරම් සුන්දරද?

"අපි කවදද පේරාදෙණියේ යන්නේ."

"සිකුරාදා යන් සුද්දි"

"ආයේ වරද්දන්න බෑ. මං ලෑස්තිවෙනවා."

"හා. කතාවකුත් තියෙනවා."

"ඉතින් අද කියලා දාන්ඩ තිබ්බනේ."

"ඒක තමා මාත් හිතුවේ."

"ළිඳ ළඟදී කාවද වෙච්ලුවනේ."

"මං හිතුවා වෙච් චලා ළිඳටත් වැටෙයි කියලා"

භාවනා මොහොතකට දෑස් පියාගෙන ඒ මොහොත සිහිකළාය. මේ ජීවිත කාලයේ උදාවූ සුන්දරම නිමේෂයක මතකය හදවතේ ගැඹුරු තැනක තැන්පත්ව ඇත.

"පාන්දරම හෙට එන්නෝන."

"පහට."

"මම පහට දොයි. හයට එන්න."

"නිදාගන්න. දැන් දොළහයි හතළිස් පහයි."

"බුදු සරණයි. නිදාගන්න"

භාවනා එසේ ටයිප් කර යවා දෙනෙත් පියාගත්තාය.

# 15

කිරිබත් හැදුවේ ජීවන් ය. ලුණු මිරිස් සමඟ ඇඹුල් තියල හැදුවේ හේරත් ය. තෙල් බේරෙන සීනි සම්බෝලය හැදුවේ දේවක ය. අද කිරිබත් ටිකක් හදන්නම ඕනා කියා ජීවන් ට සිතුනේ මහ රෑය. අද දවසේ විශේෂත්වයක් නැත. ඒත් මේ ගෙවෙන දවස් විශේෂය. කොල්ලාගේ ජීවිතේ සුබ දෙයක් හෙට අනිද්දාම අහන්නට ලැබෙන බව ජීවන්ට

සිතිණ. ඒ සුබ මංගල කාරණාව කෙළවර ඉන්නේ භාවනාය. ඇරත්, අද උදේ සිටම ජීවන්ට ඔහුගේ බිරිඳව සිහිවෙයි. බිරිඳව සිහිවී කිරි පිඬු ටිකක් හදන එකම සැමියා ඔහු විය යුතුය. කොහොමත් යන ගමන් දෙහිවල මහරගම පාරේ පිහිටි බෙල්ලන්විල පන්සලට ටිකක් යන්නට ඔහු සිතාගත්තේය.

ඔහු සීනි සම්බෝලයක් හදන්නට සිතුවේ නැත. එහෙත් ජීවන් සමඟම දේවකත් පිබිදී ආවේය. කොල්ලාට කොහොමත් මේ දවස්වල නින්ද යන්නේ නැති ලෙඩක් ඇත. එක්කෙනෙක් ඔහුගේ නින්දත් සැනසීමත් දෙකම සොරාගෙනය.

"අප්පච්චි මේක ටිකක් ටේස්ට් කරලා බලන්නකෝ. හීනියට

උම්බලකඩ පාරක් තිබ්බනම් මරු."

ජීවන් දේවකගේ සීනි සම්බෝලයෙන් ටිකක් අතට ගෙන කෑවේය.

"ඒකනේ සීනි සම්බෝලේ පුංචි මහත්තයෝ."

"සීගිරි එකට ගහන්නේ මීටත් වඩා හොඳ එකක්. ටිකාක් තෙල් බේරෙන්න ගහන්න ඕන අප්පච්චි."

"ම්. ඒක හොඳට යයි පුංචි මහත්තයෝ"

ජීවන් ගොස් කෙසෙල් කොලයක් කපාගෙන ආවේය. ඔහු කිරිබත දැමුවේ මේසයේ එලූ කෙසෙල් කොළයටය.

"මං තවන්නම් අප්පච්චි."

දේවක එය කරන අපූරුව ඔහු රස වින්දේය. කොල්ලාට මේ සියල්ල

කියා දුන්නේ ජීවන්ය. කිරිබත් තවන්නට පමණක් නොව ජීවන් කොල්ලාට බොහෝ දේ ලස්සනට කරන අයුරු ඉගැන්නුවේය. අවුරුදු දොළහ වෙද්දී කොල්ලාට ක්‍රීස් එක තබා කළිසමක් මදින්නටත් මැද ඉස්තිරික්ක පාර තබා කමිසයක් මදින්නටත් හුරු කළේය. කොල්ලා කමිස දෙකක් පුච්චාගත් බව ඇත්තය. ඒ අවුරුදු දහ තුනේය. එහෙත් ඉන් පසුව ඔහු ඒ වැරැද්ද කළේ නැත. වඩාත් වටින්නේ එයය.

“අඟලක් උසට කිරිබත තැව්වා අප්පච්චි. කෑලි මහතට තියෙන්න ඕනනේ නේද?”

“කිරිබත් කෑල්ලක් එහෙම නැත්නම් වැඩන් නෑ පුංචි මහත්තයෝ”

කිරිබත දකිද්දී දේවකට සිහිවෙන්නේම ඇයවය. අද රසට කිරි බත් පාර්සලයක් අරගෙන යන්නට පුළුවන. දේවක පොඩි කෙසෙල් කොලය තවා පැත්තක තබද්දීම ජීවන් එය දැනගත්තේය.

"සීනි සම්බෝලෙයි ලුණු මිරිසයි කිරිබත් එකටම දාන්න එපා. ඒක වෙනම කෙසෙල් කොළ කෑල්ලක ඔතාගන්න."

දේවක හිස කැසුවේය.

"හේරත් මාමා ඇඹුල් තියල නියමෙට ආවා නේ."

"හිඳෙන්න හැදුවේ පුංචි මහත්තයා. නැත්නම් රස නෑ."

"ඒකනේ නේද?"

දේවක වෙලාව බැලුවේය. පාන්දර පහය. ඔහු ඇයට පොරොන්දු

වූයේ පාන්දර හයට සීගිරි එකට එන්නටය. පොරොන්දුවක් වීනම්, එය ඒ විදිහටම ඉෂ්ඨ කළ යුතුය. එය දේවක ඇදහුවේය. හදවතක විශ්වාසය එන්නේ පුංචි පුංචි විශ්වාසයන් රැසක් එක්වීය.

"මේ කිරිබත් අප්පච්චි."

"යන ගමන් මම පන්සලට පූජ කරගෙන යනවා පුතේ. ඊයේ රෑ ඉඳලා අම්මවත් මතක් වෙනවා."

"අනේ. අප්පච්චි මාත් එන්නද?"

"මම එහෙමම පූජ කරගෙන යනවා පුංචි මහත්තයෝ. අපි පස්සේ වෙලාවක යමු. ඔයා උදෙන්ම රස්සාවට යන්න."

කොහොමත් හොඳ බර බාරයක් වෙන්නට දේවකත් සිතාගෙන උන්නේය. බාර වෙනවානම් විය

යුත්තේ එහෙමය. පොඩි පොඩි කාරණාවලට එහෙම බාරවී තේරුමක් නැත. අප්පච්චි අද පන්සල් යන්නේ ඊයේ සිදුවූ දේවල් නිසාත් බව දේවක දැනගෙන උන්නේය.

දේවක මහ පාන්දර නෑවේය. කිරිපිඬුත් අරගෙන යනවානම් සුදට පිරුවට පිරිසිදුව යා යුතුය. මේ දවස්වල සීතලය. සීතල කියන්නේ අයිස් වතුරය. ළිඳ අලුත් වතුර පෙරාගෙන ඉන්නේ සීතල නිල් කැටේටය. ළිඳ ළඟදී දේවකට බොහෝ දේ සිහිවිය. ඊයේ රාත්‍රියේ මේ ළිඳ අසළ සිදුවූයේ හාස්කමකි. 'දැනුත් ඔයා ළිඳ ළඟ ඉන්නවා වගේ.' ඒ සුවඳ මේ දැනුත් දැනෙන්නාක් බඳුය. ඇය මේ හිත පුරාමය.

සීතල වතුර පනිට්ටුව ඇඟට දාගනිද්දී දේවකට තරු විසිවිණ. ඒ තරමටම සීතලය. එහෙත් ඒ සීතල දෙවෙනි තුන්වෙනි හතරවෙනි වතුර පනිට්ටු දමාගනිද්දී අඩුවිය. ජීවිතයේ කරදරත් එවැනි යැයි දේවකට සිතිණ. වඩාත් වටින්නේ එය දරාග ැනීමය. 'හැමදේම දරාගන්න පුළුවන් වුණේ ඔයා ළඟට වෙලා හිටපු නිසා. ඒක ජීවිතේ වෙච්ච වටිනාම දේ.' දේවක එය හදවතින්ම විශ්වාස කළේය.

*** *** *** *** ***

නේත්‍රාද උදේ පාන්දර හතරේ සිට ඉන්නේ පිබිදීය. ඇය රෑ ඇඳුමින්ම ඇඳට වී කල්පනා කළාය. ඊයේ

ජීවන් බාප්පාවත් කොල්ලාවත් බලන්නට අතුරුගිරියට ගිය ගමන ඇය සිහිකළේ සැනසීමකිනි. කෙල්ලගේ ජීවිතයේ සිදුවෙන මහා මංගල කටයුත්තක පෙරමඟ ලකුණු හැම අතින්ම දිස්වෙයි.

“උන් දෙන්නා ඉන්නේ පුදුම ආදරයකින්. පොඩි නැන්දිට යුතුකම් ඉටුකරනවානම්, ජීවන් බාප්පට සාධාරණයක් ඉටුකරනවානම් ඒකට දැන් පරක්කු වැඩියි. ඒ හැමදේ වෙනුවෙන්ම සාධාරණයක් කරන්න ඕන කොල්ලට. ඒකට සාධාරණයක් කරන්න තියෙන හොඳම විදිහ මේ කසාදයයි.”

දේවකගේත් භාවනාගේත් එකතුවීම යනු මේ සීගිරි පවුලේ සිදුවෙන වාසනාවන්තම දේ යැයි

නේත්‍රාට සිතෙයි. එහි කිසිම වරදක් සිදු නොවිය යුතුය.

ඒ දේ කරන්නටනම්, දේවක යනු අදින් වසර විසි ගණනකට පෙර මිය ගිය මේ සීගිරි පවුලේ බාල දියණියගේ එකම පුතා බව අම්මාටත් තාත්තාටත් සීයාටත් කිව යුතුය. එය අද හෙටම කරන්නට සිදුවෙන බවද නේත්‍රා තේරුම් ගත්තාය.

තාත්තා ඔහුගේ දුප්පත් මස්සිනාගේ එකම පුතාට තම බාල දුවව දෙන්නට කැමති වෙයිද? සීයා තම පිණිපිරියව ඒ මුණුපුරාට දෙයිද? නෑකම් සියල්ල පැත්තක තැබිය හැක. දේවක සීගිරි එකට පැමිණ කළ දේ පමණක්ම ඇති යැයි ඇයට සිතෙයි.

ඉඳුනිල් ආවේ ලොකු දුවගේ

කාමරයේ විදුලි පහන් දැල්වෙනු දැකය.

"අනේ ඔයා අද උදෙන්ම ඇහැරුණාද? මං ඒත් බැලුවා රෑ වෙලානේ නිදාගත්තෙත්."

ඉඳුනිල් පැමිණ ඇඳෙන් ඉඳගෙන නේත්‍රාගේ දෙපා පිරිමැද්දාය. මේ අම්මා හැමදාමත් එහෙමය.

"චුට්ටක් ඇහැරලා කල්පනා කළා අම්මා."

"ඇයි ලොකු පුතේ"

"නෑ අම්මා. එහෙම ප්‍රශ්නයක් නෙමේ. සීගිරි එක ගැන මේ නිකං හිතුවේ."

"දැන් ඒකේ ප්‍රශ්නයක් නෑනේ. නේද?"

"ම්. අපිට කොල්ලා ප්ලෑන් එකක් කිව්වා. ඒක හොඳයි. ඒකත්

ඉන්නෝන අපිටත් දැන් හැමදේම මතක්කරලා දෙන්න."

ඉඳුනිල් මෙහෙම දේවකගේ ගුණ වයන්නේ අනාගතයේ දවසකට එය වැදගත් වෙන නිසාමය.

"අපේ බඩ්ඩ මොකද කියන්නේ"

ඉඳුනිල් ඇසුවේ රහසින් මෙන්ය.

"ඒකත් එක්ක කොමලේ ඉතින්. නරක කොල්ලෙක් නෙමේ."

"මං එහෙම කිව්වේ නෑනේ."

"තාම එහෙම දෙයක් නෑ. එහෙම වෙනවානම් ඒකත් නරකම නෑ"

නේත්‍රා පරිස්සමින් කීවාය. ඉඳුනිල් බලාගෙනම උන්නාය.

"මේ ගෙදරටත් ඕන අම්මා හොඳ කොල්ලෙක්"

ඉඳුනිල් මේ වෙලාවේ කිසිවක් කියන්නට ගියේ නැත. ඒ ඇයගේ

හැටිය.

"අම්මා"

"ම්."

"පොඩි නැන්දිව මතක්වෙන්නේ නැද්ද?"

හදිස්සියේම තම ලොකු දුවට ඇයව සිහිවූයේ ඇයි? ඉඳුනිල් සිතන්නට ගියේ නැත.

"ඔයා කියන්නේ මට ඊයේ හවසත් මතක්වුණා. මගේ අර දණිහිස් අමාරුව ඊයේ ටිකක් ආවා."

"කියන්නෙපැයි අනේ. අපි බෙහෙත් ටිකක් ගමු."

"ඒක එහෙමම ඇරිලා යනවා. ඒකට බාම් ටිකක් ගාලා අතගානකොට තමයි මට නර්මදාව මතක්වුනේ. ඉස්සර මේ වගේ නෙමේ ඒක හැමදාම එනවා. අනේ මාව

සැට්ටියේ ඉන්දවලා පැයක් අතගානවා. දවසක් එහෙම කරනකොට මට නින්දත් ගියා. නැඟිට්ටනකොට මේ කෙල්ල උයලා ඔයාවත් හෝදලා ඔයාට කවලා ගේත් අස්කරලා පව්."

ඉඳුනිල්ගේ දෑස්වල කඳුළුය.

"එයා මට කවදාවත් පිට නෑනා කෙනෙක් විදිහට සැළකුවේ නෑ. ඔයාව හම්බවෙන්න ඉන්නකොට ආස හැමදේම පාන්දර නැඟිටලා හදනවා. එක රෙදි කෑල්ලක් මට හෝදන්න දුන්නේ නෑ. එහෙම කෙල්ලත් යන්න ගියානේ."

අම්මා ඇයට කොතරම් ආදරය කරනවාදැයි මේ දෑස්වල ඇති තෙතමනයම සාක්ෂි දරණ බව නේත්‍රා සිතුවාය.

"ජීවන් බාප්පත් එහෙමයි නේ."

"මී. මේ පවුලට මස්සිනාලා තුන්දෙනෙක් ආවනේ. අනිත් දෙන්නා වගේ නෙමේ ජීවන්. ඉස්සර සීයා කොල්ලට ගෙදරට එන්න දුන්නේ නෑනේ. ඉතින් කෝල් කරනවා. අක්කා මොනවද කන්න ආස කිය කිය අහන්නේ. දවසක් නැන්දි අතේ සරස්වතී එකෙන් මසාල තෝසේ දාලා එව්වා. තවත් දවසක් බුහාරි එකෙන් බුරියානි එව්වා. ඔයාලගේ කොට්ට ඇතුළට දාන්න කියලා පිරිත් නූල පවා එව්වා. මේගොල්ලෝ දකිද්දී මට ජීවන්ව හරියට මතක්වෙනවා. දැන් කොහේ ඉන්නවද දන්නේ නෑ. පොඩි එකා දැන් ලොකුත් ඇති."

ඉඳුනිල් හූල්ලා මෙන් කීවාය. අම්මාට මේ දේවල් නොකියා ඉන්න එක නේත්‍රාට දුකය. ඒත් කියනවානම් මේ කතාවම කිව යුතුය.

"සීයා වුනත් දැන් හරියට තැවෙනවා. ඒ වෙච්ච දේ ගැන. එයා අරන් ආපු ආයුෂ ඉවරවුණා පව්. මැරුණේ දුකෙන්. සතුටින් සැනසීමෙන් මැරිච්ච ගෑණියෙක් නෙමේ. කොල්ලයි ජීවන් ගැනයි හරියට තැවුණා. එයා මැරෙනවා කියලා දැනගෙන උන්නා. බලන්න ගියාම අත්දෙක අල්ලගෙන අඬනවා. පුළුවන්නම් අක්කේ මගේ ජීවවයි කොල්ලවයි බලාගන්න කියලා කියන්නේ පව්. ඒත් අපිට එහෙම යුතුකමක් කරගන්න බැරිවුණා. ජීවන් කොල්ලවත් අරගෙන හැංඟිලාම ගියා. වෙන මොනවා කියලා කරන්නද ඉතින්.."

ඉඳුනිල්ට ඇඬුණි. නේත්‍රා ඇඳේ රූටා මෙන් පැමිණ අම්මාගේ හිස අතගෑවාය.

"අපිට එයාලව දවසක හම්බවෙයි අම්මා."

නෙත්‍රා කීවාය.

"කෙල්ල ගියේ අපිට කරන්න තියෙන හැම යුතුකමක්ම කරලා. සීගිරි එක වෙනුවෙන් නැහෙන්න පුළුවන් උපරිමයෙන් මැරිලා. එදා නංගි ඒ පුතාගේ අයිතිය වෙනුවෙන් කතාකරනකොට මට පුදුමත් හිතුණා. හරිනම් ඒක කරන්න තිබුනේ මටයි තාත්තටයි. එයා අපි වෙනුවෙනුයි හැමදේම කළේ. ඉස්සර ඔයාට මහ නරක හෙම්බිරිස්සාවක් හැදෙනවා. සෙම නහයේ හිරවෙනවා. ඔයාට හුස්මගන්නත් අමාරුයි. අනේ කෙල්ල ඔයාගේ නහයට කට තියලා හොටු ටික උරනවා."

"අනේ මගේ"

"ඕ. ඒකෙන්ම සනීප වුණා. පුදුම කෙනෙක්."

සමහරවිට ඒ අතීතය වෙනුවෙන් හෙට අනිද්දාම මේ සීගිරි පවුලට යුතුකම් කරන්නට සිදුවෙනු ඇත. එහෙම කරනවානම් ජීවන් බාප්පාගේත් කොල්ලාගෙත් හිත එක අබමල් රේණුවකින්වත් රිදවිය යුතු නැත. එය නේත්‍රා තදින් සිතේ ධාරණය කරගත්තාය.

# 16

භාවනා කළාතුරකින් ඇඳින සාරියක් අද ඇන්ඳාය. හිතම අද සැරසිල්ලක් වාගේය. හෙට අනිද්දා ජීවිතයේ සිදුවෙන්නට නියමිත සුබ දෙයක පෙර නිමිති දේදුණු රේඛා ඇය කලින්ම දැක්කා සේය.

මේ සතුට ටික ටික හදවතින් විඳින්නට භාවනා රඹුක්වැල්ල ප්‍රිය කළාය. එකවර සුනාමියක් සේ හදවතට සතුටක් පැමිණ තේරුමක්

නැත. පුංචි දිය උල්පතකින් මෙන් සතුට හදවතට ගලා ආ යුතුය. සදාකාලයටම සතුටක් විඳිය හැක්කේ එවිටය.

භාවනා පහළට ආවේ පැය බාගයක් පමණ කැඩපත අසළට වී මෝස්තර නිරූපන රංගනයක් කළ පසුය. මේ වැළ. දී ඇති අසනීපය සාමාන්‍ය එකක් නොවේ. ඇය නේත්‍රාගේ කාමරයට එබුණාය. නේත්‍රා උන්නේ ඇඳටම වීය. අද ටිකක් ප්‍රමාද වී සීගිරි එකට යන්නට ඇය සිතාගෙන උන්නාය.

"මේ පාන්දරම යන්න බබා."

"ම්. චුට්ටක් වේලාසන යනවා අක්කා."

"ලස්සනට සාරියක් අද ඇඳලා."

"හොඳයිද?"

නේත්‍රා භාවනාගේ අතක් අල්ලාගෙන සිනාසුනාය.

"උදේ අම්මා එක්ක පොඩි නැන්දියි බාප්පයි ගැන කතාකළා."

"එයාට අක්කා කිව්වද?"

"කිව්වේ නෑ. ඒත් කියන්න හිතුණා."

"හිමිහිටනේද අක්කා"

කොහොමත් හෙට අනිද්දාම මේ හැමදේම එළිවෙයි.

"මි යන්න. මං ටිකක් පරක්කුවෙලා එන්නම්"

භාවනා නේත්‍රාගේ කාමරයෙන් පිටතට එද්දීම වාගේ මිහිරංග සාලයේ උන්නේය. ඔහුව දකින එකත් හිතට බරක් යැයි භාවනාට සිතිණ.

"උදේම මිහිරංගයියේ. ගුඩ් මෝනිං"

කෙල්ලගේ ලස්සන මිහිරංගගේ ඇස් දවන්නක් විය.

"පොඩ්ඩක් කතාකරන්න ආවේ"

භාවනාගේ සිතට අමුත්තක් දැණුින.

"කියන්න."

"මාත් මේ බිස්නස් එකක් පටන්ගන්න යන්නේ. දැන් අපි සීගිරි එකෙත් නෑනේ."

භාවනා සිනාසුනාය.

"සීයා බලලා කියයි නේද මිහිරංගයියේ. මං දන්නේ නෑ."

"අහන්නකෝ. කවදද මේක ක්ලියර් කරන්නේ කියලා."

තමන්ට ඇති ව්‍යාපාරය නැතිකර අලුතින් ව්‍යාපාර කරන මිහිරංග ගැන භාවනාට පුදුම නැත. හැමෝම එකවාගේ සිතන්නේ නැත.

"මං සීයාගෙන් අහන්නම් අද. හවස කෝල් එකක් දෙන්න. මොකක්ද කරන බිස්නස් එක."

"ගාමන්ට් සයිඩ් එකේ වැඩක්"

"ෆැක්ටරියක් දානවද"

"අපෝ නෑ. මෙහේ කොස්ට් එක වැඩියි. මම බැංකොක්වලින් බඩු ගේනවා. නංගිත් ෂෙයාර් එකක් දානවා. මං කෝසළ්‍යටත් කිව්වා. එයත් ෂෙයාර් එකක් දායි."

"ඒක හොඳයි. දියුණුවෙන්නකෝ. මං සීයගෙන් අද අහලා කියන්නම්. නැත්නම් අයියම අහන්න කාමරේ ඇති"

මිහිරංග දෙතොල් සපමින් මොනවද සිතුවේය.

"අපි ඔෆර් එකකුත් දුන්නා සීයට"

"සීයනේ අයියේ බලලා කරන්නේ.

අපිට මොනවත් කියන්න බෑ."

"සීගිරි එක වැහුවට පස්සේ මොනවද කරන්න හිතාගෙන ඉන්නේ."

"මී. එදාට ඒක බලමුකෝ"

"අපි ජොයින්වෙලා මේක කරමු. හොඳ පොෆිට්. මාසෙන් මාසෙට බැංකොක් යන්නත් පුළුවන්"

"මගේ එහෙම ආසාවක් නෑ. සීගිරි එක වහපු දවසට ගෙදරට වෙලා ඉන්නවා. අපිට වෙන බිස්නස් අල්ලන්නේ නෑ අයියේ"

භාවනා ඉන්තේරුවෙන්ම කීවාය.

"මට පරක්කුවෙනවාමම යනවා"

"දෙන සීගිරි එකට මෙච්චර වෙලාසන ගිහින් වැඩක් නෑනේ බබා"

භාවනා සිනාසුනාය.

"මම යන්නේ මගේ වැඩකට

මිහිරංගයියේ. සීයා එක්ක කතාකරන්න"

භාවනා නිවසින් පිටවූයේ එසේ කියාය. 'කන්න දෙයක් ගන්නත් බැරිවුණා මෙයා උදේම ඇවිත්.' භාවනා වාහනයට ගොඩවූයේ එසේ සිතමිනි. එසැනින්ම වාගේ භාවනාගේ දුරකථනයට කෙටි පණිවිඩයක් ලැබිණ.

"සුද්දි මම කිරිබත් ගෙනාවා. ඇවිත් ඉන්නේ"

ඇය තොල්පට තදකළාය. 'ඔයා ෂෝක්' ඇයට කියන්නට සිතෙන්නේ එයය. එහෙත් දැන්මම එය කියන්නට කට හදාගන්නට අමාරුය.

ඔහු සුදු මල් අත්තක් සේ සීගිරි දොරකඩම උන්නේය. සුදු කමිසයට තද නිල් පැහැගත් ටයි පටිය

ලස්සනය. භාවනා ඔහුව වාහනය තුළ ඉඳගෙනම රස වින්ඳාය.

"ගුඩ් මෝනිං"

ඇය එය කීවේ දෑසින් මෙන්ය.

"වෙරි ගුඩ් මෝනිං මිස්."

කෙල්ල රැව්වාය.

"කවුද ඇවිත් ඉන්නේ ඇතුලේ"

"බේකරි සෙක්ෂන් එකේ අය. අපි අද අර කිව්ව බටර් කේක් එක දානවා සුද්දි. රවුමක් දාමු අද"

"මේ සේල්ස් කරන්න."

"ඔව්. අද සාම්පල් අරන් යනවා. මං පැකින් එකත් හදාගෙන ඉන්නේ. අද ඕඩර්ස් ගමු."

භාවනාට පුදුමය. සේල්ස් යන්නේ ඔහුද?

"ඇත්තටම අද සේල්ස් යනවද?"

"සීගිරි එක පටන් ගන්නකල් අපිට ආදායමක් නෑනේ සුද්දි. එහෙම අපරාදේ. බේකරි සෙක්ෂන් එකෙන් වැඩක් ගමු."

"හරි යනවානම් යමු. මං රෙඩි"

භාවනා පැහැදිළිව කීවාය.

"දවසකට කේක් දෙසීය පනහක් දාගත්තොත් ඇතිනේ සුද්දි"

ඔහුගේ වැඩ පුදුමය.

"එතකොට අයියේ"

"අපි ගණන් බලපු විදිහට කේක් එකකින් රුපියල් අසූවක් තියාගන්න පුළුවන්. පොඩි බටර් කේක් එකක්. රුපියල් දෙසිය පනහකට වගේ දාන්නේ"

"එච්චර අඩුවට."

"පොඩි එකක්නේ. හවස පොඩී ටී පාටියක් දාන කේක් එකක්. දවසකට

කේක් දෙසීය පනහක් කඩවල්වලට දාගත්තොත් එතනම ප්‍රොෆිට් එක රුපියල් විසිදාහක්. දවස් විසි පහක් අපි සේල්ස් ගියොත් එතන රුපියල් ලක්ෂ පහක්. පඩි ටික ගෙවන්න අපිට ඒ ඇති. ලෝන් එකත් එනවනේ”

භාවනා සීගිරි දොරකඩ නතරවී දේවක දෙස බලාගෙනම උන්නාය.

“ඇයි සුද්දි.”

“න්නෑ මේ. කොහොමද මේවා හිතුවේ. මි.”

ඇය ඇසුවේ ඔහුගේ දෑස් කෙළින්ම ඇගේ දෙනෙත්වලින් අල්ලාගෙනය.

“මේකට ආවට පස්සේ මමවත් දන්නේ නැති දේවල් මට හිතෙනවා.”

ඔහු පැහැදිළිව කීවේය.

"තව මොනවද"

ඇයට අවශ්‍ය ඒ දේවල් දැනගන්නටය.

"ගොඩක්"

"එකක්"

"හාට් එක හරියටම තියෙන තැන මම දැනගත්තා. ඒක බොයිල්වෙන හැටි දැනගත්තා. ඒක කූල්වෙන හැටිත් දැනගත්තා."

"කොහොමද හාට් එක තියෙන තැන හරියටම දැනගත්තේ. ස්කෑන් කළාද"

"න්නෑ..එහෙම ස්කෑන් කරන්න ඕනම නෑ. ඔය ඉතින් සමහරුන්ව දැක්කාම හරියට එතනම ඇවිලෙනවනේ"

ඇය දෙනෙත් බරකර සිනාසුනාය.

"කවුද දන්නේ ඉතින් එතන

හාට් එකම තියෙනවා කියලා. කවුද දන්නේ අක්මාව තියේද කියලා.”

“අක්මාව ඇවිලෙන්නේ නෑ සුද්දි.”

දෑස්...ඒවා බැබලෙද්දීම හමුවිය.

“කාව දැක්කහමද දන්නේ නෑ හාට් එක ඇවිලෙන්නේ අනිත් අයගෙ ꝑ”

ඔහු බලාගෙන මොහොතක් උන්නේය.

“එහෙම හැමෝවම දැක්කහම ඇවිලෙන්නේ නෑනේ.”

දෙදෙනාම සීගිරි එක තුළට පිය මැන්නේ එකටමය.

“සුවඳක් එනවා සුද්දි”

“මී. මගේ සුවඳ?”

“හරි අමුතු සුවඳක්නේ. වෙනදාට ගාන එක නෙමේනේ.”

'ඒවත් දන්නවා' ඇය සිතුවාය.

"පොඩි අක්කා ගෙනත් දුන්නා ඩුබායිවලින්. ඒක මේ සුවඳයිනේ."

"ම්. පොඩි අක්කව දකින්නත් ආසයි."

"සැටඩේ එනවා. ආවාම මම එක්කගෙන එන්නම්."

භාවනා බුදු පහන සූදානම් කර එය දල්වන තුරු දේවක බලාගෙන උන්නේය. ඇය වඳිද්දී ඔහුද ඇය ළඟට ගොස් වැන්දේය. 'එයාව මටම දෙන්න. වෙන මොනවත්ම එපා' භාවනා හදවතින්ම පැතුවාය. පසුව ඇඟිලිතුඩින් පහනට අත යවා තෙල් බිඳක් ගෙන ඇගේ හිසේ ගල්වාගෙන පසුව දේවකගේද හිසේ ගැල්වූවාය.

"තෙරුවන් සරණයි"

ඇය ආවේ එසේ මුහුණා කියාය.

දේවකගේ දෙනෙත් ලාවට තෙත්විය.

"අප්පච්චි අද කිරිබත් හැදුවා. හේරත් මාමා ඇඹුල් තියලක් දැම්මාමම ගැහුවා සීනි සම්බෝලයක්."

"කට්ටිය වටවෙලා උයනවා ඉතින්."

"ම්. එතකොට වැඩේ ලේසියි"

"මම උන්නානම් කිරි හොද්දක් හදනවා"

දේවක බැලුවේය.

"කිරි හොදි කිරිබත් කන්න. කිරිහොදි එක්ක කිරිබත් කන්නේ නෑනේ සුද්දි."

"පලයන් යන්න. කිරිහොදි බබාට."

ඇයගේ මුවින් පිටවිය.

"කෝ බබා."

ඔහු ඇසුවේය. ඇය දෑස් රතුවීයන තුරු සිනාසුනාය.

“බබාට සුද්දි කිරිහොදි ඕන නෑ. කිරිබතුයි සීනියි හොඳයි.”

“ම්.”

“ඉතින් කෝ බබා සුද්දි.”

“බබාලා හුළං ගැහුවාම එනවද? බබාලා එන්න මොකද කරන්න ඕන”

දේවක හිස කැසුවේය.

“ඒකනේ.”

“මම ඇහුවේ මොනවද කරන්න ඕන”

දේවක සිනාසුනේ දෑසිනි.

“මහත්තයයි නෝනයි මේ පිප්පි දාන්නෝන. රෑට රෑට”

භාවනා බඩ අල්ලාගෙන විනාඩි දහයක් පමණ සිනාසුනාය.

ඇගේ සිනහව සීගිරි එක පුරාම රැව් දෙන්නට විය. ඒ සිනාසෙන අරුමෝසං දෙතොල් දෙස දේවක නිදහසේ බලාගෙන උන්නේය.

"මොකක්ද අයියේ. පිප්පි දාන්න. කවදාවත් එහෙමම එකක් දාලා නෑනේ."

දේවක යටිතොල හපාගෙන සිනාබරව උන්නේය. ඇයගේ තෙත්වූ දෙනෙත් ඔහුගේ ලැජ්ජාවෙන් දිලිසෙන දෙනෙත් හා පැටලිණ.

"පිප්පි දාන්න කෙනෙක් දැන් හොයාගන්න ඕන. බලුප් නිවලද අයියේ පිප්පි දාන්නේ."

ඇය තවත් සිනාසෙන්නට ඇති ඕනාකමට එසේම ඇසුවාය. දේවක තොල්පට තදකරගෙන සිනාව තදකරගත්තේය.

"මං කියන්නේ නෑ සුද්දි."

"කමක් නෑ කියන්න. චුට්ටක් කිස් එකක් දුන්නාම වෙව්ලන අය පිප්පි දානකොට සිහිත් නැතිවෙයි නේද අයියේ."

ඇය ඒ මන්දහාස මල් කුමාර සිනාවට එසේම ගලාගෙන යන්නට ඉඩදුන්නාය. අද සිනාසෙනවා වැඩිය. හවස් වෙනවිට අඬන්නට වේදැයි දන්නේ නැත.

බේකරි සෙක්ෂන් එකෙන් දැමූ බටර් කේක් ඇසුරුම් කළේ දේවකත් භාවනාත්ය. එහෙම කළේ උණු උණුවේ කපාගත් බටර් කේක් එකක් කන ගමන්ය. මේ ජීවිතයේ කෑ රසම බටර් කේක් කෑල්ල බව භාවනාට විශ්වාසය. කේක් එක මෘදුය. පාටය. කටේම දියවෙන තරමට බටර් රසය.

එහෙත් කේක් එකට දැමුවේ බටර් නොවේ. මාගරින්ය.

"කාපු රසම බටර් කේක් කෑල්ල අයියේ."

"මේක සුද්දි පිටරට බටර් කේක් එකක්. ලෝකේ හොඳම බටර් කේක් එක වට්ටෝරුව මාර්තා ස්ටුවට් කියලා කෙනෙක්ගේ. එයා තමයි කේක් ක්වීන්. බටර් කේක් වට්ටෝරු හයක් අපි ට්‍රයි කළා. මේක තමයි රසම එක."

ඔහු මේවා කොහොම සොයාගත්තාද කියා භාවනාටම පුදුමය. දේවක බටර් කේක් අසුරන්නට පොලිතීන් බෑග් ගෙනවිත් තිබුණි. ඒවාට අලවන්නට සුදු ලේස් මෝස්තරයක් ගිය ස්ටිකර් කැබලිත් ඔහු දවල්ම ගොස් ප්‍රින්ට් කරගෙන

ආවේය. ඒවාවල සීගිරි හෝම් මේඩ් බටර් කේක් යනුවෙන් මුද්‍රණය කර තිබුණි. නිෂ්පාදිත දිනයත් කල් ඉකුත්වෙන දිනයත් ඊට යටින් ඔහු අතින් ලිව්වේය. පුදුමය. බටර් කේක් එක ඇසුරුම් කළ පසු පෙනුම හුරුබුහුටිය. ඔහු කේක් එකක් මිල කළේ රුපියල් දෙසිය පනහකටය. එහෙත් අවශ්‍යනම් මේ කේක් එකක් රුපියල් තුන්සීයකට මිල කරන්නට තිබුණි. එහෙත් දේවක එය කළේ නැත.

අසුරුම් කළ කේක් බිස්කට් පෙට්ටියකට අසුරා දේවක ඒවා වාහනයට යැව්වේය. පසුව ඔහු බටර් කේක් හතරක් වෙනම කැබලිවලට කැපුවේය. ඒවා ප්ලාස්ටික් පෙට්ටියකට අසුරා ඊට උඩින් කුඩා කඩදාසි ප්ලේට් ටිකකුත් ටිෂූ

මිටියකුත් තැබුවේය.

"ඒ අයියේ."

"මේක සුද්දි අපි මුදලාලිට දෙන සාම්පල් එක. ඉස්සෙල්ලා අපි එයාව අල්ලගන්න ඕන. එයා තමයි අපේ කේක් එක ප්‍රමෝට් කරන්නේ. මුදලාලිට එයාටම හැඳුණු කස්ටමස්ලා ඉන්නවනේ. එයා එන නෝනා කෙනෙක්ට කිව්වොත් නෝනා හොඳ බටර් කේක් එකක් ඇවිල්ලා තියෙනවා ඒක හරිම රසයි කියලා. අපි ගොඩ සුද්දි"

භාවනා දේවක දෙස බලාගෙ නම උන්නාය. ඇයට සිහිවුනේ මිහිරංගවය. බැංකොක් ගොස් ඇඳුම් ගෙනවින බිස්නස් එකක් කරනවා කියූ මිහිරංගවය.

"පුදුම මාකටින්නේ දන්නේ"

"ඒක මාකටින් නෙමේ සුද්දි. හරිම සාමාන්‍ය දෙයක්. දැන් සුද්දි සෙල්ල කතරගම යනවනේ"

"හා. මටත් යන්න ආසයි. අන්තිමට ගියේ අවුරුදු හතරකට විතර කලින්"

"එහේ ගියාම සෙල්ලට යන පාර පුරා දොදොල් කඩනේ. එයාලා අපිට දොදොල් පොඩි කෑල්ලක් කපලා දෙනවා. එන පවුලටම කෑලි කෑලි කපලා දෙනවා. ඒක කෑවට පස්සේ අපිට ගන්නම වෙනවා"

ඇය සිනාසුනාය.

"මේ. බැංකොක් ගිහින් ඇඳුම් ගේන එක අයියේ හොඳ බිස්නස් එකක්ද?"

ඇය නිකමට ඇසුවාය.

"හොඳයි. ඒත් පොඩි ප්‍රශ්න ටිකක්

තියෙනවා”

“මොනවද?”

“එකක් තමයි ෆැෂන්ස් තෝරන්න හොඳ දැණුමක් තියෙන්න ඕන. ඒක සාමාන්‍ය කෙනෙක්ට අමාරුයි. දවසින් දවස වෙනස්වෙන මෝස්තරනේ තියෙන්නේ. අදින් මාස තුනක් ඉස්සරහට යන ෆැෂන්ස් තෝරන්න පුළුවන් වෙන්නෝන. අනික අපිට වඩා ඒක මුස්ලිම් අය හොඳට කරනවා. එයාලා සුද්දි බැංකොක්වලින් පොඩි ගෙයක් අරන් ඉන්නේ. කුලියට වගේ. සති දෙකක් පුරා එයාලා ඇඳුම් තෝර තෝර ඒ ගෙදරට ගොඩ ගහනවා පස්සේ ඒවා එතනදීම පැකින් කරලා ලංකාවට ගේනවා. එහෙන් ගන්නේ මෙහෙන් ඕඩර් අරන්. එක කෑල්ලකින් ලොකු

ප්‍රොෆිට් එකක් තියාගන්නේ නෑ. මුස්ලිම් අය බැංකොක් ගියා කියලා එහේ වෙනම ජොලියක් ගන්නේ නෑ. පරාටයක් කාලා තේ එකක් බීලා වැඩේ කරනවා. අපි ගියොත් වෙන දේවල් කරන්න යනවා. ඔක්කොටම වඩා කස්ටම් එකේ ඇස් වහලා බඩු ගේන්න එයාලා දන්නවා. බැංකොක්වලින් බඩු ගේන්න පුළුවන්. ඒත් ඒවා ලංකාවේ සාප්පුවලට දාන එක ලේසි නෑ. මොකද සියයට අනූවක් ඇඳුම් සාප්පු මුස්ලිම් අයගේ.”

භාවනා පරිස්සමින් අසාගෙන උන්නාය. එය පවා දේවක කළොත් සාර්ථක වේයැයි ඇයට සිතුණි.

“ඇයි සුද්දි එහෙම ඇහුවේ.”

“න්නෑ මේ අපේ මිහිරංග අයියලා

මලීෂාලා කරන්න යන්නේ ඒක. සීග රි එකේ කොටස අරන්. ඔය අද උදෙත් ඇවිත් අහනවා මේක කවදා ඉවරකරලා එයාලගේ සල්ලි දෙයිද කියලා."

දේවක සිනාසුනේය.

"තමන්ගේ දේ නැතිකරගෙන වෙන දේවල් කරන්න යන්න නරකයි. එහෙම අයට හරියන්නේ කලාතුරකින්"

භාවනා හිස වැනුවාය.

"ඒක කියපු වෙලාවේ මටත් හිතුනේ ඒකයි. අපි එහෙම නෑනේ අයියේ."

දේවක ඔහුගේ අතින්ම බටර් කේක් පෙට්ටිය ගෙනගොස් වාහනයේ ඩිකියට දැමුවේය.

"වාහනේට වෙලා ඉන්න.

කඩවල්වලට එන්න එපා"

ඔහු පැමිණ කීවේය. භාවනා බැලුවාය.

"ඇයි?"

"පව්. එහෙම හොඳ නෑමට මේක කරන්න පුළුවන්"

"අපේ දේනේ අයියේ. ඒක හිතන්න එපා"

"අපිට යන්න ඕන එකපාරයි. ඊට පස්සේ සේල්ස් රෑට් එකක් හදන්න පුළුවන්"

"යමු"

භාවනා අත් බෑගය කරට දමාගෙන කීවාය. දේවක නෙත්පුරා ඇය දෙස බැලුවාය.

"ඇයි කියන්නකෝ. හිතන දේ මම වගේ බස් ගාලා කියලා දාන්න. නි..ද..හ..ස්..නේ"

"සුද්දි ෂෝක්"

දේවක කීවේය. භාවනා තොල්පට තදකරගත්තාය.

"පිප්පි දාන්නද?"

ඇය සිනාව තදකරගෙනම ඇසුවාය. දේවක ලැජ්ජාවෙන් බිම බලාගත්තේය.

# 17

ග්‍රෝසරියක් ග්‍රෝසරියක් ගානේ භාවනාත් බැස්සාය. මුදලාලිලාගේ ප්‍රතිචාරය හොඳය.

"මේ පෙට්ටි කේක්වලට වඩා ෂෝක්නේ මහත්තයා."

"මේවා අපි ගෙදර කන විදිහට දැම්මේ මුදලාලි මහත්තයා. රසයි නේද?"

"මටත් හිතුණා එකක් අද ගෙදර අරන් යන්න"

දේවක එක කේක් එකක් ගෙන මුදලාලි අතට දෝතින්ම දුන්නේය.

"මේ කේක් එක මුදලාලි මහත්තයා ගෙදර අරන් යන්න. ඒක මම ගානේ. මම පහක් විතර දාන්නද මුදලාලි සේල්ස් එකටත්. කඩේට රුපියල් තිහක් තියෙනවා කේක් එකකින්."

"දාලා බලමු. එන අයට මාත් කියන්නම්. හොඳ නෝනලා ටිකක් එනවා. ඇල්ලුවොත් ටිකක් වැඩිපුර දාමු"

දේවක කේක් පහක් පමණක් ගෙන ප්ලාස්ටික් ට්‍රේ එකක කැෂියර් කූඩුව අසළින්ම තැබුවේය.

"අපි හෙට අනිද්දා එන්නම් මුදලාලි මහත්තයා. පුළුවන්නම් මුදලාලි එන නෝනලාට කියන්න."

භාවනා පොඩි බිලක් දමා මුදලාලිට දුන්නාය.

"නෝනයි මහත්තයයි මේ සේල්ස් එනවා දැක්කමයි. කේක් දහයක් විතර දාමු නෝනා."

තවත් ග්‍රොසරියකින් කීවේය. භාවනා තොල්පට තදකරගෙන දේවක දෙස බැලුවාය. 'අපි දෙන්නා නෝනයි මහත්තයි වගේ තමයි' ඈය සිතුවාය.

"අපි අද කේක් ගොඩක් අරන් ආවේ නෑ මුදලාලි මහත්තයා. පහක් දාමු. ගියොත් හෙට ටිකක් වැඩිපුර අරන් එන්න පුළුවන්"

හවස හය වෙනතුරු දෙන්නාම කේක් අලෙවියේ ගියෝය.

"සේල්ස් නෝනට අමාරුත් ඇති."

භාවනා සිනාසුනාය. වාහනය

පැදෙව්වේ දේවකය.

"මේකත් ෂෝක් වැඩේනේ අයියේ."

"හොඳ ප්‍රඩක්ට් එකක් තියෙනවානම් සේල්ස් අමාරු නෑ සුද්දි. අපි හෙට කේක් දෙසිය පනහක්වත් දාගෙන එමු. දවස් තුනක් සේල්ස් කළාම හොඳම කඩවල් පනහක් අපිට අල්ලගන්න පුළුවන්."

"එතකොට අයියේ."

"මං විශ්වාසයෙන් කියනවා ඒ කඩවල් පනහට සතියකට කේක් එක්දාස් පන්සීයක් යවන්න පුළුවන් කියලා. එක කඩේකට කේක් තිහ ගානේ"

ඇය දෙනෙත් ලොකු කරගෙන උන්නාය.

"එතකොට"

"එක කේක් එකකින් අපිට රුපියල් සීයක් තියාගන්න පුළුවන්. සතියකට අපි දෙන්නට ලාබේ එක්ලක්ෂ පනස් දාහක් ලැබෙනවා. මාසෙකට රුපියල් ලක්ෂ හයක්. සීගිරි එකේ ලෝන් එක අපිට මේකෙන්ම ගෙවන්න පුළුවන්. මගේ ප්ලෑන් එක ඒක"

"මං හිතුවේ නෑ එච්චර."

"නෑ සුද්දි පුළුවන්. මේ එක බටර් කේක් එකකින් විතරයි. අපි ඊට පස්සේ හදනවා රස චොකලට් කේක් එකක්. ඒක රුපියල් තුන්සීයකට අපි දාන්නේ. ඒකත් හොඳ ගාණක් යනවා. එතනිනුත් ලක්ෂ හයත් ගත්තොත් අපිට ලක්ෂ දොළහක් තියෙනවා. එතකොට බේකරි සෙක්ෂන් එකට තියෙන අවන් මදිවෙනවා. මික්සර් මදිවෙනවා. අන්න එදාට

අපි තවත් අවන් එකක් ගන්නවා. තව මික්සර් එකකුත් දානවා. වැඩට කෙල්ලෝ දෙන්නෙකුත් තව දානවා"

දේවක කියද්දී එය ඇත්තටම ළඟාකරගත හැකි ඉල්ලක්කයකැයි ඇයටද සිතුණි. ඔහු ඉලක්ක හදන්නේ එය ඉටුකරගන්නට යා යුතු මාර්ගයද පාදාගෙනය. හරියන්නේ එවිටය.

"මේක අයියේ අපි දෙන්නම කරමු හොඳේ"

ඇය කීවාය.

"එහෙනම් ටික දවසක් මාත් එක්ක සේල්ස් යමු හොඳේ."

ඔහු කීවේ කරුණාවෙනි.

"ඕන දේකට කතාකරන්න. මම එනවා."

"ඕන දේකට."

"ම්. ඕන දේකට."

"ඒක හිතේ තියාගන්නම්."

'පිප්පි දාන්න එනවද කියලා ඇහුවොත් තමයි වැඩේ.' ඇය මුව තදකරගෙන සිතුවාය. පසුව බැබලෙන දෙනෙතින් ඔහු දෙස බැලුවාය.

"ඇයි සුද්දි."

"න්නෑ. නිකං."

"තිබහයි නේ."

"කේක් කෑල්ලක් කාලා තේ එකක් බොමුද"

"හා."

දෙන්නාම කේක් කෑලි දෙකක් කා මඟ හෝටලයකින් තේ ගෙනවිත් බිව්වෝය. මේ ජීවිතයෙත් පුදුමාකාර සැනසීමක් ඇතැයි භාවනාට සිතෙයි. ඒ සැනසීම ඇත්තේ ඔහු ළඟ ඉන්නා

නිසා නොවේද?

දේවක සීගිරි හී අලුතින් නිමවූ බේකරි අංශයේ සේවකයන්ට එන්නට කීවේය. ප්‍රධාන බේකරි බාස් සමඟ උදව් කරුවන් තුන්දෙනාද ආවෝය.

"අපි අද හැදුව බටර් කේක් එකේ ප්‍රශ්න ටිකක් තියෙනවා දයාසිරි"

භාවනා දේවක දෙස බැලුවේ පුදුමයෙනි. ඇයට එහෙම එක අඩුපාඩුවක්වත් තේරුණේ නැත. අරම කියද්දීත් භාවනාට පුදුමය.

"එකක් කේක් එක ටිකක් තෙත වැඩියි."

"අපි සර් කේක් ටික රස්නේ පිටම පැකින් කළානේ."

"හරි මටත් ඒක හිතුණා. අපි කේක් ටික එහෙනම් හරියටම කූල් කරලා පැකින් කරමු. කූලින් රැක්

එකේ පැය බාගයකට වඩා තියෙන්න වෙයි නේද දයාසිරි.”

“ඔව් සර්. ඒත් වේලෙන්න කලින් පැකින් කරන්නත් ඕන. මං ඒක බලන්නම් සර්”

“අනිත් එක දයාසිරි සමහර කේක් මැදින් ඩවුන්. බැහැලා”

දයාසිරි හිස කැසුවේය. දේවකගේ සියුම් නිරීක්ෂ ශක්තිය පුදුමාකාර යැයි භාවනාට සිතුණි.

“ඒක සර් බැටර් එක මික්ස් කරනකොට වෙච්ච වැරැද්දක්. බිත්තර සුදු මද ටිකක් වෙනම බීට්කරලා දැම්මාම හරි. කේක් එක ෆ්ලැට් වෙනවා. බේකින් පවුඩර් එක හරියට බැටර් එකේ මික්ස් වෙන්නත් ඕන.”

“ඒක අපි හදාගන්න ඕන. මට

ඕන තනි ෆ්ලැට් බටර් කේක් ටිකක්. අතනින් මෙතනින් බැහැලා තියෙන්න බැහැ"

සමහර කේක්වල එහෙම තිබෙනවා භාවනාද දුටුවාය. එය බටර් කේක්වල ස්වභාවය කියා ඇය ඒ වෙලාවේ සිතුවාය. ඒත් එහෙම නැත.

"පැණි රස ටිකක් අඩුකරලා වැනිලා රස ටිකක් වැඩිකරන්න ඕන. හැමතැනම ෂුගර් අයනේ දයාසිරි."

"සමහර සීනිවල පැණි රස වැඩි නිසා සර් එහෙම වෙන්නේ. මම ඒක හදන්නම්."

"හෙට අපිට බටර් කේක් හාරසීයක් ඕන දයාසිරි. සේල්ස් හොඳයි. කාපු කාපු මුදලාලිලා පුදුම වෙනවා. හෙට උදේ හයටවත් වැඩ

පටන් ගමු. මාත් එන්නම්. දයාසිරිගේ අත්දෙකින් රසම කේක් හැදෙයි. ඒක මට විශ්වාසයි”

ඔහු අඩුපාඩු ටික පමණක් කියා හිත රිදවා යැව්වේ නැත. හොඳද කීවේය. සේවකයා යන්නේ සතුටිනි.

“අපි රෑ ඉඳලා කේක් ටික හදන්නද සර්. උදේ හදන්න ගියොත් හවස් වෙනවනේ. දැන්මම බඩු ටික කිරලා ගත්තොත් අපිට කේක් ටික උදේට පැකින් එකට ලෑස්තිකරන්න පුළුවන්”

“ඒක තමා හොඳම දේ. මං තව කොල්ලෙක්වත් දයාසිරිට දෙන්නම්”

බේකරි සේවකයන් ගිය පසු භාවනා දේවක දෙස බැලුවාය.

“මට අර අඩුපාඩු ටික පෙනුණේ නෑනේ දේවකයියේ”

"ප්‍රඩක්ට් එකක් සුද්දි දරුවෙක්ව හදනවා වගේ හදන්න ඕන. අම්මා තාත්තා කැමති නෑ තමන්ගේ දරුවගේ අඩුපාඩු පිට අයට අහුවෙනවට. ඒ නිසා පුළුවන් තරම් ගෙදරදී හරියට හදලා යවනවා. එහෙම කරන්න දරුවගේ තියෙන අඩුපාඩු ගෙදරදීම අඳුනගන්න ඕන. එහෙම අම්මා තාත්තාගේ දරුවෝ සමාජයෙන් හොඳම අහනවා. මොකද අම්මයි තාත්තයි පැටියව හදලා තමයි එවන්නේ. ආදරේ කියන්නේ හොඳම දකින එකට නෙමෙයි. අඩුපාඩු ආදරෙන් හඳුනගන්න එකට. ඒවා කරුණාවෙන් හදන එකට. අන්තිමට දරුවයි බැබලෙන්නේ. අම්මා තාත්තා නෙමෙයි"

ඇය සාවධානව අසාගෙන උන්නාය.

"මගේ අඩුපාඩුවකුත් කියන්නකෝ මගේ හොඳ සුදු තාත්ති වගේ."

ඇය කරුණාවෙන් කීවාය. ඒ වචන ටිකට දේවකගේ දැස්ද තෙත්විය.

"තරහ වෙන්නේ නෑනේ කිව්වට."

ඔහු ඇසුවේය.

"නෑ කිව්වනේ. මං දන්නවනේ ආදරේට කියන්නේ කියලා"

"හරි. එකක් සුද්දි ඩෙනිම් ජීන්ස් අඳින එක. සුද්දිට ඩෙනිම් ලස්සන නෑ. හදිස්සි වෙලාවක අඳිමු. ඒත් ලස්සනම ඒක නෙමෙයි."

ඔහු එය මුහුණටම කීවේය.

'අදින් පස්සේ මගේ අල්මාරියේ ඩෙනිම් ජීන්ස් නෑ.' ඇය සිතින් සිතාගත්තාය.

"ඒක මේ."

ඔහු කියන්නට ගිය දේ ඇය වැළැක්වූවාය.

"ඒ ඇති. සුද්දි අද ඉඳලා ඩෙනිම් අඳින්නේ නෑ. එච්චරයි. හරි. ඩන්. දෙක අයියේ"

ඔහු අසරණව හිස කැසුවේය.

"තරහ නෑනේ"

"මං ඒම කිව්වද? අනිත් එක අයියේ."

"සුද්දි කනකොට පොඩ්ඩක් අම්මටයි තාත්තටයි කෝල් එකක් දෙන්නේ නෑ කෑවද කියලා අහන්න."

ඔහු අද කන්නට පෙර අප්පච්චිට කතාකරනවා ඇයද බලාගෙන උන්නාය. කලාතුරකින් මිසක භාවනාට අම්මාටත් තාත්තාටත් කතාකරන්නට මතක්වෙන්නේ නැත.

"තේරුනා. සමහර දවස්වලට

අම්මා කතාකරලා අහනවා කෑවද කියලා. තාත්තා රෑට කන්න කලින් කාමරේට ඇවිත් අහනවා සුද්දි කාලද ඉන්නේ කියලා. මට අහන්න අමතක වෙනවා තමයි. හෙට ඉඳලා ඒක කරනවා අයියේ."

"ඒක කරන්න. ආදරේ හිතේ තියාගෙන ඉන්න එපා. කියන්න."

ඇය යමක් කියන්නට මෙන් හැදුවාය.

"කියන්න සුද්දි"

"ආදරේ හිතේ තියාගෙන ඉන්න නරකයි තමා නේ. කියලා දාන්න ඕන"

ඇය කීවාය. දේවක හිස වැනුවේය. 'ඉක්මනට කියනවා' ඔහු සිතින් කීවේය.

"තව අයියේ"

"තව නෑ. දෙකෝටි විසිපන් ලක්ෂ අසූ දෙදාස් නමසිය අනූ දෙකක් හොඳ මැද නරකට තිබ්බේ ඔය දෙක විතරයිනේ."

"මගේ හොඳ දෙකෝටි විසිපන්ලක්ෂ අසූ දෙදාස් නමසිය අනූ දෙකක් තියෙනවද?"

ඇය ඇසුවාය.

දේවක හිස වැනුවේය.

"මමවත් දන්නේ නෑනේ මම එච්චර හොඳයි කියලා."

"සුද්දි තරම් හොඳ කෙනෙක් නෑ."

ඔහු පැහැදිලි සිංහලයෙන් කීවේය. භාවනාගේ දෙනෙත් තෙත්විය. ඇත්තටම තෙත් විය. ඇය ඇඬුම් වාවාගෙන උන්නේ අමාරුවෙනි.

"ඇත්තටම නැද්ද අයියේ."

"න්නෑ."

"ඔයයි හොඳ? මං නෙමේ"

ඇය අඬමින්ම කීවාය.

"අනේ.."

ඔහු කාමරයේ දොර දෙස බලා ඇගේ හිස අතගෑවේය. භාවනාගේ දෙනෙතග නැලවුණ කඳුළ වැටිණ.

"මී. මේක අද ගෙදර යනකොට අරන් යන්න. අම්මටයි තාත්තටයි කන්න දෙන්න. සුද්දිගේ අතින්ම තේත් හදලා දෙන්න."

ඔහු බටර් කේක් දෙකක් අසුරා බෑගයක දමා භාවනාගේ අතට දුන්නේය.

"රෑට කතාකරන්න හොඳේ"

"ගන්නවා සුද්දි."

"කනකොට මට හැමදාම කතාකරන්නේ ඒකද?"

ඇය ඇසුවාය. දේවක හිස වැනුවේය.

"පරිස්සමින් යන්න හොඳේ."

ඔහුට පුංචි හාදුවක් දී යන්නට ඇයගේ දෙතොල් බලාගෙන මෙන් උන්නේය. එහෙත් භාවනා අද එය දුන්නේ නැත. වෙන දෙයක් නිසා නොවේ. එකක් දී මදි නිසාය.

# 18

නිවසට ආ මොහොතේම භාවනා සාරිය ගළවන්නේවත් නැතුව ඇගේ ඩෙනිම් ජීන්ස් සියල්ලම ඇඳ මතට ගත්තාය. ඩෙනිම් කළිසම් හතක් තිබුණි. සමහරවිට මේ ජීවිතයේ යළි කිසිම දිනයක ඩෙනිම් කළිසම් අඳින එකක් නැත. ඔහු කියන්නේ ඩෙනිම් කළිසම්වලට වඩා වෙන ඇඳුම්වලට තමා ලස්සන බවය. එසේ කියන්නේ තමාගේ ලස්සන කරුණා ඇසකින්

දුටු කෙනෙක් බව භාවනා හොඳින්ම දනී. ඉතින් අහන්නේ නැතුව සිටිය නොහැක.

"පොඩි අක්කට දෙනවා. ඒකිගේ ජාතික ඇඳුමනේ ඩෙනිම."

භාවනා ඩෙනිම් සියල්ලම තාරකාගේ අල්මාරියට ගොස් දැමුවාය. දැන් හිත නිදහස්ය. ඇත්තටම නිදහස්ය. ඊටත් පසු ඇය ඇඟ සෝදාගෙන විත් කේක් කැපුවාය. තේ හැදුවාය.

"මේ ඇයි සුද්දි. මේ ආපු ගමන් කේක් කපාගෙන තේ හදන්නේ."

"හැදුවාමත් ඉතින් අනේ"

ඇය බැණ්ණාය.

"අනේ ඔයාගේ තේ එකක් බොන්න ආසාවේ බෑ. කාළෙකින් ඔයාගේ තේ එකක් බිව්වේ නෑ."

භාවනා සිනාසුනාය. පසුව ඇය තේ සහ කේක් ට්‍රේ එකක තබාගෙන සාලයට ආවාය. අද මිලින්දද වේලාසනම නිවසට පැමිණ උන්නේය.

"සීයා එන්ඩ තේ බොන්න"

භාවනා සීයාටද කතාකළාය.

"අද සුද්දිගේ තේ."

"ෂා. මගේ පොඩි මිණිපිරියගෙන් තේ එකක් බීලා නෑ කාලෙකින්"

"අද බොන්නකෝ සීයා. මේ අපේ බටර් කේක් තාත්තා."

ඇය පොඩි කඩදාසි ප්ලේට්වලට බටර් කේක් දමා දුන්නාය. නේත්‍රා සිනාසුනාය. 'ඔය කොල්ලගේ වැඩ' ඇය සිතින් කීවාය.

"ෂා. මට අද ඒ පැත්තේ එන්නත් බැරිවුණා. හොඳට තියෙනවානේ පුතේ."

"අද තාත්තා අපි සේල්ස් කළා. සීගිරි කේක්. මේ පැකින් එක"

භාවනා පැකින් කළ බටර් කේක් එකක් ගෙන පෙන්නුවාය.

"මේක සුද්දි මේ අපේ කේක්"

"ඔව්. අද මාකට් එකට දැම්මා තාත්තා. හොඳට ප්‍රතිචාර තියෙනවා. දේවකයියා කියන්නේ අපිට මේ කේක් එකෙන් මාසෙකට ලක්ෂ හයක ලාභයක් ගන්නවා කියලා"

මිලින්ද පුදුම විය.

"මේකෙන්."

"ඔව් අපි දෙන්නනේ සේල්ස් ගියේ තාත්තා"

"ඔයයි දේවකයි."

"ඔව්. වෙන අයව යවලා බෑ තාත්තා. අපි ලබන සතියේ තව චොකලට් කේක් එකක් දානවා. සීගිරි

හෝම්මේඩ් චොකලට් කේක්. ඒකටත් හොඳ මාකට් එකක් තියෙනවා. දේවකයියා කියන්නේ බෑන්ක් ලෝන් එක ඒකෙන් ගෙවමු කියලා"

මිලින්ද බැලුවේ රඹුක්වැල්ල මහතා දෙසය.

"අපිට තාත්තා ටික දවසක් යද්දී වෙනම කේක් ප්‍රඩක්ෂන් එකක් පටන් ගන්න පුළුවන්නේ."

"ඒක නෙමේ පුතා වැඩේ."

රඹුක්වැල්ල මහතා කීවේය. සියල්ලෝම බැලුවෝය

"මොකක්ද තාත්තේ"

"දැන් පුතා ඔය අවන් එකකුයි මික්සින් මැෂින් එකකයි දේවකට ගන්න පුළුවන්නේ. අද කාලේ බැංකුවකින් ණයක් ගන්න පුළුවන්නේ ඕන දේකට"

"ඔව් තාත්තේ"

"එහෙම අරන් ඔය කේක් එකම දේවකට තිබුණානේ හදන්න. හදලා එයාටම සේල්ස් කරන්න තිබුණානේ. අපිට නොදී."

රඹුක්වැල්ල මහතා කියද්දී මිලින්ද හිස වැනුවේය.

"එහෙම නොකලේ සීයා එයා මේ ලාබෙට ගන්න පුළුවන් දෙකයි පනහේ කොල්ලෙක් නොවන නිසා."

භාවනාගේ මුවින් එවදන් පිටවිය. ඉඳුනිල් දෙතොල් පට තදකර සිනාසුනාය. මිලින්දට බැලුනේ තම බිරිඳ දෙසය.

"ඔව් අපි පිළිගන්නවා. අපි කොල්ලව රැකගන්න ඕන ඒ නිසා."

මිලින්ද කීවේය. 'සමහර කුමාරයන්ව රැකගන්න රටක්

රාජ්‍යයක් දෙන්න වෙනවා’ නේත්‍රා කීවේ සිතිනි.

“තේ සීයා.”

භාවනා තේ ඇල්ලුවාය. විස්තර කළ නොහැකි ඝනකම් යමක් සීගිරි පවුලේ අයගේ හදවත්වල මේ මොහොතේ තිබුණි. කිසිවෙක් කතානොකළේ ඒ නිසාය.

“කේක් සෙක්ෂන් එකේ ප්‍රොෆිට් එක පුතේ ඔයා වෙනම එකවුන්ට් එකකට දාගන්න. ඒකෙන් දේවකටත් වෙනම මුදලක් දෙන්න”

රඹුක්වැල්ල මහතා කීවේය.

“මෙතන තියෙන්නේ එක එකවුන්ට් එකයි සීයා. ඒ සීගිරි එකවුන්ට් එක විතරයි. දේවකත් එහෙම දෙයක් බලාපොරොත්තුවෙන්නේ නෑ. අපි මේක ඇතුලේ වෙන වෙනම බිස්නස්

හදන්න ඕන නෑ. ලැබෙන දෙයක් තියෙන දෙයක් අපි හැමෝගෙම."

භාවනා පැහැදිලිව කීවාය. රඹුක්වැල්ල මහතා අරම කීවේ කෙල්ල එසේ නොකරන බව දැනගෙන මය. රඹුක්වැල්ල මහතා ඔහුගේ ජංගම දුරකථනයෙන් ඇමතුමක් ගත්තේය.

"ආ පුතා මම. ඔය මඟුද?"

භාවනා අත් බැඳගෙන බලාගෙන උන්නාය. සීයා දේවකට ගන්නට ඇත්තේ හේතුවක් නැතිවය.

"ඔයාලා අද හදපු බටර් කේක් එක මේ කන ගමන්. ඒක ෂෝක් එකට ඇවිත්නේ පුතා"

දේවක ඒ පැත්තෙන් කියන්නේ මොනවා විය හැකිද කියා භාවනා සිතුවාය.

"ඔයයි භාවනායි ඒ සෙක්ෂන් එක වෙනම හදාගන්න පුතා. මම මේ දැන් කෙල්ලට කිව්වෙත් ඒකයි. ඔයාට ඒකෙන් වෙනම පේමන්ට් එකක් හදලා දෙන්න කියලත් කිව්වා"

රඹුක්වැල්ල මහතා කීවේය. භාවනාට සැකයක් නැත. ඔහු කුමක් හෝ කියනු ඇත.

"අපේ ටාගට් එක සර් සීගිරි එක. වෙනම සෙක්ෂන් එකක් කරමු සර්. ඒක කමක් නෑ. හැබැයි ඒකේ ආදායමත් සීගිරි එකවුන්ට් එකටම තමයි යන්නේ. වෙනම එකවුන්ට් ඕන නෑ සර්. වෙනම පේමන්ට් ඕනත් නෑ"

රඹුක්වැල්ල මහතා ස්පීකර් ෆෝන් දැම්මේ සියල්ලන්ටම ඇසෙන සේය.

"සර් එහෙම හිතන්නත් එපා. එක නමක් එක හෙවණක් එක ගලක් ඒ

සීගිරි ගල විතරයි සර්"

"එහෙම නෙමේ පුතා. මේකෙන් හොඳ පොෆිට් එකක් එනවා කියලා කිව්වේ දැන්"

"අපි කොහොමත් සර් ලක්ෂ දොළහක් මාසෙකට මේකෙන් හොයනවා. ඒක සර් අපි වෙනම අයින් කරමු ලෝන් එක ඉක්මනට ගෙවලා දාන්න. සීගිරි එක කෑලි කෑලි කැඩුවා දැන් ඇති සර්. අපි එකට නැඟිටිමු. මං සර්ට පොරොන්දු වෙනවා අපි සීගිරි එක ඉස්සරහ දාන පේස්ට්‍රි ෂොප් එකෙනුත් හොඳ ප්‍රොෆිට් එකක් අරන් දෙනවා කියලා. ඒක මගේ ඩ්‍රීම් එකක් සර්. මට මාස හයක් දෙන්න සර්. අපි සීගිරි දෙවෙනි බ්‍රෑන්ච් අවුට්ලට් එක ඕපන් කරනවා සර්"

සියල්ලෝම මේ කතාව අසාගෙන සිටියහ. මිලින්දට බැලුවේ භාවනා දෙසය. ඇයගේ දෙනෙත්වල ජයග්‍රාහී සිනාවක් රැඳී තිබුණි.

"ඒත් ඉතින් පුතා ඔයත් හැදෙන්න ඕනනේ."

රඹුක්වැල්ල මහතා කීවේය.

"සීගිරි එක හැදුනොත් අපිත් හැදෙයි සර්. අපි සීගිරි එකත් එක්කම හැදෙමු. අපි එක කතාවක් ලස්සනට ලියමු සර්. ඒ සීගිරි කතාව විතරයි. ඒක විතරමයි"

"හරි පුතා. මම හෙට ඔයා එක්ක කතාකරන්නම්."

"හොඳමයි සර්."

රඹුක්වැල්ල මහතා දුරකථනය තබා භාවනා දෙස බැලුවාය. ඇය සිනාසුනාය. ඒ සිනහවේ සියල්ල

තිබුණි.

"මට පුදුම එක දෙයක් ගැනයි. මේකා කොහෙන්ද ආවේ කියලා."

රඹුක්වැල්ල මහතා කීවේය. 'ඔයාගේ පොඩි දුවගේ බඩෙන් පොඩි එකා ආවේ' නේත්‍රාට දැන්මම එය කියා දමන්නට සිතුණි.

"අම්මත් නැතුව කොල්ලව ඒකගේ අප්පච්චි හොඳට හදලා සීයේ. හැදිච්චකම ලේවලම තියෙන්න ඇති"

නේත්‍රා කීවේ එපමණය.

"ඒත් දවසක දේවක වෙනුවෙන් දෙයක් කරන්න ඕන."

ඔහු කීවේය.

"කියලා හරියන්නේ නෑ. ඒක ක්‍රියාවෙන් කරන්න ඕන."

මෙතෙක් වෙලා නිහඬව උන් ඉඳුනිල් කීවාය. මේ ඇය සීගිරි එකේ

දෙයකට කතාකළ පළවෙනි වතාවය. මිලින්දටද පුදුම සිතුණි. ඔහු තම බිරිඳ දෙස බැලුවේද ඒ නිසාය.

"ඇත්ත ඉන්දු."

භාවනාට අම්මා ගැන ඇතිවූයේ කිව නොහැකිතරම් ආදරයකි. ඇය මේ කතාකළේ දේවක වෙනුවෙන් නොව තමා වෙනුවෙන් යැයි ඇයට සිතෙයි.

"මේක ඕපන් කළාට පස්සේ කාර් එකක් දෙමු."

රඹුක්වැල්ල මහතා කීවේය.

"එහෙම හොඳයි තාත්තේ."

නේත්‍රා සිනාසුනාය.

"දෙන දෙයක් ගැන දැන්ම හිතන්න ඕන නෑ. ඒකට වෙලාවක් එයි තාත්තා."

නේත්‍රා කීවාය. මිලින්ද තම ලොකු

දුව දෙස බැලුවේ ඇය කියූ දේ තේරුම් ගෙන මෙන්ය.

"එහෙම හිතෙනවද ඔයාට."

"ඔව් තාත්තා"

එතනින් කතාව අවසන් විය. භාවනා හිස් තේ කෝප්ප ටික ගෙන මුළුතැන්ගෙයට ආවාය. ඉඳුනිල්ද ඇය පසුපසින්ම ආවාය.

"වෙසක් එකට තව කලුත් තියෙනවා. සමහරුන්ගේ මූණෝ දැන්මම තෝරණ් බැදලා වගේ"

ඇය ශීතකරණය විවෘතකරමින් කීවාය. භාවනා පිටුපසින් පැමිණ අම්මාව වැළඳගත්තාය.

"මගේ හොඳ අම්මා."

ඇය ඉඳුනිල්ව සිපගනිමින් කීවාය.

"දැන් මොකක්ද මම කරපු හොඳ වැඩේ."

ඇය ඇසුවාය.

"නිකං අනේ. ඒක නෙමේ අම්මා."

"ම්."

"අද කීයටද දවල්ට කෑවේ."

"ම්. තුනාමාරට විතර කෑවේ. ඔයා කියන්නේ මට අද කන්න අමතක වුණා. එකොළහට විතර තේ බිව්වේ. තුනහමාරට විතර තමයි මතක් වුනේ කෑවේ නෑ කියලා. කෑමත් සීතලවෙලා"

"බලන්න. අද එක්කෙනෙක් හොඳ කතාවක් කිව්වා."

"කවුද එක්කෙනා."

"එක්කෙනා වැඩක් නෑ අනේ. අහන්නකෝ"

"ම්"

"මේ බටර් කේක් එක ගැන කතාකලේ. මටනම් ඒක මරුම

මරු. ඒත් එයා හවස සේල්ස් ගිහින් ඇවිත් බේකරි සෙක්ෂන් එකේ අයව ගෙනල්ලා අඩුපාඩු ගොඩක් කිව්වා"

භාවනා ඒ කතාවම කීවාය.

"ඉතින්."

"ඒ වෙලාවේ කියනවා ප්‍රඩක්ට් එකක් කියන්නේ දරුවෙක් වගේලු. අම්මා තාත්තා දරුවෙක්ව හදනවා වගේ ප්‍රඩක්ට් එකක් හදන්න ඕනලු. අඩුපාඩු ගෙදරදීම දකින්න ඕනෙලු."

භාවනා දේවක කියූ කතාවම කීවාය.

"ඇත්තනේ සුද්දියේ"

"ඉතින් ඒ වෙලාවේ මම කිව්වා මගෙත් අඩුපාඩුවක් දෙකක් කියන්න කියලා. හොඳ තාත්තා කෙනෙක් වගේ. හදාගන්න."

"මට කිව්වානම් මම සීයක් විතර

කියනවා."

"යන්න අනේ. එයා කියන්නේ මගේ හොඳ දෙකොටි විසිපන්ලක්ෂ අසූ දෙදාස් නමසිය අනූ දෙකක් තියෙනවා කියලා."

"එච්චර. තිස් හතරක් විතර ඇති."

භාවනා අම්මාට රැව්වාය.

"ඉතින් ඒ අතරේ දෙකක් විතර නරකත් තියෙනවාලු."

"අනේ ඒකට අහුවෙලා තියෙන්නේ දෙකද?"

ඉඳුනිල් සිනාසී ඇසුවාය.

"ඔව් දෙකයි. මොකක්ද දන්නවද ඒ දෙක"

භාවනා පළවෙනි එක කීවාය. ඒ ඩෙනිම් කතාවය.

"ඇත්ත. ඔයාට ලස්සන සාරියයි

බ්ලවුස් ඇන්ඩ් ස්කට් එකයි ගවුමයි තමයි. ඩෙනිම් ත්‍රී ක්වාටර් එහෙම ලස්සන නෑ. මාත් ආස නෑ."

"ඉතින් කියන්නෙපැයි අනේ. මම ගෙදර ඇවිත් ඩෙනිම් සේරම පොඩි අක්කගේ අල්මාරියට දැම්මා"

ඉඳුනිල් ඒ කතාවෙන් බොහෝ දේ සිතාගත්තාය.

"ඉතින් දෙවෙනි වැරද්ද?"

"මම මේ කනකොට අම්මටයි තාත්තටයි කතාකරලා කෑවද කියලා අහන්නේ නෑලු. එයා එහෙම කරනවා. සමහරවෙලාවට අප්පච්චිට බණිනවත් එක්ක දැන් කන්න කියලා. ඒක ඇත්තනේ. දැන් ඔයා කාලා නෑනේ. දවල් මම කතාකළානම් බැනලා කන්න යන්න කියනවා."

ඉඳුනිල්ගේ දෑස් තෙත්විය.

දෙවියන් තම පොඩි දුවට හොඳ දරුවෙක් මුණ ගස්සවා ඇත. සමහර විට එහෙම හාස්කම් සිදුවෙයි.

"හොඳ දරුවෙක්."

"එහෙම හිතෙනවද ඔයාට."

"ඔව්."

"මටත් හිතෙනවා අම්මා. සමහරවිට දැකපු හොඳම කෙනා වෙන්න ඇති"

"හිම්හිට හිතන්න. හදිස්සියක් නෑනේ."

"කොහෙත්ම නෑ. පිට පළාතකට ට්‍රිප් එකක් ගියාම බයයි. හොඳ හෝටලයක් හම්බවෙයි ද රූම් එකක් ලැබෙයිද හොඳ සනීප ඇඳක් ලැබෙයිද කියලා. ඒත් ඉතින් ගෙදර එනකොට ඒ බය නෑනේ. ගේ තියෙනවා. හොඳම රූම් එකක්

තියෙනවා. හරිම පුරුදු ඇඳක් තියෙනවා. වැටෙන්න විතරයි ඕන නින්ද යනවා. සමහරුත් එහෙමනේ"

භාවනා ගියේ ඔය ටික අම්මාට කියාය. ඉඳුනිල් තනිවම සිනාසුනාය. පොඩි දුව ගියේ සෑහෙන දේවල් කියාය. මොනවාවත් කියන්නේ නැතැයි කියා ඇයට දොස් කීම සාධාරණ නැත. කෙල්ල වචන ටිකකින් හැමදේම කීවාය. වටින්නේ එයය.

# 19

සති දෙකක් තුළ සීගිරි සුපර් මාර්ට් වෙතට බැංකු ණය මුදාහරින්නට බැංකුව කටයුතු කළේය. එය මේ තරම් ඉක්මනින් ලබාගත හැකිවූයේ දේවකගේ කැපවීම නිසාය. ඔහු දවසකට දෙතුන් වතාවක් බැංකුවට ගියේය. සමහර අවස්ථාවල භාවනාවද එක්කාගෙන ගියාය. එක් දිනක් බැංකුවේ ප්‍රධාන කාර්යාලයටද

ගියේය. කීර්තිමත් ව්‍යාපාර ඉතිහාසයක් තිබූ සීගිරි සුපර් වෙතට බැංකු ණයක් දෙන්නට බැංකුවට බියක් ඇතිවූයේ නැත. සුපර් මාර්කට් ව්‍යාපාරය ගැන බියක් ඇතිකරගත යුතුද නැත.

රුපියල් දෙකෝටි හතළිස් ලක්ෂයක චෙක්පත අත තබාගෙන රඹුක්වැල්ල මහතා සෑහෙන වෙලාවක් කල්පනා කළේය. මෙහෙම දෙන්නට අවශ්‍යතාවයක් නැත. එහෙත් මේ සිදුවූ දේ හොඳය. දැන් සීගිරි එක නිසා පවුලේ ප්‍රශ්න ඇතිවෙන්නේ නැත. වඩාත් වටින්නේ එයය.

ඔහු චෙක්පත අත තබාගෙන මුළින්ම කතාකළේ මිලින්දටය.

“පුතා ලෝන් එකේ චෙක් එක

ලැබුණා. මේ දැන් ගෙනත් දුන්නේ. කොල්ලා මහන්සිවෙලා මෙච්චර ඉක්මනට ගත්තේ. මං හිතුවා මාස දෙකක් විතර යයි කියලා."

"මාත් හිතුවේ නෑ මෙච්චර ඉක්මනට ලැබෙයි කියලා තාත්තේ"

"අපි අද හවසම මේ වැඩේ ඉවරකරලා දාමු. ඊට පස්සේ මම සීගිරි එක ඔයාගේ දරුවන්ට ලියනවා. නෙක්ස්ට් වීක්මම එතකොට නිදහස්."

රඹුක්වැල්ල මහතා කීවේය.

"ඒක හදිස්සියක් නෑනේ තාත්තා. මගේ දරුවෝ තමන්ගේ නමට ලියාග න්න ඕන කියලා කියන්නේ නෑනේ"

"ඒ නිසාම තමයි දෙන්නේ"

නංගිගේ දරුවා ගැන කියන්නට මිලින්දට සිතුණි. එහෙත් එය පසුව

කිව යුතුයැයි ඔහු සිතාගත්තේය. රඹුක්වැල්ල මහතා ඉන්පසුව කතාකළේ ඉඳුනිල්ටය.

"තාත්තේ."

"අපිට දුව සීගිරි එකේ ලෝන් එක ලැබුණා."

"ආ තාත්තේ"

ඉඳුනිල්ට මේවා ගැන එහෙමට කියා ලෝබකමක් නැති බව රඹුක්වැල්ල මහතා දැනගෙන උන්නේය. ඔහු තමාගේ ලේලියගේ දුටු හොඳම ගුණයද එයය. ඇය හැමදාම සිතුවේ සීගිරි පවුලේ ජීවිත ගැන මිසක දේපොළ ගැන නොවේ.

"හවසට කෑම ටිකක් ලෑස්තිකරන්න. මේක අපි අද හවසම දීලා දානවා. දෙන එකේ අපි එහෙම හිතේ සැනසීමෙන්ම දීලා දාමු."

"මං හදන්නම් තාත්තේ. තාත්තා දැන්මම කතාකරලා එහෙමම කියන්න"

රඹුක්වැල්ල මහතා සුරංගිටත් රුවන්තිටත් කතාකර හවස එන ලෙස කීවේය. දරුවන්වද රැගෙන එන ලෙස ඔහු කීවේය.

"අද සීගිරි එකේ කොටස් ටික බෙදලා දෙනවා රුවන්ති."

දෙන්නාම කතාකළේ නැත. ලැබෙන දෙයක සතුටවත් දෙමව්පියන්ට දෙන්නට මේ දුවලා කැමති නැත. ඔහු දුක් විය.

ද්වේකත් භාවනාත් ආවේ කේක් සේල්ස් අංශයේ පළවෙනි කලෙක්ෂන් එකද අරගෙනමය.

"එන්න පුතේ."

ණය මුදලේ චෙක්පත අතේ

තබාගෙනම රඹුක්වැල්ල මහතා කතාකළේය.

"චෙක් එක බෑන්ක් කරන්න යවන්නද සීයේ"

"ඔව් පුතේ. මේක අද හවසම දීලා දාන්න මම හිතුවේ."

"ඔව්. දීලා දාන්න සීයේ. සමහරුන්ගේ අත කසනවා ඕක අතට ලැබෙනකල්."

දේවක කිසිවක් කීවේ නැත. සීගිරි පවුලේ දේවල්වලට කතාකරන්නට තමාට අයිතියක් නැතැයි ඔහු සිතුවේය.

"මේ සර් අපේ කේක් සෙක්ෂන් එකේ කලෙක්ෂන් එක. දැනට සර් මේකේ ප්‍රොෆිට් එක අපි මේකටම යොදවන්නද? එතකොට සීගිරි එක තව ටිකක් පොලිෂ් කරලම හදලා

ඕපන් කරන්න පුළුවන්. වෙනම සල්ලි ඕන නෑ”

ව්‍යාපාර හැදිය යුත්තේ එහෙමය. දේවක ගැන රඹුක්වැල්ල මහතා සතුටුවිය.

“තමන්ගේ බිස්නස් බෙදාගෙන කන්න හදන දරුවෝ මැද්දේ ඔයා ඔහොම හිතන එකත් පුදුමයක් පුතේ. ඔයා කැමති විදිහක් බලලා කරන්න”

“දේවකයියා අද ෂෝක් චොකලට් කේක් එකක් ට්‍රයිකරනවා සීයා. අයිසින් නැති චොකලට් කේක් එකක්.”

භාවනා කීවේය.

“අයිසින් නැතුව කේක් එක රසට තියෙයිද පුතේ.”

“මෙහෙමයි සර්. අපි කේක් බේස් එකට හොඳ චොකලට් රසයක්

දෙනවා. යටින් ලාවට වගේ කෝපි ෆ්ලේවර් එකක් ගන්නවා. තේ එකක් බොනකොට රසවෙනවා. රුපියල් තුන්සීයට දෙන කේක් එකක්නේ සර්. අයිසින් දාන්න බෑ. කල් තියාගන්නත් බෑනේ”

“හදමු පුතේ. ඔහොමම ගිහින් අක්කවත් ටිකක් එක්කගෙන එන්න”

රඹුක්වැල්ල මහතා භාවනාට කීවාය. භාවනා ගොස් නේත්‍රාව එක්කාගෙන ආවාය.

“සීයා.”

“මේක් බෑන්ක් එකට යවන්න පුතේ. මට චෙක් තුනක් අසූව ගානේ දාලා ලියන්න. මම අත්සන් කරන්නම්. වෙනම ලෙටර් තුනකුත් හදන්න. අද දින සීගිරි සුපර් මාර්ට් ආයතනයේ මුදල් කොටස ලෙස මෙතරම් මුදලක්

ලබාගත් බවත් එයට සම්පූර්ණයෙන් කැමති වූ බවත් මින්පසුව සීගිරි සුපර් ආයතනයේ පරිපාලනයේ හෝ කළමණාකරණයේ කිසිම කටයුත්තකට සම්බන්ධ නොවන බවත් එයට තමාට හිමිකාරිත්වයක් නැති බවත් පිළිගනිමි කියලා අත්සනක් ගන්න ඕන."

සීයා එහෙම කරන එක හොඳය. මිහිරංගලා විශ්වාස කළ හැකි අය නොවේ. මුදලුත් රැගෙන මේක අස්සේ ලගින්නට පුළුවන් යැයි භාවනාට සිතුණි.

"අපි අද එයාලට කියනවද සීයා මේක අපි කරන්නේ කියලා."

"අද කියන්නේ නෑ. ඒත් කියනවා මිලින්දගේ යාළුවෙක් මේකට සල්ලි දානවා කියලා. දැනට ඒ ඇති.

එහෙම නොවුනොත් ආයෙත් එයාලට ලෝබකමක් ඇවිත් මෙතන ගෝරියක් දාගන්න පුළුවන්"

භාවනාද හිස වැනුවාය.

"ඊට පස්සේ ඔයාලා වෙනුවෙන් මම සීගිරි එක ලියනවා"

භාවනාට නේත්‍රා දෙස බැලිණ.

"නෑ සීයා. මේකේ එහෙම නමින් ලිවීමක් නෑ. දවසක මේක අපි ඔක්කොම කරන්න ඕන. ඔයා තාත්තා අක්කා පොඩි අක්කා මම එතකොට මේ පොඩි නැන්දිගේ පුතා."

රඹුක්වැල්ල මහතා පුදුමයෙන් බැලුවේය.

"ඒ දරුවාව අපි දැකලවත් නෑනේ මැණික. දවසක එයා ආවාම අපි කොටස දෙමු"

භාවනා නෙත් බිමට හරවාගෙන

එහෙම කරන්න එපා කියන්නත් බඳුව හිස වැනුවාය.

"දැනට සීයා මේක නොලියා ඉමුකෝ. මී. ඔයාගේ නමටනේ තියෙන්නේ"

ඇය කීවාය. රඹුක්වැල්ල මහතාට දෙයක් අසන්නට සිතුණ නමුදු ඔහු ඇසුවේ නැත.

"දැන් ආයෙත් ඕකට නීතිඥ ගාස්ති ගෙවාගෙන වියදම් කරන්න ඕන නෑනේ සීයා"

"ඒත් ඒවා කරන්න ඕන. අද නැතත් ළඟදීම කරමු."

භාවනා හිස වැනුවාය. රඹුක්වැල්ල මහතා දේවක දෙසද බැලුවේය.

"මම ඔයා වෙනුවෙනුත් දෙයක් කරන්න ඕන පුතා. නැතිවෙන්න ගිය

සීගිරි එක ඔයා බේරගත්තා. සීගිරි එක ඕපන් කළාට පස්සේ මම ඔයාට ආයතනයෙන් වාහනයක් දෙනවා. එහෙම දෙන්නේ ගාස්තුවක් විදිහට නෙමෙයි. ඔයාව මට ඊට වඩා ගොඩක් වටිනවා. මගේ ජෙනරල් මැනේජර් බස් එකේ එන්න හොඳ නෑ"

දේවක සිනාසුනේය.

"එන විදහක් මම හිතුවේ නෑ සර්. එන තැනයි වටින්නේ. අපි සර් අවුරුද්දක් යනකල් අනවශ්‍ය වියදම් නොකර ඉමු. මෙහෙම ටික කාලයක් ඇදගෙන යන්. අපිට හොඳ තරඟයක් දෙන්න තියෙනවා. අපි ඒ වෙනුවෙන් කරන දෙයක් කරමු. මේක මේ පළාතේම හොඳම සුපර් මාර්කට් එක කරමු. ඒක මට වටිනවා."

දේවක පැහැදිලිව කීවේය. 'පස්සේ බලලා මට ඔයාගේ පොඩි මිණිපිරිව දෙන්න.' දේවකට මෙවදන් කියන්නට සිතුණි. එහෙත් එහෙම කීවේ නැත.

නේත්‍රාගේ රෝද පුටුව කරකරවාගෙන කාමරයෙන් පිටතට ආවේ දේවකය.

"අපි අක්කා මේ සිකුරාදා පේරාදෙණියේ යනවා."

භාවනා ඇසක් ගැසුවාය. ඇයට ඒතරම් සතුටක් තවත් නැත.

"අනේ මහත්තයෝ මේ වැඩ පිට."

"තිබ්බ ලොකුම වැඩේ මේකනේ අක්කා. මේක කරලා ඉවරවෙනකල් අපි උන්නේ. දැන් වැඩ ටික කරන්න දාලා දවස් තුනක් විතර ඉන්න යන්න පුළුවන්. අපි ට්‍රීට්මන්ට් පටන් ගමු

අක්කා"

නේත්‍රා හිස වැනුවාය.

"අපි රවුමක් දාමු දේවකයියේ."

භාවනා කීවාය. නේත්‍රා දේවක දෙස බලා සිනාසුනාය.

"ටවුම වටේ දෙන්නා දාන රවුම් මදිවෙලාද?"

නේත්‍රා ඇසුවාය. එයින් මුහුණ රතුකරගත්තේ දේවකය.

"ඒ ඉතින් අපි සේල්ස් යනවනේ. ඒකත් මරු වැඩේ නේද දේවකයියේ. අයියා බඩු දානවා මම බිල් දානවා. මුදලාලිලා කියනවා නෝනයි මහත්තයයි සේල්ස් එනවා මේ දැක්කමයි කියලා"

දේවක ලැජ්ජාවෙන් මෙන් සිනාසුනේය. නේත්‍රා මලක් මෙන් පිපීගෙන එන තම නැගණියගේ

ජීවිතය දෙස බලා සතුටු වූවාය.

"මල්ලී."

නේත්‍රා කතාකලේ බැරෑරුම් ලෙසය.

"අක්කේ"

"හෙට අනිද්දා දවසක ඔයා කවුද කියලා සීයටයි තාත්තටයි කියන්නම වෙනවා. සීගිරි එක ඔයාගේ නමටත් එක්ක ලියවෙන්න ඕන."

නේත්‍රා කීවාය. භාවනා මුළු හදවතින්ම හිස වැනුවාය.

"ඒ වෙනුවෙන් කෙල්ල තනියම සටන් කළා. අදත් දැක්කනේ"

"මං වෙනුවෙන් මගේ අප්පච්චිට පස්සේ කෙනෙක් සටන් කරනවා දැක්කමයි."

ඒ කතාවට භාවනාගේ දෙනෙත් තෙත්විය.

"ඉතින් ඔය අඬනවා."

නේත්‍රා කෙල්ලගේ අත අල්ලාගෙන කීවාය.

"සීගිරි එක අපි හතර දෙනාගේ. ආයේ ඒක කවදාවත් වෙනස් වෙන්නේ නෑ. මට මේ ලෝකේ මේ හවුල තරම් වටින තවත් දෙයක් නෑ"

භාවනා පැහැදිළිව කීවාය. දේවක නේත්‍රා ඉදිරිපිටදීම භාවනාගේ හිසට අතක් තැබුවේය. ඇයට පුදුමත් සිතුණි.

"බැළීමයි වටින්නේ සුද්දි. එහෙම වුනොත් හවුලක් අවුලක් වෙන්නේ නෑ"

ඔහු එපමණක් කීවේය.

"සිකුරාදා යන නිසා අපි හෙට වැඩිපුර කේක් ටිකක් දාලා යන්. වීක්එන්ඩ් එකට හෝ ගාලා අදියි.

මන්ඩෙත් පෝයනේ"

දේවක ගියේ ඔය ටික කියාය. නේත්‍රා කෙල්ලගේ අතින් අල්ලාගෙ නම පිරිමැද්දාය.

"ඇයි බබා."

ඇය සිනාසුනාය.

"හිතේ පිරිලා තියෙන හැඟුම් කෝටියයි. මම තාම ඔබට කිව්වේ එයින් බාගයයි"

භාවනා හුරතල් සිනාවක් පා කීවාය. ඇගේ හිතේ හැඟුම් පොකුරු පිපෙමින් තිබෙන බව නේත්‍රාට රහසක් නොවේ.

# 20

දේවක රජමහා විහාරය ළඟින් බැස්සේ නිකමටය. පන්සලට ගොස් පහනක් දැල්වුවහොත් හොඳයි කියා ඔහුට සිතිණ. පිනක් දහමක් හෝ යහපත් වැඩක් කරන්නට සිතෙන හැම මොහොතකම එය කළ යුතුය. සිතිවිල්ලක් එන්නේ නිකමට නොවේ. සිය වතාවක් නොව දහස් වාරයක් සිතිය යුත්තේ පවක් කරන්නට පෙරය. පිනක් කරන්නට

එහෙම සිතිය යුතු නැත. පිනට සිත ඇබ්බැහි කරගත යුතුය.

අද මල් නැත. කෙහොමත් මේ කාෂ්ඨක නියඟයේ සුදු නෙළුම් පිපෙන්නේද නැත. රජරට වැව් තලා සිඳී ගොස්ය. දේවක පොඩි තෙල් බෝතලයක් සහ පහන් තිර පැකට් එකක් ගත්තේය. සියල්ලට පෙර පන්සලට ආ බව ඇයට කිව යුතුය. නැත්නම් වෙන්නේ බැණුම් අහන්නටය. භාවනා අද වේලාසන ගියේ හවස සීගිරි මහගෙදර දෙයක් ඇති නිසාය. ඇය ගියේ වෙන දේවල් එකින් එක වාර්තාකරන බවට පොරොන්දුවක් දීය. ඒ වැඩේට ඇය ආසය.

ඇය නැති සීගිරි එකේ ඉන්නට අමාරුය. දේවක ආවේ ඒකය.

මෙහෙමම ගොස් අප්පච්චීවත් එක්කාගෙනම ගෙදර යනවා කියා ඔහු සිතාගත්තේය.

“ගෙදර ගියාද?”

ඇය ඇසුවාය.

“නෑ සුද්දි. මේ පන්සලට ටිකක් ආවා.”

භාවනාට පුදුමය. මේ හදිස්සියේ පන්සල් ගියේ ඇයි? යනවා කිව්වානම් තමාත් එනවා නොවේද?

“පුදුම ළමයෙක්නේ. හවස කිව්වානම් මාත් එනවනේ අනේ. තනියම පින් කරන්නද ඕන.”

“අනේ නෑ. තනියම පින් කරලා කෙනෙක්ට අනුමෝදනා කරන්ට නෙව ආවේ.”

ඔහු කීවේය. එහෙම කියූ විට තරහව යන බව දේවක දනී. මේ

ගැහැණු ආත්මය කෙස් ගහක් ගානේ දැන් ඔහු තේරුම් ගෙන අවසානය.

"අනිත් දවසේ එහෙම යන්න බෑ."

"ඕකේ මැඩම්. එහෙම යන්න හිතාගෙන ආවේ නෑ. පන්සල ළඟදී හිතුණා පහනක් පත්තුකරලා යන්න."

"මාවත් මතක් කරන්න හොඳේ."

ඇය නිකමට කීවාය. ඔහු මොහොතක් කතාකළේ නැත.

"මොකෝ කතා නැත්තේ."

"පහන් පත්තුකළේ කාටද කියලා කියන්නම්කෝ."

"දැන් කියන්ඩ."

ඇය මුව තදකරගෙන කීවාය.

"ඉක්මනට ගෙදර යන්න. මේ වෙලාවට පන්සල්වලත් ඔය සක්කර වට්ටම් කැරකෙනවා. බූට් කාලා කොල්ලෙක්ව හොයලා දෙන්න

කියකිය බෝධි පූජා තියනවා.”

ඇය කීවාය.

“ඇත්ත ඇත්ත. මේ දැනුත් එක්කෙනෙක් කඳුළු පෙර පෙර කළයක් අරන් ගියා. හෝ ගාලා අඬනවා.”

“ඉතින් අනිත් අයට දුකයි”

“එහෙමත් නෑ. ආදරය සුන්දර වරදකී කිසිදා සමාවක්නම් නැතී. මට පෙන්නලා ආලේ හැටී උඹ දුන්න දුක හොඳටම ඇති කිය කිය වට හත යනවා කියලා මට හිතෙන්නේ”

“ම්..ම්..පුළුලුරුැතලා වීණා බඳින් දැවටී. රතැඟිලි බැඳී නින්නාදයේ අනුරා. හද ස්වර පවා කම්පිත වෙවී. මට මා පවා නැතිකළේ කවුරුන්දෝ කියලත් කියනවා ඇති.”

භාවනා ‘හිකිස්’ ගා සිනාසී කීවාය.

"සුද්දි මාර සිංදු රසිකාවියක්නේ"

"දැන් සිංදු කිව්වා ඇති. පහන් දෙකක් පත්තුකරලා යන්ඩ ඉක්මනට. අපි නුවර ගිහින් පහන් වැටක්ම දල්වමුකෝ"

ඒ කතාව ලස්සනය.

"මේ එක දෙක මොනවද නේද සුද්දි."

"ඒකනේ. දැල්වූ පහන් දැල්වී තිබේවා කියලා හිතාගෙන මාළිග ාවට පහන් පත්තුකරලා ඇවිත් බේක් හවුස් එකෙන් ඉඳිි ආප්ප කමු බඩ පැලෙන්ඩ."

දේවක පන්සල මැදම සිනාසුනේය. ඔහු ඇමතුම විසන්ධිකර පන්සලට ඇවිදගෙන ආවේය. මේ දවස්වල හිතේ ඇති සන්සුන් සතුටට දේවක ප්‍රිය කළේය. ඉඳහිට

විත් මෙහෙම පහනක් දල්වන්නේ ඒ නිසාය. සැනසීම කියන දේ හැමදාම රැදෙන්නේ නැත. එසේ රැ ඳෙනවානම්, රඳවාගන්නට දෙයක් කළ යුතුය.

*** *** *** *** ***

සියල්ලන්ටම බීම ඇල්ලුවේ භාවනාය. ඔවුන්ට ඇල්ලුවේ සීගිරි හී බටර් කේක්ය. හැමෝම ඇවිත් ඉන්නේ ඉක්මනට මුදල් ටික ගෙන යන්නට මෙන්ය.

"අපිට සීගිරි එක සම්පූර්ණයෙන්ම දෙන්න කෙනෙක් දැනට හොයාග න්න බැරිවුණා. ඒත් හවුලකට මුදල් ටිකක් ගන්න පුළුවන් වුණා. මිලින්දත් දන්න කෙනෙක්. අද කාලේ කෙනෙක්

මේ වැටෙන බිස්නස් එකක් එකපාරම ගන්න ඉදිරිපත් වෙන්නෙත් නෑනේ."

"බිස්නස් එකේ වැලියු එකක් නෑ තමයි. ප්‍රොපටි එක වෙනම දෙන්න තිබුණා."

නාමල්ගම පැන කීවේය.

"අපි සීයා එක්ක කතාකරන්න ආවේ ඒ ඩීල් එක තමයි. මිලියන් හැත්තෑවකට ලෑන්ඩ් එක ඉල්ලනවා"

රඹුක්වැල්ල මහතාගේ ළය ඇදුම් කෑවේය. ඒ නාමල්ගමත් මිහිරංගත් මේ ව්‍යාපාරය ඒ තරමටම හෑල්ලු කළ නිසාය.

"අපි හිතමුකෝ සීගිරි එකේ කිසිම වැලියු එකක් නෑ කියලා. ඒත් අද තමුන්ට මේ තරම් ගාණක් අතට ලැබෙන්නේ ඒක නිසා. ඒක අමතක කරන්න එපා"

රඹුක්වැල්ල මහතා තදින් කීවේය.

"දැන් ඒවා වැඩක් නෑ. මිහිරංගගෙයි කෝසළුගෙයි මලීෂාගෙයි ෂෙයා එක අද බේරනවා. මේ මගෙන් ලැබෙන අන්තිම දේ. සාමාන්‍යයෙන් සීයා මුණුපුරාලා මිණිපිරීලාට දෙන්න බැඳීලා නෑ. ඒත් මම දෙනවා."

රඹුක්වැල්ල මහතා වේදනාවෙන් කීවේය.

"අපිට මිලියන විසිහතරක් ලැබිලා තියෙනවා. ඒක අපි අද බෙදනවා. අනිත් අයගේ කොටස් මතුවට. නැත්නම් මේ කරන අයත් එක්ක තමන්ගේ කොටස දාලා කරන්න පුළුවන්. මම දානවා."

රඹුක්වැල්ල මහතා කීවේය

"අවසාන වතාවට මම අහන්නේ.

තමුන්ගේ කොටස ඕනමද? නැත්නම් මේ මිලියන විසිහතරත් මම බිස්නස් එකටම දාන්නද? මිහිරංග කෝසළ මලීෂා දැන්මම කියන්න"

එය එසේ නොකරව බව දැනගෙ නම රඹුක්වැල්ල මහතා ඇසුවේය.

"මෙයාලා තව දුරටත් සීගිරි එකේ ඉන්න කැමති නෑ තාත්තේ. නේද නංගි"

රුවන්තිද හිස වැනුවාය.

"මං ඇහුවේ මෙයාලගෙන්. මිහිරංග."

"මං මගේ කොටස ගන්නවා"

"මාත් ගන්නවා. අලුත් බිස්නස් එකක් පටන්ගන්න මම යන්නේ"

"මලීෂා"

"මාත් අයියගේ බිස්නස් එකට ජොයින් වෙනවා. මට මගේ ෂෙයා

එක ඕන සීයා."

රඹුක්වැල්ල මහතා නේත්‍රාත් භාවනාත් දෙස බැලුවේය.

"එහෙනම් හෙට සිට බඩුවක් ගන්න මිසක ඔයාලට සීගිරි එකට ඇතුල්වීම සපුරා තහනම්. එකගද?"

මිහිරංගත් කෝසළත් මලීෂාත් දෙස බලා රඹුක්වැල්ල මහතා ඇසුවේය.

"අපිට එහෙම එන්න අවශ්‍ය නෑ."

"ගුඩ්. තමුන්ටත් එන්න බෑ."

ඔහු රුවන්තිත් සුරංගිත් දෙස බලා කීවේය.

"නැත්නම් එකට මේක කරමු. අමාරුවෙන් හරි ඇදගෙන යන්න පුළුවන්."

"අනේ අපිට බෑ. කරන දේ කරලා දාන්න තාත්තේ. අපිට ඔය සීගිරි

එකට එන්න අවශ්‍ය නෑ.”

රඹුක්වැල්ල මහතා හැමදේම ඔවුන්ගේ මුවින්ම ගත්තේය.

“තව දෙයක් කියන්න තියෙනවා. මින් මත්තට මම මේ කිසිම දරුවෙක්ගේ කිසිම දේකට මැදිහත්වෙන්නේ නෑ. කාගෙවත්. මට කියන්නත් එපා. තම තමන්ට කැමති විදිහට ඒ දේවල් කරගන්න. කලින් මම බලපෑම් කළානේ. මමනේ මම කැමති ඉස්කෝලවලට දරුවන්ට දැම්මේ. එයාලට ඉගැන්නුවේ. රස්සාවල් පරස්ථාවල් ගැන කතාකළේ. සීගිරි එක බෙදීමත් එක්ක ඒවත් නැතිවෙනවා.”

භාවනා ඇස්වල කඳුළු තබාගෙන ඉදිරියට ආවාය.

“ඉතින් අපි හොඳට ජීවත්වෙන්නේ

ඒ නිසානේ සීයා. කවුද දැන් ඒක වැරදියි කියන්නේ. හෙටත් ඔයා අපි ගැන බලන්නෝන. ඔයාගෙ න් අහන්නේ නැතුව මම කිසිදෙයක් කරන්නේ නෑ."

"මාත් කරන්නේ නෑ"

නේත්‍රාද කීවාය. වෙන කිසිවෙක් කිසිවක් කීවේ නැත.

"අපි එහෙනම් බත් ටිකක් කාලා මේක ඉවරකරමු. මගේ හිත එතකොට නිදහස්"

ඔහු සන්සුන්ව කීවේය.

"දැන් කවුද එතකොට සීගිරි එක කරන්නේ."

"ඒක මේ සල්ලි දාන කෙනා එක්ක භාවනයි තාරකයි නේත්‍රායි කරයි. මාත් මගේ කොටස දානවා. ඇයි සුරංගිට ප්‍රශ්නයක්ද?"

ඇය සමච්චල් සිනාවක් පෑවාය.

“මේ වෙලාවේ දෙන දේ දීලා ගන්න මුදලක් ගන්නනේ තිබ්බේ.”

“ඒක එක එක්කෙනාගේ කැමැත්ත. මම මොනවත් කියන්නේ නෑ. මේ චෙක් තුන දෙන්න කලින් මම තව පාරක් අහනවා. මේකත් සීගිරි එකට දාන්නද?”

ඔහු කවර තුන පෙන්වා ඇසුවේය. මිහිරංග ඒ දෙස බැලුවේ කෑදරකමිනි.

“අපි අයින්වෙනවා.”

මිහිරංගත් කෝසලත් මලීෂාත් එකටම කීවෝය.

“එච්චරයි.”

රඹුක්වැල්ල මහතා නැගිටිමින් කීවේය.

“එතකොට අර නර්මදාගේ

කොටස."

රුවන්ති ඇසුවාය.

"නැතිවෙච්ච ගෑණිගේ කොටස තමුන්ට මොකටද? ඒකත් මෙතන බෙදාගන්නද යන්නේ"

රඹුක්වැල්ල මහතා වේදනාවෙන් කීවේය.

"එහෙම කෙනෙක් නෑනේ ඉතින්"

භාවනා යළිත් ඉදිරියට ආවාය.

"එහෙම කෙනෙක් ඉන්නවනේ. එයා එයි."

"ඔයා නිකං කතාකරන්නේ එයාව දන්නවා වගේනේ."

"අපේ අයියා කෙනෙක්නේ. එයා එයි. එනකල් තමයි අපිත් ඉන්නේ."

ඇය අහක බලාගෙන කීවාය. ඉඳුනිල් සිනාසී බිම බලාගත්තාය.

# 21

මිලින්ද වාහනය පදවාගෙන ගියේ කොළඹ බෞද්ධාලෝක මාවත හරහාය. වෙලාව උදේ අටට පමණ වෙන්නට ඇත. සම්මන්ත්‍රණ ශාලාව අසළ තරමක වාහන තදබධයක් තිබුනේ එදින එහි පැවැත්වෙන ඉදිරිකිරීමේ ප්‍රදර්ශනය නිසාය. මිලින්ද උන්නේ බොරැල්ල කනත්ත වට රවුම පැත්තේ සිට තුන්මුල්ල දෙසට ගමන්කරමිනි.

එකවරම කොළඹ පැත්තේ සිට ආ වෑන් රියක් මිලින්ද ඉදිරියෙන්ම සම්මන්ත්‍රණ ශාලාව දෙසට දැමිණ. ඒ මුහුණ දැක මිලින්දගේ සිත මොහොතකට කම්පනයට පත්විය. ඔහුට ඔහුගේ දෑස් විශ්වාසය. සම්මන්ත්‍රණ ශාලාව දෙසට හැරවූ වෑන්රියේ උන්නේ ජීවිතයේ හමුවූ වඩාත්ම මනුස්සකමින් පිරි මස්සිනා බව මිලින්දට විශ්වාසය.

වසර විස්සක් ගෙවී ඇත. තමා මෙන්ම ජීවන්ද තරමක් වියපත් වී ඇත. එහෙත් ඒ මුහුණෝ වූ කරුණාබර පිරිමි පාට තවමත් එහෙමමය. මිලින්ද කාරය නවත්වාගෙනම උන්නේය. වෑන් රිය සම්මන්ත්‍රණ ශාලාව තුළට පිවිසියේය. පිටුපසින් ආ වාහන නලා වාදනය කරද්දී මිලින්ද අසරණව

කාරය ඉදිරියට ගත්තේය.

එහෙත් ඔහුගේ හිතට හරි නැත. ටික දුරක් ගිය මිලින්ද රූපවාහිනී සංස්ථා පරිශ්‍රය අසළින් වාහනය යූ ටර්න් දමා හරවාගෙන වේගයෙන් සම්මන්ත්‍රණ ශාලාව වෙතට ආවේය.

විශාල මැයි මාර ගහක් යට කාරය නවතා මිලින්ද සම්මන්ත්‍රණ ශාලාව වෙතට දිව්වේය. නුවර සිටිනා ජීවන් මේ බී එම් අයි සී එච් එකට ආවේ ඇයි? මිලින්ද එය සිතන්නට ගියේ නැත. ජීවන් පිළිවෙලට ඇඳගෙන උන්නේය. ඒත් ඉස්සර මෙන්ම සුදු කමිසයමය. මුහුණ පුරා වැවුණු රැවුල තැනින් තැන ඉදී ඇත. දැස් තරමක් ගිලී ඇත.

ඔහු සම්මන්ත්‍රණ ශාලාව පුරාම ගියේය. එහෙත් මිලින්දට ජීවන්ව

සොයාගන්නට නොහැකි විය. ඔහු යළිත් පැමිණ වෑන් රිය වාහන අංගනයේ ඇත්දැයි බැලුවේය. නැත. ජීවන් ආ වෑන් රිය එහි තිබුනේ නැත.

ප්‍රදර්ශනයට ඔහු ආවේ ඇයි? මිලින්ද සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ ඇවිදිමින් සිතුවේය. ඔහු ආ වෑන් රියේ යම් ආයතනයක නමක් ගසා තිබූ බව මිලින්දට යන්තමට මෙන් මතකය.

"ජීවව දැක්ක ගමන් මොනවත් හිතාගන්න බැරිවුණා. සමහරවිට කන්ස්ට්‍රක්ෂන් ෆර්ම් එකක වැඩරනවා ඇති."

මිලින්ද සිතුවේය.

හෙට පැමිණ ප්‍රදර්ශනය පුරාම ඇවිදිනවා කියා මිලින්ද සිතාගත්තේය.

කොහොමත් ජීවන්ව ඊයේ පෙරේදා කිහිප වතාවක්ම මිලින්දට සිහිවිය. ඔහු ගැන නිවැරදි තොරතුරක් දැනගන්නටනම් කතාකළ යුත්තේ අර්ජුනටය. ඔහු ජීවන්ගේ හොඳම මිතුරාය. එහෙත් මේ දිනවල අර්ජුන ලංකාවේ නැත.

“කෙල්ල ජීවගේ කොල්ලා ගැන කියනකොට මට පුදුමත් හිතුණා. ඇත්තටම දැන් කොල්ලා හොඳ උස මහත කොල්ලෙක් වෙන්න ඇත. දකින්නත් ආසයි.”

මිලින්ද සිතුවේය.

“මොනා වුනත් ජීවා හොඳට හදලා ඇති. හරි වෙනස් මනුස්සයනේ. හැමදේටම වඩා මනුස්සකම තියෙනවා. හිටපු හොඳම මස්සිනාව නැතිවුණ එකයි දුක”

මිලින්ද සිතුවේය. ඔහු වාහනයේ යන ගමන්ම ඉඳුනිල්ටද කතාකළේය.

"මං ඉන්දු මේ බීච්ම්අයිසීච්ච් එක ළඟදී අපේ ජීවාව දැක්කනේ"

"අනේ මේ කොළඹ. ඉතින් දුවලා ගිහින් කතාකරන්න එපැයි."

"දිව්වා ඉන්දු. හෝල් එක වටේම ගිහින් හෙව්වා. මං යනකොට හිටියේ නෑ. හෙට එනවා. ටිකක් වයසට ගිහින්. ඒත් පෙනුම එහෙමමයි."

"අවුරුදු විස්සක් ගියානේ. පව්. අනේ කොල්ලා දැන් මොනවා කරනවද දන්නේ නෑ"

"මං කොහොමහරි ජීවව හෙට ඇවිත් හොයාගන්නවා. නිකමට හිතෙනවා කන්ස්ට්‍රක්ෂන් කම්පනි එකක වැඩ ඇති කියලා. මේකේ මේ තියෙන්නේ කන්ස්ට්‍රක්ෂන් එක්සිබිෂන්

එකනේ. එහෙම නමක් ගහපු වෑන් එකක ගියේ"

මිලින්ද මේ කතාව ඉන්දුට කීවේ ඇය ජීවන්ට කොතරම් ආදරේදැයි දන්නා නිසාය.

"හම්බවුනොත් එක්කගෙන එන්න. කොල්ලවත් එක්ක. අපේ කෙල්ල ඊයේ කියනකොටත් මට මතක්වුණා."

ඉඳුනිල් හුල්ලා මෙන් කීවාය.

"ම්. අපි වගේම ටිකක් වයසට ගිහින්."

"කවුද ටිකක් වයසට ගියේ. හොඳටම ගිහින්."

"ඒක අපිත් එක්කම හිටපු කෙනෙක්ව දැක්කහම තමයි ඉන්දු හිතෙන්නේ."

මිලින්ද කිව්වේ වේදනාවකින් නොවේ. ජීවිතය ගැන උපන්

උපේක්ෂා සහගත අවබෝධයකිනි.

** ** ** ** ** ** ** **

දේවක නුවර යන්නට ඇඳගත්තේ සිකුරාදා දවල් දෙකට පමණය. දේවක ඇඳගෙන ඇඳුම් බෑගයත් දමාගෙන ත්‍රී වීලරයකින් අප්පච්චි ඉන්නා ඉදිකිරීමේ සමාගමට ගියේය. ජීවන් උන්නේ පිටතට යන්නට සූදානම්වය.

"අනේ පුංචි මහත්තයෝ. මෙහේ ආවේ ඇයි. කෝල් එකක් දීලා යන්න තිබ්බනේ"

කොල්ලා දුර ගමනක් යද්දී තමාට වැඳ යන බව ජීවන් දනී. ඒවා අමාරුවෙන් හෝ ඉටුකළ යුතුයැයි දේවක ඇදහුවේය.

"අප්පච්චිට වැඳලම යනවා කියලා හිතුවා"

"මං මේ බී එම් අයි සී එච් එකට යන්න මහත්තයෝ."

"එක්සිබිෂන් එක බලන්න එන්න මාත් ආසාවෙන් උන්නේ. අප්පච්චිලාගේ ස්ටෝල් එක හොඳද?."

"හොඳටම හොඳයි පුතේ. මං තමා එතන වැඩ බලන්නේ. බිස්නස් ගොඩක් ආවා. අපි අනිත් අවුරුද්දේ යමුකෝ."

දේවක ඉදිකිරීමේ සමාග මේ මිදුලේදීම ජීවන්ට පහත් වී වැන්දේය.

"පරිස්සමින් ගිහින් එන්න. නුවර පාර දැන් ඉස්සර වගේ නෙමෙයි. ඩ්‍රයිව් කරන්නේ පරිස්සමින්.

හදිස්සියක් නෑනේ. හිමිහිට යන්න"

ජීවන් පර්ස් එකෙන් බැංකු කාඩ් පත ගෙන දේවක අත තැබුවේය.

"ඕන වුනොත් මේකෙන් සල්ලි ගන්න. මගේ අතේ අද සල්ලි නෑ."

"මගේ අතේ තියෙනවා අප්පච්චි"

"මේකත් අරන් යන්නකෝ. ගිහින් මට කෝල් කරන්න"

"අප්පච්චි එහෙනම් රෑට කන්න ගෙදර යන්න. හේරත් මාමට මම මාළු ටිකකුත් දීලම ආවේ. අප්පච්චි ආස නිසා ඇඹුල් තියල් හදලා තියන්න කියලා."

ජීවන් ආදරෙන් කොල්ලා දෙස බැලුවේය. මේ වැනි දරුවෙක් ලද තමා වාසනාවන්තය. 'අම්මම තමයි' ඔහු සිතුවේය.

දේවක වැඩ බිමෙන් යද්දීම ජීවන්

කතාකළේ භාවනාටය.

"අප්පච්චි."

කෙල්ල කතා කලේ හරි ආදරෙනි.

"මේ දැන් ඇවිත් ගියේ පොඩි පුතේ. නුවර යනවා කියලා වැඳලා යන්න ආවා."

අම්මාටත් තාත්තාටත් තමාත් වැඳ යා යුතුයැයි භාවනාට සිතුණි. ඒවා අමතක වෙන යුතුකම්ය.

"හා අප්පච්චි. මම පරිස්සමින් අයියව බලාගන්නම්."

ඇය කීවාය. සමහරවිට ඔයාට ජීවිතේම එයාව බලාගන්න වෙයි' ජීවන් මේවදන් කීවේ නැත.

"වාහනයක් අතට ගත්තාම හයියෙන් යන්නමයි හිත පොඩි පුතේ. ටිකක් හිමින් යන්න කියන්න. ඔයා කිව්වාම අහනවා."

'මං කිව්වාම අහනවා තමයි.' භාවනා සිතුවාය.

"මං එහා පැත්තේ ඉන්නවනේ අප්පච්චි. ඇහුවේ නැත්නම් දෙකක් දෙනවා. මූණ නරක් කරගෙන හිටියාම වැඩේ හරි."

"හරි හරි. ඒක තමයි එයාව හදන්න පුළුවන් ක්‍රමේ. අනිත් අය ගැන හරියට හිතනවා"

'දන්නවා අප්පච්චි.' භාවනා සිතින් කීවාය.

"මාළිගාවටත් යන්න පුතේ. දළදා හාමුදුරුවන්ගේ හරි හාස්කම්. හිතේ පිරිසිදුකමින් දෙයක් ඉල්ලුවොත් ලැබෙනවා. ම්."

"යනවා අප්පච්චි. ඉල්ලන්න තියෙන්නේ ඔයාගේ පුංචි මහත්තයව විතරයි. වෙන මොනවත්ම එ..පා."

භාවනා කෙළින්ම කීවාය. ජීවන්ගේ දෑස් කඳුළින් පිරුණි.

"මගේ කොල්ලා ඔයාව තාත්තා කෙනෙක් වගේ බලාගනී. ඒක මට විශ්වාසයි"

"දන්නවා අප්පච්චි. මට ඒත් එක්කම තාත්තලා තුන්දෙනෙක් ලැබෙනවා"

භාවනා කීවාය. ජීවන් වැඩබිමේ කිසිවෙක්ට නොපෙනෙන්නට දෑස් පිසදාගත්තේය.

"ගිහින් එන්න පුතේ එහෙනම්. බුදු සරණයි."

"හා අප්පච්චි. බුදු සරණයි. ඔයා කන්නෝන."

ජීවන් දුරකථනය තබා දෑස් පහළට කරගෙන මොහොතක් උන්නේ එය පාදාගන්නටය. 'මට

කෙල්ලව දෙන්න මිලින්ද? මම ඔයා වගේම ආදරෙන් බලාගන්නම්'

ඔහු සිතින් කීවේ ඔහුගේ ළබැඳි මස්සිනාටය. අතීත මිතුරාටය.

# 22

සීගිරි එකට දුවගෙන ආ දේවක එහි දවස් තුනකට අවශ්‍ය වැඩ බාර දුන්නේය. දැන් සීගිරි එක විවෘත කරන්නට අවශ්‍ය තරම් දවස් ඇති නිසා හොඳින් එය සංවිධානය කළ හැක.

"අඟහරුවාදා මට කේක් පස්සීයක්වත් ඕන. පෝයට ඇවිත් හදන්න වෙනවා"

"හරි සර්. ඒක හිතන්න එපා.

හවස කේක් පන්සීය රෙඩි කරලම අපි යන්නම්."

"මාගරින් ඇත්ද?"

"ඇතිවෙයි සර්. මදිවුනොත් මම කතාකරලා ගෙන්න ගන්නද?"

"මට ඔයා කෝල් කරන්න. මම එවන්නම්."

දේවක වැඩ කළේ එහෙමය. ඔහු මේ හැන්දෑවේ නුවර යන්නට ඇඳගෙන ආවේ නිල් කොටු අත් කොට කමිසයත් තද නිල් පැහැයේ කළිසමත්ය. සැහැල්ලු නිස්කලංක පෙනුමකින් උන් දේවක උන්නේ කියාගත නොහැකි නිස්කලංක සතුටක් විඳිමිනි. කුණාටු අකුණු රෑ සකට පසුව දැන් සීගිරි එක මෙන්ම හිතද සන්සුන්ය.

හිත නොසන්සුන් වෙන්නේ ඇයව

දුටු විටය. භාවනා ආවේ තද දම් පැහැගත් සායට සුදු ෆ්ලෝරල් විලාසිතාවේ ඕපන් නෙක් බ්ලවුසය ඇඳගෙනය. ඇයගේ රන් චේන් පට මැද වූ හාට් පෙන්ඩනය විවෘත කරින් සුන්දරව දිස්වෙයි. මේ දැන් ටිකකට කලින් නෑව නිසාදෝ යුවතියගේ වරළස තවමත් තෙතය.

දේවක ඈත සිට බලාගෙන උන්නේය. ගිය වතාවේ ඇය නුවර යන්නට ඇන්දේ ඩෙනිම් ජීන්ස් එකකි. එදා තමා ඩෙනිම් ජීන්ස් ඇයට ලස්සන නැතැයි කියූ පසුව ඇය ඒවා ඇන්දේ නැත. දේවක හදවත ඇතුළාන්තයෙන් සතුටක් වින්දේ මේ ගැහැණු ආත්මයම තමාගේ බව සිතාගෙනය. එය පිරිමි සිතකට ගෙන එන ආනන්දය නිමක් නැත. සමහරවිට පරාමානන්දය කියන්නේ

එයට විය යුතුය. සදානන්දකර වූ ඔබේ ආදරයෙන් මම පරමානන්දයට පත්වීමි. කතාවට කියන්නේ එහෙමය.

"ෂ්..ෂ්."

දේවක අහක බලාගෙන සිටියේ හිතාමතාය. භාවනා කතාකළේ එහෙමය.

"මොකද සුද්දි නාග කන්‍යාවක් වගේ ෂ් ෂ් ගාන්නේ."

"මං නාග කන්‍යාවක් තමයි. මේ තේරේ නාගින් දුෂ්මන්ත් තේ මේරා..මේ නාගින් කෝ තේරා"

ඇය නයි සිංදුවම කීවාය. දේවක සිනාසුනේය.

"මට ඕන වෙලාවක ඕන වේශයක් ගන්න පුළුවන්. මං වෙස්මාරුකරන නාග කන්‍යාවක්."

"ඒක තමා මෙච්චර ලස්සන"

ඇය වැළඹිටෙන් ඇන්නාය.

"ලේට් වෙනවා. යමු. අක්කා වෙහිකල් එකේ"

භාවනා කීවාය.

"මේ ස්කට් ඇන්ඩ් බ්ලවුස් එක හරි ලස්සනයිනේ සුද්දි"

"අපි ඉතින් දැන් ඩෙනිම් අඳින්නේ නෑනේ. කෙනෙක් කිව්වනේ ඒවා අපිට හැඩ නෑ කියලා. ඉතින් ඩෙනිම් සේරම ගිහින් පොඩි අක්කගේ අල්මාරියට දැම්මා. ඒකිට හොඳ පල්ලම"

ඇය නෙත්බර කීවාය.

"සුද්දිට දුකයි ඉතින්"

"දුක නෑ බයයි."

"ඇයි සුද්දි බය."

"න්නෑ ඉතින් ඔය ඩෙනිම් හොඳ නෑ කියන අය ඊට පස්සේ තවත්

දේවල් හොඳ නෑ කිව්වොත් මට අල්මාරියම හිස්කරන්න වෙයිද කියලා හිතුවේ"

"එහෙම කවුද කිව්වේ"

"කියයි කියලා මේ"

"මොනවා ඇන්ඳත් නැතත් සුද්දි ලස්සනයි. හරිනේ."

"අප්ප්ද බොල නැතත් ලස්සනද?"

"වඩාත් ලස්සනයි."

ඔහු වචන බරකර කීවේය.

"අප්පච්චි හිතාගෙන ඉන්නේ මේ පහ වසරේ කොල්ලෙක් කියලා. අපිට කතාකරලා කියනවා බලාග න්න පොඩි පුතේ කියලා. මේ ලෝක පුත්‍රයෙක්."

භාවනා කීවාය. අප්පච්චි ඇයට කතාකර ඇත්තටම කියන්නට ඇත.

"මං පහ වසර කාලේ සුද්දි මම

අපේ ස්කූල් කොරිඩෝ එකේ ග්‍රීස් දැම්මා. ඉංග්‍රීසි මිස්ව ඇදගෙන වැටෙන්න. අනේ මිස්ව අඩි දහයක් විතර ලිස්සලා ගිහින් කොන්ද වැදුනා. අප්පච්චි මේක දැනගත්තා. මාව මිස්ගේ පිළිමතලාවේ ගෙදර එක්කගෙන ගියා. ගිහින් ඇඳේ කොන්ද කැඩිලා හිටපු මිස්ට වන්දවලා සමාව ගැන්නුවා. තෙලක් දීලා මිස්ගේ කොන්දේ පැයක් ගාන්න කිව්වා. මම ඇඳ උඩ නැගලා මිස්ගේ කොන්දේ තෙල් ගෑවා. මිස් හෝ ගාලා ඇඬුවා. මාව බදාගෙන ඇඬුවා."

දේවක කීවේය. ඒ කතාව අසා භාවනාගේ ඇස්වලටද කඳුළු ආවේය.

"ඉස්කෝලෙන් අවුට්වෙන දවසෙත්

මිස් මාව බදාගෙන ඇඬුවා. ඔයා චූටි අත් දෙකෙන් මගේ පිට අතගානවා තාම මට මතකයි දේවක පුතේ කිය කිය ඇඬුවා."

දේවකගේ මනුස්සකමින් පිරි ජීවිතය පිටුපස ඉන්නේ ඔහුගේ අප්පච්චීය. ඇය පින් දුන්නේ ඔහුටය. 'හොඳ දෙමව්පියන් ඉන්නකොට දරුවෝ පිරිසිදුව හැදෙනවා. ඒකයි ඇත්ත' ඇය සිතුවාය.

"අපි එහෙනම් යන්ද සුද්දි."

"යමු. නොයන්න උන්න ගමනක්නේ ඉතින් මේක නේද"

ඇය ඇසක් ගසා ඇසුවාය. නුවර යන්න උන් හැම වතාවකදීම ගමනට බාධා ඇතිවිය. එක වතාවත් සූරියආරච්චිලා නිසාය. ඉන් පසුව සීගිරි ආයතනය බෙදීම නිසාය.

"ඉතින් සුද්දි මේ අර සූරිආරච්චිලා එක්ක."

භාවනා නැවතුණාය. හදවතද ඒ අනුව නැවතිණ.

"දැන් කවුද මෝඩයේ සූරියආරච්චිලා එක්ක ගියේ. පොල් බූරුවා. මං ගියාද උඹත් එක්ක."

දේවක හිස කැසුවේය. බැගෑපත්ව බැලුවේය.

"ගියේ නෑනේ"

ඔහු අසරණව කීවේය.

"යන්න තිබ්බේ."

ඈය කීවාය.

"අරන් ගියානම් තමයි වැඩේ නේද සුද්දි"

දේවක හිමිහිට කීවේය.

"සූරියආරච්චි අරන් ගියේ නෑ තමයි. මං ඒ ගොන් හරකා එක්ක

ගියේ නැති නිසා. හෙට මෙතනට සූරියආරච්චි නැතුව වාසලආරච්චි ආවොත් මම යනවා. මෙතන ඇයි මොකෝ. අපි ගියාම මොකෝ."

කෙල්ල කියාගෙන ආවාය. දැන් කට ඇවිස්සිණ. නතර කිරීම අමාරුය.

"නෑ සුද්දි මේ මම."

"ඇහුවොත් හොඳනම් මම යනවා. ඇයි මොකෝ ඉතින්."

ඔහු දොරකඩම නැවතුනේය. වීදුරු දොරට අත තදවිය.

"ඔව්. හොඳනම් යන්න වෙනවා තමයි සුද්දි. නොයා බෑනේ. නේද"

දේවක අසරණව කීවේය. භාවනා දෙතොල් හපාගෙන මෙන් බලාගෙන උන්නාය. දෙතොල් දසන් අතර තදවෙන විදිහට ලේ පනින්නට පවා

පුළුවන.

"තනියම අක්කව එක්කගෙන යන එකයි ඇත්තේ. මම එන්නේ නෑ නුවර"

ඇය දුවගෙන මෙන් කාර්යාල කාමර පැත්තට යමින් කීවාය. ඔහු මේ හිත රිදවූවාද. නැත්නම් මේ හිත තමාම රිදවාගත්තාද? දන්නේ නැත. 'මේ ඇස්වහ වදින්නේ. මොකට කේන්ති යනවද මන්දා' ඇය තමාටම කියාගත්තාය. මඟදී ඇගේ දෑස්වල පිරි කඳුළක් සීගිරි බිමට විසිවිය.

භාවනා ඇගේ කාර්යාල කාමරයේ දොර විවර කර වේගයෙන් දොර හප්පාගෙන ඇතුළට ගියාය. ඔහු පසුපසින් එන බව ඇය හොඳින්ම දනී. දේවක ආවේ කොර ගසමින් මෙන්ය.

"අනේ සුද්දි මේ මම"

ඔහු ගොත ගසාගෙන ආවේය. එහෙම එන තරමට මේ හිතට සනීපය.

"මං කිව්වනේ. මම එන්නේ නෑ නුවර යන්න. අක්කා එක්ක යන්ඩ."

පපුව මිරිකාගන්නේ ඇයි?

"ඉතින් මම වරදක් කලේ නෑනේ. ඒත් මට සමාවෙන්නකෝ. නොදැනුවත්ම"

ඇය හැරුණාය. ඇස්වල කඳුළුය. දොඹගෙඩි මෙන් ඒවා රතුව ඇත. 'මේ මොන පිස්සුවක්ද' ඇය තමාගෙන්ම ඇසුවාය.

"ඇයි සුද්දි මේ."

"දැන් යන්න දේවක. මම එන්නේ නෑ."

හිතට ආ තරහවට හිත ඇබ්බැහි

වුවාද? සමහරවිට එහෙම වෙයි.

දේවක ඇය ළඟටම ආවේය. ඔහු ඉතාමත් ශක්තිමත් ලෙස ඇගේ වමතේ මැණික් කටුව අසලින් අල්ලාගත්තේය. ඊටත් පසුව මුහුණ දෙස බලාගෙනම උන්නේය.

"සුද්දි නැතුව නුවර නෙමේ. මම මහරගමටවත් යන්නේ නෑ. එන්න"

ඔහු කේන්තියෙන් කීවේය. භාවනා වචනයක්වත් කතාකළේ නැත. මෙහෙම තදට තමාට ඉන්න එක හොඳය. කේන්තියට හේතුවක් නැත. තරහ ගියේ ඒ අතීතය සමඟ පමණය.

"කඳුළු ආවේ මං නිසානම් කියන්න. දැහට නොපෙනීම යන්නම්"

ඔහු එපමණක් කියා ඇගේ මුහුණම අතගා කඳුළු පිසදැම්මේය.

ඒ කතාව පුදුම කතාවකි. භාවනා එය යළිත් සිතින් ප්‍රතිරාවය කළාය. 'කඳුළු ආවේ මං නිසානම් කියන්න. දෑහට නොපෙනීම යන්නම්'

"යමු."

දේවක ඇගේ මුහුණ පිසදමා අත ගනිමින් කීවේය. එහෙත් ඇය ආවේ නැත. ඒ වෙනුවට ඇය දේවකගේ ගතට මොහොතකට බරවිය. කිසිවක් කතා නොකර එසේම උන්නාය.

"අක්කා බලාගෙන ඉන්නවා සුද්දි. අපි යන්."

දේවක ඇගේ හිස අතගා මෙන් කීවේය.

"ටිකක් ඉඳලා යන්. බාධාවක් වුනානේ"

ඇයට මෙහෙමම ටික වෙලාවක් ඉන්නට ආසාවක් හිතට ආවේය. එය

තෘෂ්ණාවකි. හැමදේම මේ ආදරය පපුව අස්සේ තබාගෙන ඉන්න නිසාය. අද පපුවම කපා පෙන්විය හැක. ඒ පපුවත් ඇද බැලිය හැක.

ඉන් පසුව මේ දුක නැත. මේ හැමදේම ඒ වෙනතුරුය. ඊට පස්සෙත් පස්සෙන් පහුත් සෑහෙන ගෝරි දාගන්නට භාවනා බලාගෙන උන්නාය. ගෝරියක් නැතුව ආදරයක් ලස්සන නැතැයි ඇය විශ්වාස කරයි. 'හස්බන්ඩයි වයිපරෙයි ගෝරියක් දෙකක් දාගන්නම ඕන. එහෙම වුණාම පිටඋන්ගේ ඇස්වහ වදින්නේ නෑ.' මේ කතාව කොහෙන් කොහොම ඇහුවාද කියා භාවනාම දන්නේ නැත. එහෙත් ඇය එය අදහයි. පවුල් ජීවිතය අච්චාරුවකි. හැම රසයම එහි ඇත. නියම අච්චාරුවකට ඇඹුල මෙන්ම දැවිල්ලද තිබිය යුතුය.

අවසානයට මිහිරි පැණි රසයක්ද ආ යුතුය. එහෙම නැත්නම් ඒක අච්චාරුවක් නොවේ.

භාවනා පැමිණි වාහනයට ගොඩවූයේ මේ හැමදේම තනිවම සිතමිනි. දේවක වාහනය සීගිරි කා පාක් එකෙන් පිටතට ගත්තේ සුක්කානමට තුන්වරක් වැඳය. භාවනාද අත් දෙක එකතුකළාය. ‘මේක සුබම සුබ ගමනක් වෙන්නෝන.’ ඇය සිතින් පැතුවාය.

“අක්කා.”

දේවක කතාකලේ දියවන්නාව පැත්තට වාහනය දමනා ගමන්ය. නුවර යන්නට පහසුම මාර්ගය එයය.

“මල්ලි.”

“මට අක්කේ ලබන සතියේ ඉඳලා ගෙවල් පැත්තේ හවසට එන්න

වෙනවා. වෙද මහත්තයගේ තෙල ගාන්න.”

“අනේ. මේ වැඩ අස්සේ බෑනේ මල්ලියේ. මම අම්මට කියලා ගාගන්නම්.”

“අක්කා හිතන්නේ එහෙම පුළුවන් කියලද? ඒක ලේසි නෑ අක්කේ. මම මගේ යාළුවෙක්ගේ ගාලා තියෙනවා. පැය දෙකක් තුනක් කකුල රත්වෙන්න ගාන්න ඕන.”

පිටුපස සිටින නේත්‍රාගේ දෙනෙත් තෙත්විය. කොල්ලා කිව්වොත් එන බව ඇය දනී.

“අම්මේ.”

භාවනා හදිස්සියේ කකුල ඇල්ලුවාය. දේවක පුදුමයෙන් බැලුවේය.

“ඇයි සුද්දි. කකුලට මොකද

වුණේ.”

“මොකක්ද වුණා. දැන් දවස් දෙක තුනක ඉඳලා මේ දණ්හිස ළඟ ඇවිලෙනවා. වෙද මහත්තයගේ මමත් තෙලක් ඉල්ලගන්න ඉන්නේ.”

ඇය කීවාය.

“එහෙනම් මහත්තයෝ මගේ කකුලේ තෙල් ගාලා හමාරයි. අපේ සුද්දිගේ ගාමු. ඕක යන අමාරුවකුත් නෙමේනේ.”

“ගාන්ඩ අෑ හොඳේ.”

ඇය ඇසක් ගසා කීවාය.

“අත්ගුණේ කොහොමද අයියේ.”

භාවනා ඇසුවාය.

“සුද්දි බලන්නකෝ. මම බුදු ගුණ කියමින් තෙල් ගාන්නේ. සබ්බ පාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා. සචිත්තපරියෝ දපණං

ඒතං බුද්ධානු සාසනං. හරි හාස්කම්."

දේවක අවංකවම කීවේය.

"මම දන්න ගෑණු ළමයෙකුත් ඉන්නවා අක්කේ. පුදුම අත්ගුණයක් තියෙන්නේ. අත තියනකොට නින්ද යනවා. වරුවක් නිදි."

භාවනා දේවකට ගැසුවාය.

"ඒක බොරු නින්දක්"

"අත්ගුණේ තියෙන්නේ පව්කරලා නැති අත්වලට. පවක් කරලා නැත්නම් අත පිරිසිදුනම් අත්ගුනේ තියෙනවා. ඒක අහන්න දෙයක් නෑ."

නේත්‍රා කීවාය.

"ජීවිතේ ගොඩක් දේවල් නැතිවෙච්ච අය පව් කරන්න බයයි අක්කේ."

දේවක වේදනාබර හඬකින්

කීවේය. භාවනා ඔහු දෙස කරුණාබරව බැලුවාය.

"එහෙම අයට දවසක ගොඩක් දේවල් ලැබෙනවා. ඒ නිසා දුක්වෙන්න එපා."

"ගොඩක් දේවල් ඕන නෑ සුද්දි. පතන දෙයක් ලැබුනොත් ඇති."

ඔහු මෘදුව කීවේය. භාවනා කතාකලේ නැත. දෙයක් කියන්නට ආවද කියන්නට අමාරුය. නේත්‍රාට සිතුණේ, තමා නැත්නම් මෙතන මේ කතාව බොහෝ දුර යන බවය.

# 23

පේරාදෙණියේ වෙද මහතා පැයක් වෙලා ගෙන නේත්‍රාව යළිත් පරීක්ෂා කළේය. පසුව ඔහු බුලත් කොළයකට තෙල් පොදක් දමා දේවක අතට දුන්නේය.

"අපි දරුවගේ ලේ නහර මෙලෙක් කරන්න ඕන. පැයක් විතර තෙල් ටික ගාමු බලන්න දරුවෝ. මී. අත්ගුණෝ තියෙනවා කියලා පේනවා. තුණුරුවන් සරණයි කියලා හිතාගෙන

කරමු. හෙට උදේ නැකැතක් තියෙනවා. අපි වෙදකම් පටන් ගමු. මාළිගාවට ගිහින් එමු. රාහු කාලය අටයි තිස් තුනට ඉවරයි. එතකොට පටන් ගමු”

“එහෙමයි වෙද මහත්තයා.”

නේත්‍රා කුඩා පුටුවට බරවූවාය. දේවක තෙල් පොදකින් බුලත් කොළය තෙත් කරගත්තේය. ඊටත් පසුව ඔහු නේත්‍රා ඇඳගෙන උන් සාය මඳක් ඉහළට කළේය. දෑතම ඇගේ දෙදණ මත තබා දේවක බැලුවේය.

“තෙරුවන් සරණයි අක්කේ.”

භාවනා එතනම ඉඳගෙන උන්නාය. දේවක කොතරම් ආදරයකින් කරුණාවකින් අක්කාගේ දෙපා තවනවාද කියා ඇය බලාගෙන උන්නාය. ඔහු එය කළේ නේත්‍රාගේ

පාදයක් තම දෙපා මත තබාගෙන දෑතින්මය. කොල්ලා තවන සනීපයට නේත්‍රාගේ දෑස් පවා තෙත්විය.

"ඔයා මගේ මල්ලිම වෙන්නෝන හැමදාම."

ඇය මුමුණා මෙන් කීවාය.

"ඒකම ඇති. සුද්දි අක්කගේ අනිත් කකුල මගේ කකුල උඩින් තියන්න."

භාවනා සන්සුන්ව එය කළාය. දේවක දෙපා තවන අයුරු වෙද මහත්තයාද බලාගෙන උන්නේය.

"ගෙදර ගියාම දරුවෝ ඔය අත්දෙකින් දෙහි පැලයක් හිටවන්න ඕන. තේරුණාද?"

"එහෙමයි වෙද මහත්තයා. කාරණාව කිව්වොත්."

වෙද මහතා සිනාසුනේය.

"ඔය අත්දෙකට ඇස් වහ වදින්න පුළුවන්"

භාවනාට පුදුමය. ඔහුගේ අත්වල ඒ තරම් බලයක් තියෙනවාද? නුවර එන්නට පෙර මේ අත්දෙකින් තම හිස අතගෑ අයුරු ඇයට සිහිවිය. 'මතක්කරලා කියන්නෝන දෙහි පැලයක් හිටවන්න කියලා' භාවනා සිතාගත්තාය.

තෙල් සාත්තුවෙන් පසුව දේවක වාහනයට නේත්‍රාව අරගෙන ගියේ දෑතින් ඔසවාගෙනය.

"මල්ලී."

යන අතරතුර නේත්‍රා රහසින් මෙන් දේවකට කතාකළාය. භාවනා උන්නේ පඩිපෙළ බැසගොස් පහළය. ඒ වාහනයේ දොර අරින්නටය.

"අක්කේ."

"මොනවද බබා ඔයාට ඕන. මී."

ඇය ඇසුවාය.

"ඔයාගේ පොඩි නංගිව. වෙන මොනවත් එපා."

දේවක එහෙමම කීවේය. නේත්‍රා සන්සුන්ව සිනාසුනාය.

"සමහරුන්ව මවලා තියෙන්නේ සමහරු වෙනුවෙන්මයි මල්ලී. ඒක කාටවත් වෙනස්කරන්න බෑ. නෙවර්."

"මටත් හිතෙනවා"

භාවනා දොර ඇරගෙන බලාගෙන උන්නාය. නේත්‍රා නෙත්පුරා තම නැගණිය දෙස බැලුවාය. රඹුක්වැල්ල පවුලේ වාසනාවන්තම කෙනා ඇය යැයි නේත්‍රාට සිතුණි. 'කෙනෙක්ගේ වාසනාව තියෙන්නේ තවත් කෙනෙක් ළඟ. ඇත්ත ඒකයි.'

හෝටලයට යද්දී අට පමණ විය.

නුවර අහස පැහැදිළිව තිබුණි. නමුත් සීතල සුළඟක් පරිසරය තෙමාගෙන හමාගෙන ගියේය. හන්තාන කඳු වැටිය දෙසින් හමාගෙන ආ සුළඟ හිරස්සගල ගහකොළ සිපගෙන අමායා හෝටලයේ උඩු මහලේ කාමරයට සීතලට ඇතුල්විය. භාවනා තරු එක දෙක පිපුණු රෑ අහස දෙස මොහොතක් බලාගෙන උන්නාය.

"තරුවක් දිහා බලාගෙන මොනවද සුද්දියේ පතන්නේ"

දේවක පිටුපසින් පැමිණ ඇසුවේය.

"තරුවක් වෙන්න ආසයි."

ඇය මුමුණා මෙන් කීවාය.

"කෙනෙක්ගේ අහසේ. සදාකාලික. කවදාවත් නිවිලා යන්නේ නැති."

ඇය කවියක් මෙන් කියාගෙන

ගියාය.

"ඒ කෙනා හරි ආසාවෙන් සුද්දිව එයාගේ අහසේ තියාගනී."

දෙදෙනාම ටික වෙලාවක් යනතුරු කතාකලේ නැත.

"අද නිදාගන්න බෑ හොඳේ."

"ඔය කිව්වට සුද්දි නිදාගනී"

"මං නිදාගන්නවා අහසේ."

ඇය කීවේ එපමණය.

"අක්කා කෝ"

"පව්. වොෂ් එකක් දානවා."

"එයා ඉක්මනට ඇවිදිනවා."

"ගොඩක් බලාපොරොත්තු දෙන්න එපා දේවකයියේ."

"ඒක බලාපොරොත්තුවක් නෙමේ සුද්දි. විශ්වාසයක්. ඒකෙම ඉන්න. එයා දවසක අපිත් එක්ක මාළිග

ාවේ පඩිපෙළ නැඟලා ගිහින් මලුත් පූජාකරලා තමයි නුවරින් යන්නේ”

ඔහුගේ විශ්වාසය පුදුමය. ඔහු හැමදේම කරන්නේ ඒ විශ්වාසයෙන්ද?

# 24

කෙල්ලත් කොල්ලත් අද නිදාග ත්තේ නැති බව නේත්‍රා දැනගෙන උන්නාය. හොඳම දේ උන් දෙන්නාට කතාකරන්නට දෙයක් කතාකරන්නට දී වේලාසන නිදාගන්නා එකය. දේවක කාමරයටම කෑම ගෙන්වා ගත්තේය.

"ඔය දෙන්නා එහෙනම් පැටියෝ පරක්කුවෙලා කන්න. මට බඩගිනියි. දවල්ට හරියට කෑවෙත් නෑ. මම කනවා."

"ඉන්න අක්කේ. මම අක්කට බෙදලා දෙන්නම්."

දේවක පිඟාන ගත්තේය.

"අනේ. මං බෙදාගන්නම් මල්ලියේ."

"ඔයාට අපිට බෙදලා දෙන්න දවසක් එනවා අක්කේ. එදාට බලන්නකෝ වැඩගන්න හැටි. අම්මපා කකුල් දෙකත් උඩ දාගෙන ෂපාන් එකේ ඉන්නවා එදාට."

නේත්‍රා තොල්පට පහළට කර භාවනා දෙස බැලුවාය.

"එහෙම ඉන්න තුන්දෙනෙක් දැනට මට ඉන්නවා"

නේත්‍රා කීවේ තම නංගිලා දෙන්නා ගැනත් දේවක ගැනත්ය.

"අපේ කෙල්ල තවම කතාකළේ නෑනේ සුද්දි."

නේත්‍රා සිහිකළේ තාරකා ගැනය.

“ඒකට උඩ ගියාම මෙලෝ දෙයක් මතක නෑ. උදෙන්ම ගමු.”

“පව්. අද හිටියනම් මෙතන එෆ් එම් එක වගේ කියවයි”

“එතකොට එෆ් එම් දෙකයි.”

දේවක කීවේය. භාවනා රවා බැලුවාය.

“කතාකරන්නෙම නෑ.”

ඇය කීවාය.

“අනේ මෙන්න වැන්ඳා සුද්දි. කතා නොකර ඉන්නනම් එපා. එදාට මේ ඉර පායන්නේ නැතිවෙයි. සඳ පායන්නේ නැතිවෙයි. තරු පරවෙලාම යයි. මල් පොහොට්ටු පිටින් වැටෙයි. මේක මළගෙයක් වගේ වෙයි. පාංශකූලේ දීලා ආවා වගේ තියෙයි. සුදු කොඩි වැල් වැල්වැල් එල්ලෙයි. ඒ නිසා

කියවන්න. දිගටම කියවන්න. ලිප් බොක්ක වගේ කටක් තිබුණාට. අපි ආසයි ඔය ගෝර නාදෙට."

දේවක කියාගෙන ගියේය.

"උඹට මම. මෝඩයා. මගේ කට දැන් ලිප් බොක්ක වගේද?ආ ගොන් වස්සෝ."

ඇය සත්තු වත්තම කියා බැන්නාය. දේවක ඔළුව පහත් කළේය.

"ඉතින් අපි ආසයිනේ ඒකට."

මේ සතුට හැමදාම තියන්න කියා නේත්‍රා දෙවියන්ගෙන් ඉල්ලුවාය. වඩාත් වටින්නේ එයය. සතුටය. සැනසීමය.

"ෆිෂ් කරිය හරි සුවඳයි මල්ලි."

"මටත් ආවා. ඉඳි ආප්පයක් දාලා මාළුකරි එක්ක කවන්නද සුද්දි."

දේවක ඇසුවේය. ඔහු හරි පහසුවෙන් එහෙම අහන්නේ කොහොමද කියා භාවනා සිතුවාය. මේ හුරුපුරුදු බව කොතරම් දෙයක් හදවතට කරනවාද?

"රෑට කමුකෝ"

කෙල්ලට කන සිහියක් නැත. ආදරය කරන්නට ගත්විට එහෙමය. දේවක ඇඟ සෝදාගන්නට ගියේ නේත්‍රාට තවත් ඉඳි ආප්ප දෙක තුනක් දමාය.

"මෙච්චර කන්න බෑ දරුවෝ."

"පුළුවන්."

"මට කවලා කවලා ඉස්මුරුත්තේ හදලා නිදිකරවන්නනේ. මුගේ කපටිකම තියෙන"

නේත්‍රා විහිළුවට කීවාය. නාන කාමරයට යන්නට ගිය දේවක

හැරුණේය.

"බලන්න ඉතින්. ආදරේට ඉඳි ආප්පයක් දුන්නම හදන කතා."

"හරි හරි. විහිළුවට කිව්වේ. මල්ලි යන්න"

"නාන්නෙහෙම නෑ."

භාවනා කෑගසා කීවාය. දේවක හැරී බැලුවේ පුදුමාකාර බැල්මකිනි. ඔහුගේ දෙනෙත් එක එල්ලෙම භාවනාගේ දෙනෙත් මත ඇලවිණ. 'ඇයි දෙයියනේ එහෙම බලාගෙන ඉන්නේ' භාවනා සිතුවාය.

"එහෙම කියනවානම් මාසයක් නොනා ඉන්නම් නෝනා."

ඔහු ඒ ටිකත් කියාම නාන කාමරයට ගියේය. භාවනා මොහොතකට ඇවිල ගිය හදවත මිරිකාගෙන මෙන් අක්කා දෙස

බැලුවාය. කියන්නට දෙයක් තිබුණද කියවෙන්නේ නැත. භාවනා දිග හුස්මක් ගත්තාය. එපමණටම හුස්මක් පිටකළාය.

"බබා"

"අක්කේ."

"ඔය ෆෝන් එක අරන් රූම් සර්විස් එකට කියන්න රෙඩ් වයින් දෙකක් ගේන්න කියලා. ගෙනත් දෙයි."

භාවනා මුව තදකර සිනාසුනාය.

"ගෙනෙයිද?"

ඇය තෙපරබාමින් මෙන් ඇසුවාය.

"අරන් දෙන්නකෝ මම කියන්න. කොල්ලත් පව්නේ ඉතින්"

"ඒකනේ නේද?"

"මාත් හරි ආසයිනේ නේද"

නේත්‍රා ඇසුවාය. භාවනා මිහිරි ලෙස සිනාසුනාය. නේත්‍රා ඇගේ

නැගණිය ගැන හොඳින්ම දනී. භාවනා රූම් සර්විස් අංකය ඔබා දුරකථනය නේත්‍රා අතට දුන්නාය. නේත්‍රා එය ගත්තේ වමතිනි.

"දිස් ඊස් රූම් නම්බර් ෆෝ සීරෝ වන්. කැන් යූ සෙන්ඩ් අස් ටූ රෙඩ් වයින්. විත් ෆ්‍රෙන්ච් ෆ්‍රයිස්. යස් ස්වීට් වන්. තැන්කියූ."

භාවනා අක්කාගේ උරහිසට බරවී ඒ ගෙළ සිපගත්තාය. එහෙම කළේ රතු වයින් ඇණවුම් කළ නිසාම නොවේ. මේ තේරුම් ගැනීම සහෝදරියක් පවා නොකරන බව ඇය දන්නා නිසාය.

"රෑට මදිවුනොත් ඉතින් තව දෙකක් ගෙන්න ගන්න."

"එච්චර බීලා මෙයා වෙරිවෙනවා අනේ."

"රෙඩ් වයින් බිව්වා කියලා වෙරිවෙන්නේ නෑ."

"චූට්ටක් පාවෙයි නේද අක්කේ."

නේත්‍රාට අත සෝදාගැනීම සඳහා බෝල් එකට වතුර පුරවාගන්නට භාවනා නාන කාමරයේ දොර යන්තමට විවර කළාය. ෂවර් රූම් එකේ සිංදු කියමින් ඇඟ සෝදන දේවකට මේ කිසිවක් ඇසෙන්නේ නැත. ඔහු ෂවර් එක මහා හයියෙන් දමාගෙන ඇඟ සෝදයි. දිය බිංදු තැවරුණු ෂවර් රූම් එකේ වීදුරුවෙන් ඔහුගේ ගත යන්තමට පෙනෙයි. භාවනා තොල්පට තදකරගෙන සිනාසී දොර වැසුවාය.

"ඒකට දැන් ලැජ්ජත් ඇති."

"ලැජ්ජාවක් එන්න ඒකා මම ආවා කියලා දැනගන්න එපැයි. සිංදු කිය

කිය ඇඟ සෝදනවා."

"සුද්දි."

"ම්"

"මේ සතුට බබා හරි ඉක්මනට මේ බලද්දී නැතිවෙනවා. පරිස්සම් කරගන්න ඕන ඒකයි. වෙන දෙයක් ජීවත්වෙන්න ඕන නෑ. සතුට හරියට වටිනවා. මොනවාහරි දෙයක් කරන්න ගියත් ඒක හිතට සතුටක්ද කියලා හිතන්න. එහෙම නැත්නම් ඒක අත්ඇරලා දාන්න. වට්එවර් යූ ඩිසයිඩ් ටු ඩූ. මේක් ෂුවර් ඉට් මේක්ස් යූ හැපී බබා. දෙන් ලයිෆ් විල් බී විත් යූ"

නේත්‍රා සරලවම කෙල්ලට කියා දුන්නාය. භාවනා හිස සැළුවාය. අක්කා මේ දේවල් කියන්නේ ඇගේ ජීවිතයෙන්ම පාඩම් ඉගෙනගෙනය. වඩාත් වටින්නේ එයය.

"මට මහන්සියි සුද්දියේ. මම නිදාගන්නවා. රෑට එහෙනම් කෝපි ගෙනත් බොන්න."

"ම්."

නේත්‍රා පොරවාගෙන දෑස් යන්තමට පියාගත්තාය. භාවනා නැඟිට්ටේ අක්කාගේ මුහුණට හාදු දෙකක්ම දීය. නේත්‍රා සිනාසුනාය.

"ලව් යූ."

"ලව් යූ ටූ බබා."

භාවනා සැදැල්ලට ගොස් කළුවර හන්තානය දෙස බලාගෙනම උන්නාය.

"සුද්දී"

දේවක ආවේ තද නිල් පැහැගත් සරමත් සුදු ටී ෂර්ට් එකත් ඇඳගෙනය. භාවනා කාමරයට ආවේ තොල්පට තද කරගෙනය.

"සමහරු නාන කාමරේ නානකොට

මේ ලෝකේ දෙයක් දන්නේ නෑ. අපි ඇවිල්ලත් ගියා."

භාවනා කීවාය.

"හුටා ඇවිල්ලත් ගියාද?"

දේවක පුදුමයෙන් ඇසුවේය.

"නැතුව. සමහරු ඉතින් අරවා මේව්වා වන වන සිංදු කිය කිය නානවා"

භාවනා අහක බලාගෙන තොල් පට තදකරගෙන කීවාය.

"අනිත් අය නාන්නේ දිය රෙදි එහෙම ඇඳගෙන වෙන්න ඇති"

දේවක කීවේය.

"නෑ. ස්විමින් කිට් ඇඳගෙන."

"මේ බාත් රූම් එකේ."

භාවනා බැල්කනිය වටා වූ කෙටි තාප්පයට බරවී ඔහු දෙස බලාගෙන උන්නාය.

"දැන් ඇති නාන කතා. අපි දන්නවා ඉතින් ඇඳගෙන නානවා කියලා දේවක මහත්තයා."

ඔහුද කෙටි තාප්පයට බරවිය.

"ඇඳගෙන නානවා නම් නාමු සුද්දි. සබන් කෑල්ලක් අරන් එන්නකෝ. මං කිව්වනේ ඇඳලා බිම තියලා නාවනවා කියලා."

ඔහුගේ ගතින් එන රස්නය පවා ඇයට දැනෙයි.

"බෙල් එක වදිනවා. අපි කෑම ඔක්කොම ඕඩර් කළානේ සුද්දි. තව මොනවද?"

"ගිහින් බලන්නකෝ ඉතින්."

දේවක ගොස් දොර විවර කළේය. වේටර්වරයා උස රතුවයින් වීදුරු දෙකක් ට්‍රේ එකේ තබාගෙන උන්නේය. දේවක පුදුමයෙන් බැලුවේය.

"මේ රෙඩ් වයින් අපිටද?"

ඇය ඔහුගේ පිටුපසින් ආවාය.

"ඇතුළෙන් තියන්න."

භාවනා කීවාය. වේටර්වරයා රතුවයින් දෙකත් බැදපු අල පෙති දීසියත් ටීපෝව මත තබා ගියේය. දේවක හිස ඇලකර ඇස් යටින් බැලුවේය.

"සුද්දිට හරි ප්‍රගතිශීලී අදහස් තියෙනවනේ."

"මං නෙමේ. අක්කා කිව්වේ. අපි දෙන්නට"

දේවකට නිදාගෙන සිටින නේත්‍රා දෙස බැලිණ.

"පව්. අපි දෙන්නට කතාකරන්න දීලා එයා නිදි."

දේවක නේත්‍රාව තව ටිකක් හොඳින් පෙරෙව්වේය. නේත්‍රාට එය

යන්තමට දැනුණි. ඇගේ දෙනෙත් නින්දේදීම තෙත්විය.

"ඔය දෙකත් අරන් එන්නකෝ ඉතින් බැල්කනියට."

දේවක ස්ටූලය පිටින්ම උස්සාගෙන ආවේය. භාවනා ඇය ඇඳගෙන උන් අත් නැති ගවුම මැදින් අත තබා පුටුවේ කොනකට බරවිය. ගවුම කෙටිය. ඒ නිසා එහෙම ඉඳගත් විට දෙපා එළියේය. දේවක යන්තමට මෙන් බැලුවේය. භාවනා එය දැක්කාය. ඇය කට අමුතුකර රැව්වාය.

# 25

"සුද්දි. එන්නකෝ ළඟට. මං ඇල්පිටියේ. සුද්දි නාවලපිටියේ වගේනේ"

"කටනම් තියෙනවා. එයාගේ තමා ලිප් බොක්ක වගේ කට."

භාවනා පුටුව ඇදගෙන ඔහු ළඟට ආවාය. ඒත් දුරයි වාගේය. තව ළඟට එන්නට ආසය. එහෙත් ඊට කලින් ගන්නට පොරොන්දු විසිහතරක් පමණ ඇත. ඇය

තනිවම සිනාසුණේ ඒ නිසාය.

"සුද්දි."

"ම්"

"මේ වයින් චුට්ට බීලා කට අවුස්සගන්න වෙන්නේ"

"කතාවක් තියෙනවා. කිව්වට පස්සේ වයින් බෝතලයක්ම ගෙනත් දෙන්නත් එක්ක බොමු"

"සුද්දි බෙනවානම් බොමු. වැටෙන්න"

"ම්. බීලා බැල්කනියේ වැටිලා නිදාගමුකෝ."

දේවක ඇස් කරකවා බැලුවේය. ඇයද බැලුවාය. දෙදෙනාගේම ඇස්වල වූයේ එකම කතාවකි. ආයේ කතාකරන්න දෙයක් මේ ජීවිත කතාවේ ඇත්දැයි භාවනාම සිතුවාය. 'ඒත් ජීවිතේ කියන්නේ

සෙල්ලමක් නෙමේ. ඔයා එහෙම කරන්න හීනෙකින්වත් හිතන්නේ නෑ තමයි. ඒත් ඉතින් අපි දුර ගමනක් යනවානම් සීට් බුකින් එකක් දාලම යමු' මේ හිතෙන දේවල්වලට දවසක බඩ අල්ලාගෙන හිනාවෙන්නට පුළුවන.

"හිනාවෙන්නේ මොකටද කියලා කිව්වානම් අපිත් ඉතින් හිනාවෙනවා සුද්දි"

"හිනාවෙන්න වෙයිද අඬන්න වෙයිද කියලා දන්නේ නෑ ඉතින්."

දේවක බැලුවේය. ඔහුගේ බැල්ම විශ්වාසවන්තය. දැඩිය.

"සුද්දිට එහෙම හිතෙනවද?"

ඇය සිනාසුණාය.

"හිතෙන දේවල් දැනෙන දේවල් පොඩ්ඩක් පැත්තක් තියමු

දේවකයියේ. මී. අපි කතාකරමු"

"රයිට්. පොඩී ෂොට් එකක් ගහලා කියමු බලන්න"

ඔහු කීවේය. භාවනා පුදුමයෙන් බැලුවාය.

"මං මොනවා කියන්නද? මට කියමු බලන්න කියන්නේ. අපි ආවේ කතාවක් අහන්න. කතාවක් කරන්න නෙමේ."

"ඒකත් එහෙමද?"

ඔහු අහස දෙස බැලුවේය. අහස පුරාම තරු වරුසාවක් විසිර ඇත. එක තරුවක් දෙස ඔහු පරිස්සමින් බලාගෙන උන්නේය. එය දීප්තිමත්ය. වඩාත් දීප්තිමත්ය. එය පහන් තරුව විය යුතුයැයි දේවක සිතුවේය.

හන්තාන මායිමෙන් හමා එන සුළඟේ ඇත්තේ තුනී සීතලකි.

"අපි හම්බවෙලා හරි කෙටි කාලයයි ගියේ සුද්දි. මට අද වගේ මතකයි සීගිරි එකේදී එක ලස්සන ළමයෙක් මගේ කමිසේ බතික් කරපු හැටි"

"හැමදේම මතකයි."

භාවනා උගුරෙන් මෙන් කීවාය. මේ කතාව පටන් ගන්නට ඔහු අතීතයටම ගියාද? මේ දෛවය වෙනස් කළ රසබරම මොහොත ඇත්තේ එතනද?

"එදත් මොනවද වුණා. ඒක හරි අමුතුදෙයක්. ගොඩක් කාලෙක ඉඳන් හොයපු කෙනෙක්ව දැක්කා වගේ හැඟීමක්. ළඟින්ම හිටපු කෙනෙක්ව අලුත් තැනකදී දැක්කා වගේ හැඟීමක්. ගෙදර ගිහිල්ලත් හරියට හිතුවා."

ඔහුටම කතාකරන්නට දෙන එක සනීපයෙ. මේ දේවල් අසාගෙන ඉන්නට කොතරම් ආසද?

"ගොඩක් දේවල් හදාගන්න බැරිවුණා සුද්දි. ජීවත්වෙන්න පටන්ගත්තා විතරනේ. පොත්තෙන් එළියට ආවේ මේ ඊයේ පෙරේදනේ. ඉස්කෝලෙන් අවුට්වෙලත් අවුරුද්දක් ඉස්කෝලේ ගියානේ. ඉතින් ටිකක් බරට හදාගන්න බැරිවුණා"

ඔහු කියනා දේ ඇයට නොතේරෙනවා නොවේ.

"ඒත් සුද්දි ජීවිතේ වෙනුවෙන් හොඳ ෆයිට් එකක් දෙන්න මාර ෆිට් එකක් තියෙනවා. එහෙම තියෙනවා කියලා මේ අත්දෙකට දැනෙනවා සුද්දි. පාමංකඩ යනවා කියලා අලිමංකඩ යන්න

ඕන නෑනේ සුද්දියේ. මැරෙන වෙලාවත් අල්ලගෙන ඉන්නවා කියලා පොරොන්දු වෙනවා. එහෙම අල්ලගෙන ඉන්න දෙනවානම්. මෙන්න අත. දීපන් සුද්දියේ අත."

ඔහු ඉතාමත්ම සරලව කීවේය. මේ තරම් ඉක්මනට ඔහු මේ දෛවයේ තීන්දුව දෙයි කියා ඇයවත් හිතුවේ නැත. එහෙත් කතාව ඇත්තය. පාමංකඩ යනවා කියා අලිමංකඩ යා යුතු නැත. මේ රැය කෙටිය.

ඔහු අත දැම්මේය. භාවනා ඒ අත දෙස බලාගෙනම උන්නාය. ඇයට කියන්නට දෙයක් නැත. නොවේනම් කිව යුතු බොහෝ දේ කියා අවසානය.

"අත්දෙක විතරද ඕන. ම්"

"ජීවිතේම. මට ඔයාගේ කියන හැමදේම ඕන. හැමදේම"

"පොඩි කැස්සක් තියෙනවා. ඒකත් ඕනද?"

මේ සුන්දර මොහොතේ මේ අහන්නේ මොනවාද?

"ඒකනේ කිව්වේ ලෙඩයි දුකයි තුවාලෙයි හැමදේම"

ඇය හැරුණාය. හන්තානයට පෑයු සඳේ එළිය ඔහුගේ මුහුණට වඩාත් සුන්දරව වැටී ඇත. භාවනා ටික වෙලාවක් එදෙස බලාගෙන උන්නාය. ඊටත් පසු ඔහුව තමාගේ පැත්තට හරවාගත්තාය. හීරස්සගල කඳු යායත් මහනුවර අහසත් ඇරෙන්නට වෙන කිසිවෙක්ම නැත.

"හැමදේම ඔයාට. හැමදේම හැමදාම හදවතින්ම"

ඇය පැහැදිලි සිංහල වචන දෙකක් එකතුකර කීවාය. ඊටත් පසුව වඩාත් මෘදු ලෙස දේවකගේ පපුවට හිස තැබුවාය. දෑස් පියාගත්තාය. මේ අපරිමිත නිවන විඳින්නට පසුගිය මාස කිහිපය පුරාම ඇය දුක් වින්ඳාය. බලාගෙන උන්නාය.

"සුද්දි."

"ම්"

"මේක සාමාන්‍ය ලැබීමක් නෙමේ මට."

"මටත්."

"හැමදාමත් මම සතුටින් තියන්නම්. මගේ සතුට සුද්දිගේ සතුට කියලා හිතන්නම්"

"පොරොන්දු එපා දේවකයියේ. මට ඔයාව විතරයි ඕන. එන විදිහකට ජීවත්වෙමු. එන දුකක්

විඳින සැපක්. එකට ජීවත්වෙන්න විතරයි ඕන. මෙහෙම. මට ඔයාව විතරයි ඕන වුණේ”

තමා ආදරය කළේ නිකම්ම කෙල්ලෙක්ට නොවන බව දේවක පුංචි බණ්ඩාර කොහොමත් දැනගෙන උන්නේය. එහෙත් හැම කෙල්ලෙක්ම මෙතනදී අරයාකාරය. ඒ අතින් භාවනා පුදුම කෙල්ලෙකි. සැබවින්ම මේ ජීවිතයේ කළ හැකි එකම දේ එකට ජීවත්වීම නොවේද? වඩාත් වැදගත් වෙන්නේත් කළ හැකි වන්නේත් එයම නොවේද?

දේවක ඔහුගේ අත්ල විහිදා ඇගේ හිස් මුදුනේ සිට පිරිමැද්දේය. භාවනාගේ දෙනෙත් කඳුළින් පිරිණ. මේ ආදරය කොතරම් හදවත සැනසුවාද කියා ඇය දනී,

මේ ආදරය හදවත කොතරම් නැලෙව්වාද කියා ඇය දනී.

සඳ වළාකුළකට වැසීගොස්, හෝටලයේ සැදැල්ලට යන්තම් අන්ධකාරය වැටී, පරිසරයම දෑස් පියාගත්තායැයි මෝඩකමට සිතූ මොහොතක ඇය ඇගේ මුහුණ ඉහළට එසෙව්වාය. ආදරයේ රොන්සුණු තැවරී දිලිසෙන දෙතොලින් ඔහු ඇගේ ලවන් මෘදුව තෙත්කළේය. භාවනා එක් නිමේෂයකට කුමරියක් වී දෑස් වසාගෙන අනන්ත වූ සුවයක් වින්ඳාය.

"මට දේවෝ ආදරේද කියලා කිව්වේ නෑනේ."

ඇය තොදොල් හඬකින් කීවාය.

"ආදරේ කියලා දෙයක් තියෙනවා

කියලා දැනගත්තෙත් සුද්දිගෙන්. ඉතින් කොච්චර ආදරේද කියලා හිතන්නකෝ."

"ජීවිතේම මන්ද"

"ජීවිතේම ඔයාට කැපකරලා ඉවරයි. මම අරන් මගේන සුද්දිව අඩුකරන්න. ඔයාට උත්තරය ලැබෙන්නේ බිංදුවයි"

ඔහු කීවේය. ඇය අප්‍රමාණ වූ ආදරයකින් ඔහුගේ නළලත සිපගත්තාය. දෙපතුල්වලින් ඉස්සී සිපගත්තාය. එවිට, ඔහු ඇගේ කුසුම් ගොබයක් වන් වූ ගෙළ සිපගත්තේය. යුවතිය ඇකිලී ගියාය. ඒ හැඟීම් මාත්‍රයෙන්ම ඇය ඇකිලී ගොස් ඔහුගේ ගතට බරවූවාය.

බැල්කනියේ වූ කුඩා පුටුවට බරවූ දේවක ඔහුගේ දෙපා මත

ඇයව හිඳුවාගත්තාය. ඇය ඔහුගේ දෙපාවල සුවසේ ඉඳගෙනම ඒ උරතලයට බරවූවාය. ජීවිතය දැන් කොතරම් නිවනක්දැයි ඇයට දැනෙයි. මේ නිවන ජීවිත කාලයටම නොවේදැයි සිතෙද්දී දැනෙන සැනසීම අද විඳ ඉවරකළ නොහැක.

"සුද්දි"

"ම්."

"අපිට ගොඩක් දුක් විඳින්න වෙයි. මිලින්ද සර් මට පොඩි දුවව දෙයිද?"

ඇය සිනාසුනාය.

"දෙනවා."

"කොහොමද දන්නේ."

"මං එයාගේ දුව නිසා."

"මම මොනවත් නැති"

ඔහුට කිසිවක් කියන්නට ඇය දුන්නේ නැත.

"ගොඩක් දෙවල් තියෙනවා කියලා පහුගිය කාලේ ඔප්පු කළා. අපි සුබවාදීව හිතමු. මී"

"ඒ නැතත් මං සටන් කරනවා."

"හා සටන්කරලා හරි මාව ගන්න හොඳේ. මා..ර..ම සටනක් දීලාහරි මාවම ගන්න. මොකද දන්නවද? මම වෙන මිනිහෙක් එක්ක යන්න හිතන්නේවත් නැති නිසා"

ඇය කීවාය. පසුව භාවනා සිනාසුනාය.

"මං එනවා. ඇතිනේ."

"ඇති."

"අපිට එහෙම බාධාවක් එන්නේ නෑ කියලා මට විශ්වාසයක් තියෙනවා. කිව්වේ විශ්වාසෙයි වටින්නේ කියලනේ. නේද"

"ඔව්. විශ්වාසෙයි වටින්නේ."

"ඒකෙම ඉන්න දේවකයියේ"

"දවසක සීගිරි එක මැද අපේ බබාලා දුවන දවසක් ගැනයි මම හිතන්නේ."

දේවක මෘදුව කීවේය.

"බබලා ගොඩක්."

"දෙකක් තුනක්. හතරක් වුනත් කමක් නෑ"

ඇය සිනාසුණාය.

"උත්සාහ කරලා බලමුකෝ"

හීන් පොදයක් හන්තානය හරහා හමාගෙන ගියේය. එය වැස්සක්ම නොවේ. අලුත් ආදරවන්තයන් එක්වූ බවට කියන ආසිරි මල් වැස්සකි.

"ඇතුළට යන්."

ඇය රහසින් මෙන් කීවාය. කෑම ටික බෙදුවේ දේවකය. ඇය අත් බැඳගෙන බලාගෙන උන්නාය.

"මට කවන්නඩද යන්නේ"

"ඉඳගන්නකෝ."

"ඕක දැන් පුරුද්දකට යනවා දේවකයියේ. මට එහෙමයි."

"ඉතින් මොකද වෙන්නේ. ආ පළවෙනි කට."

ඇය ඔහුගේ අත අල්ලාගෙනම ඉඳි ආප්ප කට කෑවාය. දෑස්වල වූ හීන් තෙතමනය ඇය ඇස්වලම තිබෙන්නට හැරියාය. ඊටත් පසුව භාවනා පහත් වී ඔහුගේ දෙපා සිපගත්තාය.

"ගොඩක් කවලා ඉතින් නින්ද යයි."

"අක්කා නිදි."

"ඉතින්"

"අපි ඉතින් තුරුල්වෙලා."

"පිප්පි දාමුද?"

ඇය සිනාව නවත්වාගත නොහැකිව ඇසුවාය. සිනාසුන තරමට කටේ තිබූ ඉඳිආප්ප ටිකද ඉස්පොල්ලේ යන්නට ආවේය. දේවක දකුණතින් පිඟාන අල්ලාගෙන වමතින් ඇගේ පිට අතගෑවාය.

"පිප්පි දාන්න කළින් පේරාදෙණියේ හොස්පිට්ල් එකට යන්න වෙයි. වතුර ටිකක් බොන්න සුද්දි"

ඇය තොල්පට තදකරගෙන සිනාව නවත්වා ගත්තාය. ඇස්වල වූ බැල්ම කීවේ දිග කතාවකි.

භාවනා ඇඳේ මැදට ආවාය. බැල්කනියේ දොර තිබුනේ විවරවමය. පොදයේ සීතලත් හඬත් මෑදුව කාමරය තුළට ආවේය. ඇඳේ දකුණු කොණට බරවූ දේවකගේ

පපුවට ඇය මුළු මුහුණම තැබුවාය. සැනසීම අන්තයටම දැනෙන්නේ දැන්ය. ඔහුගේ ඇඟිලිතුඩු ඇගේ හිසකේ අතර ලතාවකට ගියේය.

"හැමදාම මෙහෙම හොඳේ"

"ම් හැමදාම."

ඔහු සපථ වූවේය.

හන්තානය නිදාගන්නට ඇත. එහෙත් හන්තාන මායිමේ සොඳුරු නවාතැනක උන් අලුත් ආදරවන්තයෝ එදා රාත්‍රියේ නිදානොගත් බව විශ්වාසය. හොඳටම විශ්වාසය. බොහෝ දේ සිදුවෙන්නට ඇත. පුදුම එහෙම නොවුනොත්ය.

# 26

මාළිගාවට යන්නට භාවනා ඇඳගත්තේ සුදු ෆ්ලෙයාඩ් සායත් ෆ්ලෝරල් මෝස්තරයේ බ්ලවුසයත්ය. ඊයේ කෙල්ලගේ මුහුණේ නැති ලස්සනක් අද උදෑසන නේත්‍රා දැක්කාය. රාත්‍රිය භාස්කම කරන්නට ඇත. නේත්‍රා උන්නේ දේවක නාන කාමරයට යනතුරුය.

"ඉතින් බබා"

නේත්‍රා ඇසුවාය.

"ඉතින් මුකුත් නෑ අනේ."

"මෙහේ වරෙන් හොර කෙල්ල"

නේත්‍රා ඇයව රෝද පුටුව වෙතම ඇදගත්තාය. කෙල්ලව ගොස් නැවතුනේ නේත්‍රාගේ උකුලේය.

"ඉතින්. කියන්නකෝ බබා මොනවද වුනේ."

නේත්‍රා ඇසුවාය.

"වුනේද"

"ම්. බබාට මොකද වුනේ."

"බබා. ට බබා ලැබුණා අනේ"

සරලවම ඇය කීවාය. නේත්‍රා කෙල්ලගේ මුහුණ සිපගත්තාය.

"දැන් පරිස්සමින්"

"දැන් මොනවටද අනේ පරිස්සමක්"

"හීන සැබෑකරගන්න ඕනනේ. ඒක

ලේසි නෑ.”

“මම ගිය ගමන් අම්මටයි තාත්තටයි කියනවා”

“මං කියන්නම්”

“හා. තැන්කියු සෝ මච්.”

දේවක ආවේ තුවා පට පමණක් ඇඳගෙන ඔහුගේ ඇඳුම් ගන්නටය. නේත්‍රාගේ උකුල මතවූ කෙල්ල දැක ඔහු නැවතුණේය.

“මෙහේ එන්න මල්ලියේ.”

දේවක ළඟටම ආවේය. භාවනාටනම් සිතුවේ තුවා පට ඇද දමන්නටය. ඇය හිකිස් ගා සිනාසුණේද ඒ නිසාය.

“දෙන්නම හැමදාම මේ වගේම ආදරෙන් ඉන්නෝන හොඳේ. දෙන්නගෙන් කවුරුවත් දෙන්නගේ හිත රිද්දන්න බෑ. එක පුංචි හිත්

රිදවීමක් ලොකුවෙන්න පුළුවන්. තුවාල පැහැවනවා."

"අක්කගේ පොඩි නංගි හැමදාම ඔහොමම හිකි හිකි ගගා ඉඳී."

දේවක සරලවම කීවේය.

"මං තාත්තයි අම්මයි එක්ක කතාකරනවා. ඒක කරනවානම් ඔයා කවුද කියලා කියන්න වෙනවා"

දේවක හිස කැසුවේය.

"ඒක කියන්නම වෙයිද අක්කේ."

"ඇයි."

"එහෙම ප්‍රශ්නයක් වෙන එකක් නෑනේ නේද?"

"කවදාවත් නෑ. අපි යන්කෝ මාළිගාවට. අද දෙන්නා වෙනුවෙන් මායි බාරවෙන්නේ."

නේත්‍රා භාවනාගේ පමණක් නොව දේවකගේද හිස පහළට

කර සිපගත්තාය. භාවනා දේවකට යන්නට දී ඔහුගේ තුවා පට ඇද්දාය. කොල්ලා නාන කාමරයට ගියේ පොඩි එකෙකු සේ දුවගෙනය. නේත්‍රා සිනාබරව අහක බලාගත්තාය.

"උඹ හිතන්නේ උඹ දිනුම් කියලද. වරෙන්කෝ කෙල්ල දිය රෙද්දක් ඇඳගෙන. අම්මපා අදිනවා රෙද්ද?"

දේවක නාන කාමරයෙන් හිස පමණක් දමා කීවේය. භාවනා ඇද කළාය.

"ඉතින් මට මොකද. ඇදගන්න එකනේ ඇත්තේ. අපිනම් දුවන්නේ නෑ."

"දැක්කද අක්කේ"

"හරි හරි. ඇඳගෙන එන්නකෝ. මාළිගාවට යන්නේ. ඔය කතා ඇති දැන්."

දේවක ඇද කළේය. භාවනා නියෙව්වාය.

***   ***   ***   ***   ***

නේත්‍රාගේ රෝද පුටුව තල්ලුකරගෙන ගියේ දේවකත් භාවනාත්ය. තමාව මාළිගාවට එක්කාගෙන යන කෙල්ලාත් කොල්ලාත් ගැන නේත්‍රා දළදා හාමුදුරුවන්ට කීවේ මාළිගාවේ වාහල්කඩට එන්නටත් පෙරය. 'දෙන්නවම සතුටින් තියන්න' ජීවිතයේ පරම අස්වැන්න එයය. එක්වෙන දෙදෙනෙක් ළඟ සතුටක් නැත්නම් වෙන මොනවා තිබුණත් වැඩක් නැත.

මාළිගාවට යන්නට පෙර දේවක

සල් මල් වටකළ මැද සමන් පිච්ච මල් ඇතිරූ මල් වට්ටියක් භාවනා වෙනුවෙන් ගත්තාය.

"එක වට්ටියක් ඇතිනේ අපි තුන්දෙනාටම."

ඔහු ඇසුවේය.

"එක පැතුමක්නේ"

නේත්‍රාද කීවාය.

"මේක පැතුම් ෆැක්ටරියක් අක්කේ"

"හා. දැන් මායි පැතුම් ෆැක්ටරිය. එයයි කියන්නේ මේ සීගිරි එක මැද්දේ දුවන්න බටු ඇට තුනක් හදන්නෝන කියලා. මට කියනවා මෙතන."

භාවනා ඔහොමම කීවාය. දේවක ලැජ්ජාවෙන් මාළිගාව දෙස බැලුවේය. නේත්‍රා සිනාසුණාය.

"ඉතින් ෂෝක්නේ. අපිත් පාළුවෙන් ඉන්නේ. හදලා දෙන්නකෝ. අපි බලාගන්නම්. මමනම් සීගිරි එකෙන් අයින්වෙලා හරි පැටව් බලාගන්නවා"

ඇය කීවාය. දේවක දුක්බරව බැලුවේය.

"ඔයාව එහෙම බේබි සිටින් දාන්නේ නෑ අක්කා. ඉන්නකෝ ටිකක්."

දේවක කීවේය.

"මට මේ ජීවිතේ කියලා දුකක් නෑ පැටියෝ."

නේත්‍රා කීවාය. දුකට පවා හුරුවෙන විට එහෙමය. දුකත් ජීවිතය වෙයි. ජීවිතය දුකක් වෙයි.

"අපි යන්කෝ"

දේවක මාළිගාවේ ඉහළ මළුවට යන පඩිපෙළ ළඟදී නේත්‍රාව දෑතටම

ගත්තේය. කෙල්ලව සූරියආරච්චිලා අරගෙන ගියානම් වෙන දේ ඇය සිහිකළාය. මේ ලැබීම දෙවියන්ම දෙන්නට ඇත.

"ඔයාට පින්"

ඇය රහසින් මෙන් කීවාය. භාවනා සල් මල් වට්ටිය අත දරාගෙන ඔවුන් අසළින්ම ආවාය. තමා මේ ආත්ම භවය වෙනුවෙන් තෝරාගත් ජීවිතය ගැන ඇය සියවෙනි වතාවටත් සතුටු වූවාය. 'එයාවම හැම ආත්මයකටම වෙන්කරලා දෙන්න දළදා හාමුදුරුවනේ. මේ සංසාරය කොච්චර දිගද? ඒතාක් කල්.' ඇය පැතුවාය.

"මෙහෙම මාව තියලා උඩ මළුවට යන්න මහත්තයෝ බබා එක්ක."

පහළ මළුවේදී ඇය කීවාය. එහි වූ ගල් පඩියේ ඉඳගෙන දළදා වැඳිය හැක.

"එහෙම අක්කව පහළ මළුවේ තියලා යනවද අක්කේ. අද ටිකක්වෙලා ඉඳලා හැමදේටම බාරවෙලා අපි යමු. තව ටික කාලයයිනේ මෙහෙම යන්න තියෙන්නේඊට පස්සේ ඉතින් අක්කට අපේ පුතාව වඩාගෙන යන්න වෙයි."

දේවක කීවේය. නේත්‍රා පුදුමයෙන් මෙන් භාවනා දෙස බැලුවාය. මේ විශ්වාසය පුදුමය. එය වඩාත්ම පුදුම එය මේ මාළිගාවේදී කියන එකය.

"මේ මාළිගාව මට හරි සමීපයි. ඉල්ලපු හැමදේම දුන්නා. හැමදේම"

ඔහු කීවේය. භාවනා මල් වට්ටිය උඩින් දේවක දෙස බැලුවේය.

"හැමදේම ඉල්ලුවද?"

"මී ගියපාර ආපු වෙලාවෙත් කෙනෙක්ව ඉල්ලුවා. එක පෝයයි ගියේ."

එසේනම් එය පුදුමාකාර හාස්කමකි.

"දෙක වසර කාලේදී පවා අප්පච්චි එක්ක මාළිගාවට එනවා මතකයි. මේ පඩිවලට කතාකරන්න පුළුවන්නම් කියයි"

ඔහු කීවේය. භාවනා මවාගත්තාය. අහිංසක මුහුණැති පොඩි පිරිමි දරුවෙක් ඇගේ හිතේ මැවිණ. සමහරවිට ඔහුගේ පුතාටත් ඒ මුහුණම එනු ඇත.

"අපි මල් පූජකරලා අතන ඉඳගෙන පැයක් විතර ඉමු. හැම ගාථාවක්ම කියලා අද නිස්කලංකයේ

වළිමු. අටයි තිස් තුනටනේ වෙද මහත්තයා එන්න කිව්වේ. වෙලා තියෙනවා අක්කා."

නේත්‍රාව බිම ඉන්ඳවා දේවක කීවේ ඇගේ හිසද අතගාය. ඇය ඔහුගේ එක අතක් අත්හැරියේ නැත.

"ඔයාට දළදා හාමුදුරුවෝ රකින්න ඕන"

ඇය මෘදුව කීවාය. දළදා හාමුදුරුවන්ට මල් පූජා කරන්නට ගියේ භාවනාත් දේවකත්ය. එක ළඟට වී මල් පුජාකරන තම නැගණියත් දේවකත් දෙස නේත්‍රා විනාඩි පහක් පමණ බලාගෙන උන්නාය. එය පුදුම එක්කිරීමකි. දෙවියන්ගේම ගැළපීමකි. 'ඔයා අද අපි අතර ඉන්න තිබුනේ පොඩි නැන්දි.' ඇය සිතින් ඇයව

සිහිකළාය.

භාවනා මල් පූජා කළේ දෑස් පියාගෙනය. දේවක ඇය අසළටම වී දෑත් නැමඳගෙන උන්නේය.

"අද දවස මතක තියාගන්නවා. මොන වැඩේ තිබුනත් අද දවසට අපි සමරන්නේ මේ මහනුවර. මාළිගාවට මේ වෙලාවටම එන්න ඕන."

"එහෙමම වෙයි. මම කෙහොමහරි එක්කගෙන එනවා."

"ඇවිදින්න බැරි මගේ අක්කවත් උස්සගෙන මාළිගාවට ආපු ඔයාට මොනවද බැරි දේවකයියේ"

ඇය මුව පුරා කීවාය. සමහර දේවල් ගැන හදවතේ ඇති භක්තිය පුදුමාකාරය.

"මොනවද ඉතින් ඔය ප්‍රාර්ථනා කරන්නේ. ආ සුද්දි."

"අපේ වෙඩින් එක ගැන. ඒක මාස හයක් යන්න කලින් වෙන්නෝන"

දේවකට පුදුම නැත.

"එහෙමම වෙයි එහෙනම්."

"ම්. බැදලා හනිමූන් එන්නේ නුවරම තමයි. මේ නුවර මට හරි විශේෂයි"

ඇය කීවාය.

"මාත් ආසයි. මගේ ගමනේ."

"දේවකයියේ"

"ම්"

"වෙඩින් එකට කැන්ඩියන් අඳිමු හොඳේ. අයියා නිළමේ මුල් ඇඳුම."

"හරි. එහෙමම වෙයි. කොහොමත් මම දේවක පුංචි බණ්ඩාරනේ. අඳින්නම එපැයි. මං හිතුවා කැන්ඩියක් අඳින්න කැමති නැති වෙයි කියලා."

"ආසයි. හෝම් කමින් එකට වෙස්ටන් ගවුමක්."

"හා. අපි එතකොට ටී ෂර්ට් එකක් වෙන්න ඇති ගහන්නේ."

ඇය වැළඹිටෙන් ඇන්නාය.

"ලස්සන සූට් එකක්"

"එතකොට මේ."

"දැන් ඇතිවෙඩින් ප්ලෑන් එක වෙන වෙලාවක කතාකරමු. දැන් වළින්න. ඊට පස්සේ හනිමූන් එකට කරන දේවලුත් කියයි මෙතන. ඊයේ රෑ ම..ට"

ඇය කියන්නට ගියදේ කිව්වේ නැත. දේවක සිනාසී දෑත් එක්කර ගත්තේය. දෑස් පියාගත්තේය. භාවනා නෙත් ඇර දේවක දෙස බැලුවේය. 'මේ ලැබීම මට ලැබිච්ච එකයි පුදුම' ඇය සිතින් සිතුවාය.

# 27

දේවකත් භාවනාත් නේත්‍රාත් පේරාදෙණියේ වෙද ගෙදරින් ආවේ සති දෙකකට බෙහෙත් රැගෙනය. තෙල් බෝතල් දාහතරක් නේත්‍රාගේ දෙපාවලට ගෑ යුතු විය. ඒ තෙල් බොතල් දාහතරම ඇගේ දෙපාවල ගෑ යුත්තේ දේවකය. ඒ වෙනුවෙන් කොල්ලාට කොතරම් දුකක් විඳින්නට වේදැයි නේත්‍රා දැනගෙන උන්නාය. තමාව ඇවිද්දවන්නට මේ කොල්ලා

දරණ උත්සාහයම දෙවියන් දැකිය යුතුය.

කසාය වර්ග දෙකක් සති දෙකට නියම විය. ඊට අමතරව ඇය විසින් කළ යුතු ව්‍යායාම කිහිපයක්ද විය. තෙල් ගෑ යුත්තේ තැඹිලි තෙලෙන් දැල්වූ පහනකින් බුලත් කොළ රත්කරය. හොඳම තැඹිලි තෙල් හෙට කොහෙන් හෝ සොයාගත යුතුයැයි ද්වේක සිතාගත්තේය. බොහෝ තැන්වල ඇත්තේ තැඹිලි තෙල් නොවේ. පොල් තෙල්ය.

තුන්දෙනාම ආවේ ගැටඹේ බෝධියට පඬුරුත් දමාය.

"අනේ මහත්තයෝ. ඔයාට වෙන වැඩක් කරන්ගන්න වෙලාවක් නෑනේමේ තෙල් ගාන්න ගියාම."

නේත්‍රා කීවාය.

"මම අක්කේ හවස හතයි නමයයි අතර වැඩක් දාගන්නේ නෑ. අපේ අප්පොච්චත් එනකොට කොහොමත් රෑ වෙනවා. අපි නිස්කලංකයේ මේ වැඩේ කරමු. අපේ සුද්දි හීනියට අපිට ප්ලෙන්ටියක් හදලා දෙයිනේ"

දේවක භාවනා දෙස බලා කීවාය.

"තේ බීලා හරියන්නේ නෑ. අපේ ගෙදරින් බත් කාලා යන්නෝන."

ඇය කීවාය.

"ඒවා අපේ අම්මා ලස්සනට කරලා දෙයි. මේකී කළේ නැතත්"

"බත් කටවල් තුන හතරක් කන්න බඩේ ඉඩ ඉතුරු කරගෙනම කනවා ඉතින්."

"ඇයි බඩේ ඉඩ ඉතුරුකරගන්නේ"

"අප්පච්චි එක්කත් බත් කටක් කන්නෝන සුද්දි. නැත්නම් පව්නේ."

දෙමව්පියන්ට ආදරය කරන හැටි ඉගෙනගත යුත්තේ ඔහුගෙනි.

"අපේ තාත්තා කොයි වෙලාවේ කනවද කියලාවත් අපි දන්නේ නෑ."

"ඒත් එක කාලෙක අපි කෑවේ නැත්නම් එයාලා කෑවේ නෑ සුද්දි"

දේවක කීවේය. ඔහුගේ කතාවට එරෙහිවිය නොහැක.

"අක්කේ ටයිට් පෑන්ට් එකක් ගන්න. බිම කාපට් එකක් දාගෙන අපි උදේට එක්සයිස් ටික කරමු හොඳේ."

"කරනවා මල්ලි. ඔයා නිසාම කරනවා."

"කකුල් දෙකට විතරක් නෙමේනේ තෙල් ගාන්න තියෙන්නේ. හිසටත් ගාන්න ඕනනේ. නහර පණගහලා අපි ගමු"

"අක්කා මම පාන්දර හතරට

ඇවිත් අක්කව ඇහැරවන්නම්."

භාවනා කීවාය.

"අක්කට අපේ සුද්දිව ඇහැරවන්න වෙයිද දන්නේ නෑ"

භාවනා දේවකට ගැසුවේය. වාහනය ඒ පැත්තට කැපෙන්නටත් ගියේය.

"මං පාන්දර නැඟිටිනවා. එක්කෙනෙක් තමයි අද උදේ නැඟිට්ටේ නැත්තේ."

ඇත්තටම උදේ කළින්ම ඇහැරුණේ භාවනාය.

"ඒ ඉතින් සුද්දි අපි නයිටක් ඇද්දනේ"

භාවනා රැව්වේ පිටුපස බලාය. දේවක හිස කැසුවේය. නේත්‍රා වාහනයට පසුවෙන පාර දෙස බලා සිනාසුනාය. ඊයේ රෑ තමා කාමරයේ

හිටියේ නැත්නම් බබාලාවත් හදන බව ඇය දනී.

"මීට මාස ගාණකට කලින් අප්පච්චියි මායි කොළඹ පදිංචියට ආවේ මේ නුවර පාරේ. එහෙම එනකොට ජීවිතේ මෙහෙම වෙනස්වෙයි කියලා දැනං හිටියේ නෑ"

දේවක භාවනා දෙස බලා කීවේය.

"ඉතින් එහෙම වෙනස්වුන එක හොඳයිනේ. ඇයි දුකෙන් වගේ කියන්නේ."

"ඒත් සුද්දි ගොඩක් දේවල් ලැබෙයි කියලා මම හිතුවේ නෑ. එන විදිහකට බලනවා කියලා හිතුවේ. ආවට පස්සෙයි අප්පච්චි සීගිරි එකට යන්න කිව්වෙත්. ඉතින් ආවා. හැමදේම වෙනස්වුනේ එදාට පස්සේ. ඉතින් ඒක වෙනසක් කියලා මම හිතන්නේ

නෑ. එතනින් තමා සුද්දි ජීවිතේ පටන්ගත්තේ"

දේවක පැහැදිලිව කීවේය.

"සීගිරි එක මට ගොඩක් දේවල් දුන්නා"

ඔහු කීවේ කෘතවේදීවය.

"අක්කේ."

"මල්ලි."

"ඔයාගේ පොඩි නංගිව ඉතින් ලොකු ගේකට එක්කගෙන යන්න බැරිවෙයි. අප්පච්චියි මායි හිතන් ඉන්නේ හෙට අනිද්දා ඉඩම් කෑල්ලක් අරන් පොඩියට ගෙයක් හදන්න."

භාවනාගේ දෙනෙතින් කඳුළක් පැන්නේය.

"මට ඔය තියෙන අතුරුගිරියේ ගේත් ඇති. කවුද දැන් ගෙවල් ගැන කතාකළේ. මෝඩයෙක්නේ"

භාවනා අඬමින්ම කීවාය.

"ඔයාට මේ සීගිරි එකේ ගොඩක් දේවල් ලැබෙනවා මල්ලියේ. එහෙම හිතන්න එපා."

නේත්‍රා කීවාය.

"නැතිවුනා කියන්නකෝ. ඒත් මොකෝ"

භාවනා දිග හුස්මක් ගත්තාය. පසුව එය ටික ටික පිටකළාය.

"ඒත් හැමදේම හදනවා අක්කේ. එහෙමයි ආස. ජීවත්වෙන්න ආසාවක් ආවාම හැමදේම කරනවා."

"සාමාන්‍ය විදිහට ජීවත්වෙලා මෙහෙම නිදහසේ උන්නාම ඇති. ජීවත්වෙන්න සල්ලි ගොඩක් ඕන නෑ"

"ඇත්ත සුද්දි."

"දැන් ඇති. වෙන කතා එපා"

ඔහු කටපියා ගත්තේය. ඇය

හිතන්නේ එසේනම් එහෙමම වුනාවේ කියා ඔහු සිතුවේය.

දේවකගේ දුරකථනය නාදවිය. කතාකළේ ජීවන්ය. භාවනා එය සම්බන්ධකරගත්තාය.

"අපි එන ගමන් අප්පච්චි. දේවකයියා ඩ්‍රයිව්කරනවා."

"එනවද කියලා බලන්න පොඩි පුතේ කතාකළේ. ඔයාලා කෑවද?"

භාවනාගේ දෑස් තෙමිණ.

"කෑවා අප්පච්චි. අප්පච්චි කෑවද"

"මේ කන්න ගත්තා පොඩි පුතේ. ලොකු පුතාට වෙද මහත්තයා බෙහෙත් නියම කළානේ නේද?"

"ඔව් අප්පච්චි. බෙහෙත් තෙල් බෝතල් දාහතරක් දුන්නා. අක්කගේ කකුලේ ගාන්න"

"අපේ පුතන්ඩියා බෙහෙත් තෙල්

ගාන්න රුසියා."

"එයා තමයි ගාන්නේ අප්පච්චි. මගෙත් මේ කොන්ද ඇවිලෙනවා. ඒකටත් තෙලක් ගත්තා."

ජීවන් සිනාසුනේය.

"තෙල් වැඩියෙක් ගෑවාමත් අපත්‍ය වෙනවා පුතේ. ඒ නිසා බලාගෙන"

ජීවන් සිනාසී කීවේය. භාවනා ලැප් ජාවෙන් දේවක දෙස බැලුවේය.

"මටත් හිතෙනවා අප්පච්චි. අපි ඉක්මනට එන්නම්"

ඇය දුරකථනය තබා සිනාසුනාය.

"තෙල් වැඩියෙන් ගෑවාමත් අපත්‍ය වෙනවලු."

දේවක සිනාසුනේය.

"ගාන එකේ ගාමු සුද්දි. නැද්ද මේ වෙන කොහේවත් වේදනාවක්"

"තියෙනවා අනේ. වෙලාවකට සර්වාංගයම රිදෙනවා."

ඇය කීවාය. දේවක පසුපස බලා සිනාසුනේය.

"දෙමු තෙල් සාත්තුවක්."

"තෙල් සාත්තුව කොහොම වෙතත් මට මේ වෙඩින් එකට බඩක් එක්ක ඉන්න වෙයි"

භාවනා කට සිරියාවක් නැතුව කීවාය. දේවක ලැජ්ජාවෙන් සිනාසුනේය. 'ලැජ්ජ හිතුණා. මූණ ජම්බු ගෙඩිය වගේ' ඇය සිනාසුනේ ඒ මුහුණ දෙසම බලාගෙනය.

පැතූ සියල්ලම ලැබුණා නොවේදැයි භාවනාට සිතුණි. ඇය මොහොතකට දෑස් පියාගෙන සිතුවේ එයය.

# 28

භාවනා පිබිදුනේ මහා පාන්දරය. ඇය ජංගම දුරකථනයෙන් වෙලාව බැලුවාය. දැන් එය ඇත්තේ ඇය නිදන කොට්ටය යටය. නොවේනම් උඩය. හදවතට සමීප ඇමතුමක් මහ රෑ පුරාත් එන නිසාදෝ ජංගම දුරකථනය අන් තැනක තැබිය නොහැක. මහ පාන්දර එකට දෙකට පවා තමාට ඇමතුම් දෙන ආදර කතාවකට ඇය ප්‍රිය කළාය.

මේ දවස්වල උන්නත් නෑ වගේය. පාවෙනවා වගේය. හිතෙන්නේ මෙහෙමම ඇඳට වී ඇඹරි ඇඹරී සිහින දකිමින් පෙරලෙමින් ඉන්නටය.

වෙලාව පාන්දර පහයි දහයය. මේ දවස්වල පාන්දරට ඇති සීතල පුදුමාකාරය. හිතෙන්නේ ගුලිවීගෙන නිදාගන්නටය. එහෙත් නොසන්සුන් හිත කියන්නේ පිබිදෙන්න කියාය. නුවර ගමනින් පසුව ප්‍රථම වතාවට සිගිරි එකට යන්නේ අදය. මහනුවර ගමන දෛවෝපගත ගමනක් විය. හුදෙකලා යුවතියක් ලෙස මහනුවර ගිය භාවනා යළිත් කඩුගන්නාව කන්ද බැස ආවේ මේ ආත්ම භවයේ ප්‍රථම සහ අවසාන වරට පෙම්වතියක් වීය.

මඟ දිගට කිලෝ මීටර් අසූවක් පමණ ඇය දේවකගේ අතින්

අල්ලාගෙන ආවාය. ඔහුගේ රස්නයෙන් අත ගනිද්දී හදවත හා සම්බන්ධ කළ ආශ්වාස ප්‍රාශ්වාස යන්ත්‍රයක් ක්‍රියා විරහිත වෙන්නාක් වැනි හිර කිරීමක් ළයට දැනෙයි. භාවනා සිනිඳු කොට්ටයට කම්මුල් හිරකරගෙන මහනුවර හිරස්සගල හෝටලයේදී සිදුවූ හැමදේම එකින් එක සිහිකළාය. ආදරය මෙතරම් එතරම් මිහිරි වේදනාබර සුවයක්ද කියා ඇය සිතුවාය. ඒ මිහිරි වේදනාව ඉවසාගත නොහැකිව දෙතොල්පට සිරකරගෙන උන් රැයක මතකය මේ දැනුත් ඇයව හිරිවට්ටවාලයි.

අද සීගිරි එකට අඳින්නේ මොකක්ද කියා භාවනා සිතුවාය. අද ඇත්තටම විශේෂ දවසකි. නොවේනම් එකම ඇසකට මේ රුව බාර කළ දවසකි. කෙනෙක් වෙනුවෙන් සැරසීම

ලොවක් වෙනුවෙන් සැරසීමට වඩා අමාරුය. ඒත් මිහිරිය. ලොවක් බලන්නේ තමා දෙස පමණක් නොවේ. ලොවකට බලන්නට දහසක් දේ ඇත. එහෙත් එක දෙනුවනකට එසේ නොවේ. එඇස් කර්ණිකා තුළ නිධන්ගතව ඇත්තේ මේ රුවම පමණි. එය එසේ නොවේයැයි සිතන්නට ඇයට නොහැක.

"පොඩි ෂොපින් පාරක් දාන්නත් වෙයි වගේ. තියෙන ඇඳුම් ඔක්කොම පරණයි."

යනවානම් යා යුත්තේ ඔහුත් සමඟය. කොළඹ අලුත් සාප්පු වැහි වැහැලාය. කොහොමත් සීගිරි සුපර් විවෘත කරන්නට පෙර යා යුතුය.

භාවනා හදිස්සියේම නැගිට

අල්මාරිය විවර කළාය. ටික වෙලාවක් සාරි එහෙට මෙහෙට ඇද ඇය අවසානයට තෝරා ගත්තේ ලොවි පැහැයේ සාරියය. එය හොඳය. මේ ලොවි රත හදවතට අනුරාග යක් සමඟ බැදි රසබර බවක් ගෙන එන්නකි. එයට අඳිනවානම් ඇඳිය යුත්තේ කළු සාරි ජැකට් එකය. දානවානම් දැමිය යුත්තේ කළු පටි සැන්ඩ්ල්ස් දෙකය. භාවනා සියල්ල කර අවසානයේ ඇගේ පැරණි අත් බෑගයේ තිබූ අඩුම කුඩුම ටික කළු පැහැගත් අත් බෑගයකට මාරු කළාය. 'පොඩි අක්කට කියන්නෝන බිලැක් හෑන්ඩ් බෑග් එකක් ගේන්න කියලා' භාවනා සිතාගත්තාය. අද ඇයටත් කතාකළ යුතුව ඇත.

"මං හිතුවා පාන්දරම ඇහැරලා ඇති කියලා."

ඉඳුනිල් ආවේ තේ එක අරගෙ නමය. වේලාසන ඇහැරුණ දවසක අම්මාට තේ ටික හදා අරන් යා යුතු යැයි ඇය සිතාගත්තාය. යුතුකම් අමතක වෙන හැටි පුදුමය. 'යුතුකම් කරන හැටි ඉගෙනගන්න ඕන ඔයාගෙන්' භාවනා දේවකව සිහිකළාය.

"ඉතින් අනේ මම වෙනදටත් වේලාසන ඇහැරෙනවා."

භාවනා සිනාසී කීවාය. අක්කා අම්මාට කුමක් හෝ කියන්නට ඇත්ද? ඒත් මේ පාන්දර ඒකට වෙලාවක් නොවුන බව භාවනා දනී.

"මී. තේක උණුවෙන් බොන්න."

තේ එක දුන් ඉඳුනිල් කාමරයෙන් නොගොස් ඇඳ මත ඉඳගත්තාය. අම්මා එහෙම ඉඳගන්නේ මොනවා හෝ කියන්නට බව භාවනා

අත්දැකීමෙන් දනී. භාවනාද තේ එක ගෙන ඇඳ මතින් ඉඳගත්තාය.

"සීගිරි එක කවදද ඕපන් කරන්නේ සුද්දි."

"අදයි ඒක තීරණාය කරන්නේ අම්මා. උදේ සීයයි තාත්තයි එක්ක පොඩි කතාවක් දාන්න තියෙනවා. සිංහල අවුරුද්දට සති දෙක තුනක් තියලා හරි ඕපන් කරන්න ඕනනේ."

"ඒක තමයි. ඉතින් අර ළමයා වැඩ ඉවරකරලද?"

භාවනා සිනාසුනාය. අම්මා මේ පිට රවුම් පාරෙන් එන්නේ දේවක ගැන කතාවකටද?

"එයාට වැඩ ඉවරකරන්න මහ වෙලාවක් යන්නේ නෑ අම්මා. හෙට ඕපන් කරමු කිව්වත් වැඩ ඉවරකරයි. ලේවලින් ආපු ටැලන්ට් එකක්නේ."

භාවනාට කියවිණ.

"ලේවලින් ආවා කිව්වේ මැණික."

භාවනා දෙනෙත් එසෙව්වාය. අම්මාට මේ වෙලාවිම දේවක ගැන කියා දමන්නට සිතෙයි. එහෙත් දෙයක් කරන කියන විදිහක් කලාවක් ඇත.

"මං දවසක කියන්නම්. මේ දැන් ඔෆිස් යන්න ඇඳගන්න එපැයි අනේ."

දේවක ගැන යමක් කියන්නට ඇති බව ඉඳුනිල්ද දනී.

"මම උදේට ටිකක් කැළණි පන්සල් යනවා. ඔයා ගිහින් මැණික මට වාහනේ ටිකක් එවන්න."

භාවනා පුදුමයෙන් බැලුවාය. අම්මා විශේෂ වෙලාවක කැළණි යන බව භාවනා අත්දැකීමෙන් දැනගෙන උන්නාය. මේ අද යන්නේ ඇයි?

"අද මේ හදිස්සියේ අම්මා.

පෝයත් පහුවුනානේ.”

“යන්නෝන කියලා හිතුණා”

“ඉතින් ඇයි කියලා කියන්නකෝ”

භාවනා අම්මාගේ උරතලයට බරවී බඩ බදාගත්තාය. ඉඳුනිල් ඇගේ හිස පිරිමැද්දාය.

“යන්නේ ඔයාට බාරයක් වෙන්න.”

ඉඳුනිල් කෙළින්ම කීවාය. දරුවන් වෙනුවෙන් කරන සමහර දේවල් දරුවන් දැනගත යුතු නැත. එහෙත් සමහර දේවල් ඔවුන් දැනගත යුතුය.

“මට අම්මා”

“ම්. ඔයාට තමයි. පොඩි අක්කටත් බාරයක් වුණා. එයාගේ ඉන්ටවීව් එක හරියන්න කියලා. ඒක ඔප්පු කරලා ඔයාට අලුත් බාරයක් වෙනවා.”

ඉඳුනිල් කීවාය.

“මට මොනවා කියලද

බාරවෙන්නේ. කියන්නකෝ."

භාවනාට එය දැනගැනීමට දැඩි අවශ්‍යතාවයක් විය.

"බාරවෙලා ඇවිත් කියන්නම්කෝ. බාරවෙන්න කලින් බාර කියන්න හොඳ නෑ"

ඉදුනිල් කීවාය. භාවනා අම්මාගේ රස්නය විඳගෙනම මොහොතක් එහෙමම උන්නාය.

"අද හවස ඉඳලා අර ළමයා අක්කගේ තෙල් ගාන්න එනවලු නේද"

"ඔව් අම්මා. එයා ඒක හරියට පේවෙලා කරන්නේ. මස් එහෙමත් කන්නේ නෑ කිව්වා. හවසට බෙල්ලන්විලට ගිහිල්ලම එනවා කියලා කිව්වේ."

"එහෙම පේවෙලා."

"එයා කියන්නේ කොහොමහරි

අක්කව ඇවිද්දවනවා කියලා"

"අක්කා දවසක ඇවිදියි කියලා මටත් දැන් හිතෙනවා."

"එයාගේ විශ්වාසය හරි පුදුමයි තමයි අම්මේ. අක්කව මෙහෙම අත්දෙකෙන් මාළිගාවේ උඩ මළුවට උස්සගෙන ගියේ"

"අක්කා කිව්වා මට. අඬ අඬ කිව්වේ."

"එයා හරි පුදුම කෙනෙක්. හවස මොනවාහරි හදමු හොඳේ."

"කෑම ටිකක් කන්න දෙමු. මං හදන්නම්."

"කොච්චර කෑවත් බඩේ තව බත් කටවල් හතර පහකට ඉඩ තියාගෙ නලු යන්නේ."

"ඇයි ඒ."

"අප්පච්චි පව්ලුනේ. රෑට එයත්

එක්ක බත් කටක් කන්න ඕනලු. තනියම ඒ වේලත් කන්න දෙන්න බෑලු."

එහෙම දරුවෙක් කොතරම් මනුස්සකම් දනීද කියා ඉඳුනිල්ම සිතුවාය.

"හොඳ දරුවෙක්."

ඉඳුනිල් කීවාය. 'මම ඒ හොඳ දරුවව ඔයාගේ බෑණා කළා' මේ ටික හෙට අනිද්දාම තමාට කියවෙන බව භාවනා දනී. 'මේකිගේ තියෙන කපටිකම. කට හොල්ලන්නේනෑ' ඉඳුනිල්ද ඇගේ හිස අතගාමින් සිතුවාය.

# 29

දේවක සීගිරි එකට ආවේ පාන්දර හයටය. මේ සතිය තුළ සීගිරි එකේ වැඩ සියල්ල නිමා විය යුතුය. ඇත්තටම දැන් කිසිවක් කරන්නට දෙයක් නැත. දේවක සැළසුම් කළ ආකාරයටම සියල්ල සිදුව ඇත. කරන්නට ඇත්තේ පිටතින් හදන පේස්ට්‍රි අවුට්ලට් එක හදන්න පමණය.

අද කේක් දමන්නටත් ඇත.

එම නිසා දේවක සිතුවේ උදේ වරුවේ ඇති හැම වැඩක්ම අවසන් කරගන්නටය. හදවතේ ඇති මිහිරවත් නිස්කලංකයේ විඳිය හැක්කේ එවිටය.

ඔහු පෙරදා රැයේ නිදාගත්තානම් ඒ පැයක් දෙකක් පමණය. නින්ද යාගෙන එද්දී ඇගේ කෙස් රොදක් පැමිණ මුහුණේ වදියි. ඇහැරී බලද්දී ඇත්තේ හිස් කොට්ටය පමණය. මේ සිදුවීම දෙතුන් වරක්ම සිදුවිය.

ඇයව මේ දුප්පත් අත්දෙකට ලැබුණා කියා දේවකට දැන් හොඳටම විශ්වාසය. දැන් ඒ මුහුණ ටිකක් මේ දෝතට ගෙන පැයක් විතර බලාගෙන ඉන්න ආසය. මේ මහා පාන්දර දුවගෙන ආවේ ඒ ආසාවටය. හයට එන්න ඔහු

ඇඳගත්තේ පහටය. පිබිදුනේ හතරටය. නෑවේ හතරාමාරටය. දේවක චද්දී ජීවන් උන්නේ නින්දේය.

"අප්පච්චි."

දේවක පොඩි ඇඳ උඩ වාඩිවී අප්පච්චීට කතාකලේය.

"ආ. උදේම යන්නද පුංචි මහත්තයෝ"

"ඔව් අප්පච්චි. අප්පච්චි නිදාගන්න. අදත් කළුතරද ඉන්නේ අප්පච්චි."

"මට මේ දවස් ටික කළුතර ඉන්න වෙනවා පුංචි මහත්තයෝ. එනකොට ටිකක් රෑවෙනවා"

"මාත් එනකොට රෑ වෙනවා අප්පච්චි. අක්කගේ තෙල් ටික ගාලා දීලම එන්නම්."

"ම්. අතේ සල්ලි තියෙනවද"

"ඔව් අප්පච්චි. හෙට උදේට ගාමුද පොඩි කලර් පාරක්. මේ හරියම සුදු වෙලානේ. මං ගාන්නම්."

ජීවන් සිනාසුනේය. ජීවන්ගේ කොණ්ඩයට සමහර අවස්ථාවල ඩයි ගෑවේ දේවකය. ඔහු එයට ආසය.

"දැන් ඉතින් මේ ලොකු කොල්ලෙක් ඉන්න අප්පච්චි කෙනෙක්නේ. ටිකක් සුදු වුණාට කමක් නෑ පුංචි මහත්තයෝ"

"බෑ අප්පච්චි. අපි කලර් එකක් දාමු. කොල්ලගේ අප්පච්චිත් කොල්ලා වගේ ඉන්නෝන"

"ම්. පරිස්සමින්. බුදු පහනට වැඳලා යන්න"

දේවක ජීවන්ගේ දෙපාවලට වැඳගෙනම ගියේය. ජීවන් කොල්ලා දෙස බලාගෙනම උන්නේය.' මං

නැති වෙලාවට ඇවිත් කොල්ලව රකින්න සුදු නෝනා. අපිට ඉන්නේ මෙච්චරනේ' ඔහු සිතින් කීවේ තම මිය ගිය බිරිඳටය. ඇය මිය ගිය දා සිට පිරිසිදුව උන් ශක්ති බලය තමාට ඇතැයි ජීවන් විශ්වාස කලේය. හැම විටම හැමදේම ඔහු ඉල්ලන්නේ නැත. එහෙත් ඉඳහිට හෝ ඉල්ලන දේ ලැබෙයි. කොල්ලාව පොලීසියෙන් හිරකළ අවස්ථාවේදීත් ජීවන් එය ඉල්ලුවේය. කොල්ලාව පැය විසිහතරක් යන්නට මත්තෙන් එළියට ගන්නට හැකි විය.

දේවක සීගිරි එක පුරා දුවමින් මෙන් හැම වැඩක්ම පරීක්ෂා කලේය. ඇය නැති සීගිරි බිම පාළුය. අඳුරුය. ඔහු සීගිරි එක වටා යන හැම විනාඩි දහයකටම වරක් සීගිරි දොරකඩට පැමිණ පිවිසුම දෙස

බැලුවේය. බැරිම තැන දේවක කා පාක් එකේ මනින්නට අවශ්‍ය දෙයක් මනින්නට පටන්ගත්තේ වෙන වැඩක් නිස්කලංකයේ කරන්නට නොහැකි නිසාය.

භාවනා බැස්සේ දේවකගේ මුහුණ මත දෙනෙත් අලවාගෙන මෙන්ය. දේවක නැවතී තම ජීවන මංපෙත මැද තැනුණු ගැහැණු රූපය දෙසම බලාගෙන උන්නේය. ඇය වැනි කෙනෙක් මේ ජීවිතය හා බැඳුණු එකම ඇතියැයි ඔහුට සිතුණි.

භාවනා ආවේ ලොව් මලක් සේය. ලතාවකට පිය මැන ආ ඇය දේවක අභියස නතරවිය.

"පාන්දරම ඇවිත්නේ."

"ඒකනේ. ගෙදර ඉන්න බෑ"

"එහෙනම් ලෙඩක්"

"ලෙඩක් නෙමේ සුද්දි. වසංගතයක්."

ඇය කාර්යාලය තුළට පියමැන ගියේ ඔහුට දෑසින් කතාකරමිනි. කාමරයට ආ විගස ඇය අත් බෑගය මේසය මත තබා හැරුණාය. එහෙමම දේවකව වැළඳගත්තාය. ඔහුගේ දෑත් ඇගේ බඳ වටා ගියේත් භාවනාගේ දෑත් ඔහුගේ ගෙළ වටා එතුණේත් එකටමය.

"දැනුයි හුස්ම වැටෙන්නේ. මට මොනවද කලේ මෝඩයෝ."

ඇය කොඳුරා මෙන් ඇසුවාය.

"මට කරපු දේම තමයි"

ඔහු කීවේය. දේවකගේ දෙතොල් ඇගේ කෙහෙ රැළි මතට තදවිය. භාවනා මුහුණ උඩු අතට හැරෙව්වාය.

"මං පාන්දර ඉඳලා ඇහැරිලා"

"මාත්."

ඇය දෑස් පියාගෙනම ඔහුට ළංවී උන්නාය.

"සුද්දි."

"මෙහෙම ටිකක් ඉන්නෝන"

"අද දෙවෙනි ගමනට ඇඳලා වගේනේ"

ඔහු කීවේය.

"දෙවෙනි ගමනට අඳින්න කලින් පළවෙනි ගමන යමු. ම්."

"ඉක්මනට."

"මාව කීපාරක් මතක් වුණාද"

"ඇහැරෙන හැම වෙලාවකම. ළඟ ඉන්නවා වගේ. කෙසුත් මූණෝ වැදුණා සුද්දි"

ඔහු කීවේය.

"කොහේ කෙස්ද?"

ඇයට ඇසිණ. කියවුණ දේ ගැන පසුව ඇයටම සිනාව නවත්වාගත නොහැකිවිය. භාවනා දේවකව වැළඳගෙනම සිනාසුනාය.

"සුද්දී"

"හරි හරි මේ කොණ්ඩේ කෙස්නේ."

ඔහු ඇගේ නහය මිරිකාගෙන උන්නාය.

"රිදෙනවා මෝඩයෝ. කෑවද"

"එහෙම කනවද"

"මිමම බත් එකක් අරන් ආවා. අම්මා හදලා දුන්නා. දෙන්නත් එක්ක කමු"

"හා. දවල්ට මඟින් කමු. සේල්ස් යන්නෝනනේ"

"කේක් හදලද?"

"ගොඩක්ගොඩගහලා."

භාවනා ඔහුගේ තුරුළින් ඈත්වූයේ නැත. මේ ගත රස්නය හදවතට සංසාරික සුවඳක් ගෙන එයි. එහිම වෙලීගෙන ඉන්නට ඇත්නම්!

# 30

සීගිරි සුපර් අලුතින් විවෘත කිරීමේ දිනය අද නියම විය. සිංහල අවුරුද්දට සති තුනක් තබා එය විවෘත කිරීමට සියල්ලන්ම එකඟවිය. මේ කතාබහට රඹුක්වැල්ල මහතා මෙන්ම මිලින්දද ආවේය.

"අපි කලින් දවසේ රෑට පොඩි පිරිතක් කියමු. වරු පිරිතක් වගේ. කෝකටත් හොඳයිනේ."

රඹුක්වැල්ල මහතා කීවේය.

"මං ඒක ලෑස්තිකරන්නම් සර්."

"ඔයාට තමයි ඉතින් හැමදේම ලෑස්තිකරන්න වෙන්නේ පුතා"

දේවක සිනාසුනේය. භාවනාට බැලුවේ නේත්‍රා දෙසය. හැමදේම ලෑස්තිකරන්නේ ඔහුනම් හැමදේම ඔහුට දිය යුතුය.

"දැන් අපේ කේක් එකත් හොඳටම යනවා. ඒකට පස්සේ අපි පොඩි වෙහිකල් එකක් දාන්න ඕන සර්."

"ඒකත් ඉතින් ඔයාම බලන්න."

මිලින්ද සිනාසී කීවේය. තාත්තාගේ මේ විශ්වාසය මේ ගමනට වැදගත්ය.

"තව ස්ටාෆ් එක ඕන නේද අපිට."

"ඔව් සර්. අපි ගොඩක් ගන්නේ නැතුව හයක් හතක් ගමු සර්. අපිට ටිකක් මහන්සිවෙලා බලන්න පුළුවන්.

බිස්නස් එන විදිහට ස්ටාෆ් එක ගමු"

වඩාත්ම හොඳම දේ ඒකය.

"දවසක දේවක තාත්තවත් එක්කගෙන එන්නකෝ කතාකරන්න"

රඹුක්වැල්ල මහතා කීවේය. දේවක අසරණව නේත්‍රා දෙස බැලුවේය.

"මේ දවස්වල අප්පච්චි කළුතර සයිට් එකකට හිරවෙලා සර්මම කියන්නම්."

"අපිට තව සල්ලි ඕනවෙයිද දේවක."

මිලින්ද ඇසුවේය.

"නෑ සර්. අපිට දැන් කේක් එකෙන් සල්ලි ටිකක් එනවනේ. අපි ඒකෙන් ඉතුරු ටික කරන්නම්. ෆුඩ් සෙක්ෂන් එකට ලිප් හතරක් හදන්න දුන්නා. ඒක ගන්න තියෙනවා.

එතකොට එළියේ පේස්ට්‍රි ෂොප් එකට හොට් කබඩ් එකක් ඕන. ඒකටත් හිමිහිට ගෙවන්න මම හදාගන්නම්. වෙන සල්ලි එපා සර්."

භාවනාට දුකය.

"තාත්තා දේවකට ඉස්සරහ රූම් එක වෙන්කරලා දෙන්නද?"

භාවනා ඇසුවාය. මිලින්ද තම බාල දියණිය දෙස බැලුවේය.

"එපා සර්. මට එහෙම කාමර ඕන නෑ. කරන වැඩක් මේ තියෙන විදිහට කරගන්න පුළුවන්."

භාවනා යන්තමට රැව්වාය.

"ඒක කොහොමත් ලෑස්තිකරලා තියන්න සුද්දි."

භාවනා බැලුවේ ඇද්ද කියන්නාක් බඳුවය.

"එහෙනම් මේ දවස් ටිකේ

හැමදේම ඉවර කරගමු. ඕපන් කරපු දවසේ ඉඳලා සීගිරි එක සම්පූර්ණයෙන් ඔය තුන්දෙනා බලන්න ඕන."

"තීරණගන්නකොට සර්ලත් ඉන්න ඕන."

දේවක කීවේය. රඹුක්වැල්ල මහතා එය අගය කළේය.

"හැමදාම."

මිලින්ද ගියේ දේවකත් සමඟ සීගිරි එක වටා රවුමක් ගොස්ය. මේ කොල්ලාගෙන් දැනෙන හුරුපුරුදු බව කුමක්දැයි ඔහුටම හිතාගත නොහැක.

"අද ඉඳලා ඔයා එහේ එනවා කිව්වේ. අපේ ලොකු දුවගේ තෙල් ගාන්න"

"ඔව් සර්. බෙල්ලන්විල

පන්සලට ටිකක් ගිහින්ම එනවා. වෙද මහත්තයා මට ඒක පවරලා තියෙන්නේ."

"ලොකු දුව ඔයාට හරි ආදරෙයි."

'පොඩි දුව ඊට වඩා ආදරෙයි' දේවකට කියන්නට සිතුණි.

"එයාව ඇත්තටම ඇවිද්දවන්න පුළුවන් වෙයිද දේවක පුතා"

මිලින්ද ඇසුවේය.

"සර් බලන්නකෝ. අක්කා මේ සීගිරි එකේ දවසක ඇවිදිනවා. එයාට එහෙම වෙන්න බෑ සර්."

"බෑ තමයි. මම හරි දුකෙන් ඉන්නේ එයා ගැන. ඉස්සෙල්ලම මූණ දැකපු කෙල්ලනේ දේවක."

"සමහර වෙලාවට සර් දෙවියෝ එහෙම දේවල් කරනවා. එයාට නරක දේවල් ටිකක් වුනානේ. ඉතින්

දෙවියෝ හිතුවා ටික කාලයක් මේ කෙල්ලව නිස්කලංකේ තැනක තියන්න ඕන කියලා. එයා එහෙම කළා."

මිලින්ද හිස වැනුවේය.

"එහෙම වෙන්න ඇති."

මිලින්ද ගියේ අන් කවරෙක් ගැනවත් නොව දේවක ගැනම සිතමිනි. සිදුවෙන සමහර දේවල් මිලින්දට නොතේරෙනවා නොවේ. ඔහු සන්සුන්ව උන්නේ දේවක නරක කොල්ලෙක් නොවන බව දැනගෙ නමය.

# 31

දේවක බෙල්ලන්විල පන්සලට ගොස් පැය බාගයක් පමණ වැන්දේය. ඔහු නේත්‍රාට තෙල් ගාන අත්දෙක බෙල්ලන්විල පන්සලේ බෝධියේ තබා විනාඩි කිහිපයක් උන්නේය.

"මේ අත් දෙකෙන් ගාන තෙලේ බලෙන් අක්කට ඉක්මනට ඇවිදින්න ලැබෙන්න ඕන. එදාට මම අක්කව එක්කගෙන මේ පන්සලට එනවා."

භාවනා කතාකලේ දේවක පන්සලේ සිටිද්දීය.

"පන්සලේද?"

"ඔව් සුද්දිමේ බෝධි මළුවේ."

"දැන් එනවා නේද?"

"මේ එනවා සුද්දි. ඇයි ඇහුවේ."

"ඒක යකාගේ වැඩක්නේ අනේ. මිනිහා එන වෙලාව ගෑණි අහන්නේ නැද්ද? එන්නෙපා ඕවා අහගෙන"

ඇය බැන්නාය.

"සමාවෙයන් ගෑනියේ. මේ දැන් එනවා"

"බත් චුට්ටක් කාලා යන් හොඳේ. කටක්."

"හා."

"මං අද මගේ අතින් මේ කිරි හොද්දක් හදනවා."

"හොද්ද කැටි ගැහෙයි සුද්දි. හැදිගාන්න"

"හොදි කැටි ගැහුනාමත් රසයි අනේ. බොරනේ"

භාවනා කීවාය.

"දැන් එනවා. අලුත් පහනයි තැඹිලි තෙල් බෝතලෙයි අරගෙනම එනවා."

දේවක කීවේය.

ඔහු බෝධියටත් ඊට එහායින් වූ පත්තිනි දේවාලයටත් වැඳ ආවේය. අද මේ යන්නේ සාමාන්‍ය ගෙයකට නොවේ. තම අනාගත බිරිඳගේ නිවසටය. දේවක එය හොඳින්ම තේරුම්ගෙන උන්නේය. ඒ නිසාම අත වනමින් යා නොහැක. දේවක ත්‍රී වීලරයෙන්ම ගොස් අලුත් කිරි හට්ටි දෙකකුත් කිතුල් පැණි බෝලයකුත්

ගත්තේය. නිවසකට අරගෙන යන්නට හොඳම දෙයක් වේ නම් ඒ අලුත් මුදවපු කිරිය. එය වාසනාවන්ත ගමනක සංකේතයකි.

"කිරි හොද්දේ සුවඳ සාලෙටත් එනවනේ."

ඉඳුනිල් ආවේ එසේ කියාගෙනමය.

"කියනකොට ඒක ලස්සනට කියන්නකෝ අනේ. සාලෙට නෙමේ පාරට එනවා කියන්න. ටිකක් වැඩිකරලා කියන්නෝන"

භාවනා කීවාය. කිරි හොද්ද හොඳට ආ බව ඇයටත් දැනෙයි.

"මස් මාළුවක් කන්නේ නෑ කියනවනේ. නැත්නම් මස් ටිකක් හදනවා."

"එයාගේ විශ්වාසේ ඉන්න දෙන්න"

භාවනා කීවාය. ඇයටත් දැන් එය

විශ්වාසය.

"කරන දේ පිරිසිදුව කරන්න හිතනවා ඇති"

"හැමදේම"

භාවනා පොල් කටු හැන්ද කරකවමින් කීවාය. ඉඳුනිල් සිනාසුණේ නැත. එය දුවගේ විශ්වාසයය.

"හතු තෙල්දාලා හරි රසයිනේ අම්මා නේද?"

"ඒකනේ. මාත් මේ කාලෙකින් හැදුවේ."

"බත් කටක් කාලා යන්නම එන්න කිව්වා."

"තාත්තත් වේලාසන ආවොත් හොඳයි."

"එයි."

නේත්‍රා රෝද පුටුවත් කරකවමින් ආවේ එවිටය. ඇය සුදු සායත් සුදු ටී

ෂර්ට් එකත් ඇඳගෙනම උන්නාය.

"මල්ලි කතාකළාද බබා."

"මං කතාකළා. පන්සලේ ඉන්නවා කිව්වේ. අක්කට බාරයක් වෙලාම එනවලු"

භාවනා කීවාය. නේත්‍රාට බැලුනේ අම්මා දෙසය.

"මටත් බාරවෙන්න මල්ලි කෙනෙක් උන්නනේ."

"අපිවත් බාර නොවෙච්ච කොට නේද අක්කේ."

භාවනා කීවේ අහිතකින් තොරවය.

"කොල්ලා පව්."

"පව්නම් තමයි. ඒකට මොන දුකක් අනාගතේ විඳින්න වෙයිද කියලා හිතාගන්න බෑ මටනම්.".

ඉඳුනිල් කීවේ අහක බලාගෙන

මෙන්ය. භාවනා පොල් කටු හැන්ද අත තබාගෙනම හැරුණාය.

"මොකක්ද ඒ කතාව. ඇයි එයා දුක් විඳින්නේ"

භාවනා ඇසුවාය.

"මම ඉතින් ඔයාට මොනවත් කිව්වයෑ"

"කියන්නකෝ ඔයා"

"නිකං කිව්වේ."

"කියන්නම්මා."

භාවනා පෙරැත්ත කළාය.

"වදකබාරියෙක් ලැබුණාම ඉතින් කොල්ලට දුක තමයි."

ඉඳුනිල් කීවාය. භාවනා හොරැහින් බැලුවේ නේත්‍රා දෙසය.

"ඒ එයාට වධක බාරියෙක් ලැබුනොත්නේ. මං හිතන්නේ

හොඳ කෙල්ලෙක් ලැබෙයි පුංචි කුමාරිකාවක්.”

“එහෙම පතමු ඉතින්.”

“යන්ඩනේ යන්ඩ”

භාවනා අහක බලාගෙන මෙන් කීවාය.

නිවසේ විදුලි සීනුව නාදවිය. නිසැක ලෙසම දේවක එන්නට ඇති බව භාවනා දනී. ඇය පොල් කටු හැන්ද දමා සාලයට ගියාය. ඉඳුනිල් නේත්‍රාගේ රෝද පුටුව තල්ලුකරගෙන ආවාය.

දේවක ආවේ කිරි හට්ටි දෙකත් පන්සල ළඟින් ගත් නෙළුම් මල් පොකුරත් තැඹිලි තෙල් බෝතලයත් අතින් ගෙනය.

“කිරි හොද්දක සුවඳක් ආවා සුද්දි පාරටම. මේ ඒ සුවඳ දිගේ ආවේ.”

භාවනා හැරී බැලුවේ අම්මාත් අක්කාත් දෙසය.

"කිරි හොද්ද හැදුවේ මම"

ඇය ආඩම්බරයෙන් කීවාය. ඉඳුනිල් සිනාසුණාය.

"මේ අම්මේ මම හොඳකිරි ටිකකුයි කිතුල් පැණි ටිකකුයි අරන් ආවා. හොඳම ඒවා"

දේවක ඉඳුනිල් අතට කිරි හට්ටි ටික දී එහෙමම ඇයට වැන්දේය.

"අනේ. නැඟිටින්න පුතේ. බුදු සරණයි."

භාවනාත් නේත්‍රාත් බලාගෙන උන්නෝය.

"කිරි අරගෙන පැණි අරගෙන තෙල් අරගෙන මල් අරගෙන මල්ලි හොඳ සුබ ගමනක් වගේ ඇවිත් තියෙන්නේ"

නේත්‍රා කීවාය. දේවක ලැජ්ජාවෙන් බිම බලාගත්තේය.

"ඉතින් අපි ඇඹරෙන්න කතාවක් කිව්වයෑනේද අම්මේ."

දේවක ලැජ්ජාවෙන් සිටිද්දී නේත්‍රා කීවාය.

"සුබ වැඩකටනේ අම්මේ ආවේ. ඒකයි."

දේවක කීවේය.

"ඒකනේ. ඉඳගන්න පුතේ."

"කිරි එක අද කනවානම් ෆ්‍රිජ් එකේ දාන්න ඕන නෑ අම්මේ"

"අපි කෑම කාලා කිරි කමු. පැණි දාගෙන."

භාවනා කීවාය. ඒක කියූ හැටියට ඉඳුනිල්ටත් සිනාගියේය.

"පුතා මේ මල් ගෙනාවේ පන්සල් ගියාද?"

"බෙල්ලන්විලට ටිකක් ගියා අම්මේ. බෝධියට අත තියලම ආවා."

"අද ඉඳලා අයියා මස් මාළු කන්නෙත් නෑනේ. ඉතින් අපිත් අද වෙජිටේරියන් හැදුවා."

"අපිට කෙහොමත් එළවළුයි බතුයි කාලා පුරුදුයි අම්මේ."

"ඒකනේ. මෙයාලට තමා හැමදේම ඕන. මෙයාලට කිව්වේ මෙයාටයි අර උඩ ගිය බබාටයි. මොනවාවත් නැත්නම් සොසේජස් කරලක් හරි බැදලා ඕන."

"බබාලනේ ඉතින්"

භාවනා කීවාය. හිත පුරා ඇති මේ සතුට කොහොම තියාගන්නද? අද මුළු ගේම පිරී ඇතුවාක් මෙන්ය.

"මං පුතාට බොන්න තේ එකක් හදාගෙන එන්නම්."

"අම්මා කිරි තේ."

භාවනා කීවේ ඇසක්ද ගසාය.

"වෙද මහත්තයා කියපු වෙලාවටම පටන් ගමු අක්කේ. තව විනාඩි විස්සක් තියෙනවා"

"අනේ මහත්තයෝ ඔයාගේ මේ ලස්සන සුදු කමිසේ තෙල් ගෑවෙයිනේ"

"මගේ ටී එකක් දෙන්නද?"

දේවක හිස වැනුවේය.

"බබා අරන් එන්න. මල්ලි මෙහෙම හිටපුදෙන්. අම්මත් එනවනේ"

කෙල්ලගේ හැටි දන්න නිසාම නේත්‍රා කීවාය. නැත්නම් ඇය ටී ෂර්ට් එක මාරුකරන්න කියා දේවකව උඩට එක්කාගෙන යන බව ඇය අත්දැකීමෙන් දනී. 'එහෙමට බඩ්ඩ. ඒක කොල්ලට හොඳ නෑ.'

"හරි හරි."

භාවනා ගියේ නේත්‍රාට ඇද කරය. ඇය උඩට ගොස් තිබූ හොඳම සුදු ටී ෂර්ට් එකක් තෝරාගෙන එයට විලවුන් ටිකක්ද ඉසගෙනම ආවාය.

"ඒකේ සුවඳ සුද්දි"

දේවක ටී ෂර්ට් එක අතට ගෙන කීවාය.

"සුවඳද? මාසෙකින් හෝදලා නෑනේ."

නේත්‍රා මුව තදකරගත්තාය. ඇය ගිය ටිකට මේ ටී ෂර්ට් එකට සෙන්ට් බෝතලයම හලන්නට ඇති බව ඇය අත්දැකීමෙන් දනී. ඉඳුනිල් කෙසෙල් ගෙඩිත් කැපූ කළු දොදොලුත් තේත් රැගෙන ආවාය.

"කේක් තිබ්බා මම කැපුවේ නෑ. බිත්තර දාලනේ"

"මේක හොඳයි අම්මේ"

"ඉතින් පුතා දැන් ගෙදර යනකොට රෑ වෙනවනේ."

"වීල් එකක් අරන් යනවා අම්මේ. අප්පච්චිත් එනකොට රෑවෙනවා. මේ දවස්වල කළුතර සයිට් එකක වැඩ බලනවා."

"ඉතින් කන්නේ පුතේ."

"හේරත් මාමා කියලා අපේ නෑ වෙන මාමා කෙනෙක් ඉන්නවා අම්මේ. එහෙම නැත්නම් අපි දෙන්නගෙන් කළින් එන කෙනා මොනවාහරි හදනවා."

"අප්පච්චිටයි පුතාටයි ඉතින් පාළුත් ඇති."

"හරි පාළුයි තමා අම්මේ."

"ඒකට මෙහේ. කනක් ඇහිලා ඉන්න නෑ."

දේවකට බැලුණේ භාවනා දෙසය.

"මොකද ඉතින් මං දිහා බලන්නේ .කනක් ඇහිලා ඉන්න නැත්තේ මං ඉන්න නිසා වගේනේ."

"අනේ නෑ. ගෙදර ඉන්නකොට ඉන්නවද කියලා දන්නේ නෑ"

ඉඳුනිල් කීවාය.

"හැමෝටම තේරෙයි මං නැති වෙච්ච කාලෙක. අනේ ඉන්නකොට ඉන්න තැනක් පාළු නෑ කියලා කියයි."

"නැති කාලෙක මොකටද දැන්ම කියමුකෝ නේද අම්මේ. ඉන්න තැනක් පාළුත් නෑ අඳුරුත් නෑ. තොරණට ලයිට් දාලා වගේ. ලවුඩ්ස්පීකර් දාලා තොරණේ විස්තර කියනවා වගේ. නේද අම්මේ."

දෙවක කීවේය. භාවනා යටිතොල

හපාගෙන දේවක දෙස බැලුවාය.

"ඇහුනද"

ඇය අම්මාට කීවාය.

"ඉන්නකොට තේරෙයි ඉතින්."

ඉඳුනිල් කීවාය. භාවනා අම්මාට රැව්වාය.

"මොනවා තේරෙන්නද?අපි ඉන්න තැනක රැස් විහිදෙනවා."

"ඇත්ත අම්මේ. රැස් විහිදෙනවා. අපිව ඒ රැස් දහරින් නෑවෙනවා."

දේවක කීවේය. නේත්‍රාට සිනාව නවත්වාගත නොහැකි විය. භාවනා දේවකගේ බෙල්ල පාමුළින්ම අල්ලාගෙන තදකළාය.

"ඇත්තද රැස් දහරාවෙන් නෑවෙනවද. සබන් කෑල්ලකුත් දෙන්නද ඒ ගමන්ම නාගන්න."

භාවනා දේවකගේ ගෙලද තදකරගෙන ඇසුවාය. නේත්‍රා මේ මොහොත රස වින්ඳාය. දේවක මේ නිවසට ආ මොහොතේ සිට නිවස පුරා පැතිරී ගිය චළියක් ඇය දැක්කාය. ඒ චළිය කෙල්ලෝ තුන්දෙනෙක් උන් ගෙදර මෙතෙක් තිබූ චළියක් නොවේ. අද ආ චළියකි.

# 32

තැඹිලි තෙල් පහනින් තැබූ බුලත් කොළවලින් තම ලොකු දුවගේ දෙපා තවන දේවක දෙස මිලින්ද මොහොතක් බලාගෙන උන්නේය. මේ සීගිරි එකට ගත් අලෙවි ප්‍රවර්ධන කළමණාකරුය. ඒ කොල්ලා මෙහෙම බිම වැටී කෙල්ලෙකුගේ දෙපාවල තෙල් ගෑ යුතු නැත. නේත්‍රාට පිරිමි සහෝදරයන් දෙදෙනෙක් සිටී. එහෙත් ඒ කිසිවෙක් මේ තාක් මේ

කකුල් දෙක ගැන අසාවත් නැත.

පේරාදෙණියේ වෙද මහතාව සොයාගෙන ආවේද ද්වෙකය. නේත්‍රාව වෙද මහතා ළඟට එක්කාගෙන ගියේද ඔහුමය. දැන් තම අතින්ම වෙදකම් කරන්නේද ඔහුය. අක්කා කෙනෙකුගේ පාදයක් තම දෙපා මත තබාගෙන තවන අතගාන මල්ලී කෙනෙකු මෙන් ඔහු එය කරන්නේ එයටම පේවීය. එහෙම පේ වීමක් බලාගෙන ඉන්නට පවා ආසය. මිලින්ද ඉඳුනිල් සමඟ ඒ දෙස බලාගෙන උන්නේ ඒ නිසාය.

නේත්‍රාගේ දෙපා දණිහිසෙන් මඳක් ඉහළ සිටම විවරව තිබුණි. ඇයට එහෙම වෙනසක් දැනෙන්නේ නැත. ඔහු මේ බිම වාඩිවී තම දෙපා උකුල මත තබාගෙන පිරිමදින්නේ මොනවද

මුමුණාමිනි. ඒ තුන් සූත්‍රය බව නේත්‍රා දනී. එහෙම කරන කොල්ලා කොතරම් පිරිසිදුද කියා ඇයට සිතෙයි.

භාවනා ළඟම ඉඳගෙන තැඹිලි තෙල්වලින් බුලත් කොළ රත්කර දෙයි. එහෙම තෙල් ගා ගෙවී ගිය බුලත් කොළ අසූවක් පමණ දැන් වෙනතක තබා ඇත. මෙය පහසු දෙයක් නොවේ. එය එක්තරා රටාවකට කළ යුතු දෙයකි. සමාධියකින් කළ යුතු දෙයකි. ආදරයකින් කැක්කුමකින් කළ යුතු දෙයකි. නේත්‍රාගේ දෙනෙත් දැන් දෙතුන් වරක්ම තෙත්විය. ඇය ළඟට ආ තාත්තා දෙස බැලුවේද ඇස්වල කඳුළු තබාගෙනය.

"මට තාත්තේ මගේ මල්ලිව

හම්බවුණානේ.”

ඇය කටපුරා කීවාය. දේවක හැඟීම්බරව බැලුවේය.

“ඔයා ඕකකරන විදිහ නිසාම අක්කගේ කකුල් දෙක සනීපවෙයි. මට එහෙම හිතෙනවා”

මිලින්ද කීවේය. දේවක හිස වැනුවේය.

“අක්කව අපි ඇවිද්දවනවා සර්. ඒක එහෙමම වෙනවා. ඊට පස්සේ අපි ඉතින් අක්කගේ වෙඩින් එකට දිග නයිට් දෙක තුනක් අදිමු.”

දේවක කීවේය. මිලින්දට පුදුම සිතුණි. බලාපොරොත්තු තිබිය හැක. එහෙත් මේ තරම් ස්ථිරව එය කියන්නේ කෙසේද?

“අනේ මට මෙහෙම හොඳයි

මල්ලියේ.”

“එක පොට්ටයෙක් රතු කැටේට පච්චයක් කිව්වා කියලා හොඳ පතල් කාරයෙක් මැණික විසිකරලා දාලා ගෙදර යන්නේ නෑ අක්කේ. ජීවිතේ ගැන තියෙන බලාපොරොත්තු එහෙමම නැතිකරගන්න එපා. අක්කගේ ජීවිතේ අක්කට විතරක් අයිති නෑ. ඒක අයිති තව අය ඉන්නවා.”

දේවක කීවේය. ඔහුගේ කතාවට කිසිවෙක් එරෙහි වූයේ නැත. එහෙත් ඉඳුනිල්ගේ දෑසට කඳුළු ඉනුවේය. ලොකු දුවගේ ජීවිතය වෙනුවෙන් ඇය වූ බාරදන්නේ ඇයමෙ පමණය. එයා ඉෂ්ට කරන දවසක් ගැන ඇය හීන දැක්කේය. අද මේ කොල්ලා පැමිණ දල්වන්නේ ඒ පහන්ය.

"ඔයාට පින් පුතේ"

ඉඳුනිල් ගියේ හදිස්සියේම පැමිණ කොල්ලාගේ හිස අතගාය. ඇය ඒ පුංචි වදන් දෙකෙන් කිවයුතු සියල්ල කීවාය.

"දැන් අනිත් කකුල අක්කේ."

"සනීපෙට මට නින්දත් යන්න එනවා මල්ලියේ."

"තෙලේ බලේ."

දේවක කීවේය.

"අතේ ගුනේ."

නේත්‍රා කීවාය.

"සුදු කකුල එහෙම පණ නැතිවෙන්න දෙනවද නේද සුද්දි. අපි ගමුකෝ පණ ගහලා."

දේවක කීවේ මිලින්ද ගිය පසුය.

"අම්මගේ ඇස්වල අද කඳුළු"

භාවනා කීවාය. තාත්තාගේ ඇස්වලද මහා දෙයක් ලියවී තිබෙනු නේත්‍රා දැක්කාය.

"එයාලට කවදාවත් මේ පුතාට බෑ කියන්න බෑ දැන්"

"බෑ කිව්වොත් මම මේ සාලේ පෙරළිලා අඬනවා"

"මාවම ඉල්ලලා නේද සුද්දි."

දේවක කීවේය. භාවනා දේවකගේ හිස අතගෑවේ පොඩි එකෙකුගේ හිස අතගාන්නාක් බඳුවය.

"අනේ ඕව් අනේ. ඔය ඉතින් වයසට ගිය කාලෙක අනේ ඉතින් තෙල් ටිකක් හරි ළඟට වෙලා ගගා ඉඳියිනේ. නේද මහත්තයෝ."

භාවනා දේවකගේ මුහුණ දෙස

බලාගෙන කීවාය.

"මම කොහොමත් ඉන්නේ වෙද මහත්තයට කියලා තෙලක් හින්දවලාම තියාගන්න. සුද්දිගේ ගාන්න"

"කොහේ ගාන්ඩද"

ඇය පුදුමයෙන් මෙන් ඇසුවාය.

"දැන් ඇති."

නේත්‍රා කීවාය. තිදෙනාම සිනාසුනේ එක මොහොතේය. සුරංග නී සාලයට ඇතුල්වෙනවා කිසිවෙක් දැක්කේ නැත. ඇය ආවේම මලීෂා සමඟය. නැන්දාව දැක භාවනාටනම් බියක් දැනුනේ නැත. දේවක මෙහෙම ඉන්නවා ඔවුන් දැකගත යුතුය. එහෙත් නේත්‍රාගේ සිතට තරමක බියක් දැනුණි. මේවා පෞද්ගලික දේවල්ය. ඒවා වෙන අය දැනගත

යුතු නැත.

"මේ මොකද මේ ලොකු දුව"

සුරංගනී ඇසුවේ කොල්ලා ඇගේ දෙපා තම දෙපා මත තබාගෙන තෙල් ගාද්දීය. දේවක ඇත්තටම අවට වෙන දේවල් ගැන සිහියකින් උන්නේ නැත. ඔහු නේත්‍රාගේ දෙපා දෑතින්ම අල්ලාගෙන තෙල් ගායි. භාවනා තැඹිලි තෙල් පහනින් බුලත් කොළ රත්කර දෙයි.

"මේ මගේ කුකුල්වලට පොඩි බෙහෙත් කරනවා නැන්දේ"

නේත්‍රා කීවාය. සුරංගනී බැලුවේ දේවක දෙසය.

"මේ කවුද මේ."

"මේ නැන්දේ අපේ සීගිරි එකේ ප්‍රමෝෂන් මැනේජර්. දේවක"

භාවනා හරි ලස්සනට කීවාය.

"ඉතින් සීගිරි එකේ ප්‍රමෝෂන් මැනේජර්ද ලොකු දුවට බෙහෙත් කරන්නේ ආ."

නේත්‍රා භාවනාට ඇස්වලින් කිව්වේ කට වහගන්න කියාය.

"මේ මල්ලි මේ තෙලක් අරන් ඇවිත් නැන්දේ. ඒකයි"

මලීෂා අහක බලාගෙන සිනාසෙනු භාවනා දැක්කාය. 'ඒකීට ෆේස්බුක් මාන්දම. ටොයිලට් එකට ගියත් පෝස්ට් එකක් දානවා. මෙතන එනවා හිනාවෙන්න කිකිළි වගේ' භාවනා සිතින් බැන්නාය.

"අම්මා කුස්සියේ ඇති නැන්දේ"

භාවනා එහෙමම කිව්වේ මෙතන ඉන්න ඕන නෑ කියලා නොකියා

කියලයි.

"මට ටිකක් කතාකරන්න තියෙනවා කට්ටියත් එක්කම."

"අපිටනම් තව පැයකට මෙතනින් හෙළවෙන්න බෑ නැන්දා. මේක වෙලාවක් බලලා පිරුවට කරන වැඩක්. එකදිගට කරන්නම ඕන. නැඟිට්ටින්න බෑ."

භාවනා කියාගෙන ගියාය.

"මාත් ආවේ වැදගත් වැඩකට"

"අක්කගේ කකුල් දෙක සනීපකරගන්න එක නැන්දේ අපිට හැමදේකටම වඩා වටිනවා."

භාවනා එකහෙළාම කීවාය. නේත්‍රා බැලුවාය.

"කතාකරන දෙයක් අම්මයි තාත්තයි ඇති නැන්දේ. යන්න."

"මට කට්ටිය එක්කම කතාකරන්න ඕන."

"දැන් ඉතින් සීගිරි එකත් බෙදලා දුන්නට පස්සේ නැන්දේ."

"ඕක කරලා එන්නකෝ. මම උඩ ඉන්නවා රුවන්තිගේ කාමරේ."

භාවනාට හීල්ලිණ.

"කොහෙන් ආවද මන්දන්නේ නෑ. පිළිවෙලකට වැඩක් කරගන්න දෙන්නේ නෑනේ. මළ ඇණයක්."

භාවනා කේන්තියෙන් කීවාය.

"අපි මේක හිමිහිට කරමුකෝ සුද්දි. තව ටිකයිනේ තියෙන්නේ."

දේවක කරුණාවෙන් කීවේය.

"ෂුවර් එකටම හෙණයක්. එයා එහෙමයි. අර කතාවේ කියනවා වගේ නපුරු අඳුරු බලවේගයක්."

භාවනා කේන්තියෙන්ම කීවාය.

"නපුරු බලවේග අයින් කරන්න පුළුවන් යහපත් බලවේගවලට විතරයි සුද්දි"

ඔහු කරුණාවෙන් කීවේය. දේවක නේත්‍රාගේ කකුල්වල තෙල් ගා නිමාකරන්නට පැයක් පමණ ගියේය. ඉන් පසුව ඔහු හිසට ගල්වන තෙලද අතට ගත්තේය.

"මල්ලියේ."

"අක්කේ."

"මේ හිසට ගල්වන තෙල මහත්තයෝ අපි හෙට ගාමු. මේ මනුස්සයාව යවන්නෝන."

භාවනා කේන්තියෙන් බැලුවාය.

"කොහෙන් පාත්වුණාද මන්දන්නේ නෑ"

"අපි කරන එක හොඳටම කරමු අක්කේ. කමක් නෑ. හෙට ගාමු."

එහෙත් ඔහු තෙල් බිඳක් ගෙන විනාඩි දෙකක් නේත්‍රාගේ හිස මසාජ් කළේය. නේත්‍රාගේ දෑස් පියවී ඒ පියවීගිය දෑස්වලින් කඳුළු පිටවිය. දේවක ඇගේ නළලත මත දෙඅත්ල තබා ටික වෙලාවක් ඉඳ හිස පිරිමැදම දෑත ගත්තේය.

# 33

දේවක කන්නට නතර වූයේ නැත. භාවනාට දුක සිතුණේ ඔහුව මහ රෑ වෙනතුරු තියාගන්නට නොහැකිවීම ගැනය. ඇය රහසින් මෙන් අම්මාට දෙයක් කීවාය. ඉඳුනිල් ලස්සනට ඉඳි ආප්ප පාර්සල් දෙක්ක බැඳ දුන්නාය.

"මේක අරන් ගිහින් කන්නෝන. හොඳේ."

කළුවර මිදුලේදී ඇය රහසින් මෙන් කීවාය. දේවක බැලුවේ

දීප්තිමත් දෙනෙතිනි.

"කනවා සුද්දි. මං යන්නම්."

"යනවා කියන්න එපා. එන්නම් කියලා යන්න."

"එන්නම්. බුදු සරණයි"

"මී. ත්‍රී වීල් එකක් අරන් යන්නේ හොඳේ."

"හරි සුද්දි"

ඔහුගේත් ඇගේත් අත් යන්තමට ළංවී පසුව අත්හැරිණ. භාවනාගේ දෑස් තෙමිණ.

"දැන් අර උදැලු හාමිනේට කතාකරන්න ඕන."

ඇය නේත්‍රාට කීවාය. ඇයම ගොස් සුරංගිට කතාකරගෙන ආවාය. මිලින්දත් ඉඳුනිලුත් පැමිණ සැටියට බරවූවාය.

"මොනවද අක්කේ කතාකරන්න

තියෙනවා කිව්වේ."

ඉඳුනිල් ඇසුවේය.

"මම ආවේ පොඩි දුව ගැන කතාකරන්න. මිහිරංග පොඩි දුව ගැන බලාපොරොත්තුවෙන් ඉන්නේ. මේවා හංඟලා කතාකරන්න ඕනනෑනේ නංගී."

ඉඳුනිල් සිනාසුනාය. එය හරි ලස්සන සිනාවකි. අම්මාට සිනා ගියේ ඇයිදැයි භාවනා සිතුවාය. මිලින්දද බැලුවේ ඇය දෙසය.

"දෙන්නව එකතුකරමු."

භාවනාට කැස්සක්ද ආවාය. ඇය හිස බිමට නැඹුරු කර දිගටම කැස්සාය. මිලින්ද යන්තමට තම බාල දියණිය දෙස බැලුවේය.

"පොඩි දුව ගැන මායි ඉන්දුයි තීරණයක් අරන් ඉවරයි අක්කේ."

මිලින්ද කීවේය. භාවනා පුදුමයෙන් මෙන් තාත්තා දෙස බැලුවාය. තමා ගැන ගත් තීරණය කුමක්ද?

"මොකක්ද තීරණය."

මිලින්ද සිනාසුණේය.

"මේ ගෙදර මීට පස්සේ තීරණයක් ගන්නකොට ඡන්ද විමසීමක් කරනවා. ගෙදර ලියාපදිංචි ඡන්ද හයක් තියෙනවා. මම ඉන්දු තාත්තා ලොකු දුව තාරකා පොඩි දුව. කාගේහරි තීරණයක් ගන්නකොට මම ඡන්ද විමසීමක් කරනවා. හයෙන් පහක ඡන්ද ගන්න තීරණය ගන්නවා"

මිලින්ද කීවේය. භාවනාගේ දෑස් දිලිසී බිමට බරවිය. තාත්තා ඇත්තටම එහෙම හිතනවානම් ඇයට සැනසීමක් ඇත. 'දැනටමත්

මට ඡන්ද හතරක් තියෙනවා. මගේ අම්මගේ අක්කගේ පොඩි අක්කගේ. තව එකයි අඩු.' ඇය සිතුවාය.

"මේ ගෙදරට බෑනලා තුන්දෙනෙක් එනවා. ඒ එන බෑනලා තුන්දෙනාව මේ ගෙදර හයදෙනාම එක වගේ ආදරෙන් පිළිගන්න ඕන. එහෙම වුනොත් මට හොඳ පවුලක් හදාගන්න පුළුවන්. මගේ හීනය එච්චරයි. දවසක මගේ දුවලා තුන්දෙනයි බෑනලා තුන්දෙනයි එයාලගේ බබාලා දහයකුයි වටකරගෙන තේ ටිකක් බොන්න ලැබෙනවානම් මට ඒ ඇති. නේද ඉන්දු."

මිලින්ද කීවේය. මිලින්ද කියූ සිහිනයෙන් ඉඳුනිල්ගේ පවා දෑස් තෙත්විය.

"දරුවන්ට එයාලගේ ජීවිතේ තීරණගන්න ඉඩදෙන්න අක්කේ. මට මගේ දරුවෝ දුක් විඳිනවා බලාගෙන ඉන්න බෑ."

ඉඳුනිල් කීවාය. ඇය සාමාන්‍යයෙන් එසේ කියන කෙනෙක් නොවේ. එහෙත් අද කීවාය. භාවනාවත් නේත්‍රාවත් කතාකලේ නැත. 'ආවා මෙතන උඩ දාගෙන මඟුල් කතාකරන්න' භාවනා උන්නේ කේන්තියෙනි. 'නල්ල මලේ පුතා බැඳගන්න. බඳින කෙල්ලට සංසාරයම දුකක්' ඇය සිතින් සිතුවාය.

"මාත් දෙයක් කියන්න ඕන සුරංගි."

රඹුක්වැල්ල මහතා කාමරයේ සිට මේ සියල්ල අසාගෙන ඉඳ සාලයට

එමින් කීවේය. භාවනා ගැස්සී බැලුවාය.

"පොඩි දුව ගන්න තීරණය මොකක් වුනත් මිලින්ද කියපු විදිහට මම මගේ ඡන්දය දාන්නේ කෙල්ලගෙ න් අහලා. එයා කැමති කාටද. මගේ ඡන්දයත් එයාට. අවුරුදු විසි එකක් මගේ අස්සට වෙලා කැරකුන කෙල්ලට මටත් තියෙනවා යුතුකමක් කරන්න."

රඹුක්වැල්ල මහතා පුටුවට බරවෙමින් කීවේය. භාවනා දුවගෙන විත් සීයාගේ ගෙළ වටාම දෑත් යවා ඔහුව වැළඳගෙන සිපගත්තාය.

"මගේ හොඳ සුදු සීයා."

ඇය අඬමින් මෙන් කීවාය. තාත්තා කියන්නාක් මෙන් ඡන්ද විමසීමක් කරනවානම් දැනටමත්

තමා දේවකව ලබාගෙන අවසන්ය. ප්‍රශ්නයකට තිබුනේ එක ඡන්දයකි. දැන් එයත් ලබාගෙන අවසානය.

"මෙතන කට්ටිය කතාකරන්නේ මඟුලක් තීන්දුකරලා වගේනේ."

සුරංගි කේන්තියෙන් මෙන් කීවාය.

"නැන්දේ. මම කොහොමත් තීරණයක් ගන්නවා. මම තීරණයක් ගන්නේ මම බඳින මිනිහා මට විතරක් ආදරේනම් නෙමේ. මගේ තාත්තට අම්මට සීයට අක්කලා දෙන්නටත් ආදරේ නම් විතරයි. අපි පවුලක්. එක පවුලක්. මේ පවුල කවදාවත් වෙන්වෙන්නේ නෑ. නෙවර්. මේ සීගිරි ගෙදර තව ලොකුකරලා අපි දවසක හදනවා. ඉඩම තියෙනවනේ. අපි ඔක්කොම එකට ඉන්නේ. එක නයිට්ිය

බෙදාගෙන අඳින අපි තුන්දෙනාට එකට වැටිලා ජීවත්වෙන්න පුළුවන්. අපි තුන්දෙනාගේ බබාලා මේ සාලේ එකට වැටිලා සෙල්ලම් කරන්න ඕන. එකට. අපි ලොකු ටෙන් සීටර් වෑන් එකක් ගන්නවා. එකට ගමන් යන්න. මී. උදේට ළමයි පෝළිමක් ස්කූල් දාන්නේ ඒ වෑන් එකේ. වැඳලා කියන්නම් නැන්දා. දැන් අපිට අපේ පාඩුවේ ඉන්න දෙන්න. සීගිරි එක බෙදන්න කිව්වා. සීයා එක බෙදුවා. සල්ලිත් දුන්නා. දැන් අපිට අපේ පාඩුවේ ඉන්න දෙන්න. ගොඩක් පින්."

භාවනා දෑත් එකතුකර වැන්ඳාය. සුරංගි නැඟිට්ටේ කේන්තියෙනි.

"දවසක තේරෙයි. මිහිරංගට හොඳ තැනකින් මඟුලක් කතාකරලා තියෙන්නේ. මාත් ආවේ නෑකමට."

ඇය කීවාය.

“මිහිරංග මල්ලිට ඒ කතාකරලා තියෙන එක කරලා දෙන්න නැන්දේ. නංගිව දෙන්නේ නෑ.”

මෙතෙක් වෙලා නිහඬවම උන් නේත්‍රා කීවාය. භාවනාට පුදුම සිතුණේ නැත.

“එහෙමයි එහෙනම් කතාව නේ”

කිසිවෙක් කතාකලේ නැත.

සුරංගි ගියේ මොනවද මුමුණමිනි.

මිලින්ද භාවනා දෙස බැලුවේය. පසුව ඉඳුනිල් දෙස බලා සිනාසුනාය.

“ඉන්දු.”

“මි.”

“ටෙන් සීටර් වෑන් එකක් කීයක් විතර වෙනවද දන්නේ නෑ නේද”

ඔහු ඇසුවේය. භාවනා තොල්පට

තදකළාය. ඇය ඇවිදගෙන මිලින්ද වෙත ආවාය. එසේ පැමිණ අම්මාත් තාත්තාත් අතර ඉඳගත්තාය.

"තාත්තා ගන්න එකේ තාත්තා පොඩි රෝසා බස් එකක්ම ගත්තත් කමක් නෑ"

"එච්චර ලොකු එකක්."

"මී. මොකද මගේ අදහසක් තියෙනවා පහක් හදන්න."

ඇය අතේ ඇඟිලි පහ පෙන්වා කීවාය. මිලින්දගේත් ඉඳුනිල්ගේත් දෑස් ලොකු විය.

"පහක්."

"මී. වටින්නේ තාත්තා අපේ අය. අපිට අපේ අය එළියට ගිහින් හොයාගන්න බෑ. අපිට හදාගන්න වෙනවා. ටිකක් අමාරුවෙයිනම් තමයි. ඒත් ඉතින් ඔයාගේ සුදු

නෝනත් ඉන්නවනේ. දෙයියන්ගේ පිහිටෙන් මිසිස් ඉඳුනිල් රඹුක්වැල්ල හොඳට නිරෝගීයි. එයා අපි වෙනුවෙන් පහක් බලාගනී. අක්කලා දෙන්නත් ඔය ඉන්නේ. අක්කට දෙනවා හෝම් වර්ක් කියලා දෙන්න. පොඩි අක්කට දෙනවා උන් එක්ක සෙල්ලම් කරන්න"

"එතකොට ඔයා"

"නෑ මේ ඉතින් මට මෙයාලගේ තාත්තව බලාගන්නත් තියෙනවනේ."

භාවනා ඇඟට පතට නොදැනී කීවාය. සියල්ලන්ම සිනාසුනෝය.

"එහෙනම් එයාට එන්න කියන්නකෝ. අපි කතාකරමු."

"අර ඡන්ද විමසීම."

භාවනා ඇසුවාය.

"මම එක දෙයක්

පොරොන්දුවෙනවා. අද"

"හා කියන්න"

"මම ඡන්ද කොමසාරිස්. අනිත් අයගේ ඡන්ද මමයි ගණන් කරන්නේමම මගේ ඡන්දය දාන්නේ අනිත් අයගේ ඡන්දය බලලා. එයාලා කැමති කාටද? මමත් එයාට මගේ ඡන්දය දෙනවා"

"හුරේ."

භාවනා අත්දෙකම එසෙව්වාය. මිලින්ද තම පොඩි දුවගේ දෑස්වල ගලන සතුට දැක හදවතින්ම සතුටුවිය.

"විසිහතරවෙනිදා දැන් සීගිරි එක ඕපන් කරනවානේ."

"ඔව් ඇයි."

"නෑ. එදා හවසට මට ඔයාලට කියන්න දෙයක් තියෙනවා. සීයට

අම්මට තාත්තට හැමෝටම. අර උඩ ඉන්න පොඩ්ඩි අක්කටත් එන්න කියනවා. විශේෂ කෙකෙනෙක්ව එදාට මම මෙහෙට එක්කගෙනත් එනවා."

භාවනා කියාගෙන යද්දී නේත්‍රාගේ පපුවත් එක්ක ගැස්සිණ.

"කවුද සුද්දි විශේෂ කෙනා."

"එක්කෙනෙක් නෙමේ තාත්තා. දෙන්නෙක්. ඊට කලින් මට කතාවක් තියෙනවා කියන්න. ඒක කියලා මම ඒ දෙන්නව එක්කගෙන එනවා. එතකල් මට කල්දෙන්න."

"දෙන්නෙක්."

"ඕ දෙන්නෙක්."

භාවනා කීවාය. මිලින්ද ඉඳුනිල් දෙස බැලුවේය.

"තාත්තා අම්මා දිහා බලන්න එපා. එයාවත් දන්නේ නෑ මේ ගැන.

සොරි අම්මා. මට තව දවස් දෙක තුනක් දෙන්න."

ඉඳුනිල් අසරණව සිනාසුණාය. 'එතකොට දේවක පුතා නෙමේද' ඇය එහෙමත් සිතුවාය. පසුව ඇයට දුකක්ද දැනුණි.

"අම්මා."

"ම්."

"එදාට අපි ඩිනර් එකක් ලෑස්තිකරමු නේද?අර එන විශේෂ දෙන්නට අම්මා"

"හරි ඒක පුළුවන් කියමුකෝ. දෙන්නෙක් ගැන කියන්නේ."

ඇය ඇසුවාය.

"එහෙම තමයි අම්මා. එදාට චුට්ටක් අඬන්නත් වෙයි ඉතින්"

"ඇයි ඇයි අපිව බයකරන්නේ."

ඉඳුනිල් ඇසුවාය.

"මේ කෙල්ලට පිස්සු අම්මේ. එයාට ඔය දවස් දෙක තුන දෙන්නකෝ."

රඹුල්වැල්ල මහතාට පවා මේ කිසිවක් සිතාගන්නට නොහැකිවිය. භාවනා උඩට ගියේ සියල්ලන්ම බලාගෙන සිටිද්දීය. පියගැටපෙළ නඟින අතරවාරයේ ඇය එහි මැද බිත්තියේ ගසා තිබූ නර්මදාගේ පින්තූරය අසළදී වේගය බාල කළාය. 'ඔයාගේ මහත්තයවයි පුතාවයි එදාට මම ආයෙත් මේ ගෙදරට ගේනවා නැන්දි. මම හොඳයි නේද' ඇය සිතින් කීවාය.

උඩු මහලේ උන් භාවනාට පහළ මාලයේ උන් නේත්‍රා දුරකථනයෙන් කතාකළාය.

"මේ ඇයි බබා"

"ඕනම දෙයක් අක්කා ඕනවට වඩා හංගන්න නරකයි. රහසක් වුනත් කියන්න වෙලාවක් තියෙනවා."

භාවනා කීවාය.

"ඇත්ත. ඒත් ජීවන් බාප්පව"

"එයාව මේ ගෙදර පිළිගන්නේ නැත්නම් කවදාවත් දේවකයියව පිළිගන්නෙත් නෑ අක්කා. ඒක ෂුවර්. සීගිරි පවුලේ අයට එයාලගෙන් වෙච්ච ලොකු වැරැද්දක් නිවැරදි කරගන්න එදාට එක අවස්ථාවක් තියෙනවා. මං හිතන්නේ නෑ එයාලා ඒක අපතේ යවයි කියලා."

භාවනා කීවාය.

"ඔව්. ඔයා කියන දේත් ඇත්තක් තියෙනවා. මොනවා කළත් කොල්ලට කියන්න"

"කියනවා. දැන් ඉතින් එයාට

ටොයිලට් එකට ගියත් කියනවනේ."

භාවනා කීවේ ඇඳ මත පෙරළෙමිනි. පසුව ඇය ජංගම දුරකථනය ගෙන එහි වූ දේවකගේ පින්තූරයක් තිරය මතට ගත්තාය.

"ඔයා අහිංසකයි. ලස්සනයි මනුස්සකම් දන්නවා. ඒ ටිකට ඔයාගේ දක්ෂකම එකතුවුණා. ඒකයි ඔයා බැබලෙන්නේ. ඒත් මම ඔයාට කැමතිවුනේ මේ කිසිම දෙයක්නිසා නෙමේ. ඔයාට හොඳට කෙනෙක්ව බලාගන්න දන්නවා. කෙනෙක්ව නෙමේ. මාව බලාගන්න දන්නවා. ඉතින් ආසයි එහෙම දුවෙක් වෙලා ඔයා ළඟ ඉන්න."

ඇය ජංගම දුරකථනයේ මුහුණත සිපගෙන කීවාය. 'දැන් මට සිද්ධවෙනවා වදාට ඔයයි අප්පච්චියි

කවුද කියලා කියන්න. ඒ වගේම නර්මදා නැන්දිගේ පුතාට මම ආදරය කරනවා කියලා කියන්නත් වෙනවා'

අතීතයේ එක දවසක ඔහුගේ අප්පච්චිට මේ නිවස තහනම් විය. තම බාල දියණියම කොහොමටවත් ජීවන් වැනි හිඟන්නෙකුට දෙන්නේ නැතැයි සීයා කීවේය. ඒ දේම ජීවන්ගේ පුතාටත් වෙයිද? භාවනා තුළ ගැස්මක් නැතැයි කිව නොහැක. දෛවයේ එක්වරක් වූ දේ යළිත් සිදුනොවෙයි කියා නීතියක් නැත.

සියළු තීරණ ඇත්තේ සීයාත් තාත්තාත් සතුවය.

# 34

'මහා පාන්දරක එන්න. හයට.”

භාවනා දේවකට මේ කෙටි පණිවිඩය යැව්වේ පෙරදා නිදාගන්නට යද්දීය. පාන්දරට මුළු සීගිරි එකම නිහඬය. සියළුම ඉදිකිරීමේ වෙනස්කිරීම් අවසන් නිසා සීගිරි සුපර් එකේ ඉන්නේ ආරක්ෂික නිළධාරීන් පමණය. නේත්‍රා රාත්‍රී සේවා මුරය සඳහා ආරක්ෂකයන් දෙදෙනෙක්ම දැමූයේ සීගිරි එක

අලුතින් හැදෙන ලස්සන දැකය. අලුත් සීගිරි එක සඳහා වැඩිපුර බඩු තොග ගබඩාවල තැන්පත්කර තිබුණි.

භාවනා පිබිදුනේ හරියටම හතරාමාරටය. මහා පාන්දරක ඔහුව දකින්නට ඇතිවූ ආසාව කුමක්දැයි ඇයටම සිතාගත නොහැක. ඒ සීතල පාන්දරම ඇය නෑවාය. යුවතිය සාරිය ඇන්ඳේ හිසේ තුවාපට ඔතාගෙනමය. තෙත කොණ්ඩය පිටින් ගියකළ ඔහුගෙන් එයටත් අනන්ත බැණුම් අහන්නට සිදුවෙයි. දැන් දේවක එහෙමය. හැමදෙයක්ම බලයි. මේ ජීවිතයම ඔහුගේය. එසේ බලාගන්නට ඔහු ආසා කලේය. ඒ ඇලුම් බැලුම් විඳින්නට භාවනාගේ හදවත අසීමිත ලෝබකමකින් සැදී පැහැදී උන්නේය.

"මෙච්චර පාන්දර දරුවෝ."

භාවනා පහළට එද්දීම ඉඳුනිල් ඇසුවාය. ඇය පිබිදුනා පමණාය. හයටත් තව විනාඩි දහයක් ඇත.

"කරන්න වැඩ ගොඩක් තියෙනවා අම්මා"

ඉඳුනිල් පිපීගෙන එන දියණියගේ සුන්දරත්වය රස වින්ඳාය. මලක් පිපීගෙන එනවා නම් සමනළ කතාවක්ද ඒ ළඟ පාතක ඇත. අම්මා කෙනෙක් ලෙස ඇය එය නොදන්නවා නොවේ.

"අර එක්කගෙන එනවා කිව්ව දෙන්නා."

භාවනා සිනාසුනාය.

"ඔයාටත් එදාට තමයි බලාගන්න වෙන්නේ. අද කියන්න බෑ."

"මාව ඉතින් පුදුම කරලා මැණික."

"ඔයාවම තමයි පුදුම කරන්න ඉන්නේ. හිතං ඉන්නේ මම නිකං මේ තොත්ත බබා කියලනේ නේද?"

ඉඳුනිල්ට මේ කිසිවක් තේරෙන්නේ නැත. නේත්‍රාගෙන් ඇසුවද කියන්නේ නැත.

"පොඩි ඉඟියක් දෙන්නම්. ඔයා ගොඩක් සතුටුවෙයි ඒ දෙන්නව දැකලා."

"මේ මම."

"ම් ඉන්දු අඬනවා එදාට. පව් ඉතින්"

භාවනා මුළුතැන්ගෙයටම වී තේ එක බීවාය.

"මං දුවනවා. ඩ්‍රයිවර් අන්කල්ව එවනවා. උදේ කෑම මොනවාහරි එවන්න හොඳේ"

"ම්. ආස මොනවද?"

දැන් හිතන්නට අවශ්‍ය තමා ආස දේවල් ගැන නොවේ. ඔහු ආස දේවල් ගැනය. ඒ හැඟීම පුදුමය.

"පොල් සම්බෝලයි පරිප්පුයි හාල් මැස්සෝ තෙල් දාලයි සුදු කැකුළු බතුයි. ටිකක් ලොකු බත් එක්ක එවන්න හොඳේ. බිත්තර ඔම්ලට් එකකුත් දාන්න"

ඉඳුනිල් සිනාසුනාය.

"මි එවන්නම්."

භාවනා පහත් වී අම්මාට වැන්දාය. ඉඳුනිල්ගේ පපුව උණුවිය. ඇය මෙසේ දිනපතා වඳින්නට ගත්තේ දේවක හමුවූ පසුව බව ඉඳුනිල් දනී.

"තුණුරුවන් සරණයි."

භාවනා කඩිසර ගමනින් ඇවිදගෙන වාහනයට ආවාය. තවම

පාන්දර අඳුරය. මේ පාන්දර අළුයම් අන්ධකාරයේ ගමන් යන්නට ඇය ආසය. එහෙත් ඒ ආසම මේ ළඟකදී ආ එකකි. නැත්නම් ඇය කීයටවත් මෙතරම් පාන්දර ඇඳෙන්වත් බහින්නේ නැත. පාන්දරට ගුලිවී නිදාගන්නා එක කොතරම් සැපක්දැයි ඇය කාලයක් සිතාගෙන උන්නාය. දුවගේ ඒ ආසව ගැන දන්නා නිසාම ඉඳුනිල් ඇයට නිදාගන්නට දුන්නාය. යුවතියන් කොහොමත් ආස මහ රෑ වෙනතුරු අවදිව සිට දවල් වෙනතුරු නිදාගන්නටය.

කතාවක් ලස්සන කුමාරයා කුමරිය එන මඟ බලා උන්නොත් පමණය. කිසිම කතාවක කුමාරි කුමාරයා එනතුරු බලාගෙන ඉන්නේ නැත.

දේවක සීගිරි එකට ආවේ මීට පැය කාලකට පෙරය. ඔහු සීගිරි සුපර් විවෘතකර එහි විදුලි පහන් දල්වා ටික වෙලාවක් ඇවිද්දේය. එහෙම ඇවිදින විට අලුත් අදහස් හිතට එයි.

"හැමදේම හිතපු විදිහටම වෙනවා. අවුරුද්දට වළං කඩේ දාන්න මැටි වළං ටික ආවානම් හරි. ඒ ටික නැතුව මේ හරිය පාළුයි වගේ. කිරි උතුරවන පුංචි මැටි මුට්ටි තුන්දාහක්වත් ඕන වෙයි. පොඩි දර මිටි තුන්දාහකුත් ගෙනත් තියනවා. පොඩි මැටි ලිප් ටිකත් ගේනවා. ඊට අමතරව මැටි ඇතිළි ටිකක් ඇති."

ඔහු එය අදම කරනවා කියා සිතුවේය.

"කට්ලට් බැද බැද දෙන තැන

ටිකක් පාළුයි වගේ. මේ පැත්තෙන් කට්ලට්වලට සැමන් ෆ්‍රී දෙන නිසා එයාලගේ සැමන් අට්ටි හතරක් දානවා. පොල් තෙල් දෙන අයගේ පොල් තෙල් ලයින්ස් දෙකකුත් දාමු. එහෙම කළාම හරි. කට්ලට් බදින්න කෙල්ලෙක් දැම්මොත් ඒක ටිකක් ඇදෙයි. කොල්ලෙක්වම දානවා. ඒප්‍රණ් එකක් ඇඳලා. කවුරුහරි නැතිවුනොත් ඉතින් දේවකත් කට්ලට් බඳින්න නරකම නෑ."

ඔහු තනිවම සිතුවේය.

"වළං කඩේ දාන තැන අවුරුදු නැකත් දාලා පොඩි බැනර් එකක් දාන්න ඕන. මේ පාර කිරි උතුරවන්න තියෙන්නේ උදේකනේ"

දේවක සියල්ල ඔහුගේ ජංගම දුරකථනයේ 'නෝට් පෑඩ්' එකට

දමාගත්තේය. අවසානයට ඔහු සීගිරි දොරකඩට ආවේය. ඒ ඇයව පිළිග න්නටය. පුරුද්දක් ලෙස එය ඔහු කරයි. භාවනා ඒ දැකුම හදවතින්ම පැතුවාය.

භාවනා බැස්සේ ඔහුගේ දෙනෙත් මත දෙනෙත් අලවාගෙනය. මේ දේ හැම දිනයකම සිදුවෙයි. ඒ හැම දිනයකම ප්‍රථම වරට ඔහුගේ දෙනෙත් දුටු දිනයේ හදවතට දැනුණ හැඟීම් මාත්‍රයම ඇයට සිහිගන්වයි. ‘නැවුම් හැඟුමින් ඔබේ නෙත දුටු රත්තරං දවසේ.’ ඇයට ඒ ගී පද සිහිවෙයි. ඒ සිංදුව කාගෙද? එයත් ඇසිය යුත්තේ ඔහුගෙන්මය.

යුවතිය ආවේ කෝපි මල් සිනාවක් මඟ හලාගෙනය.

“ඇයි මී.”

ඔහුගේ බැල්ම දරාගත නොහැකිව ඇය ඇසුවාය.

"සිංදුවක් මට මතක්වුණාඒකයි."

"මටත් සිංදුවක් මතක් වුනානේ."

"මොකක්ද?"

"මං කියන්නම් බබාගේ සිංදුව කියන්නකෝ."

දෙදෙනා ඇවිදගෙන ගියේ සීගිරි කාර්යාලය වෙතටය.

"වික්ටර් කියන ලස්සන සිදුවක්."

ඇයට මොකක්ද විය. යුවතිය සිහිකළ ගීතයත් කියන්නේ වික්ටර්මය.

"නැවුම් සුවළින් ඔබේ මුව දුටු රත්තරං දවසේ.

සිතක ආදර පැතුම් මල්පෙති අවදිවිය රහසේ"

භාවනාගේ දෙනෙත් තෙත්විය. ඇත්තටම තෙත්විය.

"අනේ සුද්දි මේ."

ඇය තොල්පට හපාගෙන බලාගෙන උන්නාය.

"මේ මොන හාස්කමක්ද කියන්න"

"කියන්නේ සුද්දි."

ඇයව වෙව්ලන බවක් දේවක දැක්කේය. ඔහු අතේ අත ගුලිකර මෙන් අල්ලාගත්තේය.

"ඇයි කියන්නකෝ."

"ඉතින් දෙයියනේ මටත් මේ බහිනකොට ඒ සිංදුව මතක් වුණානේ. එහෙම වුනේ කොහොමද?"

ඔහු සිනාසුනේය.

"එකම හාට් එකකින් ජීවිත දෙකක් වැඩනේ සුද්දි. ඒ වගේ හාස්කම් ගොඩක් වෙයි."

"ඒත්."

"මාත් හාස්කම් දැක්කේ මේ ඊයේ පෙරේදා."

ඔහු ඇගේ යන්තමට තෙත්වූ හිස අතගා කීවේය.

"තාම ඔළුව තෙතයිනේ."

දේවක ඇගේ මේසය මත වූ ටිෂූ බොක්ස් එකෙන් ටිෂූ ගෙන හිස තෙතමාත්තු කළේය. භාවානගේ දෙනෙත්වල කැටිවූ කඳුළු වැටිණ. ඇය ඔහු ළස්සනට මැදගෙන ඇඳගෙන ආ සුදු කමිසය පොඩිකරමින් ඔහුගේ පපුවට බරවිය.

"අර සිංදුවේ ඉතුරු ටික දන්නවද? මී."

"මී. මම සිංදු කැප්ටන් සුද්දි"

"කියන්න."

"නැවුම් සුවළින් ඔබේ මුව දුටු

රත්තරන් දවසේ.

සිතක ආදර පැතුම් මල් පෙති අවදි විය රහසේ

සිනිදු ඔබේ සුදු දෙපා යට වෙන සිහින් වැලි අතරේ.

රැඳුණි මා හද සිහින සිතිවිලි පැතුම් දිවි කතරේ.

උදා තරුවක් සමඟ අවදිව නොහිඳ ඝන අඳුරේ.

එන්න මා වෙත සිහිල් සුළඟක දැවටිලා සොඳුරේ"

ඔහු ගීතය කියා ඇය දෙසම බලාගෙන උන්නේය.

"ඊකනේ පාන්දර ආවේ බබා. උදා තරුවක් සමඟ අවදිව නොහිඳ ඝන අඳුරේ. ආවා ඔබ වෙත සිහිල්

සුළඟක දැවටිලා සොඳුරේ.”

ඇය ඔහුගේ පපුව සිපගෙන මෙන් කීවාය. දේවක ඒ හිසට අතක් තබාගෙනම පිරිමැද්දේය.

“මේ එකට හිතෙන දේවල් හැමදාම හිතෙයි නේද?”

ඇය ඇසුවාය. එය පුදුම දෙයකි.

“හැමදාම. අපේ දරුවන්ටත් අපිට හිතෙන දේම හිතෙයි”

“එහෙම වෙනවානම් කොච්චර දෙයක්ද? ඉතින් දැන් රෑ නැන්දා ආවනේ. මට ෂෝක් දෙයක් වුණා.”

රෑ සිදුවූ හැමදේම ඇය විස්තර කළාය.

“ඉතින් පස්සේ නැන්දා ගියාට පස්සේ තාත්තා අහනවා ටෙන් සීටර් වෑන් එකක් කීයක් විතර වෙයිද දන්නේ නෑ නේද ඉන්දු කියලා. මං

කිව්වා ගන්න එකේ එකපාර රෝසා බස් එකක්ම ගමු කියලා."

දේවකද සිනාසුණේය.

"ඒක හොඳ අයිඩියා එක තමයි."

"මං ඉතින් කිව්වා අර එක්කෙනෙක් කියපු දේ. අපි පහක් හයක් හදන්න ඉන්නේ කියලා"

"සුද්දි කිව්වා."

"මී. මගේ බොරු නෑනේ. කියලා දානවා"

දේවක ඇගේ දෙකන් පෙති වැසෙන්නට දෑතම තැබුවේය. භාවනා ඇකිලී ගියාය.

"ඉතින් සීගිරි එක ඕපන් කරන දවසේ රෑ මම හැමදේම කියනවා. අප්පච්චිටයි පුතාටයි එදාට ටිකක් එන්න වෙනවා."

දේවකට බියක් දැනුණේ නැත.

කවදා හෝ මේ ඇත්තට මුහුණ දිය යුතුය. එය අදද හෙටද කියා වැඩක් නැත. අතීතයේ එක් දවසක තමාගේ අප්පච්චිව සීගිරි නිවසට ගත්තේ නැත. අද ඔහුගේ එකම පුතාට සීගිරි පවුලේ ලස්සනම නිධානය මේන් කියා පුදයි කියා විශ්වාස කළ නොහැක.

"එනවා සුද්දි"

"බයයිද?"

ඇය ඇසුවාය. දේවක සිනාසුනේය

"නෑ. මම එනවා. වෙන මොනවත් හිතන්න එපා. අප්පච්චිවත් එක්කගෙ නම එනවා."

දේවක කීවේය.

"අපිට මේ ඇත්තට මුහුණ දෙන්න වෙනවා."

"ඔව්. අපි එහෙම කරමු. මං

අප්පච්චිට කියන්නම් එදාට වැඩක් දාගන්න එපා කියලා. එයත් එයාගේ මස්සිනයි නෑනයි බලන්න හරි ආසාවෙන් ඉන්නේ"

භාවනා දේවකගේ ළයට බරවී විනාඩි දහයක් පමණ උන්නාය.

"මොන දේ වුනත් අපි එකතුවෙනවා. ඒක පොරොන්දුවක්. මම මගේ මේ ආත්මේ තීරණ අරන් ඉවරයි."

ඇය පැහැදිළිව කීවාය.

"ඒක එහෙමම වෙයි. නුවර අපේ ඉඩමට හොඳ ඔෆර් එකක් ලැබුණා. ඒක මේ මාසේ ඉවරකරනවා. ඒ සල්ලිවලින් අපි මෙහේ ඉඩමක් ගන්න හිතාගෙන ඉන්නේ"

භාවනා කිසිවක් කීවේ නැත. දේපොළ ඉඩකඩම් ගැන ඇයගේ

තැකීමක් නැත. වටින්නේ මේ බැඳීම්ය. එහෙත් අතීතයේ එක දවසක ඔහුගේ අප්පච්චිව මේ සීගිරි පවුලට වැද්දා නොගත්තේද මේ දේපොළ නිසාමය. මිනිස්සු තීරණ ගන්නේ සිදුවූ දේවල් ගැන සිතා මිසක හදවතේ ඇති දේවල් ගැන සිතා නොවේ. බයත් ඒකය.

# 35

සුබ නැකතින් සීගිරි සුපර් මාර්ට් විවෘත විය. සිංහල අවුරුදු කටේ විවෘත වූ සීගිරි සුපර් මහ සෙනඟින් උතුරන්නට මහ වෙලාවක් ගියේ නැත. සුපිරි වෙළඳ සැළක් මින් පෙර කිසිම දිනයක යොදා නොගත් වෙළඳ උපායන් සාර්ථක වී තිබුණි. සති අන්ත පුවත්පත්වල පළවූ දැන්වීම් මඟින්ද ප්‍රදේශයේ හැම නිවසකටම දේවක විසින් කණ්ඩායමක් යොදා

බෙදාහැරිය අත් පත්‍රිකාද මාර්ගයෙන් සීගිරි හී නැවුම් වෙනස්කම් ගැන පාරිභෝගිකයේ දැනගත්තෝය.

කතා දෙකක් නොමැතිව සිංහල අලුත් අවුරුද්දට අවශ්‍ය සෑම දේම ගන්නට පාරිභෝගිකයෝ උද්‍යසන හතේ සිට සීගිරි සුපර් වෙත ඇදුනෝය. හැම සුපිරි වෙළඳ සැළක්ම විවෘත කෙරුණේ උදේ නමයෙන් පසුය. එහෙත් දේවක විසින් මේ අවුරුදු කාලයේ සීගිරි සුපර් උද්‍යසන හතට විවෘත කලේය. එය මධ්‍යම රාත්‍රී දොළහ දක්වා විවෘතව තැබිණ.

සුබ නැකතින් සීගිරි සුපර් විවෘත කෙරුණේ රඹුක්වැල්ල මහතාත් මිලින්දත් අතිනි. මිලින්ද ඔහුගේ දියණියන් තිදෙනාව ළඟින්ම

තබාගත්තේය. රඹුක්වැල්ල මහතා දේවකගේ අතත් රිබන් පටිය කපන්නට අත ගස්සවා ගත්තේය. මේ හැමදේම කලේ ඔහුය. සරල සුදු පැහැගත් අත් දිග කමිසයට තද නිල් පැහැගත් ටයි පටියක් පැළඳ උන් දේවක වෙතින් ආවේ ඕනම අභියෝගයකට මුහුණ දෙන්නට සූදානමින් ඉන්නා තරුණ සෙන්පතියෙකුගේ පෙනුමය. භාවනා එදින ඇන්ළේ දේවක විසින් ඇයට තිළිණ කළ ලා රෝස පැහැගත් සාරියය.

“පොඩි මස්සිනේ. ළඟට වෙලා ඉන්නකෝ අනේ”

තාරකා දේවකට කීවේ ඔහුගේ අතක් මිරිකාය. ඇය ඇගේ ගුවන් සේවයෙන් සතියක නිවාඩු ලබාගෙන

ආවේ භාවනාගේ ඉල්ලීම පිටය. 'ගොඩක් වැදගත් දේවල් වෙන සතියක්. ඔයාට හෙලවන්න බෑ' භාවනා කලින්ම කීවාය. 'උඹේ ආදර සටන දිනලා දීලම තමයි මම ආයෙත් උඩ යන්නේ. බලමු කෙල්ලේ. අනං මනං කතා ආවොත් මම මහගෙ දර හොලවනවා.' තාරකා කීවාය. ඈය එසේ සටන් කරන්නටම උපන් කෙල්ලෙකි. ඒ බව පවුලේ හැමෝම දැනගෙන උන්නාය.

නව සීගිරි සුපර් සුඛ නැතකින් විවෘත කළ දා අමුත්තෝ පුදුමයෙන් වටේම ගියෝය. නැවුම් අසිරිය පුදුමය. ඒ වෙද්දී පාරිභෝගිකයෝද දෙසීයකට ආසන්න ප්‍රමාණයක් සීගිරි වෙත පැමිණ උන්නෝය. හැම පාරිභෝගිකයෙක්ම පිළිගත්තේ භාවනාය. ඒ කිරිබත් කට්ට සම්බල්

හා ඇඹුල් තියල් බිඳක් තැබූ සුදු පීරිසි හැම පාරිභෝගිකයෙක්ටම දෙමිනි. එයද දේවකගේ අදහසකි.

එක තැනක අලුතින්ම දැමූ ඇඹුල් තියල් හට්ටි සිය ගණනකි. තවත් තැනක මේ දැන් අවන් එකෙන් බාන උණු උණු බටර් කේක් සිය ගණනකි. තවත් තැනක කිරි උතුරවන පොඩි මුට්ටිය. දර මිටිය. බුලත් අත්ය. කුලියාපිටියෙන් ගෙනා අලුත්ම පොල්ය. මීගමුවෙන් ගෙනා අලුත් බලයන්ය. තලපත්ය. මාළු කැපීම සඳහාම දේවක කෙනෙක්ව සොයාගත්තේය. ඔහු වත්තල ජූඩ්ය. විශේෂ පඩියක් දී ඔහුව ගත්තේ ඊයේ හවසය.

සීගිරි හී සියළුම සේවකයෝ ඇඳගෙන උන්නේ අලුත්ම නිළ

ඇළුමය. කොල්ලෝ කෙල්ලෝ ටික කඩියන් මෙන් වැඩකරමින් උන්නෝය. විවෘත කුස්සියේ බටු මෝජු හැදෙමින් තිබුණි. සිංහල අච්චාරු දැමෙමින් තිබුණි. ඒවා ඒ මොහොතේම කුඩා මැටි ඇතිළිවලට දැමිණ. පාරිභෝග යකයෝ ඒවා පොර කමින් ගත්තේ මෙදා අවුරුදු සීගිරි එකෙන්ම කන්නට සිතාගෙන මෙන්ය.

මිලින්ද හැමදේම පැත්තක සිට ආසාවෙන් බලාගෙන උන්නේය. භාවනා ගියේ ඔහුට කෝපි කප් එකක් දෙන්නටය.

"තාත්තා."

ඇය කතාකළාය. මිලින්ද බලාගෙන උන්නේ ඇඹුල් තියල් හට්ටි ගන්නා පාරිභෝගිකයන් දෙසය.

"සුද්දි."

"තාත්තා."

"කොල්ලා ඒක කළා එහෙනම්."

ඔහු කීවේය. භාවනාගේ දෙනෙත් තෙත්විය.

"එයාම තමා තාත්තා කලේ. අපි නෙමේ."

"එයා ගැන හිතන්නම වෙනවා දැන්."

භාවනා රැඳුණාය.

"එයාගැන හිතන්න ඕන කියලා මමනම් හිතුවේ මේ දේවල් දැකලා නෙමේ තාත්තා."

"එහෙනම්."

"අපේ අක්කව මෙහෙම වඩාගෙන වෙද මහත්තයා ළඟට එක්කගෙන ගියේ වෙලාවේ."

භාවනා කීවාය. මිලින්ද හැරුණේය. තම දියණිය නොකියා

කියන කතාවක් ඇත.

"මී. අපි හවස කතාකරමු. ඒත් ඔයා කවුද දෙන්නෙක්ව එක්කගෙන එනවා කිව්වනේ."

"එනවා තාත්තා."

"මී බලමු. බටු මෝජුව නැගලා යනවනේ සුද්දි."

"තාම තාත්තා සීනි සම්බෝලේ දැම්මේ නෑ. ඒක ආවම බලන්නකෝ. මේ පැත්තම සුවඳ වෙයි. අද ලූනු කිලෝ අසූවකින් දාන්නේ. මමනම් කියන්නේ මදිවෙනවා."

"මදිවෙන්නම ඕන"

ඔහු කීවේය. භාවනාත් මිලින්දත් කතාකරමින් ඉන්නා අතරවාරයේ ඉඳුනිල්ද ආවාය. ඇයද විවෘත කිරීමට ආවේ සාරියකින් සැරසීය.

"කොල්ලා හරිම දක්ෂයෙක්නේ.

මටනම් පුදුමත් එක්ක."

ඇය කීවාය.

"අපිත් මේ කතාකරකර උන්නේ ඒක ගැන තමයි ඉන්දු."

භාවනා දෑස් පොඩිකරගත්තාය. 'කෝ ඔයා පේන්න නෑනේ පිස්සෝ. කෝ ඔයා' ඇය සෙව්වේ දේවකවය.

"කොල්ලාව විශ්වාස කරලා මේක දුන්න නිසා හොඳයි."

"ඒක නෙමේ හොඳ ඉන්දු."

"එහෙනම්"

"මේක බෙදන්න යද්දී කොල්ලම මැදිහත් වෙලා මේක බේරගෙන අපිට ගන්න හැටි කියලා දුන්නට. අරම වෙන කෙනෙක්ට ගියානම්."

ඉඳුනිල් හිස වැනුවාය. දැන් මේ සීගිරි එකම මේ පවුලට අයත්ය.

"දැන් මේක අපේ."

"ඔව් අපෙයි අර නංගිගේ පුතාගෙ යි."

ඉඳුනිල් කීවාය.

"මී. කොල්ලව දකින්නත් ආසයි. ආවාම අපි කතාකරලා කියමු."

"මී."

ඉඳුනිල් කීවාය. භාවනා සිනාසුනාය. 'මේ හැමදේම කලේ ඒ කොල්ලා කියන තුරු මට ඉස්පාසුවක් නෑනේ' භාවනා සිතුවාය.

රඹුක්වැල්ල මහතාත් මිලින්දත් ඉඳුනිලුත් පැත්තට වී සීගිරි හී ඇති අලුත් අසිරිය දෙස බලාගෙ නම උන්නෝය. නේත්‍රාද රෝද පුටුව කරකවාගෙන ආවාය. භාවනාද තාරකාද ඒ අසළම උන්නාය.

"පොඩි පුතේ."

රඹුක්වැල්ල මහතා කතාකලේය.

"සීයා"

"මට මේකා ආපු දවසේ කිව්ව දේ හොඳට මතකයි"

රඹුක්වැල්ල මහතා පමණක් නොව මිලින්දද නේත්‍රාද භාවනාද එදා ඔහු මේ සීගිරි එකේ සම්මුඛ පරීක්ෂණයට ආ දා කියූ දේ සිහිකලේය.

"මම සර් මේ සේල්ස් ප්‍රමෝෂන් මැනේජර් කෙනෙක් ඉල්ලලා තියෙන වේකන්සි ඇඩ් එක දැක්කට පස්සේ පෙරේදා සීගිරි එකට ආවා සර්. මම ආවේ සැටඩේ සර්. සුපර් මාර්කට් එකකට හොඳට කස්ටමස්ලා එන දවසක් එදාවත් සර් සීගිරි එකට එහෙමම සෙනඟක් ඇවිත් හිටියේ නෑ. කා පාක් එක ටිකක් පාළුවට ගිහින් තිබුනේ. මෙච්චර

ලස්සනට හදපු සීගිරි සුපර් එකට එහෙම කස්ටමස්ලා නැවිත් ඉන්න හේතුවක් නෑ සර්. ගොඩක් සුපර් මාර්කට්වල නැති සිංහල පාටක් සීගිරි එකට තියෙනවා. ඒක හදවතට දැනෙන ගතියක් තියෙනවා සර්. මම කිව්වේ මට දැනිච්ච දේ ඒක සීගිරි එකට ගොඩවෙනකොටම දැනෙන දෙයක්. සීගිරි එකේ තේමාව දකිනකොට හිතෙන දෙයක්. අපේ ගතියක් දැනෙනවා. ඒත් සීගිරි එකට ක්‍රව්ඩ් එක ඇවිත් නෑ. මොකක්හරි ප්‍රශ්නයක් තියෙනවා කියලා මට දැනුණා සර්. ඒක ගොඩක් ලොකු ප්‍රශ්නයක් නෙමේ. පොඩි පොඩි දේවල් ටිකක්. හරිගස්සන්න පුළුවන් දෙයක්. ඕනම සුපර් මාර්කට් එකක තියෙන බඩු සුපර් මාර්කට් එකට පිටින් තියෙන කඩවල්වලින් පොළවල්

වලින් ගන්න පුළුවන්. සමහරවිට සුපර් මාර්කට් එක දෙන මිළටත් වඩා අඩුවෙන්."

"ඒත් එහෙම තියෙනවා කියලා දැනගෙනත් ඇයි කස්ටම කෙනෙක් සුපර් මාර්කට් එකකට එන්නේ. එයාට පහසු නිසා. මේ එක්ස්පීරියන්ස් එකට එයා ආස නිසා. ඒ සී කරපු සුපර් මාර්කට් එකක් ඇතුලේ වෙනමම ෂොපින් එක්ස්පීරියන්ස් එකක් ගන්න එයා ආස නිසා. එයාට ඕන කරන හැමදේම එක තැනක එක විදිහකට තියලා තියෙන නිසා."

දේවක කියාගෙන එද්දී සම්මුඛ පරීක්ෂණේ උන් මිහිරංග බාධාකළ හැටි නේත්‍රා සිහිකළාය.

"දැන් ඔයා හදන්නේ අපට සුපර් මාර්කට් ගැන උගන්නන්නද?"

මිහිරංග ඇසූ අයුරු ඇයට මතකය.

"ඉන්න සර්. මම තාම කතාව පටන් ගත්තේ නෑ. සීගිරි එකේ එම් ඩීට සුපර් මාර්කට් කරන කලාව උගන්වන්න මට බෑ සර්. සීගිරි එක මම දන්න විදිහට පටන් අරන් තියෙන්නේ මම ඉපදෙන්නත් කලින්. ඒ වගේම ලංකාවේ අද සුපර් මාර්කට් කරන කම්පනි ඒවා ගැන හිතන්නත් කලින්. ඒක මම දන්නවාඒත් සර් ප්‍රින්සස් කෙනෙක් වගේ ඉන්න ඇක්ට්‍රස් කෙනෙක්ගෙත් පොඩි පොඩි අඩුපාඩු තියෙනවා. ඒවා දන්නේ ෆිල්ම් එකේ ඩිරෙක්ටර් නෙමේ. ඇක්ට්‍රස්ව මේක් අප් කරන මේක් අප් ආටිස්ට්. එයා නිළියගේ තියෙන පොඩි පොඩි අඩුපාඩු ලස්සනට

නොතේරෙන්න වහලා එයාව ආයෙත් ප්‍රින්සස් කෙනෙක් කරනවා. ඒකයි මම කියන්නේ. හැමදාම දකින දේ අඩුපාඩු පේන්නේ නෑ. ඒත් පිටින් ඉන්න කෙනෙක්ට ඒක හොඳට පේනවා. මට මිස් සීගිරි එකට ඇතුල්වෙච්ච හැටියේම දැනිච්ච දේ තමයි චුට්ටක් පාළුයි කියලා. මොකක්ද සිරියක් අසිරියක් නැති ගතියක් පෙනුනා. මම හිතන විදිහට මිස් සුපර් මාර්කට් එකක් ඇතුලේ පොඩි කානිවල් එකක ගතියක් තියෙන්න ඕන. එහෙන් මෙහෙන් අතරින් පතරින් බැබලෙන ගතියක්. මම කියන්නේ මේ ලයිට්ස් දාන්න ඕන කතාවක් නෙමේ. අපි කියන්නේ සෝබාව දේ මෙපුර සිරි විසිතුරු බලන් මිතුරු මඟ පියකරු වූ කියලා. මේක එකම සල්පිළක්

වෙන්නෝන මිස්. එක එක කතන්දර සුපර් මාර්කට් එක ඇතුලේ තියෙන්න ඕන."

"කියන්න බලන්න එකක් දෙකක්."

තමා කියූ අයුරු නේත්‍රා සිහිකළාය.

"සීගිරි එකේ ස්ටාෆ් එක ඔහේ තැන තැන හිටියේ මිස්. එහෙම කියලා එයාලා සේල් එක ප්‍රමෝට් කරන්නේ නෑ. මම එදා දැකපු විදිහට දොළොස් දෙනෙක් හිටියා එහෙම කැරකි කැරකි. ඒ අය අතරින් හතර දෙනෙක් හිටියේ මොබයිල් කොල්ස් වල. ඒ ශ්‍රමය සර් අපරාදේ කියලා මට හිතෙන්නේ. එක්කෙනෙක්ව අපට දාන්න පුළුවන් ස්පෙෂල් වෙජිටබල් ඔයිල් එකක් ප්‍රමෝට් කරන්න. ඔයිල් කම්පනි

එකට කතා කළොත් එයාලා අපිට සම්පූර්ණ සහය දෙයි. අපි ටේබල් එකක් දානවා සර්. එතන ලස්සනට පොඩි ගෑස් එකක් තියලා අපි ඔයිල් පෑන් එකක් රත්කරලා මොනවාහරි පොඩි දෙයක් ෆ්‍රයි කරකර දෙනවා. ඒ ටේබල් එකේ පැත්තකින් අපි වෙජිටබල් ඔයිල් එකත් තියනවා. අපි හිතමු සර් අපි ෆ්‍රයි කරලා දෙන්නේ කට්ලට් එකක් කියලා. ඒ කොස්ට් එක අපරාදේ යන්නේ නෑ. එදාට අපිට වෙජිටබල් ඔයිල් දෙසීයක් තුන්සීයක් සේල් කරන්න පුළුවන්. තව මම දැක්කා අපි ගෙනාපු චිකන් සෑහෙන ප්‍රමාණයක් තියෙනවා. අපිට පුළුවන් ස්පෙෂල් චිකන් කරියක් හදන්න හවසට. හදලා පොඩි සාම්පල් එකකුත් කස්ටමස්ලට දෙන්න. මෙන්න මේ

චිකන් වලින් හදපු කරිය කියලා. ඒ සුවඳින් සුපර් මාර්කට් එක පිරෙනවා සර් එතකොට. අපිට ස්පෙෂල් චිකන් කරියක් රුපියල් එකසිය පනහකට වගේ දෙන්න පුළුවන්. ලස්සන කප් එකක. හිතන්නකෝ එන දෙසීය දෙනෙක් මේ සුවඳ චිකන් කරිය ගත්තා කියලා සර්. එතනම කලෙක්ෂන් එකට රුපියල් තිස්දාහක් ඇඩ් වෙලා. එක චිකන් කරියකින්. හිතන්නකෝ එතනම අපි පොල් රොටි හදනවා කියලා. අද රෑට පොල් රොටියි චිකන් කරියි කියලා බෝඩ් එකකුත් දානවා. මමනම් ගන්නවා සර්සීගිරි එකේ සබන් නම් ඇත්තෙම නෑ සර්. නමුත් අපිට යුනි ලීවර්ස්ලත් එක්ක කතාකරලා ඒකත් ප්‍රමෝට් කරන සේල්ස් ටේබල් එකක් දාන්න පුළුවන්. මම සීගිරි

එකේ වෙජිටබල් කෝනර් එක අදත් දැක්කා සර්. කිසිම පිළිවෙලක් නෑ. බෙල් පෙපර් ළඟ අමුමිරිස්. අමුමිරිස් වලට පස්සේ තක්කාලි. ඊට පස්සේ මුරංගා. එහෙම ලස්සන නෑ සර්. උඩරට එළවළු ලස්සනට උඩින් තියන්න පුළුවන්. අලුත් සදාල කොළ එක්ක බෙල් පෙපර් තත්කාලි එහෙම තියලා. අපිට පුළුවන් එතනම කොස් කපන්න."

"වට් කොස් කපන්න. සීගිරි එක අතුලේ."

මිහිරංග ඇසූ අයුරු භාවනා සිහිකළාය. ඇය අද ඒ ගැන සතුටු විය. 'ඒ මිහිරංගලාට අද සීගිරි එක අයිති නෑ. පුදුමයි'

"ඔව් සර්. කොස් කපන්න. අපිට ගෑනු කෙනෙක් හොයාගන්න

පුළුවන් ඒකට දවස් පඩියට. එයා බිම ලස්සනට පැදුරක් දාගෙන බංකුවක වාඩිවෙලා කොස් ගෙඩි විස්සක් තිහක් දවසකට කපයි. කොස් මඳුළු වෙනම. කොස් මැල්ලුම් වෙනම. සුපර් මාර්කට් එකට එන කෙනා කොස් මැල්ලුම් ගන්න ආයේ පොළට යන්නෝන නෑ නේ සර්. නේද. බලන්නකෝ ඒක කරලා. එතන සෙනඟ පිරෙයි. මම සර් සැටඩේ සීගිරි එකේ තිබ්බ බටර් කේක් එකක් ගත්තා සර්. හවසට ප්ලේන්ටියක් හදාගෙන කන්න."

කොල්ලා කියූ අයුරු රඹුක්වැල්ල මහතා සිහිකලේය.

"ඒත් සර් ඒ ආශාව එතනම ඉවරයි. බටර් කේක් එකේ ඩේට් එක්ස්පයර් සර්. දවස් හතරක්

වෙනවා එක්ස්පයර් වෙලා. මට පුදුම හිතුණා. කවුරුවත් මේවා චෙක් කරන්නේ නැද්ද කියලා. පුස් ගඳ ගහන කේක් එකක් සර් තිබ්බේ. එක ලේඩි කෙනෙක් ඩේට් බලන්නේ නැතුව කේක් එක ගත්තා. මට දුක හිතුණා. එළියට ගියානම් හොඳ නැති නිසා මම මිස් කෙනෙක්ට කිව්වා ඒක අයින් කරන්න කියලා. කැෂියර් එකේ. සීගිරි එකේ සර් ඉඩ ඕන තරම්. අපිට ඕන එක මික්සරයයි අවන් එකයි හොඳ බේකරි වැඩ දන්න දෙන්නෙකුයි විතරයි. අපිට ෂෝක් බේකරි කෝනර් එකක් පටන් ගන්න පුළුවන්. උදේට රස මාළු පාන්. හවසට උණු උණු අච්චු පාන්. කර කර ගා හැපෙන රෝස් පාන්. ඩයබිටික් අයට රසම රස කුරක්කන් පාන්. එතකොට දවස ගානේ දාන

බටර් කේක්. චොකලට් කේක්. එක පාන් ගෙඩියක් බේක් වෙන සුවඳ ඇති සර් මේ සීගිරි එක පුරවන්න. පාන් පිච්චෙන සුවඳ තරම් මිහිරි සුවඳක් තවත් නෑනේ සර්."

ඒ සුවඳ ඔහු සීගිරි එක මැද හැදුවේය. අද මේ එන්නේ බටර් කේක් බේක්වෙන මිහිරි සුවඳය. හවසට පාන් සුවඳද එනු ඇත.

"ඒකෙන් සර් කලෙක්ෂන් එකට තව රුපියල් පහළොස් දාහක් විසිදාහක් එකතු කරන්න පුළුවන්. හවසට සර් මේ පාරේ ලක්ෂ ගාණක් යනවා. මේ කා පාක් එක තියෙන්නේ පාර අද්දර. කා පාක් එක නිකං ක්‍රිකට් ග්‍රවුන්ඩ් එකක් වගේ ලොකුවට තියෙනවා. මෙහේ කූල් කබඩ් වල චිකන් කකුල් නිකං

එක්ස්පයර් වෙනවා. ඉතින් සර් අපි ඩ්‍රාමුකෝ චිකන් කකුල් දෙසීයක් විතර ඩ්‍රාලා හවසට බාබකියු එකක් එළියේ. ලොකු පන්දම් දෙකකුත් ගහලා. මේ කොල්ලෝ දෙන්නෙක් ඇතිනේ. බේකරි සෙක්ෂන් එකෙන් නියම බන් දෙනවා. බන් දෙකයි ග්‍රිල් කරපු චිකන් කකුලයි වෙජිටබල් සැලඩ් එකයි සෝස් කප් එකයි. රුපියල් තුන්සීයයි. සෙනඟ ඇදෙයිනේ. නිකං මොකටද සොසේජස් එක්ස්පය වෙලා අහක ඩ්‍රාන්නේ. මම ආපු දවසේ එහෙම ගොඩක් අහක දැම්මා. මීට් සෙක්ෂන් එකෙන්. මම දැක්කා. ඇයි එහෙම එක්ස්පය වෙනකල් ඉන්නේඅපි ඩ්‍රානවනේ හොඳ සොසේජස් බන් එකක්. අඩුවටඅම්මලා පොඩ්ඩි උන්ට අරන් දෙයිනේ යන ගමන්.”

එදා තමා හිතූ දෙයක් ඇය

සිහිකළාය. 'ඔයාව සීයා අරන් ඉවරයි දේවක. ඒක ෂුවර්. මම දන්නවා සීයා ගැන'

"අද සුපර් මාර්කට් එකට බල මාළු ආවද කියන්න සර්."

දේවක එදා ඇසුවේ දේවකගෙනි.

"ආවද මිහිරංග."

සීයා ඇසුවේ මිහිරංගගෙනි. එදවස සේල්ස් බැලුවේ මිහිරංගය. භාවනාට හැමදේම මතකය.

"දවසගානේ එන්නේ නෑනේ සීයා. මොකටද දැන් මෙතනට බල මාළු."

"නෑ සර් මට ආපු ප්‍රයිස් එක දැනගන්න."

"කීයද ආපු ගාන මිහිරංග."

සීයා මිහිරංගගෙන් ඇසුවා භාවනාට මතකය.

"මට මතක නෑ සීයා. කීයක්

එනවද?"

ඒ වෙලාවේ දේවක ටික වෙලාවක් මිහිරංග දෙස බලා උන් අයුරු භාවනා සිහිකළාය. 'එදා ඔයාගේ ඇස්වල තිබුනේ අමුතුම බැල්මක්'

"අද සර් බල මාළු කිලෝ එකක් රුපියල් දෙසීය පනහයි. මම බලාගෙන ආවේ. හොඳ මාළු තොග අද මාළු මාකට් එකට ඇවිත් තියෙන්නේ. අපිට කෑලි කපපු බලමාළු අද ගන්න පුළුවන් සර් තුන්සීයකට"

"ඔව් දේවක. ඒත් මොකටද"

තමා එසේ ඇසූ බව නේත්‍රාට සිහිවිය.

"අපි දානවනේ මිස් ෆිෂ් සෙක්ෂන් එක ළඟ ඇඹුල් තියල් ටේබල් එකක්. අලුත් මැටි ඇතිළි පන්සීයක්

ගෙනත් අපි ඇඹුල් තියල් පේස්ට් එකක් හදලා දානවා එක දිගට බල මාළු ඇඹුල් තියල්. අපිට එක ඇඹුල් තියල් ඇතිළියක් මාකට් කරන්න පුළුවන් හාරසීයකට. ඒත් අපි දෙනවා තුන්සීයකට. හොඳට ලාබයිඒකෙන් ෆිෂ් සෙක්ෂන් එකත් ප්‍රමෝට් වෙනවා. කලෙක්ෂන් එකත් වැඩිවෙනවා.”

මේ ටික කියද්දී ඔහු ගැන සිතූ දේ භාවනා සිහිකළාය. ‘ඔයා කොහෙද හිටියේ මෙච්චර කල් දේවක.’

“මේ සීගිරි එක මාස තුනකින් ගොඩගන්න පුළුවන් සර්. ඒක කරන්නම පුළුවන්. සීගිරි එකට සෙනඟ අඩුවුනේ මේ වැඩිවෙච්ච අනිත් සුපර් මාර්කට් නිසා නෙමේ. මේක ඇතුලේ කතන්දරයක් නිසා. සීගිරි එකේ හොඳ පර්ෆියුම් නෑ.

සබන් නෑ. මිල්ක් පවුඩර් නෑ. එක ෆොරින් පර්ෆියුම් එකක් නෑ. මොයිස්චරයිසින් ක්‍රීම් එකක් නෑ. සැනිටරි පෑඩ් තියෙන්නේ එක වර්ග යයයි. එකත් ලූජ් වර්ගය. ඒත් ගෑනු ළමයි වැඩියෙන් යූස් කරන අලවන වර්ගය නෑ."

ඔහු මේ තැනට ආවේ එහෙම සියුම්ව සීගිරි එක නිරීක්ෂණය කරය.

"සීගිරි එකට ෆිෂ් සප්ලයි කරන කෙනා කවුරුහරි මෙතනට කරන්නේ ලොකු වංචාවක්. මිනිස්සු හැමදාම හොයන්නේ එකම විදිහේ මාළු වර්ග ටිකක් සර්. තලපත් කෙලවල්ලෝ පරව් තෝර වගේ ලොකු මාළුයි හුරුල්ලෝ සාලයෝ සුද්දෝ පරා පැටව් හාල් මැස්සෝ වගේ පොඩි මාළුයි. ඒත් සීගිරි එකේ ගිය

සෙනසුරාදා තිබුනේ හුරුල්ලෝ හතර පස් දෙනෙක් විතරයි. අනිත් සේරම පියා මැස්සොයි සූඩයොයි ගල් මාළු වර්ගයකුයි තව මොනවද වගයකුයි. එහෙම ෆිෂ් කවුන්ටරයක් කරන්න බෑ සර්."

දේවකා එදා කීවේ බියක් නැතිවය. මිහිරංග මාළු ගන්නා අයගෙන් පවා කොමිෂන් ගන්නා බව භාවනා දැනගෙන උන්නාය. අද ඇය එය සිහි කළාය. පසුව සතුටු වූවාය. 'ඒ කවුරුවත් අද සීගිරි එකේ නෑ. මේක අපේ'

"හොඳට යන හාල් වර්ග සර් විස්සක් විතර තියෙනවා. සුදු කැකුළු සම්බා කැකුළු රතු කැකුළු රතු සම්බා කැකුළු කීර සම්බා සුදුරු සම්බා එතකොට නිපුන සුපිරි

සම්බාකීර කැකුළු. මාතර රතු තිස්ස රෝස කැකුළු. ඒ මොනවත් අපි ළඟ නෑ සර්. ඇයි එහෙම වුණේ කියලා දන්නේ නෑ. තියෙන්නේ සුණු සහල් වගේ කැඩිච්ච සම්බා හාලකුයි එලොවටත් නැති මෙලොවටත් නැති කැකුළු හාලකුයි. හාල් සප්ලයි කරන අය ඕන තරම්නේ සර්. අපිට හොඳ කොමිෂන් එකක් ගන්න පුළුවන්. අනික අපි වැඩිපුරම කන්නේ බත්නේ. ඒත් සීගිරි එකේ වැඩිපුරම තියෙන්නේ ඉටිපන්දම්. රැක් එකක් පුරවලා ඉටිපන්දම්. මේ පැත්තේ ලයිට් යනවද බකට් පත්තු කරනවද කියලා මම දන්නේ නෑ."

අද තත්වය භාවනා සිහිකළාය. 'ඔයා විශේෂයෙන් හිතලා පෑඩ් පැකට් වර්ග හය හතක්ම ගෙන්නගත්තා. වැදගත් ගෑණියෙක්ට

සාමාන්‍ය කඩයකට ගිහින් පෑඩ් පැකට් එකක් ඉල්ලන්න පුළුවන්තරම් වාතාවරණයක් අපේ රටේ නෑ.' භාවනා සිතුවාය.

"සීගිරි එක සති හතරක් වහන්න ඕන සර්. මම හිතන දේ. වහලා අපි අලුතින් පටන් ගන්න ඕන. අලුත් විදිහකටඑන කෙනාට හිතෙන්න ඕන දැන් තියෙන්නේ අලුත් වෙච්ච එයාලා ගැන හිතන. එයාලට ඇත්තටම සුපිරි දේ දෙන සීගිරි එකක් කියලාඑළියේ යන කෙනාට හිතෙන්න ඕන නේද සර් මේක ඇතුලේ මොකක්ද වෙනවා කියලා. ඒක දකින්න තමා එයා එන්නේවී නිසා මේක ඇතුලේ සර් අපිට මොනවා හරි කරන්න වෙනවාබැබලෙන දෙයක්. තරු විසිවෙන දේවල් ටිකක්. එහෙම වුනොත් ෂැම්පූ එක ගන්න

එන කෙනා මෙහෙන් යන්නේ ඒක අමතක වෙලා වෙන දේවල් ටිකක් අරගෙන. දැනටනම් එහෙම දෙයක් නෑ සර්. තියෙන්නේ දවස් තුනක් පරණ වෙච්ච වෙජිටබල් ටිකකුයි කුණුවෙච්ච පොල් ගෙඩි දාසයකුයි කැඩිච්ච හාල් ටිකකුයි එක්ස්පය වෙච්ච කුකුල් මස් ටිකකුයි කිසිම බ්‍රෑන්ඩ් එකක් නැති බඩු ටිකකුයි මුඬු වෙච්ච පොල් තෙල් බෝතල් ටිකකුයි විතරයි සර්. සර් මාව මේ පෝස්ට් එකට ගත්තත් නැතත් මේ ඇත්ත සර්ට කියලා යන්නයි මම ආවේ”

ඔහු අන්තිමට කීවේ එයය. එහෙත් කිසිවෙක් දේවකව යැව්වේ නැත. ඔහුව තබාගත්තේය. අද ඔහු ඒ කියපු දේ ඒ ලෙසම කර ඇත.

“කොල්ලා කිව්ව දේ කරන

කොල්ලෙක්. කිව්වා වගේම මාළු ඇඹුල් තියල් සිංහල අච්චාරු දාන කවුන්ටරයක් දැම්මා. පොල් ගෙනාවා. අපේ හැම හාලක්ම තියෙනවද පුතේ."

"හාල් වර්ග නමයක් තියෙවනවා සීයා. දේවකම කතාකරලා ගත්තේ."

නේත්‍රා කීයාය.

"ඔය එන්නේ බටර් කේක් සුවඳ? මං මෙතනට ආවට පස්සේ දැක්කා විස්සත් තිහක් බටර් කේක් එක අරන් යනවා."

මිලින්ද කීවේය. දැන් මේ සියල්ල නිසාම කාටත් වඩා සතුටු භාවනාටය. ඇය උන්නේ පිපිරෙන්නට තරම් ආසන්නවය.

"කෝ දැන් දේවක."

මිලින්ද ඇසුවේය. ඔවුන් සෙනඟ

අතරින් ඉදිරියට ගියේ දේවකව සොයාගෙනය. අවසානයට දේවක උන්නේ සුදු කමිසයට උඩින් සුදු ඒප්‍රණ් එකක් ඇඳගෙන කට්ලට් බදිමිනි. රඹුක්වැල්ල මහතා ඈත සිට බලාගෙන උන්නේය.

"අපි හොයපු කොල්ලාම තමයි."

රඹුක්වැල්ල මහතා කීවේය.

"සීයා මොකටද කොල්ලෙක් හෙව්වේ."

නේත්‍රා ඇසුවාය. භාවනා තොල්පට තදකරගත්තාය.

"වැඩ දෙක තුනකට මම කොල්ලෙක්ව හෙව්වා ලොකු පුතේ"

"ඉතින් මේකා ඒ වැඩ දෙක තුනටම හොඳයිද?"

"හොඳ වැඩියි."

මිලින්ද සිනාසුනේ ඉඳුනිල් දෙස

බලාය. 'ඔක්කොමත් හරි මේ කෙල්ල හවසට දෙන්නෙක්ව එක්කගෙන එනවා කිව්ව එක තමයි හිතාගන්න බැරි' ඈය සිතුවාය.

සියල්ලන්ම නතරව උන්නේ පොල් ගොඩ ළඟය.

"මේ පොල් තොගයම ගත්තේ පොල් ගෙඩියක් තිස් තුන ගාණේ සීයේ. දේවක ඒවා ඊයේ රෑ ළමයිව දාලා වෙන්කළා. ලොකුම ඒවා හැත්තෑවට. ඊට අඩු ඒවා හැටට පස්සේ පනහටපොඩිම ගෙඩි හතළිස් පහට"

දේවක පොල් දැමීම සඳහා ලොකු පොලි බෑග්ද ගෙන්වාගෙන තිබුණි. ඒනිසාම බොහෝ පාරිභෝග කයන් පොල් ගෙඩි දහය පහළොව ගත්තෝය.

දේවක වටා පාරිභෝගිකයන් විස්සක් පමණ රවුමට උන්නෝය. ඔහු අපූරුවට කට්ලට් බදිමින් උන්නේය. භාවනා අත් බැඳගෙන බලාගෙන උන්නාය. 'ඔයාව පැත්තකට වෙලා රස විඳින්න පුළුවන්. දැන් මම විතරක් නෙමේ ඔයාව රස විඳින්නේ. ඒත් ඔයා දන්නවනේ මායි ඔයාගේ පළවෙනි රසිකාවිය' ඇය සිතින් කීවාය.

"කට්ලට් එකක් කමු සර්."

දේවක සියල්ලන්ටම කට්ලට් දමාගෙන ආවේ සුදු ඒප්‍රණ් එක පිටිනි.

"අනේ පුතා ඔයා කට්ලට් බැද්දාම."

රඹුක්වැල්ල මහතා කීවේය.

"සර් දන්නවද? කට්ලට්

බදිනකොට මානසික ආතතිය නැතිවෙනවා. කට්ලට් බදිනකොට එළවළු කපනකොට එහෙම වෙනවා. අපි අද ටිකක් වැඩිපුර කට්ලට් බදිනවා සර්. අපිට සැමන් ෆ්‍රී ලැබෙනවා. පොල් තෙල් ලැබෙනවා. එයාලගේ පොල් තෙල් හෝ ගාලා යනවා. ඒ තෙල හොඳයි කියලා හැමෝම දකිනවා. එක කට්ලට් එකක්වත් කැඩෙන්නේ නැතුව බැදෙනවා. කට්ලට් සීයක් බැද්දත් තෙල මුඬු වෙන්නේ නෑ. මම එයාලට ඒක කියලා දීලා බදින්නේ. එතන ඉඳගෙන කොල්ලවත් ට්‍රේන් කරනවා සර්."

දේවක කීවේය. මිලින්ද අත් බැඳගෙන දේවක දෙස බලාගෙන උන්නේය.

"මේ පොල් මදිවෙයිනේ පුතේ දැන්. සෑහෙන්න යනවා."

මිලින්ද කීවේය. 'ඔයා දැන්ම ඉඳලා එයාට පුතේ කියන එක හොඳයි තාත්තා. එයාව මම ඔයාගේම පුතා කරනවා. බලන්නකෝ' භාවනා සිතුවාය.

"අපි තව පොල් ලොරි දෙකක් ඕඩර් කළා සර්. නේද අක්කා."

නේත්‍රා හිස වැනුවාය.

"මම ඒත් බයෙන් ඕඩර් කලේ. මල්ලි කිව්වට. අපි මෙහෙම පොල් වික්ක සුපර් මාර්කට් එකක් නෙමේනේ තාත්තා."

නේත්‍රා පැහැදිලිව කීවාය.

"අම්මා කැවිලි ගෙදර හදන්න එපා. සේරම කැවිලි අපි හෙට ඉඳලා හදනවා. ආස්මී කොකිස් කැවුම් අතිරස සීනක්කු මුං කැවුම් අලුවා

දොදොල් හැමදේම හෙට ඉඳලා හදනවා. මුල්ම කැවිලි ටික ගෙදරට ගේනවා."

දේවක කීවේ ඉඳුනිල්ටය. ඉඳුනිල්ට පුදුමය.

"කැවිලි හදන්නේ කොහෙද පුතා දැන්."

රඹුක්වැල්ල මහතා ඇසුවේය.

"කැවිළි ගෙදර තමා සර් අර හදන්නේ. හෙට අපි නැකතට තෙල් තාච්චි ලිපේ තියනවා."

දේවක අලුත් පොල් අතුවලින් හදමින් තිබූ කුඩා පැළ පෙන්වූවේය. ඔහු ඒ සඳහා යොදාගෙන තිබුනේ ඉස්ටෝරුවට පිවිසෙන තැන වූ කුඩා ඉඩය.

"කැවිලි හදන දෙන්නෙක්ට මම එන්න කියලා තියෙන්නේ. අපි

එයාලට සර් දවසට තුන්දාහක් දෙනවා. එයාලා උදේ නමයේ ඉඳලා රෑ නමය වෙනකල් කැවිලි හදනවා. යන්න ත්‍රීවීල් ගාස්තු දෙනවා. අපිට පාඩු නෑ. කැවිලි වට්ටි පිටින් දෙන්නේ. හැම කැවිළි වර්ගයකින්ම දහයක් දාපු කැවිලි වට්ටියක්. වට්ටි ටික බලන්න මම කෙනෙක්ව යැව්වා”

ඉඳුනිල් බැලුවේ මිලින්ද දෙසය. තම බිරිඳ එසේ තමා දෙස බැලුවේ ඇයිදැයි මිලින්දද සිතුවේය.

“සර්ට පුළුවන්නම් විතරක් එක දෙයක් කරලා දෙන්න”

දේවක රඹුක්වැල්ල මහතාට කීවේය. ‘ඔයා හැමදේම හිතන්නේ කොහොමද ’භාවනා සිතුවාය.

“කියන්න පුතා”

“අපිට හෙට අනිද්දා වෙද්දී

පාකින් එක ඉඩ මදිවෙනවා. ඒක මම දන්නවා. එහා ඉඩම හිස් සර්. අපිට පොඩි ගාණක් දෙන්න ඒක කතාකරන්න පුළුවන්නම් සර් මෙතනින් එන්ට්‍රන්ස් දාන්න පුළුවන් ඒ ඉඩමට යන්න. ඒක හිස්නේ"

රඹුක්වැල්ල මහතා බැලුවේ මිලින්ද දෙසය.

"පුතා එහෙම හිතනවද?"

"ඔව් සර්. මේ වගේ පාකින් දෙකක් පිරෙන්න හෙට වාහන එනවා."

මේ හැම කතාවක්ම වූයේ අද දහවලේය. සීගිරි පවුලේ තීරණාත්මක කතාව ඇරඹෙන්නේ අද රාත්‍රියේය. ඒ ගැනවත් කතාකරන්නට දේවකටත් භාවනාටත් ඉවරයක් තිබුනේ නැත.

"චුට්ටකට එන්න ඔෆිස් එකට."

භාවනා දහවල් එකට පමණ කීවාය. ඒ වෙද්දී සීගිරි සුපර් එක සෙනඟින් පිරී ඉතිරී ගොස් තිබුණි. දේවක ආවේ කැෂියර් කවුන්ටර් හතර දෙසම බලාය. කිසිම වැරැද්දක් සිදුවී නැත. සිදුවෙන්නට ඉඩදෙන්නටත් නොහැක.

භාවනා මේසයට බරවීගෙන හිටගෙනම උන්නාය. දේවක ආවේ දුවගෙන මෙන්ය. ඇය දේවකගේ අතකින් අල්ලාගත්තාය.

"එහෙනම් ඔයා ඒ හාස්කම කළා. හැමෝම එක්කෙනෙක්ගැන පුදුම වෙනවා. අපිටයි ආඩම්බර."

ඇය කීවාය. දේවක ඇය අල්ලාගත් සුරත ඉහළට ගෙන ඇගේ අත පහත් වී සිපගත්තේය.

"මිනිහෙක්ගේ වාසනාවන්ත කාලේ ආවාම හැමදේම හොඳවෙනවා සුද්දි. ඒත් ඒ වාසනාවන්ත කාලේ ඒ මිනිහගේ ජීවිතේට ගෙන්න පුළුවන් ගෑනියෙක්ට විතරයි."

"කවුද දැන් ඒ ගෑණි."

ඔහු ඇගේ හිස මත අතක් තැබුවේය. ඔහු එහෙම විශ්වාස කරනවානම් ඒ හාස්කම වෙන්නට ඇත්තේ ඒ නිසාම වෙන්නට ඇත.

"ඒ හාස්කමේ අනුහස මට දෙන්නේ ඔයාගේ තියෙන ගුණවත් කමටමම කරපු දෙයක් නෑනේ දේවකයියේ."

"ඒ කරපු දේ."

"කියන්න."

"ඒක කියන්න ගියොත් මේ වෙලාව මදි"

"මී. වෙලාවක් දාලා කියන්න හොඳේ."

"අපි දිනනවා කියලා මම දැනගෙන උන්නා."

"ඒත්"

"ඇයි සුද්දි."

"අපි ඇත්තටම දිනුවා වෙන්නේ අද රෑට. ඒ සටනත් අපි ජගන්නම ඕන."

"මට දැන් අප්පච්චි කතාකළා. එයා එළියේ ඉඳලා හැමදේම බලාගෙන ඉඳලා. අප්පච්චිට සතුටුයි."

"පච්. එයාගේ නෝනා හදපු තැන මේක."

"ඒක කමක් නෑ. අප්පච්චි අද රෑට එන්න ලෑස්තිවෙලා ඉන්නේ. උදේ මහගෙදරට ගේන්න රිදී

පනහක් අරන්. අම්බලන්ගොඩින් ගෙන්නගෙන. හරිම ලස්සන එකක්."

"ඉතින් අප්පච්චි අපිට පහනක් දුන්නනේ. ඇයි තව එකක්"

භාවනා ඇසුවාය.

"අප්පච්චි දුන්නා. පහනක්..කෝ."

දේවක ඇසුවේය. ඇය දීප්තිමත් දෑසින් සිනාසුනාය.

"මේ ඉන්නේ. අපේ දොළොස් මහේ පහන. අපිටනම් ඒ ඇති."

ඇය ඔහුගේ මුහුණ පුතෙක්ගේ මුහුණක් දෝතින් ගන්නා අම්මා කෙනෙක් මෙන් ගත්තාය. දේවකගේ දෑස්වල තුනී තෙතමනයක් විය. එය භාවනාව පුදුම කරවන්නක් විය.

"අනේ ඇයි මේ."

ඇය ඔහුගේ දෑස්වලට ඇඟිලිතුඩු තබා ඇසුවාය.

"කඩුගන්නාව කන්ද බැහැගෙන එනකොට ජීවිතේ මොකක්ද හාස්කමක් වෙනවා වගේ දැනුණා සුද්දි. ඒත් මේ වගේ දෙයක් වෙයි කියලා."

ඇය ඔහුගේ පපුවටම බරවූවාය.

"මාව දැක්කට පස්සෙවත්"

"මං සුද්දිව අඳුනගත්තා. ඒත්"

"අඳුනගත්තා කිව්වේ."

"ගිය ආත්මේ මාත් එක්ක හිටපු කෙනා කියලා."

ඇය ඇස් පියාගෙනම මොහොතක් උන්නා. මේ බැඳීමට කොහොමත් මේ මාස දෙක තුනට වඩා එහා ගිය අතීතයක් තිබිය යුතුමය. නැත්නම් මේතරම් හුරුපුරුදු බවක් දැනෙන්ට හේතුවක් නැත.

“හවස මං චුට්ටක් ළඟ පන්සලටත් දුවලා තමයි යන්නේ. හොඳද?”

දේවක බලාගෙනම උන්නේය. ජීවිතයේ හැමදාමත් හාස්කම් වෙන්නේ නැත. එහෙත් විශ්වාසයෙන් සිටිය යුතුය. තදබල විශ්වාසයක් ඇතිවිට දෙවියන්ට පවා සමහර දේවල්වලට අත තියන්නට බයක් දැනෙයි.

“මම දෙවියන්ට එක දෙයක් කියලා තියෙන්නේ.”

දේවක ලොකු හුස්මක් පපුවට ගෙනම කීවේය.

“මොකක්ද?”

“මට දීපු දේ ගැන මම හරි භක්තියෙන් ඉන්නේ. සමහරවිට කිසිම පවක් මගේ අතින් වෙන එකක්

නැතිවෙයි. ජීවිත කාලේ පුරාම මම පින්ම දෙයි. එච්චර දෙයක් මට දුන්නේ. හැබැයි දෙයියෝ ඒ දේ මට පෙන්නලා ආයේ ගත්තොත්. ආයේ මම දේවාලයක් කෝවිළක් දිහා බලන්නේවත් නෑ කියලා මම කියලා තියෙන්නේ."

ඇය හිස ඇලකර බලාගෙන උන්නාය.

"මාව දෙයියෝද ඉතින් දුන්නේ."

"එහෙම විශ්වාස කරනවා සුද්දි"

"ඔයා කියනවානම් එහෙම වෙන්න ඇති."

ඇය ඔහුගේ දෑස්වල ඇස් අලවාගෙනම බලාගෙන උන්නාය. නපුරක් අහිතක් වේයැයි නොසිතෙන තරමටම මේ ආදරය විශ්වාසය.

# 36

ජීවන් තම බිරිඳගේ පින්තූරය දෙසම බලාගෙන උන්නේය. ඔහු අද ඇයව සිහිකරමින් එන ගමන් කළුතර බෝධිය වඳින්නට ආ වයසක අම්මාරුවන් සිය දෙනෙක්ට ක්‍රීම් ක්‍රැකර් බිස්කට් පැකට් සීයක් සහ වැනිලා කිරි පැකට් සියයක් දන් දුන්නේය. මේ පින්කම මුළින්ම ඇයත් සමඟ කළ අයුරු ජීවන් සිහිකළේය. ඒ අදින් වසර විසි පහකට පමණ

පෙරය. දේවක ඉපදෙන්නටත් පෙරය.

"ජීවිතේ කිසිම බලාපොරොත්තුවක් නැතුව යන්න එන්නත් තැනක් නැතුව පන්සල් ආපු අම්මලා හවසටත් තේ ටිකක් නැතුව මහත්තයෝ ඉන්නේ. අපි අද ජෑම් බනිස් එක්ක කිරි පැකට් බෙදමු. අද අපේ මහත්තයගේ උපන් දිනේට කරන පින්කම ඒක තමයි ඕන්න"

එදා ජෑම් පාන් ගෙඩි දෙසීයක් පමණ බිස්කට් පෙට්ටිවල දමාගෙන කිරි පැකට්ද ගෙන කළුතර බෝධි මළුවේ උන් වයස්ගත උපාසකම්මලාට උපාසක මහත්තයලාට බෙදූ අයුරු ජීවන් සිහිකලේය. ඇයට හැමදාම තිබුනේ ඒ වැනි පින් දහම්ය. අරම අකල් මරණයක් උරුම වූයේ එහෙම

පින්කළ ඇයටය. මේ පින්කම කරද්දී දේවකත් ළඟ උන්නානම් හොඳය. එහෙත් ඔහු එතන සිටිය යුතුමය. සීගිරි පවුල තම කොල්ලාට දුන්නේ ලේසි පාසු අභියෝගයක් නොවේ. ඒ අභියෝගය කොල්ලා දැන් දිනා හමාරය. එකක් ලේවලින් ආ ශක්තියෙනි. අනිත් එක පෙඩි එක දක්ෂය.

ජීවන් කළුතර සිට කොළඹ ආවේ අද රාත්‍රියේ මුහුණ දෙන්නට වෙන දේ ගැනය. වසර විසි ගණනකට පසුව සීගිරි නිවසට යන්නේ ඇය නැතිවය. ඇගේ මතකයන් ගුලිවී ඇති සීගිරි මහගෙදරට පය තබද්දී හදවතට කම්පනයක් දැනෙනු ඇත. එය ඉවසාගෙන සිටිය හැක. අද මේ ගෙදරට යන්නේ වසර විසි ගණනකට පසුව ඒ ගෙදර පොඩි

දුවව ඉල්ලාගෙන ගියාක් වැනිම වූ දෙයකටය. තම කොල්ලාට ඒ ගෙදර පොඩි දුවව දේදැයි දන්නේ නැත.

මීට වසර විසි ගණනකට පෙර තමා මුහුණ දුන් දෛවයේ ඒ රුදුරු දුකට තම කොල්ලාටත් මුහුණ දෙන්නට වුවහොත් කොතරම් දුකක් වේ දැයි ජීවන් දන්නේ නැත.

"හැමදේම තියෙන්නේ උඹයි තාත්තයි අතේ මිලී. මම මගේ කොල්ලව සීගිරි එකට එව්වේ මෙහෙම උඹේ දුව එක්කගෙන වරෙන් කියලා නෙමේ. ඒත් එහෙම දෙයක් වෙලා. මොනවා කරන්නද? පුළුවන්නම් එක පාරක් මගේ කොල්ලව විශ්වාස කරපන්. උඹ වගේම ආදරෙන් කෙල්ලව කොල්ලා බලාගනී"

මේ ටික මිලින්දට කතාකර දැන්මම කියන්නට හැකිනම් කියා ජීවන්ට සිතෙයි. කොහොමත් ජීවන්ගේ පපුව තිබුනේ සාමාන්‍ය තත්වයේ නොවේ.

"මං ගෙදර ආවා පුංචි මහත්තයෝ"

ජීවන් ගෙදරට පය තැබූ විගසම කොල්ලාට කතාකර කීවේය.

"ඉක්මනට එනවා අප්පච්චි. සීගිරි එකට සෙනඟ උතුරනවා. පාකින් ඔක්කොම ෆුල් අප්පච්චි. මට පැයක් දෙන්න"

භාක්කම සිදුවි ඇත. ජීවන්ට බැලුනේ ඔහුගේ නැතිවූ බිරිඳ දෙසය.

"පරිස්සමින් එන්නකෝ."

ජීවන් එහෙමම පුටුවකට බරවිය. අද කවරදාකවත් නැතුව ඔහුගේ

පපුවත් රිදෙයි. සමහරවිට මේ මුහුණ දෙන තත්වය නිසා විය යුතුයැයි ඔහු සිතුවේය.

"අද මොන දේ වුනත් ඔයාට දරාගන්න වෙනවා. ජීවිතේ එහෙමයි. දුක පපුවේ මිරිකගෙන ජීවත්වෙන්න වෙනවා. සමහර වෙලාවට මුළු ජීවිත කාලෙම පුතේ. ඒක ලේසි නෑ. ඒත් කරන්න වෙන දෙයක් නැත්නම් මේ ඇත්තට මුහුණ දෙන්න වෙනවා."

කොල්ලාට ඒකට ශක්තියක් ඇත්දැයි ඔහු දන්නේ නැත. අහිමිවීම් නොදැකපු කොල්ලෙක් නොවේ. එහෙත් ආදරයේ අහිමිවීම ඒ හැම නොලැබීමකටම වඩා දරාගැනීම දුෂ්කරය.

ජීවන්ගේ දුරකථනයට ඇමතුමක් ලැබිණ. ඔහු බැලුවේය.

කතාකරන්නේ භාවනාය.

"කියන්න පොඩ්ඩි පුතේ. මං මේ දැන් ගෙදර ආවේ."

ජීවන් ආදරයෙන් කීවේය. කෙල්ලගේ කටහඬ ඇහෙද්දී ජීවන්ටත් පුදුමාකාර තෘෂ්ණාවක් දැනෙයි. පතනවානම් ගැහැණු දරුවෙක් ඇය වාගේ කෙනෙක් විය යුතුය. ඇය වාගේ කෙනෙක් නොව ඇයම විය යුතුය.

"අප්පච්චි හිතේ බයකින් නේද ඉන්නේ. මට කියන්න"

ඇය ඇසුවාය.

"ඔයාට බොරුවක් කියන්න බෑනේ පුතේ. බයක් නැතුවමත් නෙමේ. අවුරුදු විසි හතරකට විතර පස්සේ මම ඔය ගෙදරට අඩිය තියන්නේ. මට එන්න අවසර තිබුනේ නැති

ගෙයක්නේ"

"දන්නවා අප්පච්චි. ඒත් ඒ තීරණය නිසා එයාලා සෑහෙන දුකක් විඳින්න ඇති. සීයා වුනත් පස්සේ කාලෙක එහෙම දුක් වුණා. අතෑරියේ වටින බෑනා කෙනෙක් කියලා එයාට හිතෙන්න ඇති."

ජීවන් සුසුමක් හෙළුවේය.

"අම්මා කොහේහරි ඉඳලා අපිට පිහිටවෙයි අප්පච්චි. අප්පච්චි බයවෙන්න එපා. මං ඉන්නවනේ. මගේ අප්පච්චි නෑවිත් ඉන්න එපා හොඳේ."

භාවනා කරුණාබරව කීවාය.

"නෑ පුතේ. එනවා. ඔයයි මගේ කොල්ලයි වෙනුවෙන් එනවා. මට මගේ  දුවව ඕන. ඔයා මගේ දුවම වෙන්න ඕන මැණික."

"අනේ..ඉතින් මාත් අප්පච්චිගේ කෙල්ලනේ. දැන් කොල්ලා විතරක් නෙමේ ඉන්නේ"

භාවනා මේ වචන ටික මෙහෙමම කීවාය.

"ලැබෙනවානම් පුතේ මේ දැන් ඔයාව එක්කගෙන එනවා."

ජීවන් කියූ දේට භාවනාගේ දෑස් තෙත්විය.

"දන්නවා අප්පච්චි. අට වෙද්දී එන්න. දේවකයියව මම කොහොමහරි වේලාසන එවන්නම්. මේ දුවනවා දුවනවා මටවත් අල්ලග න්න නෑ. ඔයාගේ පුංචි මහත්තයා සීගිරි එකට භාස්කම් කියන්නේ මොකක්ද කියලා ඔප්පු කරලා පෙන්නුවා."

"මම එනවා පුතේ. හවස

කළුතර අම්මව මතක්කරලා පොඩි පින්කමකුත් කරලා ආවේ. මං ඔය දෙන්නා ගැනත් හිතලා කළේ.”

“ඒක හොඳයි අප්පච්චි. මට මේ දවස් ටික දෙන්නකෝ. මං ඔයාව දවසක මේ අත්දෙකින් බලාගන්නවා. මට අද එච්චරයි පොරොන්දු වෙන්න පුළුවන්.”

හැම දරුවෙක්ම මේ ටික කියන්නේ නැත. බැඳීම් කියන්නේ මේවාටය. දෙවියන් එවැනි බැඳීමකට දෙයක් කරන්නේ නැත්නම් දේවාලවල වැඩ ඉඳීමත් පව්ය.

# 37

මිලින්ද වේලාසනම නිවසට ආවේය. ඉඳුනිල් උන්නේ වැඩට ඉන්නා අයවත් හවුල් කරගෙන රෑ කෑම සූදානම් කරමිනි. අද හවස නිවසට එන දෙදෙනා කවුදැයි කිසිවෙක් දන්නේ නැත. කළින් ඉඳුනිල් සිතාගෙන උන්නේ කෙල්ල එක්කාගෙන එන්නේ දේවකව කියාය. එහෙත් පසුව ඇය කීවේ 'ඔයාලා දන්න දෙන්නෙක්ව එක්කගෙන

එනවා' කියාය. ඒ කවුදැයි ඇය කීවේ නැත. ඉඳුනිල් මේ රෑ කෑම සූදානම් කරන්නේ එන කෙනෙක් ගැන දන්නේවත් නැතිවය.

මිලින්ද ආ විගසම ඉඳුනිල්ව සොයාගෙන ආවේය.

"සීගිරි එක උතුරනවා ඉන්දු. පාරට දාගන්නවත් බෑ. පාකින් ඔක්කොම පිරිලා. මම පාරේ නවත්තගෙන ටික වෙලාවක් බලාගෙන ඉඳලා මේ එන්නේ"

ඉඳුනිල් සිනාසුනාය.

"අර දරුවගේ වැඩ තමයි. මටත් දැන් කෙල්ල කතාකළා. හෙලවෙන්න බැරුව කිව්වා ඉන්නේ. අද සීගිරි ඉතිහාසයේ වැඩිම කලෙක්ෂන් එක කියන්නේ. ඒක බලන්නවත් කම්පියුටර්ස් ළඟට යන්න බෑලු.

ඒ තරමට කැෂියර් පොයින්ට්ස්වල පෝළිමලු"

"එහෙම නොවුනොත් තමයි පුදුම. තාත්තත් හරිම සතුටින් කතාකළේ."

"ඒකව දැක්ක මුල්ම දවසේම මට හිතුණා. වාසනාවන්ත දරුවෙක්. දක්ෂයි ඔක්කොටම වඩා."

"සුද්දි කතාකලා කිව්වා නේද?"

"ඔව්."

"එන දෙන්නා කවුද ඉන්දු"

ඉඳුනිල්ද බැලුවාය. ඇයගේ දෙනෙත්වල වූයේද ප්‍රහේලිකාවකි.

"මටත් හිතාගන්න බැරුව ඉන්නේ. තාත්තත් මගෙන් දැන් කතාකරලා ඇහුවා"

"මේ කෙල්ල හරි පුදුම කෙල්ලෙක්නේ. කියන්න එපැයි"

"ලොකු දුව දන්නවා ඇතිනේ."

"එයත් කියන්නේ නෑ. නංගිට එයා කරන දෙයක් කරන්න ඉඩදෙන්න කියලා කිව්වේ."

"තව පැය දෙක තුනකින් ගෙන්නන කෙනෙක්ව ගෙන්නන්න එපැයි. බලමුකෝ අපි.  එන කවුරු වුනත් විශේෂයි කියලා මම මේ රෑ කෑම ටික හදන්නේ"

"ම්."

මිලින්ද උඩ මහළට නිකමට යන්නට ආවේය. ඇය මඟදී නැවතුවේ පියගැටපෙළ අසළම වූ බිත්තියේ ගසා තිබූ සීගිරි පවුලේ පින්තූර දැකය. ඔහුගේ දෙනෙත් නරත වූයේ නර්මදාගේ පින්තූරය අසළය. දේවකගේ අම්මා ඇය බව මිලින්ද දන්නේ නැත.

"ඔයාව අද දවලුත් මට

මතක්වුණා. අවුරුදු විසි ගාණකට පස්සේ අද එදා වගේම සීගිරි එක උතුරනවා. ඔයත් කොහේහරි ඉඳලා බලාගෙන ඇති කියලා මට හිතෙනවා. ඔයා කියපු සමහර දේවල් ඒ දවස්වල අපිට කරන්න බැරිවුණා. ඒත් මේ අලුතින් ආපු කොල්ලා ඒවා දැන් කරනවා. ඉතින් මට ඔයාවත් මතක් වුණා"

මිලින්ද ඇගේ පින්තූරය අතගාමින් සිතුවේය. තේ එක අරන් ආ ඉඳුනිල් එය දැක්කාය. මොකක්ද හේතුවක් නිසා ඇගේ දෑස් තෙත්විය.

"මටත් අද උදේ ඉඳලා නංගිව මතක්වෙනවා."

ඇය කීවාය.

"අද වගේ දවසක ඉන්න තිබුණා."

"ම් පව්. සැපක් වින්දේ නැති

කෙල්ල."

මිලින්ද උඩට ගියේ ඇස් පිසදමමිනි. ඔහු කොතරම් ඇයට ආදරය කළාදැයි ඉඳුනිල් දනී. ඇය වුව එහෙමය. මේ බොහෝ දෙනෙක්ට වඩා වටිනාම සහෝදරිය ඇයය.

අද හවස භාවනා කවුරුවන් එක්කාගෙන ඒදැයි සිතාගන්නට ඉඳුනිල් උත්සාහ කළාය. 'අර දරුවත් තාම සීගිරි එකේනේ. මං හිතුවා එයා කියලා. ඒත් දැන්. ඇරත් දෙන්නෙක් කවුද?' මේ පැය දෙක තුන ඉවසාගෙන ඉන්නට සිදුවෙන බව ඉඳුනිල් තේරුම් ගත්තාය. එන්නේ කවුරුන් වුව ඒ එන අය කෙල්ලගේ ජීවිතයත් දෛවයත් සමඟ බැඳුණු අයෙක් විය යුතුයැයි ඉඳුනිල් සිතුවාය.

# 38

තාරකා කොළඹ පිහිටි එවම්රේට්ස් කාර්යාලයට ගොස් සීගිරි එකට ආවේ ඉක්මනිනි. සීගිරි එක වාහනවලින් පිරී ඇති අයුරු ඇය රස වින්ඳාය.

"ඔයාව මගේ නංගිට දෙන්න හිතුවේ මේ සිගිරි එකට එන සෙනඟ දැකලා නම් නෙමේ පොඩි මස්සිනේ. ඔයාගේ මනුස්සකම් දැකලා. අපේ පවුලට ඔයා වගේ කෙනෙක් ඕනමයි. නිකමටහරි නිකමටහරි ඔයාට

කවුරුහරි අකමැති වුනොත් අද මගෙන් හොඳ කතා දෙක තුනක් අහගන්නවා. අවුරුදු විසි ගාණකට කලින් ඔයාගේ අප්පච්චිව අපිට නැතිවුණා. උන්නානම් මේ ඉන්න ඇල්බීසියා ගස් වගේ බාප්පලා නෙමේ අපිට ඉන්නේ. ජීවන් බාප්පා වගේ කෙනෙක්. ඒත් එයාව අපිට නැතිවුණා. ඔයාවත් අපිට නැතිකරගන්න බෑ. කොහොමටවත් බෑ”

තාරකා සිතුවාය. ඇය කැබ් රියේ ඉඳගෙනම දේවකට ගත්තේය.

“තරූ. එන්නකෝ ටිකක් මේ පැත්තට.”

දේවක කීවේය.

“අනේ. මම මේ එළියේ ඉඳගෙන උඹේ දක්ෂකම් රස විඳිනවා කොල්ලෝ. අයි කාන්ට් එක්ස්ප්‍රස්

මයි ෆීලින්ස්. උඹ කියන්නේ මට ඇඬෙනවා."

තාරකා කීවාය. ඒ කතාවට දේවකගේද දෙනෙත් රතුවිය.

"එක දෙයක් උඹට අද පොරොන්දු වෙනවා"

"කියන්න තරූ"

"මං උඹව කෙල්ලට නැතිවෙන්න දෙන්නේ නෑ. ගෙයි සාලේ මැද පෙරළිලා හරි ගිනි තියාගෙන හරි උඹව කෙල්ලට අරන් දෙනවා."

තාරකා කීවාය.

"පින් තරූ. මට එයාව නැතිකරන්න බෑ. ඔයා වගේ කෙනෙක් අක්කා වගේ කෙනෙක් නැතිකරගන්නත් බෑ"

"උඹව වටින්නේ කෙල්ලට විතරක් නෙමේ බං. අපේ පවුලටම උඹව

ඕන. මං ඔය ජීවිතේම අනාගත්ත කාලෙක මං ගැනත් ටිකක් බලපන් හොඳේ”

තාරකා කීවාය.

“එහෙම වෙනවද බං පොඩි අක්කේ උඹට.”

දේවක කරුණාවෙන් කීවේය.

“ජීවිතේ ගැන එහෙමට කියලා ෂුවර් එකක් නෑ බං. උඹ වගේ සත්තරං කොල්ලෝ ගොඩක් නෑ.”

තාරකා කීවේ අවංකවමය.

“එනිවේ ෆිට් එකේ වරෙන් කොල්ලෝ. අප්පච්චිටත් කියපන් බයවෙන්න එපා කියලා”

“මං දන්නවා තරූ”

“මං තිබ්බා. ටේක් කෙයා”

තාරකා දේවකට කතාකර දෙනෙත් පිසදා ගත්තාය. අද නරක

දෙයක් වේයැයි තාරකා සිතුවේ නැත. සීයා වුව කරපු දේවල් ගැන දැන් පසුතැවෙන බව ඇය දැනගෙන උන්නාය. ඇරත් ජීවිතයේ කළ මෝඩකම් ගැන පසුතැවෙන්නට අවුරුදු විස්සක් විසිපහක් වැඩිත් එක්කය.

දැන් ගෙදර ගිය ගමන්ම අම්මා තමාව අල්ලාගන්නා බව තාරකා දනී. හවස එක්කාගෙන එන්නේ කවුදැයි කෙල්ල තවමත් කියා නැත. එන්නේ කවුදැයි තමාත් අක්කාත් දන්නා බව අම්මා හොඳින්ම දනී.

"අනේ සුදූ. අම්මට කියන්න එපා. එයත් ආදරේ කෙනානේ. මට පුදුම කරන්න දෙන්න."

භාවනා දැන් ටිකකට කලින් කතාකර කීවාය.

"ෂුව බං. උඹටයි දේවකටයි අද ඔතනින් ගැළවෙන්න පුළුවන් වෙයිද?"

තාරකා ඇසුවාය.

"මගේ ජීවිතෙත් ගළවගන්නත් එපැයිනේ සුද්දූ. කැෂියර් මැෂින්වලට කෙල්ලෝ ටික දාලා පනිනවා."

"වරෙන්. ෆයිනල් මිෂන්."

තාරකා සිනාසී කීවාය.

# 39

භාවනා කාමරයේදී දේවකගේ නළලට හාදුවක් දුන්නාය.

"ද්‍රාඩිය සුද්දි."

ඔහු කීවේය.

"ද්‍රාඩිය මොනවද ඉතින් වෙන ඒවා"

භාවනා කියාගෙන ආ දේ ගිලගෙන සිනාසුනාය.

"හැදිලා ඉවරයි."

"කවුද මාව නරක් කළේ. මංද?"

"නෑ නෑ මම."

"ඇත්ත පිළිගන්න දේවකයියේ. අපිව කැන්ඩි හෝටලේදී මේ."

දේවක ලැජ්ජාවෙන් බිම බලාගත්තේය.

"හරි හරි ඉතින්. අපිත් ඉතින් නිකං හිටියේ නෑ තමයි. මේ පහ වසරේ ළමයෙක් වගේනේ."

දේවක භාවනාගේ නැහැය මිරිකුවාය.

"යන්න. ෂෝයි ඇඳන් එන්නමං බලාගෙන ඉන්නවා"

"වීල් එකක් අරන් යනවා සුද්දි. ඉක්මනට එනවා"

දේවක භාවනාගේ හිසමෙ අතගා කාර්යාලයෙන් පිටතට ආවේය.

තවමත් සීගිරි එක පුරාම වාහනය. ඔහු ඒ සාර්ථකත්වය වින්දේය. 'මේ මොන දේ සක්සස් වුනත් වැඩක් නෑ මට ඔයාව ලැබෙන්නේ නැත්නම්. හෙට තමයි ඇත්තටම මේ දේ විඳින්නේ.' ඔහු සිතුවේය.

දේවක පාරේ ආ ත්‍රී වීල් එකකට අතදමා ගොඩ වුනේය.

"පුළුවන් ඉක්මනට අතුරුගිරියට යමු."

දේවක කීවේය. හද ගැස්මක් හද කපාගෙන එයි. එය ඉවසාගෙන ඉන්නට අමාරු දෙයකි.

"අප්පච්චිවයි මාවයි බලාගන්න අම්මේ. ඔයාගේ මහගෙදරට යන්නේ"

ඔහු මියගිය අම්මාව සිහිකර කීවේය. දේවක පපුව අතගාගත්තේ ඒත් සමඟය.

භාවනා මඟ දිගටම සිතුවේ අද රෑට මොනවා අඳිනවාද කියාය. එන්නේ දුප්පත් කොල්ලාත් අප්පච්චීත් වුව එය මංගල ගමනකි. සාය කෑල්ලක් බ්ලවුස් කෑල්ලක් පටලාගෙන ඉන්න පුළුවන. එහෙම කළත් ඔහුත් අප්පච්චීත් කිසිවක් හිතන්නේ නැත. එහෙත් එහෙම ඇඳ බාල්දු කරන්නේ ඒ ජීවිත දෙකය. භාවනා ඊට සූදානම් නැත. කොහෙත්ම සූදානම් නැත.

මේ ජීවිතයේ දෛවෝපගත දවස අදයැයි ඇයට සිතෙයි. එක පැත්තකින් දේවකය. ඔහු මියගිය නැන්දාගේ එකම පුතාය. මේ කිසිවෙක් ඉතාම කුඩා කාලයේදී ඇරෙන්නට නැන්දාගේ පුතාව දැක නැත. අනිත් පැත්තෙන් සීගිරි එකට මේ හාස්කම කලේ ඒ නැන්දාගේ

පුතා වූ දේවක බව කිසිවෙක් දන්නේ නැත. මේ දෙන්නාම එක්කෙනෙක් බව කියන්නේ අදය.

සියල්ලටම වඩා වැදගත්ම දේ අවුරුදු විසි ගණකකට පසුව මේ සීගිරි මහගෙදරට පය තබන ජීවන්ය. ඔහුව දෛවයේ එක අඳුරු මොහොතකදී මේ සීගිරි මහගෙ දර පිළිගත්තේ නැත. එදා ඔහුව පිළිගත්තේ නැති සීගිරි පවුල අද ඔහුව පිළිගනීද කියා භාවනාට හරියටම කියන්නට අමාරුය. එහෙත් දේවක පුංචි බණ්ඩාරව අද සීගිරි පවුලට ප්‍රතික්ෂේප කරන්නට බැරිය. ඔහු එක කාලයක මේ ගෙදරින් එළියට දැමූ මේ ගෙදරින් කසාදයක් දෙන්නට බැහැ කියා එලවූ ජීවන්ගේ එකම පුතාය. එදා අප්පච්චීට

කරන්නට බැරිවූ දේ අද පුතා කර පෙන්වූවේය.

භාවනා නිවසට ආවේ අද සීගිරි පවුලට දෙන මේ දෛවෝපගත සර්ප්‍රයිස් එක ඔවුන් කොහොම දරාග නීද කියාය.

අය හිතින් බාර දෙකක්ම වී උන්නාය. මාළිගාවටද බාරවී තිබුණි. ඒ බාර කිසිවක් ඉටු නොවෙන්න විදිහක්ද නැත.

"හැමදේම දෙවියන්ට බාරදීලා මායි දේවකයියයි නිකම් හිටියේ නෑනේ. අපිත් විඳින්න තියෙන හැම දුකක්ම වින්ඳා. මගේ කොල්ලා පොලිස් කූඩුවේ හිටන් ගියා. මට එයාව ගන්න උසාවිත් යන්න වුණා. අපිට පාරවල් දිගේ කේක් විකුණ විකුණ යන්නත් වුණා. මේ මහගෙ

දර සාලේ කෑ ගහහ අඬන්නත් වුණා. හැමදේම කරලා අන්තිමට තමයි දෙවියන්ට ඇවිත් කිව්වේ පොඩ්ඩක් බලන්න කියලා. දෙවියන්ට ඒකත් කරන්න බැරිනම් ඒ ටිකත් අපිම කරගන්නම්.”

ඇය කීවේ තරමක් තද වේදනාවකිනි. භාවනා නිවසට පය තැබුවේ මුහුණ සාරි පොටින් පිසදමමිනි. ඉක්මනට උඩට ගොස් අද රෑ අඳින්නට සාරියක් ලෑස්තිකරගත යුතුය. හෙප්පු අල්ලගන්නට දෙයක් නැත. ඒ අත් දෙක අල්ලාගෙන අවසානය. එහෙත් අද කරන්නට යුතුකම් ටිකක් ඇත.

“තියෙන සාරියක් පටලගන්නවා. එකපාරම අපිට බැරියෑ වෙඩින් සාරියම අඳින්න නේද?”

ඇය සිතින් තමාටම කියාගත්තාය. ගෙදරට එද්දීම කහ බතක සුවඳක් දැනුණි. අම්මා ඒ අතින් යුතුකම් හරියටම ඉටුකරන අම්මා කෙනෙකි. ඇය සාරි පොටින් මුහුණ පිසදමමින්ම කුස්සියට ගියාය.

“කට්ලට් එයාලා ආවමම බදින්නද අම්මා තියන්නේ.”

“එහෙම තමයි හිතුවේ. ඇයි?”

“කමක්නෑ වේලාසන බැදලා තියන්න. අපිට ඒ වෙලාවට ගොඩක් කතාකරන්න තියෙයි”

ඉඳුනිල් ප්‍රශ්න හය හතක්ම මුහුණ මත තබාගෙන පොඩි දුව දෙස බැලුවාය.

“මටවත් මේවා කියලා තිබුනානම් හොඳයිනේ මැණික. තාත්තත් අහනවා මගෙන් සීයත් අහනවා. මං කියලා

මොනවා කියන්නද?”

අම්මා අසරණය. ‘මං ඊට වඩා අසරණයි අම්මේ.’ ඇය සිතින් කීවාය.

“මේ පැය දෙක ඉවසන්න. නරකකට කියනවා නෙමේ අම්මා.”

ඉඳුනිල් දෙනෙත් පිසදාගත්තාය.

“ඔයා අඬන්න එපා. මේ දෙන්නා ආවට පස්සේ ඔයා කොහොමත් අඬනවා. ඔයාට අඬන්න වෙනවා. ඒ නිසා දැන්ම අඬන්න එපා. ඒකමයි තාම කියන්නෙත් නැත්තේ.”

“මේ මොනවද සුද්දි කියන්නේ.”

“කාලයක් නොකියම උන්න දෙයක්. කතා නොකරම උන්න දෙයක්. ඒත් අද මේ මහගෙදර කතාකරනවා. මේ පැය දෙක දෙන්න. මම උඩට යනවා අම්මා. සාරියක් පටලගන්න

තියෙනවා"

ඉඳුනිල් හැරී බැලුවාය.

"එයාලව පිළිගන්නද සාරියක් අඳින්නේ"

"මී. එහෙම නැතුව බෑ. හැමදෙයක්ම කරන විදිහක් තියෙනවා අම්මා. කාට නැතත් මට මේ දෙන්නා එන එක වැදගත්. තීරණය ඔයාලා ගන්න. මම ඒකට බලපෑමක් කරන්නේ නෑ. ඒත් මට මේක කරන්න දෙන්න."

ඉඳුනිල් කතාකරන්නට ගියේ නැත. අද වෙන්නේ කුමක් හෝ බරපතල දෙයක් බවනම් ඇයට විශ්වාසය.

භාවනා නිකමට නේත්‍රාගේ කාමරයට ගියාය.

"එතන දාලා එන්න බෑ. රෑ වෙලා හරි යනවා. ඒත් මම ආවා අක්කා."

"කමක් නෑ සුදූ. කොල්ලා හැමදේම හරියට බලලා කරලනේ තියෙන්නේ. සිස්ටම් එක යනවා."

"හෙට ඉඳලා මොනවා කරන්න වෙයිද දන්නේ නෑ."

"එහෙම වෙන්නේ නෑ. මටත් මේ ගෙදර කරන්න පුළුවන් දෙයක් තියෙනවා. තාරකත් ආවා. සැලෝන් එකට දුවලා එන්නම් කියලා ගියා."

"මාත් සාරියක් අඳිනවා."

"ඒක හොඳයි. මේක උඩ ඉඳන් බෑ. නැත්නම් මාත් කොල්ලා එන දවසට සාරියක් අඳිනවා. අපේ එකානේ. ඒකව මෙහෙම සාය කෑලි පටලවාගෙන පිළිගන්න දුකයි."

"අද රත්වෙයිද නිවෙයිද කියලා කියන්න දන්නේ නෑ."

"රත්වුනොත් නිවමු. නිවුනොත් පත්තුකරමු. එන විදිහකට බලමු. අපි තුන්දෙනෙක් මෙතන ඉන්නවා. අම්මා ගැනත් බයවෙන්න එපා. සීයයි තාත්තයි තමයි. ඒත් තාත්තා ජීවන් බාප්පට පණ ඇරලා."

"ඒ කාටවත් දේවකයියට විරුද්ධ වෙන්න බෑනේ"

"ඒකා එහෙම කෙනෙක්. අපි මේ පැය දෙක බලමුකෝ."

භාවනාද එසේම සිතුවාය. හිතට බරක් තියෙන වෙලාවක පැයක් යනු සතියක් මෙන්ය. 'දැන් ගිහින් නානවා පැයක්. පස්සේ ඇවිත් කෑම මේසේ දානවා. දෙන්නා ආවට පස්සේ මේස දානවා බොරු.' ඇය සිතුවාය.

භාවනා උඩ කාමරයට ගොස් දේවකට ගත්තාය. ඔහු තවමත්

මඟය.

"සිස්ටම් එකක වර එකක් ඇවිත්. මේ දැන් බලලා යන ගමන් සුද්දි."

"ඇයි ගියේ. ඒ මැෂින් එක නවත්තන්න තිබුනනේ. ඒ සිස්ටම් වරස් හදන්න ගිහින් අපේ සිස්ටම් එක වැරදුනොත්."

"මං හිතන්නේ නෑ. ඒක වැරදෙන්න හදපු සිස්ටම් එකක් නෙමේ."

"ඒ ඉතින් මං නිසානේ"

භාවනා සිනාසී කීවාය.

"ඇත්තම කියන්නද"

"ම්."

"උඹ නිසා තමයි"

"විහිළුවට කිව්වේ. අපි මොන කබ්බෝද? ඔයානේ මැණික. දේවක පුංචි බණ්ඩාර. ඒ හාස්කම කලා.

මෙතන තතාව යන්නේ එහෙමනේ."

"මං ඉක්මනට එනවා."

"බලන් ඉන්නවා. මමනේ පිළිග න්නේ. අප්පච්චිට පස්සෙන් එන්න කියන්න. මට ඔයාව මුළින්ම පෙන්නන්න ඕන. ඊට පස්සේ අප්පච්චිව. ටිකක් නිවලා රත්කරන්න ඕන."

"වෙන දේ ඒ වෙලාවට බලමු. මං ඉක්මනට එන්නම්. වාහනේ තියෙනවනේ"

භාවනා දිග සුසුමක් පිටකර දුරකථනය වසා දැමුවාය. ආයේ කතාකරන්නට කෙනෙක් නැත.

# 40

රඹුක්වැල්ල මහතා කුස්සියේ රවුමක් ගසන්නට ආවේ අලුත් කලිසමකුත් අලුත් කමිසයකුත් ඇඳගෙනමය. ඔහු අද මේ නිවසට එන අමුත්තන් පිළිගන්නට සැදී පැහැදී උන්නේය. එන්නේ කවුරු හෝ කෙල්ලගේ ජීවිතය සමඟ තදින් බැඳුණු කෙනෙකි. එක දෙයක් දැන් ඔහු පොරොන්දු වී අවසානය. ඒ කෙල්ල ඇගේ ජීවන ගමනට

තෝරාගන්නේ කවුරු හෝ ඒ කෙනාට තම ඡන්දය පාවිච්චි කරන බවය. අවුරුදු දෙකේ තුනේ සිට තමාගේ වටේ කැරකි කැරකී උන් කෙල්ලට එහෙම සාධාරණයක් කළ යුතුව ඇත.

ඇගේ සතුට තමාගේ සතුටය. කෙල්ලගේ අහිංසක ලෝකය නැතිකර ලබන්නට සතුටක් නැත.

"මොනවත්ම කියන්නේ නැද්ද දුවේ"

රඹුක්වැල්ල මහතා ඉඳුනිල්ගේ අතින් තේ එක ගෙන ඇසුවේය. ඉඳුනිල් බැද්ද කට්ලට් එකක්ද පීරිසියකට දමා ඔහුට දුන්නේය.

"ඒකනේ කියන්නේ තාත්තේ. මේ දැනුත් මම අඬලා ඉන්නේ. කියන්නේ දැන් අඬන්න එපා එයාලා ආවම

අඬන්න වෙයි කියලා. මහ ගැටපද කියන්නේ. මටම තේරෙන්නේ නෑ මේ කෙල්ල කවුරු එක්කගෙන එන්න ඉන්නවද කියලා."

"මං හිතුවා මේ අපේ දේවක පුතා කියලා."

ඉඳුනිල්ද හිස වැනුවාය.

"මෙතන තාත්තේ මොකක් නමුත් දෙයක් තියෙනවා. මේ කෙල්ලෝ තුන්දෙනාම ඒක දන්නවා. ඒත් කියන්නේ නෑ. අක්කලා නංගිලා සේරම දන්නවා. මටවත් කියන්නේ නෑ කියන්නේ තාත්තේ. නරකකට එහෙම කරනවා නෙමේ. මොකක් නමුත් තියෙන නිසා එහෙම කියන්නේ."

ඉඳුනිල් කීවේ දෑස් පිසදාගෙන නය. රඹුක්වැල්ල මහතා ඇගේ හිස

පිරිමැද්දේය.

"අපි බලමු. කෙල්ලගේ ජීවිතේනේ. ඔය පේවෙලා දෙයක් කරන වෙලේ අපි කරන්න දෙමු. එයත් බුද්ධිමත් කෙල්ලනේ. බලමු දුවේ."

"එහෙම තමයි තාත්තේ. මම මොනවා නැතත් හරි ලස්සනට මේ කෑම ටික ලෑස්ති කරනවා. ඒවල අඩුවක් තියන්නේ නෑ."

"ඔව්. එහෙම කරන්න. ඒක අපේ යුතුකම. අපේ කෙල්ලවනේ බලන්න එන්නේ"

රඹුක්වැල්ල මහතා සාලයට පැමිණ එහි තැන තැන ඇවිද්දේය. මානසික කැළඹීමක් ඇතිවූ විට ඔහු කරන්නේ ඒකය. ඔහු අවසානයට ගොස් නතර වූයේ පවුලේ ඡායාරූප ඇති තැනය. එක මුහුණින් මුහුණ

ගොස් අවසානයට ඔහුගේ දෑස් ගොස් නතරවූයේ මියගිය ඔහුගේ දියණියගේ මුහුණ මතය.

"ඔයාව මේ දවස්වල මට හරියට මතක්වෙනවා. අපි ආයෙත් සීගිරි එක ගොඩගත්තා මැණික. අද සෙනඟ උතුරනවා. ඔයා හිතපු ගොඩක් දේවල් අවුරුදු විසි ගාණකට පස්සේ එක කොල්ලෙක් ඇවිත්කරනවා. හරි හාස්කමක්. මිනිස්සු අතේ සල්ලි නැති වෙලේ අද ලක්ෂ දාහතරක කලෙක්ෂන් එකක් හවස පහ වෙනකොට තිබුණා."

රඹුක්වැල්ල මහතා සිතින් කීවේය.

නේත්‍රා ඇගේ රෝද පුටුව අතින් කරකවමින් ආවේ ඒ වෙලාවේය. සීයා මේ බලාගෙන ඉන්නේ මියගිය නැන්දාගේ ඡායාරූපය දෙස

බලාගෙන බව ඇය දැක්කාය. මේ හදිස්සියේ එසේ කරන්නේ ඇයි. ?

"සීයා"

"ඔයාලගේ නැතිවෙච්ච පොඩි නැන්දා අද උන්නානම් අද සීගිරි එක දිහා දවසම බලාගෙන ඉඳී. එයා හරි ආදරෙයි සීගිරි එකට. එයා ඉස්සර මේ අදහස්ම කියනවා සීගිරි එක දියුණු කරන්න. අද ඒවා මේ කොල්ලා ඇවිත් එකින් එක කරනවා."

නේත්‍රාගේ දෙනෙත් තෙත්විය.

"සීයා."

"ලොකුපුතේ."

"අද වෙන්න යන දේ ගැනද හිත හිත උන්නේ"

ඔහු අසරණව නේත්‍රා දෙස බැලුවේය.

"ඔයාට අද හරි වැදගත් දවසක්

වේවි සීයා."

"මට පුතේ"

රඹුක්වැල්ල මහතා ඇසුවේ ඇස් ලොකුකරගෙනය. නේත්‍රා ට දුකය.

"ඔව් සීයා. ඔයාට තමයි ගොඩක්ම වැදගත් වෙන්නේ. ඒ ටික විතරක් මම අද කියන්නම්. සමහර වෙලාවට සීයා අපට හරි හදිස්සියේ පින්කමක් කරගන්න වාසනාව ලැබෙනවා. ඒ වෙලාවට හිතන්න ඕන ඒ පින්කම ගැන විතරයි. වෙන මොනවත් හිතන්න එපා. මම ඔයාගේ ලොකු පිණිපිරී හැටියට අද කියන්නේ. ඕනනම් මගේ සීයට මම වැඳලා කියන්නම්."

ඇය දෑතම එකතුකර වැඳ කීවාය. රඹුක්වැල්ල මහතා ඇය ළඟට පැමිණ ඇගේ හිස මත අත

තබාගෙන උන්නේය.

"ඔයාලා තුන්දෙනාගේ ජීවිත වෙනුවෙන් එහෙම දෙයක් කරන්න තියෙනවානම් මම හැමදේම කරනවා ලොකු පුතේ"

"එහෙම හිතනවා සීයා. ඒත් සීයා අපි නෙමේ ඔයාගේ ඔඩොක්කුවේ උන්නේ. ඔයාට වැඩියෙන්ම ආදරේ කලේ. අපේ පොඩි කෙල්ල. එයා වෙනුවෙනුයි අද තීරණයක් ගන්න තියෙන්නේ. ඔයා එනකල් එළියේ පඩියට වෙලා බලාගෙන උන්න කෙල්ල. මං කන්නේ ෂීයා ආවම කියලා පොඩි කටෙන් කියලා රෑ දහය වෙනකල් බඩගින්නේ උන්න කෙල්ල. බර්ත් ඩේ එකට ඔයා දෙන දේයි එයාට ලොකු. එහෙම කෙල්ලට අද එක යුතුකමක් කරන්න වෙනවා.

ඒ ඔයාට. මම තාත්තටත් මේකම කියනවා. ඒත් වැඩියෙන්ම ඔයාට කියනවා. ඒ ඇයි කියලා අද ඔයාට තේරෙයි.”

රඹුක්වැල්ල මහතා තෙත්වූ දෙනෙතින් නේත්‍රාගේ හිස අතගෑවේය.

“කරන්න පුළුවන් හැමදේම මම කරනවා පුතේ.”

“ඔව් සීයා. ඒක කරන්න. එහෙම වුනොත් අද අපේ පවුලේ වාසනාවන්තම දවස වේවි. සමහර අඳුරු දවස් මේ පවුලෙන් මැකිලා යාවී. ඒ වාසනාවන්ත දවස අද මවන්න පුළුවන් ඔයාට. මේ පවුලේ මුදුන් මුල ඔයා. අපි ඒක අද නෙමේ. හැමදාම කියනවා. අපි හැබැහින් දැක්ක දෙවියා ඔයානේ. ඒත් අතීතේ

ඔයත් වැරදි තීරණ ගත්තා. ඒ නිසයි මෙහෙම කියන්නේ."

රඹුක්වැල්ල මහතාට හැමදේම සිහිවෙයි. ඒත් අදම මේ කෙල්ල මේ හැමදේම මතක් කරන්නේ ඇයිද කියා ඔහුට හිතාගන්න අමාරුය.

"මට තේරෙනවා පුතේ."

ඔහු ගියේ වාවාගත නොහැකිව බව ඇය දනී.

අක්කා කියූ මේ හැමදේම භාවනා උඩ සිට අසාගෙනය. තව පැයකින් එකහමාරකින් මේ හැමදේම විසඳෙනු ඇත. සීගිරි පවුලේ ඒ වාසනාවන්ත දවස උදාවේද නැද්ද කියා එවිට තීරණය කරන්නට පුළුවන.

ඇය ලොකු හුස්මක් පපුවට ගත්තාය. පසුව කාමරයට ගියාය.

# 41

අමුත්තන් පිළිගන්නට සීගිරි පවුල සූදානම්ය. මිලින්දත් රඹුක්වැල්ල මහතාත් ඇඳගෙනම සාලයට වී උන්නෝය. ඉඳුනිල්ද ගොස් සාරියක් පටලවාගත්තේ කෙල්ලත් සාරියක් අඳින නිසාය. දුව සාරියක් අඳිනවානම් අම්මාට ගවුමක් අඳින්නට නොහැක. එහෙම සිරිතක් නැත.

තාරකාද ආවාය. ඇය කවදාවත්

නැතුව තරමක් දිග ගවුමක් ඇඳ පිළිවෙලකට උන්නාය. කොට කෑල්ලක් ඇඳගෙන වෙනදා අමුත්තන් එනවිට ඉන්නා ඇය අද මෙහෙම ඇන්ඳේ කෙල්ලත් දේවකත් ජීවන් බාප්පාත් වෙනුවෙනි.

"ඔයත් අද හරි පිළිවෙලට ඇඳගෙන ඉන්නේ."

"වැදගත් හොඳ මිනිස්සු එනකොට තාත්තා වැදගත් විදිහට ඉන්නෝන"

"කවුද ඉතින් ඔය එන වැදගත් අය කියලා කියන්නකෝ."

"දැන් එයි."

සියල්ලන්ම උඩ බැලුවාය. භාවනා ආවේ ඇය ප්‍රියකළ රෝස පැහැයත් රිදී පැහැයත් මුසුවූ සාරිය ඇඳගෙ

නය. ඇය මේ තරම් අද හැඩවේයැයි කිසිවෙක් සිතුවේ නැත.

"අද කෙල්ලගේ ලස්සන."

භාවනා සිනාසුනාය.

"අම්මගෙන් තාත්තගෙන් සීයගෙන් සමාව ඉල්ලනවා. එන්නේ කවුද කියලා කිව්වේ නැති එකට."

රඹුක්වැල්ල මහතා හිස වැනුවේය.

"එයාලා ඇවිත් සීගිරි එක ළඟ දැන් ඉන්නවා. මම එයාලට එන්න කියන්නද තාත්තා."

"ඒකනේ පුතේ. අපි මේ බලාගෙන ඉන්නේ. එන්න කියන්න."

"මම ගිහින් පිළිගන්නම්. තාත්තලා ඔහොම ඉන්න"

භාවනා මිදුලට පය තැබුවාය.

දෙන්නාව එක්කාගෙන එන්න ඇයට ආසය. එය දෛවෝගත එක්කාගෙන ඒමකි.

"සීගිරි එක ටිකක් අප්පච්චිට පෙන්නුවා සුද්දි"

"එන්න අයියේ. මම ගේට් එක ළඟ."

"අනේ. පොදෙත් වගේනේ"

"එහෙමනේ. හොඳ අය එනකොට මල් වැහි වස්සනවා. ඉක්මනට එන්න"

"එනවා මේ."

දේවක එක සිතින් කීවේය. භාවනා අහස දෙස බැලුවාය.

"එයාලා ආවට පස්සේ වහින්න"

ඇය සිතින් කීවාය. දෙදෙනා සීගිරි මහගෙදරට පය තැබූ පසුව

අනෝරා වැස්සක් කඩාගෙන වැටුනත් කමක් නැත. කොහොමත් අද සීගිරි මහගෙදරට අවුරුදු විසි ගණකට පසුව අනෝරාවක් වැටෙන දවසකි.

සුදු පැහැගත් කොරොල්ලා කාරය සිගිරි මිදුලට දැමිණ. භාවනා පපුවට අතක් තබාගත්තා. භාවනා බලාගෙ නම උන්නාය. හදවත දැන් දැන් පිපිරී යතැයි ඇයට සිතෙයි.

මුලින්ම වාහනයෙන් බැස්සේ දේවකය. ඇයට පුදුමය. ඔහු ඇඳගෙන ආවේ ලා නිල් බතික් චාම් බතික් මෝස්තරයක් ගිය සුදු සරමත් වැළමිට දක්වා නැවූ සුදු කමිසයත්ය. ‘ඔයා හැමදාමත් වගේ අදත් ලස්සනයි. මෙහෙම ආපු එක ගැන හරිම සතුටුයි. වෙල්කම් අයියේ.’ ඇය සිතින් කීවාය.

ජීවන් මුළින්ම බැස්සේ නැත. ඔහු වාහනයටම වී උන්නේය.

"අප්පච්චී බහින්න අප්පච්චියේ"

ජීවන් පැති වීදුරුව පහත්කර ඇය දෙස බැලුවාය.

"ඔයා අද හරි ලස්සනයි පොඩි පුතේ."

ජීවන් කීවේය. භාවනා ඇස් පොඩි කළාය.

"ඔයාගේ පුංචි මහත්තයනේ අප්පච්චී අද ලස්සන."

මේ ටික නොකීවා නම් හදවතට නිවනක් නැත.

"එයාට එහෙම එන්නෝන කිව්වේ පුතේ."

"බහින්න අප්පච්චී. සීයා තාත්තා අක්කලා දෙන්නා ඔයාගේ ඉන්දු නංගි

සේරම බලාගෙන ඉන්නවා. බහින්න. බයවෙන්න එපා. මමනේ ඔයාලව එක්කගෙන එන්නේ."

"එනවා පුතේ."

ජීවන් බැස්සේය. භාවනා දෙනෙත් ඔසවා දේවක දෙස බැලුවාය. 'ඔයත් චුට්ටක් බයවෙලා ඉන්නේ. මම දන්නවා. ඉන්නකෝ ටිකක්'

"යන්. එන්න."

භාවනාට ඔහුගේ අතකින් ඇල්ලෙන්නට මෙන් ගියේය. එහෙත් එහෙම එක්කාගෙන යන්න හොඳ නැත. දවසක් එනු ඇත. එදවසට එහෙම අල්ලාගෙනම යා හැක. අදට ඉවසිය යුතුය.

"අප්පච්චි පිටිපස්සෙන් එන්න. දොරකඩ ළඟ චුට්ටක් නවතින්න

අප්පච්චි."

ඇය කීවාය. ජීවන් හිස වැනුවේය. භාවනා මහගෙදරට පය තැබුවේ දේවකත් සමඟමය. සියල්ලන්ටම බැලුනේ දේවක දෙසය. ඉඳුනිල්ට සැනසීමක් දැනුණි. මහා සැනසීමක් දැනුණි. ඇය බලාපොරොත්තුවෙන් උන් රුව කෙල්ල සමඟ උන්නාය. එය පැතුමකි.

"මම දේවකයියව එක්කගෙන ආවා සීයා."

දේවක ගොස් රඹුක්වැල්ල මහතාටත් මිලින්දටත් ඉඳුනිල්ටත් වැන්ඳේය. ඊටත් පසුව නේත්‍රාගේ රෝද පුටුව ළඟටම පැමිණ ඇයට වැන්ඳේය.

"අනේ ඇති මහත්තයෝ. නැඟිටින්න."

නේත්‍රා අඬමින් මෙන් කීවාය. දේවක ගියේ තාරකාටත් වළඳින්නටය.

"අනේ කොල්ලෝ මට වළඳින්න එපා. උඹට පිස්සුනේ බං."

ඇය දේවකව වැළඳගත්තාය. භාවනා දෑස් තදකරගෙන මෙන් උන්නාය.

"ඔයා එක්කගෙන එනවා කිව්වේ දෙන්නෙක්වනේ සුද්දි."

මිලින්ද ඇසුවේය. ඇය හැරුණාය.

"ඔව් තාත්තා. තවත් එක්කෙනෙක් ආවා. එයා එළියේ ඉන්නවා. ඔයාලා දන්න කෙනෙක්."

"කවුද පුතේ. එක්කගෙන එන්න."

"දේවකයියගේ අප්පච්චි තාත්තා සීයා කමක් නැද්ද මම දේවකයියගේ

අප්පච්චිව එක්කගෙන ආවට."

"ඒකනේ පුතේ. මෙච්චර වටින කොල්ලගේ අප්පච්චිව අපි බලන්නම එපැයිනේ."

"ඒකනේ සීයා. ඉන්නකෝ."

භාවනා දොරකඩට ගියාය. තව ටිකකින් සීගිරි මහගෙදරට පය තබන්නේ දෛවෝපත කෙනෙක් බව රඹුක්වැල්ල මහතාවත් මිලින්දවත් ඉඳුනිල්වත් දැනගෙන උන්නේ නැත.

"එන්න අප්ච්චියේ."

ඇය බියක් නොමැතිව ජීවන්ගේ අතකින් අල්ලාගෙනම ආවාය. සීගිරි මහගෙදර මොහොතකට සෙලවිණ. ඇවිලිණ. දෙදරිණ.

රඹුක්වැල්ල මහතාට ඉබේමට නැඟිට්ටවිණ. වසර විසි ගණනකට

පසුවත් ඔහු හොඳින්ම ජීවන්ව ඇළිනගත්තේය. මිලින්දගේ දෑස් ලොකුවිය. ඉඳුනිල්ගේ දෙනෙත් තෙත්විය.

"ජීවා"

මිලින්දට කියවිණ.

"මේ දේවකයියගේ අප්පච්චි තාත්තා. සීයා. ඔයාගේ පොඩි බෑනා. අම්මා. ඔයා ගොඩක් ආදරය කරපු මල්ලී. මං එක්කගෙන ආවා."

භාවනා අසරණව කීවාය.

"තාත්තේ"

ජීවන් පැමිණ රඹුක්වැල්ල මහතා පාමුළ සම්පූර්ණයෙන්ම දණ ඔබා ඔහුට වැන්ඳේය. රඹුක්වැල්ල මහතා අසරණ විය. අනාථ විය. ඔහු අන්ත අසරණ කෙනෙක් මෙන් මිලින්ද

දෙසත් ඉඳුනිල් දෙසත් භාවනා දෙසත් බැලුවේය. අවසානයේ ඔහුගේ දෙනෙත් නතරවූයේ දේවක අසළය.

"මම තාත්තට වැඳලා යන්න කියලා ආවේ තාත්තේ."

ජීවන් හිස ඔබාගෙන සිටිද්දීම කීවේය. මොනවායින් මොනවා වේදැයි හැමෝම බලාගෙන උන්නෝය. අවසානයේ රඹුක්වැල්ල මහතාගේ දෑතම ජීවන්ගේ උරතලයට ගියේය.

"නැඟිටින්න පුතා. ඔයා ආපු එක ගැන. ම..ම..ට."

ඔහුට වචනයක්වත් ගැටග සාගන්නට නොහැකි විය. අවසානයේ රඹුක්වැල්ල මහතා ජීවන්ව නැඟිට්ටුවාගෙන තම ළයට බරකර ගත්තේය.

"ම..ම..ට සමාවෙන්න ජීවා. සමාවෙන්න පු..තා"

සීයා අඬනවාද කියාත් භාවනාට සිතුණි.

"එහෙම කියන්න එපා තාත්තේ. මම ඔයාලව බලාගන්න බැරුව හරියට දුක් වින්ඳා. කොල්ලව සීගිරි එකට එව්වේ උඹගේ සීයව මාමව නැන්දව අක්කලාව නංගිලාව පෙන්නගන්න ඕන නිසා."

ජීවන් අසරණව කීවේය.

"දන්නවා පුතා. අද ම..ට හ...රි සතුටු දවසක්."

ජීවන් මිලින්ද දෙසත් ඉඳුනිල් දෙසත් බැලුවේය. ජීවන් එන්නටත් පෙර මිලින්ද පැමිණ ජීවන්ව වැළඳගත්තේය.

"මං උඹව දවසක් දැක්කා ජීවා. මම ඉන්දුටත් ඇවිත් කිව්වා. අනේ බලපන්කෝ. අපි වයසට ගිහින්නේ."

දෙමස්සිනාලා වැළඳගත්තේ පුදුමාකාර ආදරයකිනි. භාවනා කඳුළු පිරී දෙනෙතින් බලාගෙන උන්නාය.

"අක්කේ."

වැඩියෙන්ම ඇඬුනේ ඇයටය. ඉන්දුටය. ඇය ඉකි බිඳිමින් හැඬුවාය. මේ ටික වෙන බව කෙල්ල කියූ බව ඇයට සිහිවිය.

"අ..පි..ව බ..ල..න්..න ආ..වේ නැත්තේ ඇයි මල්ලියේ. ඔයාවයි දරුවවයි නංගිවයි කො..ච්..ච..ර මතක් වුණාද? මම කො..ච්..ච..ර"

ඇයට කියාගන්නට බැරිවිය.

"හැමදේම මතකයි අක්කේ.

හැමදේම. එහෙම අමතක කළානම් මම කොල්ලව එවන්නේ නෑ..නේ.”

ඉඳුනිල් ජීවන්ව වැළඳගෙනම දේවක දෙස බැලුවේය.

“දේ..ව දූ..ත..යෙ..ක් වගේ කොල්ලෙක් සිගිරි එකට ඇවිත් හාස්කම් කරනකොට මට මොකක්ද දැනුණා. ඒකව දැක්ක මුල්ම දවසෙත් මට මොකක්ද වුණා. අ..නේ ම..ගේ දූ..රු..වා”

ඇය දුවගෙන මෙන් විත් දේවකව වැළඳගත්තේය.

“අනේ මෝඩ කොල්ලා. ම..ට මැ..ඩ..මී කිව්වනේ. මම.”

ඇය දේවකට ගැසුවේය.

“ඉතින් මම වැඳලනේ ගියේ අ..ම්..මා.”

දේවකට ඇඩිණා.

"ලොක්කිව හම්බවුණා. උඹව තමයි දැක්කේ නැත්තේ පුතේ"

ජීවන් පැමිණ තාරකාව වැළඳගත්තේය.

"අවුරුදු විසිගාණක් මට මගේ සුදු බාප්පිව නැතිවුණා. ආ..යේ නැතිකරන්න බෑ. කවදාවත් බෑ. මෙච්චර හොඳ බාප්පියෙක්. මල්ලියෙක් ඉඳලනේ අපිට."

තාරකා කවදාවත් නැතුව ඇඬුවාය.

"ජී..වා"

කතාකලේ රඹුක්වැල්ල මහතාය.

"තාත්තේ."

"අද චියා උන්නානම්."

ජීවන් හිස වැනුවේය.

"එයා නැතිවුනේ නෑ තාත්තේ. හැමදාමත් මායි කොල්ලයි ළඟ උන්නා. පුතා ඇවිත් කිව්වා සීගිරි එකට ආපු මුල්ම දවසේ මොකක්ද වුණා කියලා. එතකොට එයා දන්නේ නෑ මේ එයාගේ අම්මා සීයා මාමා හදපු සීගිරි එක කියලා. දන්නේ නෑ. පස්සෙයි මම කිව්වේ."

"දේවක පුතා ඇතුලේ ඉඳලා මේ හාස්කම කලේ එයා. මම දන්නවා. එයා ගියේනෑ තමයි. මේ ළඟම ඇති."

රඹුක්වැල්ල මහතා හඬමින් මෙන් කීවේය.

"මට මගේ වටිනාම මුණුපුරාව ආයෙත් ලැබුණා. කොල්ලව හදන්න හරියට දුක් විඳින්න ඇති."

ජීවන් සිනාසුණේය. ඒ සිනහව තාමත් එහෙමමම යැයි ඉඳුනිල්ට සිතුණි.

"එයාව ඔයාලට පෙන්නගන්න මට ආසාව තිබුණේ. අවුරුදු ගාණක් ඒකට බලාගෙන උන්නා. කොළඹ පදිංචියට ආවේ ළඟකදී. එයාගේ ස්ටඩීස් ඉවරවෙනකල් උන්නා තාත්තේ. ඉවරවෙච්ච ගමන් මාකටින් වැඩ කරකර උන්නේ. අම්මා වගේමයි. බත් කඩවලට ගිහින් අයිඩියා දෙනවා එදා ඉඳලා බත් කඩේ සෙනඟ. නුවර පෙරහැර කාළේ ඉයලොග් කනෙක්ෂන් හය හත්දාහ සේල් කරනවා. හැමදේම බලාගෙන උන්නා. එතකොට තමයි හිතුවේ එයාව ගැළපෙන්නේ සිගිරි එකට තමයි කියලා. මට ඕනවුණේ ඔයාගේ

මුනුපුරාව ඔයාටම දෙන්න. දෙයක් ගන්න හිතාගෙන එච්චා කියලා හිතන්න එපා"

ජීවන් අසරණාව කීවේය.

"ඔයාට මේ පවුලෙන් ගන්න තිබුන දේ ඔයා කොහොමත් ගත්තා ජීවා. ඒක දෙන්නයි මට මනුස්සකමක් නැතිවුනේ."

රඹුක්වැල්ල මහතා අවුරුදු විසි ගණනකට පෙර තමා අතින් වූ වැරද්දේ වගකීම බාරගත්තේ එසේය.

"මම තාත්තට ඉන්දු අක්කට මිලීට මගේ කෙල්ලෝ තුන්දෙනාට එදා වගේම ආදරෙයි තාත්තේ. අදයි මම මගේ අයව අවුරුදු විසි ගාණකට පස්සේ දැකගත්තේ. ඒ ගැන මට."

ජීවන්ට අවසානයේදී ඇඬුණි.

භාවනා පැමිණ ඔහුගේ හිස පිරිමැද්දාය.

"අඬන්න එපා අප්පච්චි. අපිට දැන් ඔයා ලැබුනනේ. නැන්දිත් බලනවා ඇති ඉඳලා ඉඳලා එයාගේ මහත්තයව එක්කගෙන ඇවිත් අඬවනවා කියලා. අර බලාගෙනත් ඉන්නවා."

භාවනා පෙන්වූයේ නර්මදාගේ පින්තූරයය. ජීවන් ගොස් ඒ පින්තූරය අතින් පිරිමැද්දේය.

"පව්"

තාරකා මුව තදකරගෙන කීවාය.

"අප්පච්චිට ඇවිත් ඉඳගන්න කියන්න පුතේ"

රඹුක්වැල්ල මහතා කීවේය. භාවනා ගොස් ජීවන්ව එක්කාගෙන

ආවේය.

"දැන් ජීවා මොනවද පුතා කරන්නේ."

රඹුක්වැල්ල මහතා ඇසුවේය.

"මං තාත්තේ කන්ස්ට්‍රක්ෂන් ඩිසයිනර් කෙනෙක්. මෙහේ කන්ස්ට්‍රක්ෂන් ෆර්ම් එකක වැඩකරනවා. "

ජීවන්ව බී එම් අයි සී එච් එකේදි දුටුවේ කන්ස්ට්‍රක්ෂන් ප්‍රදර්ශනයේදී බව මිලින්දට සිහිවූයේ එවිටය.

"ජීවා"

ඔහු යලිත් කතාකලේය.

"තාත්තේ"

"අපි වෙන්වෙලා හිටපු කාලේ ඇති පුතා. ඔයා දැන් අපිත් එක්ක ඉන්න ඕනේ. අපිත් එක්කම"

ජීවන් බලාගෙනම උන්නේය.

"මිලින්දත් දැන් එයාගෙම බිස්නස් එකක් පටන් අරන් තියෙන්නේ. කෙල්ලෝ දෙන්නයි කොල්ලයි සීගිරි එක බලාගනී. ඔයා මිලින්ද එක්ක අපේ දෙයක් කරන්න ගන්න"

ජීවන් අහිංසක ලෙස සිනාසුනේය.

"මට මේ බැඳිම ඇති තාත්තේ. හරි තනිවෙලා උන්නේ. ඒක  කියන්න අමාරු දුකක් තාත්තේ"

ජීවන් කීවේය.

"අපි තනිවෙලා නෑ කියලද හිතන්නේ. නේද ලොකු පුතා"

මිලින්ද හිස වැනුවේය.

"දැන් ඉන්නේ අතුරුගිරියේ නේද?"

"ඔව් තාත්තේ. ඊයේ පෙරේදනේ

කොළඹ ආවේ. කැන්ඩි ලෑන්ඩ් එක විකුණන්න දාලා තියෙන්නේ. ඒක දීපු ගමන් මෙහේ පොඩියට ගෙයක් හදන්න ගන්න ඉන්නේ”

“එපා”

රඹුක්වැල්ල මහතා කීවේය.

“ජීවා අපිත් එක්ක ඉන්න ඕන. එහෙම නේද ලොකුපුතා”

“ඒක මම අද නෙමේනේ තාත්තේ කිව්වේ”

ඉඳුනිල් ඉදිරියට ආවාය.

“මම තාත්තගෙන් කවදාවත් දෙයක් ඉල්ලලා නෑ තාත්තේ”

ඇය කීවාය.

“ඒකනේ දුව”

“ඒත් අද ඉල්ලනවා. ජීවා

අපි ළඟම තියාගන්න. ආයේ මේ තාත්තටයි පුතාටයි වෙන්වෙලා ඉන්න දෙන්න බෑ. හරියට දුක් වින්ඳා. මගේ කෙල්ලෝ තුන්දෙනාටත් හයියකට කෙනෙක් ඉන්න ඕන. මිලින්දත් හරියට තනිවෙලා ඉන්නේ. තනියම දුක් විඳ විඳ. එහෙම ඉන්න අමාරුයි"

ඇය දෑතම එක්කර කීවාය. රඹුක්වැල්ල මහාත සිනාසී බැලුවේ ජීවන් දෙසය.

"ඔයා මට බෑ කියයි. ඔයාගේ අක්කට බෑ කියන්නේ නෑ. මම දන්නවා"

ජීවන් ආදරයෙන් ඉඳුනිල් දෙස බැලුවේය.

"එනවා අක්කේ."

ජීවන් කීවේය. තාරකාත් නේත්‍රාත්

භාවනාත් අත්පොළසන් දුන්නෝය. නේත්‍රා රෝද පුටුව කරකවාගෙන ඉදිරියට ආවාය. ඇය එහෙමම ඇවිත් අල්ලාගත්තේ දේවකගේ අතය.

"එතකොට මේ අපේ සුදු මල්ලිව එපාද?"

නේත්‍රා ඇසුවාය. භාවනා අත් බැඳගෙන සිනාසුනාය. 'ඒකනේ'

"මම මිලී."

ජීවන් යමක් කියන්නට මෙන් ගියේය. එහෙත් මිලින්ද එය නැවැත්වූවේය.

"මම උඹේ කොල්ලට මගේ කෙල්ලව දෙන්න තීරණය කලේ උඹ මගේ මස්සිනා කියලා දැනගෙන නෙමේ ජීවා."

මිලින්ද සන්සුන්ව කීවේය. භාවනා පුටුවේ පත්තට පැමින මිලින්දව වැළඳගත්තාය.

"අපි කොහොමත් සීගිරි එක අපිට ගත්තා ජීවා. දැන් ඒක අයිති අපේ ෆැමිලි එකට විතරයි. මගේ කෙල්ලෝ තුන්දෙනාටයි උඹේ කොල්ලටයි. එච්චරයි. ඉක්මනට මේ වෙඩින් එක ගන්නවා. එහෙම නේද තාත්තේ"

දේවක කඳුළු පුරවාගෙන බලාගෙන උන්නේය.

"අපි ඒක කතාකරලා ඉවරයි ජීවා. තීන්දුයි. අපිට කොල්ලව ඕන. අපේ එකාව."

"සියටයි තාත්තටයි අම්මටයි අක්කලාටයි පින්"

දේවක ඇඬුම්බර හඬකින්

කීවේය.

"මට කවුරුවත් පින් දෙන්නේ නැද්ද?"

භාවනා තොල් පට තදකරගෙන ඇසුවාය.

"පින් කඳකට තව පින් මොකටද සුද්දි"

දේවක කීවේය. සියල්ලන්ම ඇගේ පින්බර මුහුණ දෙස බලාගෙනම උන්නෝය.

"දැන් අම්මා අපි පාටිය ස්ටාට් කරමුද? ඔයාගේ ආදරණීය මස්සිනා වෙනුවෙනුයි මගේ"

කියාගෙන ආ දේ ඇය ගිලගත්තාය.

"ජීවා"

රඹුක්වැල්ල මහතා කතාකළේය.

"තාත්තේ"

"ඔය ඉන්න ගේ සතියක් ඇතුළත බාරදෙන්න. කොල්ලා එක්ක මෙහේ එන්න. අපිට ඔයාවත් ළඟ තියාගන්න ඕන. කොල්ලවත් අපි ළඟට ඕන."

"ඒකනේ මම එක්කගෙනත් ආවේ නේද සීයා"

ඇය රඹුක්වැල්ල මහතාගේ කර වටා දෑතම යවා කීවාය.

"දැන් අර කිව්ව පොඩි රෝසා බස් එක ඕඩර් කරන්න වෙයි වගේ නේද ඉන්දු"

මිලින්ද කීවේය. භාවනා සිනාසුනාය. ජීවිතය ඇරඹෙන්නේ දැන් යැයි ඇයට සිතුණි. ඒ සතුට මෙහෙම සමරා තේරුමක් නැත.

"කවදද දෙන්නට දැන් වෙඩින්

එක ගන්න ඕන."

භාවනා දේවක දෙස බැලුවාය. දේවක ඇය දෙස බැලුවාය.

"සීයා දැන් අප්පච්චිටයි මටයි මෙහෙට එන්නත් කියපු එකේ තාත්තේ මේ"

"කියන්න පුතා කමක් නෑ."

"නෑ මේ. හෙට අනිද්දා වුනත් කමක් නෑ."

දේවක හිස කසමින් කීවේය. භාවනා පපුව පිරීගිය බැල්මකින් බලාගෙන උන්නාය. 'තැන්කියු සෝ මච්'

"එහෙනම් දෙන්නත් එක්කම බලලා දිනයක් දාගන්න. නේද ඉන්දු"

"මං වෙඩින් එකේ කෙල්ලගේ වැඩ ටික බලාගන්නම් තාත්තේ. හැමදේම.

එක නංගියයිනේ ඉන්නේ නේද ෂුද්දූ."

තාරකා කීවේ ඇයව වැළඳගෙ නය. කොහොමත් ඇය සිතාගෙන උන්නේ එහෙමය.

"මං අනිත් දේවල් ටික බලන්නම් තාත්තා. හෝම් කමින් වෙඩින් කියලා දෙකක් ඕන නෑ. අපි එක උත්සවයක් ගමු. නේද අප්පච්චි"

නේත්‍රා ඇසුවේ ජීවන්ගෙන්ය.

"මට පුතේ මේක හීනයක් වගේනේ. කියන දෙයක් මාත් කරන්නම්. මට අද ලැබෙන දේවල් වැඩියි. මම එක දෙයක් විතරක් මිලීටයි ඉන්දු අක්කටයි පොරොන්දු වෙන්නම්. මගේ දුවලා තුන්දෙනෙක් වගේ මම උඹෙයි අක්කගෙයි කෙල්ලෝ තුන්දෙනාව බලාගන්නම්."

ජීවන් කීවේ එපමණය.

"අපිටත් ඉතින් බලාගන්න කියලා දහයක් පහළොවක් නෑනේ අප්පච්චියේ. නේද? ඔයාවත් අපි බලාගන්නවා."

භාවනා කීවාය. හැමෝගේම හදවත්වල තිබුනේ එවැනි අදහසකි. ආදරයකි. කැක්කුමකි. අද තරම් සැනසීමක් දැනුන දවසක් මේ ජීවිතයේ කවදාවත් තිබී නැතැයි භාවනාට සිතුණි.

# 42

භාවනා එක මොහොතක දේවකගේ අතකින් අල්ලාගෙන උඩට ගියාය. මේ මොහොත එනතුරු ඇය පැයක් පමණ කුරුමාණම් ඇල්ලුවාය.

භාවනාගේ අතක එල්ලීගෙන දේවක ඇගේ කාමරයටම ආවේය. පසුව ඇය අත් බැඳගෙන බලාගෙ නම උන්නාය.

"සුද්දි."

"මී. සුද්දි තමයි. මොකද ඉතින්

දැන් කියන්නේ සුද්දිට."

ඔහු භක්තිමත් ලෙස ඇයගේ අතකින් අල්ලාගත්තේය. ඊටත් පසුව බැතිබර ලෙස ඇගේ අත සිපගත්තේය.

"මේ ජීවිතයම අද සිට ඔබටම කැප කරමි භාවනා කුමරිය."

ඇය සිනාබරවම උන්නාය.

"ඒක පිස්සෝ අදද හිතාගත්තේ"

"අදනේ මට පර්මිෂන් ලැබුනේ"

"ඉතින් මම පර්මිෂන් දුන්නනේ කලින්."

ඔහු හැඟීම්බර ලෙස ඇයගේ බඳ වටා සුරත යවා පපුවටම කෙල්ලව ගත්තේය.

"කවුද හිතුවේ මේ රන්කඳ මටම දෙයි කියලා. බයෙන්නේ උන්නේ. දුප්පත් කොල්ලනේ. ගමේනේ. දෙයිද

කියලා දන්නෙත් නෑනේ. බයෙන්නේ උන්නේ."

ඇය අනවසරයෙන්ම ඔහුගේ නළල සිපගත්තාය.

"මේ තියෙන සැනසීම ඔන්න මෙහෙමම මම දෙනවා. උදාවෙන හැම දවසක්ම මට මේ වගේ ඕන"

"මවන්නම්."

"පොරොන්දු කියන්නේ හදවතින්ම ඉෂ්ඨ කරන දේවල්වලට"

"සැකයක් එහෙම තියෙනවද ඔබට."

ඇය යටැසින් බැලුවාය.

"අන්නේ. මේ හිතේ සැක සංකා නෑනේ. එකපාරම මම මගේ පපුවම දුන්න කෙනෙක්"

"දන්නවා. ඒකනේ තාමත් මේ උතුර දකුණ මාරුවෙලා ඉන්නේ."

"එහෙම බෑ. දැන් සුපර් මෑන් වැඩ පෙන්වන්න."

"මේ අදම"

"ම්."

"හරි. මම මගේ නෝනව පුදුම කරවන්න තාම ගත්තේ නෑ"

"එච්චරටම පුදුම කරවන්න දේවල් තියෙනවද?"

"තියෙයි තියෙයි."

"එකක් දෙකක් දැන්මම පෙන්නන්නකෝ."

"එහෙම බෑ. ළඟදිම දවසක් එනවා."

ඇය ඒ ඇස්වලටම එබුණාය.

"ඔයා මාව පුදුමකරලා ඉවරයි දේවෝ. දැන් බලාගන්න මම ඔයාව පුදුම කරන හැටි."

ඇය ගොස් අල්මාරිය විවර කළාය. ඊටත් පසුව කුඩා ජුවලරි බොක්ස් එකක් ගත්තාය. එහි වූයේ සුන්දර පිරිමි මුදුවකි.

"කෝ දෙන්න අත. බඳින දවසට දාන අත එපා. ඒක වෙනම දානවා. අද මේක දෙන්න"

දේවක බලාගෙන සිටිද්දීම ඇය ඒ මුදුව දැම්මාය.

"ලස්සනයි. ජීවිතේ දාපු ලස්සනම මුද්ද? ඒකනේ දාන්නෙම නැතුව උන්නේ."

දේවක එදෙස බලාගෙනම උන්නේය.

"සුද්දි."

"ම්."

"මට අඬුනා."

"දැක්කා. දුකත් හිතුණා මට."

"හැමදේම ඔයා නිසාමේ හදවතේ විශ්වාසය නිසා."

"එහෙම හිතනවද?"

"ඔව්."

"ඒකේ කොච්චර දේවල් තිබුණද කියලා ඔයා දන්නේ නෑ."

"දන්නවා සුද්දි"

"මේ සම්බන්ධය හරි කෙටි එකක්. ඒත් කතාව දිගයි"

"තව දිග වෙයි. ඒත් නැවතීමක් නැතිවෙයි."

ඇය ඔහුගේ නළලට නළල තබාගෙන උන්නාය.

"අදට එකක් දෙන්න. හෙට විසි දෙදාස් පන්සීයක් ඕන"

ඇය කීවාය. දේවක දෑස් පියාගෙන මෙන් ඇගේ සිහින් තොල් සඟලට බරවුණේය.

"සුදූ."

තාරකා ආවේ කෑගසාගෙනමය. දෙතොල් මෑත්විය.

"ඕ. සොරි සොරි සුදූ"

තාරකා හිස බිමට නවාගෙන සිනාබරව කාමරයෙන් යන්නට ගියාය.

"මෙහේ වරෙන් බං."

දේවක කතාකලේය.

"එක ගේක ලව් කරනවානම් මස්සිනේ කාමරේ දොර ලොක් කරගනින්. අනිත් දේවල් ලොක්කරගන්න කලින්. ඕකේ."

"තේරුනේ නෑනේ."

භාවනා ලැජ්ජාවෙන් බිම බලාගෙන සිනාසුනාය.

"උඹ නොඉඳුල් දෙතොලම ඉඳුල් කළානේ. නේද"

ද්වේක හිස කැසුවේය.

"මාව ටිකක් බදාගනින්. එච්චරටම මම උඹට ආදරෙයි."

තාරකා දෑත් දෙපසට විහිදා කීවාය. ද්වේක ඇයව පුදුමාකාර ආකාරයකින් වැළඳගත්තේය.

"උඹත් වරෙන් සුදූ. මගේ ජංගි කොටේ"

ඇය කීවාය. භාවනා ඔවුන් අතර සිරවූවාය.

"මේ ආදරයට ඇස් වහක් වදින්න එපා. දැට්ස් ඕල්."

තාරකා කීවේ හැඟිම්බරවය. භාවනාද ඇස් පියාගෙන පැතුවේ එයය.

"තව පොඩි දෙයක් තියෙනවා අයියේ."

තාරකා කීවාය. භාවනා

විමසිල්ලෙන් බැලුවාය.

"මොකක්ද තරූ."

"මේ ගෙදර ගැන උඹට ගොඩක් බලන්න වෙනවා. අපේ පවුලට තව ටික කාලයක් යනකල් සරම් කෑල්ලක් එන්නේ නෑනේ. ඕකේ. ඉතින් හැමදේටම උඹට දුවන්න වෙයි."

දේවක සිනාසුනේය.

"මම ඒක ආසාවෙන් කරනවා."

"සමහර රෑක මම ඇවිත් උඹට කියයි කොත්තුවක් කන්න ආසයි බං කියලා. අපි එහෙමයි."

"ඉතින් තොත්තුවක් දීගෙන කොත්තුවක් ගෙනත් කමුකෝ බං. ඉවරයිනේ වැඩේ."

තාරකා දිලිසෙන දෑසින් සිනාසුනාය.

"තැන්කියු සෝ මච්. උඹ අපිව

බලාගන්නවට අපි උඹට දෙන්නේ උඹටවත් හිතාගන්න බැරි ආදරයක්. බලපන්කෝ."

"ඒක ඇති තරූ. මේක බෝනස් වාසනාවක්."

තාරකා දේවකගේ මුහුණට ළංවී තවත් හාදුවක් දුන්නාය.

"මොකද උඹ රවන්නේ. අපිටත් මේකව ඉඹින්න ඕන."

භාවනා ඇද කළාය.

"කෙල්ලව සතුටින් තියපන්. ඒ ඇති. මං අරවා විහිළුවට කිව්වේ."

තාරකා අවසානයට කීවාය.

"මේකී හරි මූඩි කරක්ටර් එකක්. පොඩ්ඩක් බැන්නොත් හූ තිය තිය අඬන්නේ. හැබැයි උඹට පුළුවන් එක තත්පරෙන් මේකීගේ ඇඬිල්ල නතරකරන්නත්."

"දන්නවා තරූ."

"ඒකනේ. මම මේ මේකී ගැන කියනවා. මේකී නල්ල මලේ කෙල්ල කියලා උඹ දන්නේ නැද්ද නේද?"

භාවනා රවාගෙන මෙන් දේවක දෙස බැලුවාය. තාරකා ගිය පසුව ඇය දේවකගේ අතක් ගෙන මිරිකුවාය.

"මමද දැන් නල්ල මගේ කෑල්ල මෙතන. එයා කියන ඒවට ඔළුව වනන්න. ආ."

දේවක සිනාසුණේය.

"සුද්දි ඉතින් නල්ල මලේ කෙල්ල තමයි කොහොමත්."

දේවක බයක් නැතිව කීවේය. භාවනා ඔහුගේ ගතට බරවූයේ ඒ කුස කොනිත්තාගෙනමය. දැන් කොතරම් නිවනද?

# 43

ජීවනුත් දේවකත් සීගිරි නිවසින් යන්නට පිටත් වෙද්දී පාන්දර එකටත් ළංවී තිබුණි. ජීවන් යන්නට පෙර සියල්ලන්වම වැළඳගත්තේය.

"ඔයා ජීවා කොල්ලවත් අරන් ඉක්මනට එන්න ඕන"

රඹුක්වැල්ල මහතා ජීවන්ව වැළඳගෙන කීවේය.

"එනවා තාත්තේ. මම හිතුවේ ගෙයක් ගන්න කියලා"

"මේ ගෙදර පොඩි දුවටත් අයිතියි. ඒ අයිතිය ඔයාටයි කොල්ලටයිත් තියෙනවා. මම හැමෝටම දෙයක් දුන්නා. දෙන්න බැරිවුණේ මගේ කෙල්ලට විතරයි"

ජීවන් බලාගෙන උන්නේය. ඔහු ඉඳුනිල්ව වැළඳගෙන සෑහෙන වෙලාවක් උන්නේය.

"ඉක්මනට කොල්ලවත් අරන් එන්න. අපිට පුළුවන් ඔයාවත් බලාග න්න. නංගි හිටපු කාමරේම මම ඔයාට ලෑස්තිකරන්නම්."

ඉඳුනිල් කීවාය.

"ඔයාලා එක්ක ජීවත්වෙන එක සැනසීමක් අක්කේ."

"අපිටත්."

ජීවනුත් මිලින්දත් සෑහෙන වෙලාවක් වැළඳගෙන උන්නෝය.

දෙමස්සිනාලා සෙට්වෙන්නට වෙනම වෙලාවක් දාගත්තෝය.

"අපි සෙට්වෙලා කරන දෙයක් ගැන කතාකරමු ජීවා"

"හෙට දාගමු මචං."

භාවනාත් නේත්‍රාත් සිනාසුණේ මුහුණට මුහුණ බලාය. ජීවන පැමින නේත්‍රාගේ හිසම සිපගත්තේය.

"මං ගිහින් එන්නම් ලොකු පුතේ."

නේත්‍රා ජීවන්ගේ කුසම සිපගත්තාය.

"අපි ඉක්මනට එමු බාප්පේ. ම්."

තාරකාද පැමිණ ජීවන්ව වැළඳගත්තාය.

"මගේ ජීවිතේ මට ලැබිච්ච ලොකුම තෑග්ග ඔයයි අපේ කොල්ලයි."

තාරකා දේවක ගැන කීවේ

එහෙමය.

ජීවන් අවසානයට අල්ලාගත්තේ භාවනාවය. එය පුදුමාකාර වැළඳග ැනීමක් විය. භාවනාද ඔහුව ඒ ආදරයෙන්ම වැළඳගත්තාය.

"ඔයාව බලාගන්න අපට ලැබිච්ච එකම ඇති. වෙන මොනවත් එපා පුතේ"

ජීවන් භාවනාගේ හිසම සිපගෙන කීවාය. කොතරම් හැඟීම්බර වූවාද කියනවානම් ඇයට කතාකරන්නට පවා බැරිවිය. ඊටත් පසුව ඇය සාලයේ බිම දෙදණම ඔබා ජීවන්ට වැන්ඳාය.

ජීවනුත් දේවකත් සියල්ලන් දෙසම බැලුවේ ඉක්මනින් එන්නම් කියන්නනාක් බඳුවය. මේ අලුත් වූ නෑකමට ඇස් වහක් කට

වහක් වදින්නට එපා යැයි ඉඳුනිල් හදවතින්ම පැතුවාය. කොහොමත් තම පවුලට දැන් උදාවී ඇත්තේ හොඳ කාලයක් බව ඇයට ඉවෙන් මෙන් දැනුණි.

*** *** *** *** ***

"මේ හැමදේම වෙනුවෙන් ඔයාට පින් කියන්න වෙනවා මැණික. මුලින්ම කොල්ලව රැකගත්තා. ඊට පස්සේ අවුරුදු විසිගාණක තුවාලයක් ඔයා අද සනීප කළා. මම ඒ නිසා කොච්චර දුකින් උන්නද කියලා ඔයා දන්නේ නෑ. මගේ ජීවිතේ එහෙම පසුතැවිලි වෙන්න දෙයක් තිබුනේ නෑ. ඒත් මේ ප්‍රශ්නේ තිබුණා. හරි දුකින් උන්නේ ඒ ගැන. වතාවක් දෙකක්

ජීවත්ව හොයාගෙන නුවර යන්නත් මම හිතාගෙන උන්නා. මම ඒ ගැන අර්ජුන අන්කල්ටත් කියලා තිබුනේ."

භාවනා පැමිණ සීයාව වැළඳගත්තාය.

"හැමදේම වුනේ හොඳට කියලා හිතමු සීයේ. ඒ දෙන්නා ගොඩක් දුක් විඳලා තියෙනවා. අප්පච්චියි පුතයි තනියම උයාගෙන පිහාගෙන දුක සැප බෙදාගෙන ඉඳලා තියෙන්නේ. අප්පච්චි වේලාසන ආවොත් එයා උයනවලු දෙවකයියා ආවොත් එයා උයනවා. දෙන්නා දෙන්නගේ ඇඳුම් මාරුවෙන් මාරුවට හෝදනවා. අපි අම්මට තාත්තට සළකනවා මදි කියලා තේරුනේ එයා අප්පච්චිව බලාගන්න හැටි දැකලයි."

භාවනා අවංකව කීවාය.

"මට අද හරිම සතුටුයි. සමහරවිට මගේ ජීවිතේ උදාවෙච්ච හොඳම දවස අද වෙන්න ඇති. ඒක උදාකළාට ඔයාට පින්. අපි වෙඩින් එක ලස්සනටම ගමු."

රඹුක්වැල්ල මහතා කීවේය.

"ඔව්. හෙට අනිද්දම ගන්න ඕන සීයා. නැත්නම් මුන් දෙන්නට ඇස් වහ වැදෙනවා"

"එහෙම වෙන්න දෙන්නේ නෑ, මම හෙටම යනවා බෝධි පූජාවක් තියන්න."

ඉඳුනිල් කීවාය.

"අම්මට අද හරිම සතුටුයි. එයාගේ පොඩි බෑනයි පරණ මල්ලියි දෙන්නම ලැබුනනේ."

තාරකා කීවාය.

"මේ ගෙදර එහෙම සුබ දේවල්

වෙන්න ඕන ගෙයක්. පහුගිය දවස්වල මොකක්ද නරක බැල්මක් වැටිලා තිබුණා."

"ඔව් අම්මා. මේ ගෙදරට අද ඉඳලා කිරි උතුරයි. කිරිම උතුරන්න ඕන නේද සුදූ."

නේත්‍රා කීවේ භාවනා දෙස බලාය.

"මොකද ඒක කියලා මං දිහා බලන්නේ."

"කිරි උතුරවන්න ඕන ඔයා."

"අප්පද බොල. දැන් මමද කුක්කු දේවී වෙන්නේ."

සියල්ලන්ම සිනාසුනෝය.

"ඔව්. පහක් හදනවා කිව්වේ. දෙකක් තුනක් හෙට අනිද්දම හදන්න වෙයි දෙන්නට. අපිට පාළුයි නේද ඉන්දු."

මිලින්ද කීවේය.

"අනේ ඉතින් මිලීත් සීයා කෙනෙක් වෙනවනේ."

භාවනා දුවගෙන ගොස් මිලින්දව බදාගෙන කීවාය.

දේවක භාවනාට ගත්තේ පාන්දර හතරටය. පුදුමය නම්, ඒ පාන්දර හතරට ඇයව අවදිවී සිටීමය.

"තැන්කියු සෝ මච්"

දේවක ගත් හැටියේම භාවනා කීවාය.

"ඖ වට් සුද්දි"

"මේ මහ පාන්දර මාව මතක්වුණාට. අයි ලයික් දැට්. හැමදාම ප්‍රාර්ථනා කලේ එහෙම කෙනෙන්ව තමයි. කාව මතක් වෙන්නත් කලින් මාව මතක් වෙන, කාට දෙන්නත් කලින් මට දෙන්න හිතෙන, කාව ඉඹින්නත් කලින් මාව

ඉඹින, කාවවත් ළඟට ගන්න කලින් මාව ළඟම ගන්න, මාත් එක්ක නිදාග න්න, මට කලින් ඇහැරෙන, හොඳ මහත්තයෙක්ව මම පැතුවා. අයි විෂ්ඩ්, ඇන්ඩ් අයි හැව් බීන් වේටින් ෆෝ ලෝන්ග් ටයිම්. නැ අයි ගොට් මයි විෂ්. තැන්කියු සෝ මච්"

ඇය කියවාගෙන ගියාය. දේවකට තිබුනේ අහගෙන ඉන්නට පමණි.

"ඉතින් සුද්දි ඒ මමමද කියලා"

"අයම් ෂුව. මම දන්නවා ඒ ඔයා කියලා. ඒ ගැන මට ඩවුට් එකක් නෑ. සමහර දේවල් ගැන හන්ඩ්‍රඩ් ප්‍රසන්ට් නෙමෙයි දේවකයියේ. තවුසන්ඩ් ප්‍රසන්ට් ෂුව. යූ ආ ද විෂ්. යූ ආ ද ලව්. ඇන්ඩ් යු ආ මයින් "

ඇය ඇඳ මත ඉඳගෙනම කියවාගෙන ගියාය.

"වන් තිං."

"කියන්න සුද්දි"

"හැම කෙල්ලෙක්ම මේතරම් අවංක නෑ හරිද? මේතරම් ඕපනුත් නෑ. නිහතමානීත් නෑ. හිතේ හැඟීම තිබුනත් කියන්නේ නෑ. මොකද අනිත් කෙනා අලි ඔළුව ගනී කියලා. ඒත් මම. අයම් නොට් ලයික් දැට්"

ඇය ඒ ටිකද කීවාය.

"මට ඔයා ගැන කියන්න එපා සුද්දි"

"ඇයි"

"ඔයා ගැන ඔයත් නොදන්න දේවල් මම දන්නවා"

භාවනා දෑස් පියාගෙන ඇඳ වියලට බරවූවාය.

"මං දන්නවා. ඒකනේ මෙච්චර ආදරේ"

ඇය රහසින් මෙන් කීවාය.

"ඉතින් කියන්න මේ පාන්දර හතරට ඇයි මාව මතක්වුනේ"

"මතක්වෙන්න කාරණාවක් ඕනද?"

"නෑනේ"

"ඒකනේ. ඉතින් මම කතාකළා. මම මේ අපේ පොඩි කුස්සියට ආවා"

"ඇයි"

"කිරිබත් හදන්න"

"අනේ ඔයා"

"ම්. අපිට අද හරි සුබ දවසක්නේ. ඊයේ අප්පච්චියි මායි නිදාගන්නකොට ගොඩක් රෑ වෙලා. ඉතින් හිතුවා උදේම කිරිබත් ටිකක් හදලා තියලම එනවා කියලා."

භාවනාට පුදුම නැත. කෙනෙක් ආදරයේදී මනුස්සයෙක් වෙන්නේ ඔහු මනුස්සකම් සමඟ කළින්

හැදී තිබුණානම්ය. ජීවිතයේ නැති මනුස්සකම් ආදරයේදී එන්නේ නැත.

"මටත් කිරිබත් ටිකක් අරන් එන්න හොඳේ. දවසක් ගෙනාවා හරිම රසයි. අර කොටපු කට්ට සම්බලයත් එක්ක"

"හා. අපේ ඇඹුල් තියල් ටිකකුත් දාගෙන කමු"

"දෙමු ගේමක්. ඉතින් කියන්නකෝ අප්පච්චා මොනවද කිව්වේ"

"ඇවිත් කියන්නම්. එයාගේ ඇස්වල කඳුළු ඊයේ"

"මට මේ සතුට සමරන්න දුරක යන්නෝන. කොහෙද මේ සීගිරි එකක් එක්ක හෙලවෙන්න බෑනේ"

"ඒකට බණින්න එපා."

ඔහු කීවේය.

"අපි හම්බවුනේ අපි එකතුවුනේ අපි ආදරය කලේ අපි මෙච්චර

ළංවුනේ සිගිරි එක නිසා. මට ඒක දේවාලයක් වගේ”

ඔහුගේ මේ උතුම් ගතිගුණවලට භාවනා ප්‍රියකළාය. ඒවා දුර්ලභය. ඇත්තටම එවැනි ගතිගුණ ඇති කෙනෙක් හමුවේයැයි සිතිය නොහැක. භාවනාද එහෙම සිතුවේ නැත. එහෙත් දෙවියන් ඒ දුර්ලභ ගතිගුණ සමඟ කෙනෙක්ව මවා තිබුණි. පුදුමය ඔහුව තමාට හිමිවීමය.

“එහෙනම් උදෙන්ම දේවාලෙට එන්න හොඳේ. මට ටිකක් ළඟට වෙලා ඉන්න ඕන. මාර සේනාව එන්න කලින් එන්න”

“එන්නම්. ඒකයි මේ ඇහැරවන්න කතාකලේ”

“අර මං දුන්න සෝස පාට ෂර්ට් එක ඇඳන් එන්න හොඳේ.”

"ම්."

"ඉතින් මටත් මොකක්හරි ඇඳන් එන්න කියන්නකෝ. මැනර්ස් දන්නේ නෑනේ මේ ගොන් තඩියා"

ඇය කීවාය.

"මොක ඇන්ඳත් ඉතින් ලස්සන අයට ඇඳුමක් කියලා තේරුමක් නෑ සුද්දි"

"එහෙනම් ඔය මොකක්හරි පටලවගෙන එනවා"

"පටලවගෙන නාවත් මොකද මටනම්"

"ෂටප්. කිරිබත හරියට හදන්න."

භාවනා දුරකථනය තබා එය පපුව උඩ තබාගෙනම දෑස් පියාගත්තාය. 'මේ හිතේ තියෙන සතුට ආරක්ෂා කරන්න' ඇය රහසින් මෙන් පැතුවාය.

# 44

දේවක අප්පච්චීගේ ඇඳ වෙතට ගියේ පොඩි කිරිබත කෙහෙල් කොලයෙන් තවා කෑලි කපා කට්ට සම්බෝලයද කොටා තබාය.
ජීවන් උන්නේ නින්දේය. ඔහු ඊයේ නිදාගත්තේ පාන්දර තුනත් පසුවූ පසුවය. මේ ජීවිතයේ සතුටු දවස් උදාවූයේ හරිම පොඩ්ඩය. ඒත් ඔහුට ඊයේ දවස පුදුම සැනසීමක් ගෙන ආවේය. නිදාගන්නට පෙර ජීවන්

තම මියගිය බිරිඳ සමඟ සෑහෙන වෙලාවක් කතාකළේය.

දේවක ඇඳගත්තේ අප්පච්චී නිදාගෙන උන් නිසාය. පොඩි ළිඳෙන් නාන අන්තිම දවස් ටික මේය. මේ නිවසේ ඔහු ප්‍රියකළ දේවල් අතර මේ වෙළ ළඟ පොඩි ළිඳද විය. 'යන්න කලින් ඔයාව අරන් ඇවිත් මෙතන තියලා වතුර ටිකක් ඔළුවට දාන්න ඕන.' දේවක සිතාගත්තේය. මේ කතාව අද කිව්වොත් අදම නාමුකෝ කියලා ඇය කියන බව දේවක දැනගෙන උන්නේය.

දේවක රෝස පාට කමිසයට මෙරූන් පැහගත් ටයි පටියද පැළඳගෙන ජීවන් වෙත ආවේය. අප්පච්චිගේ ඇඳ මත වාඩිවී ඔහු ටික වෙලාවක් අප්පච්චී දෙස

බලාගෙන උන්නේය. ජීවිතය සමඟ අවුරුදු ගාණක් ඔට්ටු වූ දුක්බර තරුණයෙක් වයසට ගොස් තිබුණි. දේවකගේ හදවතට දැනුනේ ආදරය මුසුවූ අප්‍රමාණ දුකකි. 'ඔයාට හැමදාම දුක් විඳින්න දෙන්න බෑ' ඔහු සිතුවේය.

"අප්පච්චියේ."

දේවක කතාකලේ නෑමෙන් සීතල වූ අත අප්පච්චිගේ පපුව මත තබාය. පුංචි කාලයේ අප්පච්චිගේ මේ පපුවේ රෝම අතර හිස තබාගෙන නිදාගත් අයුරු දේවක සිහිකලේය. තව එක දවසක් එහෙම නිදාගන්නට ඔහුට ආසාවක් ඇතිවිය.

"අනේ පුංචි මහත්තයෝ. යන්නද පුතේ"

ජීවන් ඇස්ඇර ඇසුවේය.

"ඔව් අප්පච්චි. අද වැඩනේ. මම කිරිබත් ටිකක් හැදුවා. කාලා යන්න ඕන"

"අනේ ඔයා පාන්දර ඇහැරුණාද?"

"ඔව් අප්පච්චිපස්සේ කිරිබත් පාරක් හැදුවා. කට්ට සම්බෝලයකුත් හදලා තියෙන්නේ. කාලම යන්න. නැත්නම් කෙහෙල් කොලයක් ඇති ඔතාගෙන යන්න."

"ඔතාගෙන යන්නම් පුතේ"

ජීවන් කොල්ලා දෙස බලාගෙනම උන්නේය.

"ඔයාට දෙයක් ලැබෙන්න ඇයි මෙච්චර පරක්කු කියලා හැමදාම හිතුවා. අපි හැමදේම ලස්සනට කරමු."

"හොඳයි අප්පච්චි. මම ගිහින්

කෝල් කරන්නම්. හවසට මහගෙ දර පැත්තේ ඇවිත් යන්න. මාමා බලාගෙන ඉන්නවා කිව්වා නේද"

"ඔව් පුතේ. ඔය කොහේටහරි යන්න. "

"යන්න. අප්පච්චි එහෙම ගියෙම නෑනේ. මමත් අද ටිකක් පරක්කුවෙනවා. එහෙම වුනොත් සීගිරි එකටත් ඇවිත් යන්න"

දේවක ඇඳ පාමුළදීම ජීවන්ට වැන්දේය.

"අම්මා අද ඉන්න තිබුණා. අපි මේ ගෙදරින් යන්න කලින් අම්මට දානයක් දීලම යමු පුතේ"

"එහෙම කරමු අප්පච්චි. මටත් ආසයි"

දේවක යන දෙස ජීවන් බලාගෙ නම උන්නේය. කොල්ලාගේ ජීවිතය

මල් පැලයක් මෙන්ය. ලස්සන මල් පැලය නොවේ. ඒ මල් පැලයේ පිපි මලය. ඒ භාවනාය.

භාවනා තාත්තාගේත් අම්මාගේත් කාමරයට ගියේ රෑ ඇඳුම පිටින්මය. පුදුමයකට මෙන් මේ මහා පාන්දරත් දෙදෙනාම අවදියෙන් උන්නෝය.

"එන්න සුද්දි. අපි මේ කතාකරකර උන්නේ ඔයා ගැන තමයි"

භාවනා අම්මාත් තාත්තාත් ළඟ ඇලවූවාය. දෙන්නා ළඟ ඇලවුනේ සෑහෙන කාලයකට පසුවය. අම්මාත් තාත්තාත් ළඟ අන්තිමටම නිදාගත්තේද ඇයය. භාවනා වෙනම කාමරයකට ගියේ හය වසරටත් ගියාට පසුය. සාමාන්‍ය පෙළ කරන කාලයේදීත් ඇතැම් රැයවලදී ඇය කොට්ටයද රැගෙන අම්මාත්

තාත්තාත් ළඟට නිදාගන්නට ආවාය.

"මොනවද පුතා කියන්නේ"

මිලින්ද ඇසුවේ භාවනාගේ හිසට අතක්ද තබාගෙනය.

"අප්පච්චිට සතුට දරාගන්න බෑලු තාත්තා. දෙන්නත් එක්ක නිදාගෙන තියෙන්නේ ගොඩක් රෑ වෙලා"

"එයා ගොඩක් දුක් විඳපු කෙනෙක්"

මිලින්ද කීවේය.

"දැන් කොල්ලයි අප්පච්චියි දෙන්නම අපි ළඟනේ. යුතුකම් කරන්න ඕන යුතුකම් දන්න කෙනෙක්ට"

ඉඳුනිල් අතීතය සිහිකරමින් කීවාය.

"දෙන්නත් එක්ක කතාකරලා අද මට කියන්න ඕන. කොහෙද

වෙඩින් එක ගන්න කැමති කවදද කොහොමද කියලා. ඔයාලා දෙන්නා කැමති විදිහට හැමදේම කරලා දෙන්නම්"

භාවනා මිලින්දගේ පපුවට හිස තැබුවාය.

"එයත් එක්ක කතාකරලා කියන්නම් තාත්තා. අපිට නැති අදහස් තියෙන්නේ"

"දෙන්නම දවසක අක්කව බලාග න්න ඕන"

"ඇයි අක්කිව විතරක්. අපි හැමෝවම බලාගන්නවා. අනික අපි ඉන්නේ එකටනේ. කවුරුවත් වෙන්වෙන්නේ නෑ. වෙන්වෙන්න කාටවත් දෙන්නෙත් නෑ"

පොඩි දුවගේ මේ අදහස් මිලින්දගේ හිතට සැනසීමක් ගෙන

ආවේය. කෙල්ලෝ තුන්දෙනා එකට ජීවත්වීම තරම් සතුටක් තවත් නැත.

"මේ දවස් ටිකේ පුතාට පරිස්සමින් ඉන්න කියන්න. මේ දේවල් දැනගත්තාම සමහරු මොනවා කරයිද කියලා හිතාගන්න බෑ"

ඉඳුනිල් කීවේ සුරංගිත් රුවන්තිත් ගැනය. තවම ඒ කිසිවෙක් දේවක කවුද කියා දන්නේ නැත.

"එයාලටත් මේවා කියලා දාන්න තාත්තා. මොකටද අපි හංගන්නේ. අනික ඉතින් තරහ වෙන්න දේකුත් නෑනේ. අපි සිගිරි කොටසත් දුන්නනේ හැමෝටම"

"එයාලා බලාපොරොත්තුවෙච්ච කොටස මේක නෙමේ"

අම්මා කියන කතාව භාවනා

තේරුම්ගත්තාය.

"හැමදාම හිතුවේ මගේ ජීවිතේ කොටසක් කාටහරි දෙන්න නෙමේ අම්මා. මගේ කොටස මේ හැමෝම. මම ඔයා සීයා තාත්තා අක්කලා දෙන්නා සීගිරි එක. මේ හැමදේම එක්ක මාව ගන්න කැමති කෙනෙක්වයි මාත් හෙව්වේ. මං හිතන්නේ නෑ කවුරුවත් එහෙම දේකට කැමතිවෙයි කියලා. කාගෙ වත් ජීවිතේක කොටසක් වෙලා වැඩක් නෑ. ජීවිතයම වෙන්නයි ඕන"

මේ ගෙදර ලස්සනටම ආදරය කලේ පොඩිම කෙල්ල යැයි මිලින්දට සිතුණි. ඒ ඇයගේ ලැබීමය.

භාවනා නේත්‍රාගේද කාමරයට ගියාය. ඇයද උන්නේ අවදියෙනි.

"ඔයත් ඇහැරලා. අම්මයි

තාත්තයිත් ඇහැරලා උන්නේ මං යනකොට"

"ඊයේ ඉතින් හරි විශේෂ දවසක්නේ පැටියෝ. ඉතින් නින්ද ගියෙත් නෑ"

භාවනා ඇයව තුරුල්කරගෙ නම ඇඳට ආවාය. අක්කාගේ සිනිඳු පියයුරු අතර මුහුණ තියාගෙන ඉන්නට හැමදාමත් ඇය ආසය.

"වැඩක් නැත්නම් මේම පැයක් විතර නිදාගන්නවා"

භාවනා කීවාය. නේත්‍රා නැගණියගේ හිස සිපගත්තාය.

"එයාලා දෙන්නට ගොඩක් සතුටුයි අක්කා"

"ඒ සතුට ලැබෙනවා කියලා මම දැනගෙන උන්නා. කාලෙකින් මේ පවුලට එහෙම සතුටක් ලැබුනේ.

ඇස්වහක් වදින්න එපා"

"වදිනවානම් වදින්නේ මේ ගෙදරින් පිට අයගේ ඇස්වහ තමයි"

"බලමුකෝ"

"දැන් ඉතින් මට ඔයාවත් නිස්කලංකයේ සනීපකරගන්න පුළුවන්. තෙල්ගාන මල්ලී අපි ළඟ"

භාවනා සිනාසී කීවාය.

"එහෙම ඒකා තෙල්ගානකොට මම විජ්කළා. මේකව අපිටම ලැබෙන්න කියලා"

"මී ටූ"

ප්‍රාර්ථනා කරන හැමදේම දෙවියන් දෙන්නේ නැත. එහෙත් දෙවියන්ට දෙන්නට නොදී බැරිදේත් ඇත.

"අපි වෙඩින් එක ලස්සනටම ගමු. මං ගානේ බබාගේ ජුවලරි ටික අරන් දෙන්නේ. ඒක හැමදාම හිතාගෙන

උන්නා”

“අනේ. මට ඉතින් එහෙම කියලා ගොඩක් ජුවලරි ඕන නෑනේ”

“එහෙම බෑ. උස්සනටම දාගෙන යන්නෝන”

හිතට මේ දැනෙන නිවන සදාකාලික වේවායි භාවනා නේත්‍රාගේ පපුවට මුහුණ තබාගෙන සිතුවාය.

ඇය තාරකාගේද කාමරයට ගියාය. ඇයනම් උන්නේ හොඳ නින්දකය. භාවනා ඇයව ඇහැරවන්නේ නොමැතිව බදාගෙන ටික වෙලාවක් උන්නාය.

“උදේ පාන්දර මාව බදාගෙන කිස්කරන්නේ නැතුව ගිහින් කොල්ලව කිස් කරපන් බං”

භාවනා පොඩි අක්කාව සිපගනිද්දී ඇය කීවාය.

"හැමදේකටම තැන්කියු කියන්න ආවේ"

"මී. ලව් යූ බබා. උඹ වෙනුවෙන් මැරෙනවා"

"අයි නෝ. මමත් දවසක ඔයා වෙනුවෙන් මැරෙනවා"

තාරකා නින්දෙන්ම භාවනාව තුරුල්කරගත්තාය.

"ඉක්මනට බබෙක්ව ගෙනෙන් බං. මට ආසයි පැටියට බඩු ගේන්න"

"දුවෙක්ද පුතෙක්ද ඕන"

"කවුරු වුනත් කමක් නෑ. ගෙදර ආවාම මට ළඟ තියාගෙන ඉන්නයි ඕන. මේ ගෙදර පාළුව නැතිකරපන්"

භාවනා හිස වැනුවාය.

"පැටියව මල් වට්ටිය වගේ වටේ යයි වගේ"

"දෙන්. උඹට පුළුවන් කොල්ලා

එක්ක ඉන්න"

තාරකා කීවාය.

"මී නිදාගන්න. හවසද යන්නේ"

"මී. ඇවිත් යන්නම්. උඹවයි කොල්ලවයි බලලා තමයි යන්නේ"

භාවනා සීයාගේ කාමරයටද ගියාය. හැමෝටම මේ දුන් තෑග්ගට වෙන වෙනම ස්තූති කළයුතු විය.

"කාලෙකට පස්සේ සැනසීමෙන් නිදාගත්තා මැණික. ඔයාට ගොඩක් පින් මගේ හිතේ තිබ්බ ලොකු බරක් නිදහස් කළාට"

"ඒ වගේම මගෙත් සීයා. අයි ලව් යූ සෝ මච්"

භාවනා සීයාගේද තුරුලට ආවාය.

"දැන් හරි ආසයි ඔයාලා එක්ක තව ටික කාලයක් ජීවත්වෙන්න"

"ඉතින් ඔයා ගොඩක් කල් ජීවත්වෙනවනේ සීයා. මොනවද මේ කියන්නේ"

"ඉන්නවා ඉන්නවා. අද ගිහින් ෂුගර් කොලෙස්ට්‍රෝල් චෙක්කරගන්න ඉන්නේ"

"මාත් එන්නම්"

"ඒක මට කරගන්න පුළුවන්. සතුටින් ඉන්න. කොහොමහරි කොල්ලවයි ජීවන්වයි මෙහෙට ගේන්න"

"එයාලා එනවා සීයා. අයි ප්‍රොමිස්"

"එච්චරයි ඕන"

භාවනා යළි කාමරයට ආවේ මේ හැමදේම කළ පසුවය. ඇය ඒ ඉක්මනින්ම ඇඳගත්තාය. ඔහු වඩාත්ම කැමති සාරිය කුමක්දැයි

ඇය දැනගෙන උන්නාය. ඒ ඔහු සීගිරි එකට ආ මුල් දවසේ තමා ඇඳගෙන උන් ලා දම් පැහැගත් සාරියය. භාවනා එයම තෝරාගත්තාය. වසන්තය පටන්ගත්තේ ඒ දවසින් පසුවය. එදා සිදුවූ හැමදේම භාවනාට අද මෙන්ම මතකය.

# 45

පාන්දර සීගිරි සුපර් හී කිසිවෙක් උන්නේ නැත. දේවක ආවේ දැන් ටික වෙලාවකට කලිනි. ඔහු සිගිරි එක වටේම ගොස් හැමදේම පරීක්ෂා කලේය. එක දවසක මේ සීගිරි එකට පය තැබුවේ හැමදේම එයට දෙන්නට සිතාගෙනය. අවසානයේදී ඒ හැමදේම ගෙන සීගිරි එක හැමදේම ඔහුට දුන්නේය.

ඊයේ මෙන්ම අදද සීගිරි

එකට පාරිභෝගිකයෝ උතුරන බව දේවක හොඳින්ම දැනගෙන උන්නේය. එක දවසක ඔහු සිතුවේ සීගිරි එක ඇතුලේ කාන්දම් ටිකක් සවිකරන්නටය. පාරිභෝගිකයෝ යනු ඇල්පෙනිතිය. දේවක සිතූ දේ හරිගියේය. ඊයේ උදෑසන නමයේ සිට පාරිභෝගිකයෝ සීගිරි එකට ඇදීගෙන ආවේ වශීයක් කළ පරිද්දෙන්ය. හරියටම උතුරන්නේ ඊයේ ආ පාරිභෝගිකයෝ මේ පණිවිඩය ඔවුන්ගේ නෑදෑයන් මිතුරන් අතරට ගෙන ගිය පසුවය.

දෙයක් හරියන්නේ ඒ ගැන කතාවක් යනවානම්ය. දේවකට අවශ්‍ය වූයේ සීගිරි එකේ එවැනි පැතිරෙන කතා සියයක් පමණ හදන්නටය. ඔහු කතාවෙන් කතාව හැදුවේය. අන්තිමට සීගිරි එක

ඔහුගේ ජීවිත කතාවද අලුතින් ලිව්වේය.

අවසානයට පාන්දර හිමිදිරි ආලෝකයද ගෙන ඔහු සීගිරි එක දොරඬකට ආවේය. යුවතිය බැස්සේ ඔහුගේ මුහුණෝ දෙනෙත් අලවාගෙනය. එදා මෙන්ම අදත් ඔහු තමා එනමඟ බලාගෙන උන්නේය. ඇය එය හදවතින්ම බලාපොරොත්තු වූවාය.

"මං හිතුවා අපේ මහත්තයා අද මං එන පෙරමඟ බලාගෙන ඉන්න එකක් නෑ කියලා"

"ලයිෆ් ටයිම් ඉන්නවා"

දෑසින් දිග කතාවක් කීවේය. දෙනෙනාම ගියේ ඔවුන්ට සුපුරුදු කාර්යාල කාමරයටය. මේ පාන්දර කිසිවෙක් සීගිරි සුපර් වෙත එන්නේ

නැත. පැයක් දෙකක් ඔවුන්ගේය.

අත් බෑගය මේසය මත තබා භාවනා විදාහල දෑතින් ඔහුව වැළඳගත්තාය. දේවකගේ දෑත් යුවතියගේ බඳ වටා ගියේ ඉබේටමය. දැන් ඔවුන් ඔවුන්ගේය.

“දේවකයියේ”

“කියන්න සුද්දි”

“හැමදේකටම ගොඩක් පින්. තැන්කියු සෝ මච්”

“ඉතින් මම මොනවද කියන්නේ එහෙම වුනාම”

“වෙල්කම් කියන්න”

ඇය දෑස් මොහොතකට පියාගත්තාය.

“අදින් ඇරඹෙන ජීවිතේ දුක සැප නින්දා අපහාස හැමදේම තියෙයි. ඒත් ඒ හැමදේම ඔයා ළඟට වෙලා

මට විඳින්න පුළුවන්. මේ ලෝකයට වඩා ගොඩක් ලොකු ලෝකයක් මට දැන් තියෙනවා. ඒ ලෝකේ මේ අත් දෙකමැද"

භාවනා ඔහුගේ මුහුණ දෙස බලාගෙනම කීවාය. දේවක ඒ බෝ පත් මුහුණ දෝතට ගත්තේය.

"මට දැන් භාවනා කරන්න පුළුවන්. මේ මූණ දිහාම බලාගෙන"

"හැමදාම"

"ඔව්. හැමදාම. දැන් ජීවත්වෙන්න ආසයි"

"මටත්"

භාවනා දෙපතුල්වලින් ඉස්සී ඔහුගේ නළලත සිපගත්තාය. ඊටත් පසුව ඔහුගේ ලවන් සොයාගෙන ඇගේ නොසන්සුන් දෙතොල් පහළටම ආවේය.

"හැමදේම ඔයාට"

ඇය රහසින් මෙන් කීවාය. ලෝකය මොහොතක් නතරව තිබුණි. හුස්මක් පවා වැටුනේ අහම්බයකින් මෙන්ය. විනාඩි අටකට පමණ පසු ඇය මෘදු හතියක් සමඟ යළිත් ඒ ලවන් මතම ඇලුණාය.

"අයි ලව් යූ සෝ මච්. කියන්න බැරිතරම්"

"මී ටූ සුද්දි"

ඔහු කීවේ මෘදු හඬකිනි.

අලුත් ආදරවන්තයන් දෙදෙනා එකිනෙකාගේ ලවන් මත ගැල්වූ ආදර මීවිතක් සොයන්නට මෙන් දෙතොල් අලවාගෙනම උන්නෝය.

නිමි.

ඉතින් මට සැනසීමය.
සුජීව ප්‍රසන්න ආරච්චි නම් වූ මට සැනසීමය.
මේ සැනසීම ලබාගන්නට මා නිදි වැරූ රැයවල් ගණන
ඔබ දන්නේ නැත. මේ මොහොතේ
ඔබට දැනෙන සැනසීම මට සිතාගත හැක.
ඒ සැනසීම එළෙසම විඳින්නට
මාද බලාගෙන උන්නෙමි.
ඔබට බොහෝමත්ම ස්තූතියි.
අතිශය සාමාන්‍ය ලේඛකයෙක් වූ මාව විශ්වාස කළාට
බොහෝමත්ම ස්තූතියි.
භාවනා දේවකව විශ්වාශ කළාක් මෙන්
ඔබද මාව විශ්වාස කළේය.
ඉතින් ඒ විශ්වාසයට
මම සිරස නමා නමස්කාර කරමි.

සුජීව ප්‍රසන්න ආරච්චි
2019 මාර්තු 1 වෙනිදාවක. පාන්දරක.